ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,102 - 2018 දෙසැම්බර් මස 14 වැනි සිකුරාදා - 2018.12.14

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

IV(ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

	පිටුව
තනතුරු- ඇබෑර්තු	4002
විභාග, විභාග ප්‍රතිඵල ආදිය	—
බඩුබාහිරාදිය විකිණීම්	—
පළාත් පාලන නිවේදන	—
අතුරු ව්‍යවස්ථා	4022

	පිටුව
පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම් ..	—
ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන	4030
අයවැය ලේඛන	—
දේපළ විකිණීම්	—
විවිධ දැන්වීම්	4033

සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ

වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

ගැසට් පත්‍රයේ පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2019 ජනවාරි මස 04 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2018 දෙසැම්බර් මස 21 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."

ගංගානි ලියනගේ,
රජයේ මුද්‍රණාලයාධිපති

2018 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය www. documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

4001- B 81477— 5,403 (2018/12)

තනතුරු - ඇබෑර්තු

නාරම්මල ප්‍රාදේශීය සභාව

ප්‍රාථමික ශ්‍රේණියේ ශිල්පීය නොවන, අර්ධ ශිල්පීය හා ශිල්පීය තනතුරු සඳහා බඳවා ගැනීම

නාරම්මල ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී ඇති පහත උපලේඛනයේ සඳහන් තනතුරුවලට බඳවා ගැනීම සඳහා මෙම උපලේඛනයේ සඳහන් සුදුසුකම් ඇති නාරම්මල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

තනතුරු නාමය	*තනතුරු පුරප්පාඩු සංඛ්‍යාව*	*වැටුප් ක්‍රමය*	*අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්*
01. සෞඛ්‍ය කම්කරු	02	03/2016 දරන රා.ප.ව. PL-1-2016 වැටුප් කේතය රු. 24,250-10×250-10×270-10×300-12×330 - රු. 36,410	රජය පිළිගත් පාසැලකින් 08 වන ශ්‍රේණිය (09 වසර) සමත් විය යුතුය.
02. මුරකරු	01	03/2016 දරන රා.ප.ව. PL-1-2016 වැටුප් කේතය රු. 24,250-10×250-10×270-10×300-12×330 - රු. 36,410	අධ්‍යයන පොදු සහතිකපත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී යටත් පිරිසෙයින් විෂයන් දෙකක්වත් සමත් වී තිබිය යුතුය. (වෛකල්පිත විෂයයන් හැර)
03. කාර්යාල කාර්යය සහායක	01	03/2016 දරන රා.ප.ව. PL-1-2016 වැටුප් කේතය රු. 24,250-10×250-10×270-10×300-12×330 - රු. 36,410	අධ්‍යයන පොදු සහතිකපත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී යටත් පිරිසෙයින් විෂයන් දෙකක්වත් සමත් වී තිබිය යුතුය. (වෛකල්පිත විෂයයන් හැර)

02. *බඳවා ගැනීම සඳහා පොදු කොන්දේසි :*

I. අයදුම්කරුවන් ශ්‍රී ලංකාවේ පුරවැසියන් විය යුතුය.

II. අයදුම්කරුවන් නාරම්මල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචිකරුවන් විය යුතුයි. (වසර 03 ක ස්ථිර පදිංචිය සනාථ කළ යුතුයි)

III. අයදුම්පත් භාරගන්නා දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

IV. නාරම්මල ප්‍රාදේශීය සභාවේ දැනට තාවකාලික අනියම්, ආදේශක, කොන්ත්‍රාත් පදනම මත සේවය කරනු ලබන සේවකයින් කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

V. අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් හා මනා සෞඛ්‍යයකින් සිටිය යුතු අතර, දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරු වී දඬුවම් ලැබූවෙකු නොවිය යුතුයි.

VI. දැනටමත් පළාත් සභා රාජ්‍ය සේවයේ නියුතු අයෙක් නම් ඔහු අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර 05 තුළ අවවාද කිරීමක් හැර දඬුවම් ලබා නොතිබිය යුතු අතර, එකී පූර්වාසන්න වසර 05 තුළ සියලු වැටුප් වර්ධක උපයාගෙන තිබිය යුතුයි.

VII. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් සුදුස්සන් තෝරා ගැනේ.

03. *සේවයේ නියුක්ත කරලීමේ කොන්දේසි :*

I. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය සම්බන්ධයෙන් රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයට ඔබ යටත් විය යුතුය.

II. වැන්දඹු/වැන්දඹු පුරුෂ හා අනත්දරු දායකත්වය හිමි වේ.

III. පත්වීම අවුරුදු 03 ක පරිවාස කාලයකට යටත් වේ.

04. මෙම බඳවා ගැනීමේ කොන්දේසි හා රෙගුලාසිවලට අමතරව ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ රෙගුලාසිවලට, රජයේ දෙපාර්තමේන්තු නියෝගවලට ද වයඹ පළාත් සභාව හෝ වයඹ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් වරින් වර නිකුත් කරනු ලබන වෙනත් රෙගුලාසි හෝ නියෝගවලට ද අනුකූලව ක්‍රියාකිරීමට සියලුම සේවකයින් බැඳී සිටිය යුතුයි.

05. අයදුම්පත් සමග ඉදිරිපත් කළ යුතු ලේඛන :

අයදුම්පත්‍රය සමග පහත සඳහන් සහතික වල පිටපත් අමුණා එවිය යුතු අතර, මුල් පිටපත් සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතුය.

I. උප්පැන්න සහතිකය,
II. අධ්‍යාපන සහතික,
III. තම පදිංචිය සනාථ කිරීම (ග්‍රාම සේවා නිලධාරීගෙන් ලබා ගත් සහතිකය ප්‍රාදේශීය ලේකම්වරයා විසින් සහතික කර තිබිය යුතුය),
IV. මෑතක දී ලබාගත් චරිත සහතික දෙකක් (එක් සහතිකයක් පදිංචි ප්‍රදේශයේ ග්‍රාම නිලධාරීගෙන් ලබා ගත යුතුයි)
V. වෘත්තීය හෝ පළපුරුද්ද පිළිබඳ සහතික
(රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ හෝ නියුක්ත වූවන් තම අයදුම්පත් ආයතන ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය)
මූලික සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවීම් කරනු ලැබේ.

අයදුම් කළ යුතු ආකාරය :

අයදුම්කරුවන් මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුව පිළියෙල කරන ලද අයදුම්පත් ඉල්ලුම් කරන තනතුර කවරයේ වම්පස ඉහළ කෙළවරේ ලියා, 2019.01.15 වැනි දිනට හෝ ඊට ප්‍රථම ලැබෙන සේ ලේකම්, ප්‍රාදේශීය සභාව, නාරම්මල යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ කැඳවන අතරතුරදී මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම, වෙනස් කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීමේ පූර්ව බලය නාරම්මල ප්‍රාදේශීය සභාවේ ලේකම් සතුවේ.

එම්. පී. සී. රේණුකා,
ලේකම්,
නාරම්මල ප්‍රාදේශීය සභාව,
නාරම්මල.

2018 නොවැම්බර් මස 26 වැනි දින,
නාරම්මල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දීය.

ආදර්ශ අයදුම් පත්‍රය

නාරම්මල ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩුව පවතින ප්‍රාථමික ශිල්පීය/ ශිල්පීය නොවන/ අර්ධ ශිල්පීය ගණයේ ..... තනතුර සඳහා බඳවා ගැනීම

01. ඉල්ලුම්කරුගේ සම්පූර්ණ නම :————————————————.
02. මුලකුරු සමග නම :————————————————.
03. ස්ථිර ලිපිනය :————————————————.
04. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :————————————————.
05. උපන් දිනය : වර්ෂය:———————— මාසය :———————— දිනය :————————
06. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස : අවුරුදු :———————— මාස :———————— දින :————————
07. ජාතික හැඳුනුම්පත් අංකය :————————————————.
08. දුරකථන අංකය :————————————————
09. විවාහක/ අවිවාහක බව:————————————————

10. ස්ත්‍රී/ පුරුෂ භාවය:——————————

11. ඔබ ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු වන්නේ පරම්පරාවෙන්ද ලියාපදිංචි වීමෙන් ද යන වග :——————————

12. අධ්‍යාපන සුදුසුකම් (සහතිකවල ඡායා පිටපත් අමුණා එවන්න.)

අ.පො.ස. සා/පෙළ විභාගය : සමත් වර්ෂය:—————— විභාග අංකය :——————

විෂයය	සාමාර්ථය	විෂයය	සාමාර්ථය

අ.පො.ස. උ/පෙළ විභාගය : සමත් වර්ෂය :—————— විභාග අංකය :——————

විෂයය	සාමාර්ථය	විෂයය	සාමාර්ථය

13. 1. වෙනත් අධ්‍යාපන සුදුසුකම් :——————————
2. වෘත්තීය සුදුසුකම් :——————————
3. සේවා පළපුරුද්ද :
I. දැනට සේවය කරන ආයතනය:——————————
II. දැනට දරන තනතුර :——————————
III. එම තනතුරට පත් වූ දිනය :—————————— :
IV. මීට පෙර සේවය කරන ලද ස්ථාන හා දරන ලද තනතුර :——————————

14. ඔබ කවරදාක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේ ද? :——————————

මෙම අයදුම්පත්‍රයෙහි මා විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. ඉහත සඳහන් තොරතුරු අසත්‍ය බවට ඔප්පු වුවහොත් මා සේවයට බඳවා ගැනීමට පෙර නුසුදුස්සෙකු වන බව හා පත්වීම ලැබීමෙන් පසු එය ඔප්පු වුවහොත් කිසිදු වන්දියක් ද රහිතව සේවයෙන් පහ කිරීමට යටත්වන බවද දනිමි.

.....
අයදුම්කරුගේ අත්සන

දිනය :——————

දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු වූ අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය

..... මහතා/ මහත්මිය/ මෙනවිය මෙම ආයතනයේ ..... වශයෙන් සේවයේ නියුක්තව සිටියි. මෙම තනතුර සඳහා තෝරා ගතහොත් ඔහු/ඇය සේවයෙන් නිදහස් කළ හැක/නොහැක. ඔහු/ඇය පූර්වාසන්න වසර 05 තුළ අවවාද කිරීමක් හැර කිසිදු දඬුවමකට භාජනය වී නොමැති බව සහතික කරන අතර, ඔහු/ඇය විසින් ඉදිරිපත් කර ඇති අයදුම්පත්‍රය නිර්දේශ කර ඉදිරිපත් කරමි.

.....
ආයතන ප්‍රධානියාගේ අත්සන.

දිනය :——————

ආගරපතන ප්‍රාදේශීය සභාව

ප්‍රාථමික ශ්‍රේණියේ ශිල්පීය, අර්ධ ශිල්පීය, ශිල්පීය නොවන හා කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන බණ්ඩ 2 තනතුරු සඳහා බඳවා ගැනීම

මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ ආගරපතන ප්‍රාදේශීය සභාවේ දැනට පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරුවලට බඳවා ගැනීම සඳහා මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති සහ ආගරපතන බල ප්‍රදේශයේ ස්ථිර පදිංචිය ඇති අයගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම නිවේදනය අවසානයේ දැක්වෙන ආදර්ශ අයදුම්පත්‍රය අනුව සකස් කළ අයදුම්පත් 2019.01.11 දිනට පෙර **ලේකම්, ආගරපතන ප්‍රාදේශීය සභාව, මෙරායා, ලිඳුල** යන ලිපිනයට ලැබෙන පරිදි ලියාපදිංචි තැපෑලෙන් පමණක් එවිය යුතුය. ඉල්ලුම්පත් බහා එවන ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඔබ විසින් ඉල්ලුම්කරන තනතුර සඳහන් කළ යුතුය. තනතුරු කිහිපයකට ඉල්ලුම් කරන්නේ නම් වෙන් වෙන් වශයෙන් අයදුම්පත් යොමු කළ යුතුයි.

අනු. අංක	*තනතුරු නාමය*	*තනතුරු සංඛ්‍යාව*	*අනුයුක්ත කරන ස්ථානය හා කාර්යය*	*වැටුප් පරිමාණය*	*අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්*
01	රියදුරු III වන ශ්‍රේණිය	05	ආගරපතන ප්‍රාදේශීය සභාව මූලික අවශ්‍යතාවයක් වන ප්‍රවාහනය සම්බන්ධ කාර්යයන් ගෙන් සමන්විත වූ කාර්ය භාරයක් සහ ලේකම් විසින් සේවයේ අවශ්‍යතාවය මත පවරනු ලබන රාජකාරී කටයුතු ද මෙම තනතුරු දරන්නට පැවරේ.	PL – 03 2016 රු. 25,790- 10×270-10×300-10×330 -12×350- රු. 38,990	**අධ්‍යාපන සුදුසුකම් :** අධ්‍යයන පොදු සහතිකපත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන 02ක් සහිතව විෂයයන් 06ක් සමත්ව තිබීම. මින් විෂයයන් 05 ක් එක් වරකදී සමත් වී තිබිය යුතුය. **වෘත්තීය සුදුසුකම් :** තාර බර හොන්ඩර 34 ට වැඩි බර මෝටර් වාහන බර ට්‍රේලර් සහ මගීන් 32 ට නොවැඩි සංඛ්‍යාවක් ගෙන යා හැකි බස් රථ සඳහා රියදුරු බලපත්‍රයක් එනම් මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් විසින් නිකුත් කරන ලද ඒ වාහන පන්තියේ බලපත්‍රයක් හෝ නව රියදුරු බලපත්‍රය අනුව ඒ1/ ඒ/බී 1/බී/ සී1/සී/ සීඉ ඩී1/ ඩී/ ජී1/ ජී/ පේ පන්තියේ බලපත්‍රයක් ලබා තිබීම. **පළපුරුද්ද :** මෝටර් රථ පැදවීමේ බලපත්‍රය ලැබීමෙන් පසු අවම වසර 03 ක පළපුරුද්දක් ලබා තිබීම (පළපුරුද්ද විධිමත් සහතිකයක් මගින් සනාථ කළ යුතුයි) **කායික සුදුසුකම් :** අවම උස අඩි 05 අඟල් 02 1/2 ක් විය යුතුයි.

අනු. අංක	*තනතුරු නාමය*	*තනතුරු සංඛ්‍යාව*	*අනුයුක්ත කරන ස්ථානය හා කාර්යය*	*වැටුප් පරිමාණය*	*අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්*
					මනා ඇස් පෙනීමක් තිබිය යුතු අතර දිවා කාලයේදී සහ රාත්‍රී කාලයේදී සේවයේ යෙදීම පිණිස ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය. මාර්ග නීති සංග්‍රහය ගැන මනා දැනුමකින් යුක්ත විය යුතුය. *බඳවා ගැනීමේ ක්‍රමය :* ධාරාව – ප්‍රතිශතය විවෘත – 70% සීමිත – 30%
02	ආයුර්වේද ඖෂධ සංයෝජක III වන ශ්‍රේණිය	02	ආගරපතන ප්‍රාදේශීය සභාව තනතුරට අදාලව හා අවශ්‍යතාවය මත ආයතන ප්‍රධානියා විසින් තීරණය කර පවරන්නා වූ රාජකාරි	PL 02-2016 රු. 25,250- 10×270-10×300-10×330-12×350- රු. 38,450	**අධ්‍යාපන සුදුසුකම් :** අධ්‍යයන පොදු සහතිකපත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී සිංහල හෝ දෙමළ භාෂාව සමග අවම වශයෙන් විෂයන් 02 කට සම්මාන සහිතව විෂයන් 06ක් සමත්ව තිබීම. **ශිල්පීය නිපුණතා/ප්‍රවීණතා :** වෘත්තියට අදාලව ජාතික වෘත්තීය සුදුසුකම් 02 වන මට්ටමේ (NVQ 02) හෝ 03 වන මට්ටමේ (NVQ 03) සහතිකය ලබා තිබීම; හෝ කාර්මික අධ්‍යාපනය හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ (DTET) වෘත්තියට අදාලව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් හදාරා සහතික ලබා තිබීම ; හෝ ජාතික තරුණ සේවා සභාවේ (NYSC) වෘත්තියට අදාළව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් හදාරා සහතිකය ලබා තිබීම; හෝ ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු කිරීමේ අධිකාරියේ (VTA) වෘත්තියට අදාලව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් හදාරා සහතිකය ලබා තිබීම; හෝ

අනු. අංක	*තනතුරු නාමය*	*තනතුරු සංඛ්‍යාව*	*අනුයුක්ත කරන ස්ථානය හා කාර්යය*	*වැටුප් පරිමාණය*	*අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්*
					ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරියේ දෙපාර්තමේන්තුවේ (NAITA) වෘත්තියට අදාළව එක් වසරක පාඨමාලාවක් හදාරා සහතිකය ලබා තිබීම. *හෝ* තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ ලියාපදිංචි කාර්මික පුහුණු ආයතනයක වෘත්තියට අදාළව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් සම්පූර්ණ කර සහතිකය ලබා තිබීම. **පළපුරුද්ද :** අදාළ ක්ෂේත්‍රයේ ලබා තිබීම. (පුහුණු කාල සීමාව යටත් පිරිසෙයින් අවුරුදු 02 ක් වත් විය යුතුය)
03	මාර්ග කම්කරු III වන ශ්‍රේණිය	18	ආගරපතන ප්‍රාදේශීය සභාව මාර්ග දෙපස කාණු පවිත්‍ර කිරීම, තණකොළ කැපීම, කහ ඉරි ඇඳීමට සහාය වීම, තාර දැමීම, ප්‍රිමික්ස් සැකසීමට අත් උදව් දීම, මාර්ග අතුගෑම, පිරිසිදු කිරීම, ගලි යන්ත්‍රයේ කාර්යයන්, කසළ එකතු කරන ට්‍රැක්ටර්වලට දැමීම.	PL 01 - 2016 රු. 24,250 - 10×250-10×270-10×300-12×330- රු. 36,410	**අධ්‍යාපන සුදුසුකම් :** අධ්‍යයන පොදු සහතිකපත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් විෂයයන් 02කට සම්මාන සහිතව විෂයයන් 06ක් සමත්ව තිබීම. මින් විෂයයන් 05 ක් එක් වරකදී සමත් වී තිබිය යුතුය. ඉහත සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් නොමැති අවස්ථාවලදී 5 ශ්‍රේණිය සමත් අයවලුන් බඳවා ගැනීමට කටයුතු කරනු ලැබේ.
04	ජල කම්කරු III වන ශ්‍රේණිය	06	ආගරපතන ප්‍රාදේශීය සභාව යාන්ත්‍රික ජල යෝජනා ක්‍රමයන්හි ජලය බෙදා හැරීමේ යන්ත්‍ර ක්‍රියාත්මක කිරීම, වැල් අලුත්වැඩියාව සඳහා සහාය වීම.	PL 01-2016 රු. 24,250 - 10×250-10×270-10×300-12×330- රු. 36,410	**අධ්‍යාපන සුදුසුකම් :** අධ්‍යයන පොදු සහතිකපත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් විෂයයන් 02 කට සම්මාන 02ක් සහිතව විෂයයන් 06ක් සමත්ව තිබීම. මින් විෂයයන් 05 ක් එක් වරකදී සමත් වී තිබිය යුතුය.

අනු. අංක	*තනතුරු නාමය*	*තනතුරු සංඛ්‍යාව*	*අනුයුක්ත කරන ස්ථානය හා කාර්යය*	*වැටුප් පරිමාණය*	*අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්*
05	සෞඛ්‍ය කම්කරු III වන ශ්‍රේණිය	19	ආගරපතන ප්‍රාදේශීය සභාව මාර්ග දෙපස කාණු පවිත්‍ර කිරීම, තණකොළ කැපීම, මාර්ග අතුගෑම, පිරිසිදු කිරීම, ගලි යන්ත්‍රයේ කාර්යයන්, කසළ එකතු කරන ට්‍රැක්ටර් වලට දැමීම, පොදු වැසිකිළි හා කැසිකිළි පවිත්‍ර කිරීමේ කාර්යයන් ඇතුලුව පිරිසිදු කිරීමේ කාර්යයන්.	PL 01-2016 රු. 24,250- 10×250-10×270-10×300-12×330-රු.36,410	**අධ්‍යාපන සුදුසුකම් :** අධ්‍යයන පොදු සහතිකපත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් විෂයයන් 02කට සම්මාන සහිතව විෂයයන් 06ක් සමත්ව තිබීම. මින් විෂයයන් 05 ක් එක් වරකදී සමත්ව තිබිය යුතුය. ඉහත සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් නොමැති අවස්ථා වලදී 5 ශ්‍රේණිය සමත් අයවලුන් බඳවා ගැනීමට කටයුතු කරනු ලැබේ.
06	පුස්තකාල සහායක III වන ශ්‍රේණිය	01	ආගරපතන ප්‍රාදේශීය සභාව පුස්තකාල පිරිසිදු කිරීම, පොත්පත් ඇසිරීම, පොත්පත් ශාඛාවලට ගෙන යාමේ දී සහායක කටයුතු, පොත් බැඳීමට සහාය වීම, පුස්තකාල හා කියවීම් ශාලා පවත්වාගෙන යාම.	PL 01-2016 රු. 24,250- 10×250-10×270-10×300-12×330- රු. 36,410	**අධ්‍යාපන සුදුසුකම් :** අධ්‍යයන පොදු සහතිකපත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් විෂයයන් 02කට සම්මාන 02ක් සහිතව විෂයයන් 06ක් සමත්ව තිබීම. මින් විෂයයන් 05 ක් එක් වරකදී සමත් වී තිබිය යුතුය.
07	කාර්යාල කාර්ය සහායක III වන ශ්‍රේණිය	03	ආගරපතන ප්‍රාදේශීය සභාව දුරකථන ක්‍රියාකරු වශයෙන් ක්‍රියා කිරීම, පොත් බැඳීමේ කාර්ය හෝ ලේඛන භාරකරු වශයෙන් ක්‍රියා කිරීම හෝ ඡායා පිටපත් යන්ත්‍ර ක්‍රියාකරු වශයෙන් ක්‍රියා කිරීම හෝ බයිසිකල් පණිවුඩකරු හෝ පණිවුඩකරු කාර්යයයේ නිරත වීම හෝ පිළි ගැනීමේ නිලධාරි වශයෙන් ක්‍රියා කිරීම. හෝ	PL 01-2016 රු. 24,250- 10×250-10×270-10×300-12×330- රු.36,410	**අධ්‍යාපන සුදුසුකම්** අධ්‍යයන පොදු සහතිකපත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් විෂයයන් 02කට සම්මාන සහිතව විෂයයන් 06ක් සමත්ව තිබීම. මින් විෂයයන් 05 ක් එක් වරකදී සමත් වී තිබිය යුතුය.

අනු. අංක	*තනතුරු නාමය*	*තනතුරු සංඛ්‍යාව*	*අනුයුක්ත කරන ස්ථානය හා කාර්යය*	*වැටුප් පරිමාණය*	*අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්*
			කාර්යාල කාර්යය සහායක වශයෙන් කාර්යාල අභ්‍යන්තරයේ ක්‍රියා කිරීම හෝ බාහිර කාර්යාල කාර්ය සහායක වශයෙන් කාර්යාලයේ අභ්‍යන්තරයේ සහ බාහිරව ක්‍රියා කිරීම හෝ සෝපාන යන්ත්‍ර ක්‍රියාකරු වශයෙන් ක්‍රියා කිරීම හෝ ලේඛනාගාර සහායක වශයෙන් ක්‍රියා කිරීම.		
08	මුරකරු III වන ශ්‍රේණිය	03	ආගරපතන ප්‍රාදේශීය සභාව පළාත් පාලන ආයතනය සතු දේපළ ගොඩනැගිලි සහ වාහන ආදිය ආරක්ෂා කිරීම.	PL 01 – 2016 රු. 24,250 - 10×250-10×270-10×300-12×330- රු. 36,410	**අධ්‍යාපන සුදුසුකම් :** අධ්‍යයන පොදු සහතිකපත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් විෂයයන් 02කට සම්මාන සහිතව විෂයයන් 06ක් සමත්ව තිබීම. මින් විෂයයන් 05 ක් එක් වරකදී සමත් වී තිබිය යුතුය.
09	විදුලි කාර්මික III වන ශ්‍රේණිය	01	ආගරපතන ප්‍රාදේශීය සභාව තනතුරට අදාළව හා අවශ්‍යතාවය මත ආයතන ප්‍රධානියා විසින් තීරණය කර පවරන්නා වූ රාජකාරි	PL 02 – 2016 රු. 25,250- 10×270-10×300-10×330-10×330-12×350- රු. 38,450	**අධ්‍යාපන සුදුසුකම් :** අධ්‍යයන පොදු සහතිකපත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී සිංහල හෝ දෙමළ භාෂාව සමග අවම වශයෙන් විෂයයන් 02 කට සම්මාන සහිතව විසයයන් 06ක් සමත්ව තිබීම. **ශිල්පීය නිපුණතා/ප්‍රවීණතා :** වෘත්තියට අදාළව ජාතික වෘත්තීය සුදුසුකම් 02 වන මට්ටමේ (NVQ 02) හෝ 03 වන මට්ටමේ (NVQ 03) සහතිකය ලබා තිබීම.

අනු. අංක	තනතුරු නාමය	තනතුරු සංඛ්‍යාව	අනුයුක්ත කරන ස්ථානය හා කාර්යය	වැටුප් පරිමාණය	අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්
					හෝ කාර්මික අධ්‍යාපනය හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ (DTET) වෘත්තියට අදාළව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් හදාරා සහතික ලබා තිබීම. *හෝ* ජාතික තරුණ සේවා සභාවේ (NYSC) වෘත්තියට අදාළව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් හදාරා සහතිකය ලබා තිබීම. *හෝ* ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු කිරීමේ අධිකාරියේ (VTA) වෘත්තියට අදාළව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් හදාරා සහතිකය ලබා තිබීම. *හෝ* ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ (NAITA) වෘත්තියට අදාළව එක් වසරක පාඨමාලාවක් හදාරා සහතිකය ලබා තිබීම. *හෝ* තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ ලියාපදිංචි කාර්මික පුහුණු ආයතනයක වෘත්තියට අදාළව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් සම්පූර්ණ කර සහතිකය ලබා තිබීම. **පළපුරුද්ද :** අදාළ ක්ෂේත්‍රයේ අවුරුදු 02ක පළපුරුද්දක් ලබා තිබීම.

02. *බඳවා ගැනීමේ කොන්දේසි :*

(i) අයදුම්කරුවන් පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.

(ii) අයදුම්කරුවන් මනා මානසික හා ශාරීරික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

(iii) අයදුම්පත් කැඳවන දිනට පූර්වාසන්න වසර තුනක කාලයක් ආගරපතන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය.

(iv) අයදුම්පත් කැඳවන අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. (දැනටමත් රාජ්‍ය සේවයේ හෝ කිසියම් පළාත් රාජ්‍ය සේවයක ස්ථිර සේවයේ නියුක්ත තැනැත්තන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.)

ක්ෂේත්‍ර වැඩ පරීක්ෂක තනතුර සඳහා වයස අවුරුදු 18 ට නොඅඩු අවුරුදු 30 ට නොවැඩි විය යුතුය.

(v) ඉහත දක්වා ඇති එක් එක් තනතුරට අදාළව ඉදිරියෙන් දක්වා ඇති අවම සුදුසුකම් සපුරා තිබිය යුතුය.

(vi) බඳවා ගැනීමේ පටිපාටිය අනුව විධිමත් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට යොමු කරනු ලබන අතර, එහිදී ලබාගන්නා ඉහළම ලකුණු අනුව සුදුස්සන් තෝරා ගැනේ.

(vii) රියදුරු තනතුර සඳහා ඉල්ලුම්කරන අය ලිඛිත පරීක්ෂණයකට ඉදිරිපත් විය යුතු අතර, අවශ්‍ය සියලුම සුදුසුකම් සපුරා ඇති හා ඉහළම ලකුණු ලැබූ අපේක්ෂකයන්ගෙන් වෘත්තීය පරීක්ෂණයක ප්‍රතිඵල මත කුසලතා අනුපිළිවෙල අනුව බඳවා ගනු ලැබේ.

සීමිත බඳවා ගැනීමේ දී කායික මානසික යෝග්‍යතාවය සහ අධ්‍යාපන, වෘත්තීය හා පොදු සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා වන සම්මුඛ පරීක්ෂණයක් සමග ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් (අර්ධ ශිල්පීය හා ශිල්පීය නොවන තනතුරු සඳහා) මගින් ලබා ගන්නා ප්‍රතිඵල මත සුදුසුකම් ලබන්නන් මෝටර් රථ පරීක්ෂක විසින් පවත්වන ප්‍රායෝගික පරීක්ෂණයක දී සුදුසුකම් ලබා ගත යුතුය.

(viii) අයදුම්පත් කැඳවීමෙන් අනතුරුව හෝ අයදුම්පත් කැඳවන අතරතුර බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ මෙම නිවේදනය සංශෝධනය කිරීම හෝ අවලංගු කිරීමේ බලය ආගරපතන ප්‍රාදේශීය සභාවේ ලේකම් සතු වේ.

(ix) දැනටමත් ආගරපතන ප්‍රාදේශීය සභාවේ එම තනතුරුවල අනියම්, ආදේශක, දීමනා, කොන්ත්‍රාත් හෝ කුළී පදනම යටතේ සේවයේ නියුතු වූවන් කෙරෙහි වැඩි සැලකිල්ලක් දක්වනු ලබන අතර, ඔවුන් ආයතන ප්‍රධානියා මගින් තම අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.

(x) තෝරාගනු ලබන අයදුම්කරුවන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ නීතිවලට ද පළාත් පාලන දෙපාර්තමේන්තුවේ රෙගුලාසිවලට ද ආගරපතන ප්‍රාදේශීය සභාව දැනට පනවා ඇති හා පනවනු ලබන නීතිවලට හා එකී නීති රීති සියල්ලට යටත් විය යුතුය.

(xi) මූලික සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ.

03. *සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි :*

1. මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය.
2. වැන්දඹු හා අනත්දරු අරමුදලට දායකත්වය හිමිවේ.
3. බඳවා ගනු ලබන අය වසර 03 ක පරිවාස කාලයකට යටත්ය. එම කාලය තුළදී වැඩ පැමිණීම හා හැසිරීම සතුටුදායක වේ නම් පරිවාස කාලය අවසානයේ සේවය ස්ථිර කරනු ලැබේ.
4. රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය අනුව අවශ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබා දිය යුතුය.
5. බඳවා ගැනීමේ කොන්දේසිවලට අමතරව ආයතන සංග්‍රහයේ II පරිච්ඡේදයේ බඳවා ගැනීම සඳහා වන අනෙකුත් පොදු කොන්දේසිවලට යටත් විය යුතුය.
6. යහපත් චරිතයකින් යුක්ත විය යුතු අතර කවර බල ප්‍රදේශයක් තුළ කවර ප්‍රදේශයක් වුවද සේවය කිරීමට සුදුසු ශරීර සෞඛ්‍යයකින් යුක්ත තැනැත්තෙකු විය යුතුය.
7. දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරු වී දඬුවම් ලැබූවෙකු නොවිය යුතුය.
8. රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයෙන් පහ කරනු ලැබූවෙකු නොවිය යුතු අතර රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 44/90 යටතේ විශ්‍රාම ලැබූවෙකු නොවිය යුතුය. ආගරපතන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ කෙරෙන ස්ථාන මාරුවීම් වලට යටත් වේ.
9. සේවයේ අකාර්යක්ෂමතාවයක් හෝ අසතුටුදායක තත්වයක් පෙනී ගියහොත් සභාවේ මනාපය පරිදි සේවය අවසන් කිරීමේ බලය ප්‍රාදේශීය සභාව සතුය.

04. *ඉල්ලුම් කළ යුතු ආකාරය :*

මෙම නිවේදනය අවසානයේ දක්වා ඇති ආදර්ශ ආකෘතියට අනුව A4 ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්ත භාවිතා කරමින් අයදුම්පත් පිළියෙල කර ඉදිරිපත් කළ යුතුය. අයදුම්පත් බහා එවන ලිපි කවරයේ වම් පස ඉහළ කෙළවරේ ඉල්ලුම්කරන තනතුර සඳහන් කර 2018.12.28 වැනි දින හෝ එදිනට පෙර ලැබෙන සේ, ලේකම්, ආගරපතන ප්‍රාදේශීය සභාව, මෙරායා, ලිඳූල යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් පමණක් එවිය යුතුය. තැපෑලේදී නැති වන හෝ වැරදි ලෙස ලිපිනය ලිවීමෙන් ආපසු හරවා යැවෙන අයදුම්පත් සම්බන්ධයෙන් වග කියනු නොලබන අතර, නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

අයදුම්පත සමග පහත සඳහන් ලිපි ලේඛනවල සහතික කළ පිටපත් අමුණා එවිය යුතුය.

(i) උප්පැන්න සහතිකය
(ii) ජාතික හැඳුනුම්පත
(iii) අධ්‍යාපන සහතික
(iv) ග්‍රාම නිලධාරි විසින් නිකුත් කළ පදිංචි සහතිකය (ප්‍රාදේශීය ලේකම් අනු අත්සන් කර තිබිය යුතුය)
(v) වෘත්තීය සුදුසුකම් දක්වෙන සහතික
(vi) සේවා පළපුරුද්ද පිළිබඳ සහතික
(vii) මෑතක දී ලබාගත් චරිත සහතික 02 ක්

සී. ජෙයප්‍රකාශ්
ලේකම්,
ආගරපතන ප්‍රාදේශීය සභාව,
මෙරායා,
ලිඳූල.

2018 දෙසැම්බර් මස 07 වැනි දින,
ආගරපතන ප්‍රාදේශීය සභා කාර්යාලයේ දීය.

ආදර්ශ අයදුම් පත්‍රය

ආගරපතන ප්‍රාදේශීය සභාවේ ..... තනතුර සඳහා අයදුම්පත්‍රය.

01. සම්පූර්ණ නම :————————————

02. ලිපිනය :————————————

03. දුරකථන අංකය :————————————

04. උපන්දිනය :————————————

05. ජාතික හැඳුනුම්පත් අංකය :————————————

(ඡායා පිටපතක් ඇමිණිය යුතුය)

06. 2018 ..... දිනට වයස:————————————

07. පුරවැසිභාවය :————————————

08. විවාහක ද/ අවිවාහක ද යන වග :————————————

09. දැනට තනතුරක් දරන්නේ නම් එම විස්තර :

(i) තනතුරේ නම :————————————

(ii) එයට පත් වූ දිනය :————————————

(iii) පත්වීමේ ස්වභාවය (ස්ථිර/අනියම්/තාවකාලික) :————————————

(iv) මැතිවරණ කොට්ඨාසය :————————————

(v) පළපුරුද්ද හා සේවා කාලය :————————————

10. අධ්‍යාපන සුදුසුකම් :

(සමර්ථ වී ඇති උපරිම ශ්‍රේණිය සඳහන් සහතිකවල පිටපත් ඇමිණිය යුතුය)

අ.පොෂ. (සා.පෙළ) විභාගය සමත් වර්ෂය :———————— විභාග අංකය :————————

අනු. අංකය	*විෂයය*	*සාමාර්ථය*	*අනු. අංකය*	*විෂයය*	*සාමාර්ථය*

11. වෘත්තීය සුදුසුකම් :————————

12. වෙනත් සුදුසුකම් :————————

(තාක්ෂණික දැනුම පිළිබඳ සහතිකවල පිටපත් ඇමිණිය යුතුය)

13. ඔබ කවරදාක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේ ද? :————————

14. ඔබ දැනටමත් මෙම ප්‍රාදේශීය සභාවේ සේවයේ නියුක්තව සිටී ද? ඔව්/නැත :————————

ඔව් නම් දැනට දරන තනතුර හා එම තනතුරට පත් වූ දිනය :————————

ඉහත සඳහන් අංක 01 - 14 දක්වා කරුණු සත්‍ය හා නිවැරදි බවට සහතික කරන අතර යම් විටක දී මෙම තොරතුරු අසත්‍ය බව හෙළි වුවහොත් මා සේවයෙන් පහ කිරීමට යටත් වන බව තේරුම්ගෙන ඇති බවත්, ඉල්ලුම්පත්‍ර කැඳවීමේ කොන්දේසිවලට මම යටත් වන බවත් ප්‍රකාශ කරමි.

.....
අයදුම්කරුගේ අත්සන.

දිනය :————————

දැනට රාජ්‍ය සේවයේ නියුක්ත අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය

මෙම ඉල්ලුම්කරු වන ..... යන අය මෙම ආයතනයේ ..... වශයෙන් ..... දින සිට සේවය කරනු ලබයි. ඉල්ලා ඇති තනතුරට තෝරා ගතහොත් ඔහු/ඇය දැනට දරන තනතුරෙන් නිදහස් කළ හැක/නොහැක. ඔහු/ඇය කිසිම නීත්‍යානුකූල දඬුවමකට භාජනය වී නොමැති බව මින් සහතික කරන අතර අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි.

දිනය :————————

.....
ආයතන ප්‍රධානියාගේ අත්සන
නිල මුද්‍රාව.

නම :————————————

තනතුර :————————————

ආයතනය :————————————

වත්තල ප්‍රාදේශීය සභාව

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ වත්තල ප්‍රාදේශීය සභාවේ, පුරප්පාඩුව පවතින මෙම නිවේදනයේ සඳහන් තනතුරුවලට බඳවා ගැනීම සඳහා සුදුසුකම් සපුරා ඇති බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

අනු. අංකය	*තනතුරු නාමය*	*තනතුරු පුරප්පාඩු සංඛ්‍යාව*	*වැටුප් ක්‍රමය*	*අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්*
1	ආදාහනාගාර ක්‍රියාකරු	02	PL2-2016 (රා.ප.ව. 3/2016 උපලේඛන 2 අනුව) රු. 25,250 - 10x270 - 10x300 - 10x330 - 12x350 - රු. 38,450	*අධ්‍යාපන සුදුසුකම් :* 8 ශ්‍රේණිය සමත් වී තිබීම. *වෘත්තීය සුදුසුකම් :* අදාළ තනතුරට නියමිත පරිදි තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිගමනය කර ඇති පරිදි ජාතික වෘත්තීය කුසලතාවන්හි (N. V. Q.) අවම වශයෙන් 2වන මට්ටමේ නිපුණතාවයක් ලබාගෙන තිබීම හෝ අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ මාස 06කට නොඅඩු පළපුරුද්දක් ලබා තිබීම. (සහතික මගින් සනාථ කළ යුතු ය) *පළපුරුද්ද :* (විවෘත අයදුම්කරුවන් සඳහා අදාළ නොවේ) පළාත් පාලන ආයතනයක ප්‍රාථමික ශ්‍රේණියේ තනතුරක සේවය ස්ථිර කර ඇති සේවා කාලය වසර 05 සපුරා ඇති හා අදාළ කාර්යක්ෂමතා කඩඉම සමත් වසර 05ක සතුටුදායක සේවා කාලයක් සපුරා ඇති සේවකයෙකු විය යුතු ය.
2	විදුලි කාර්මික	01	PL2-2016 (රා.ප.ව. 3/2016 අනුව) රු. 25,250 - 10x270 - 10x300 - 10x330 - 12x350 - රු. 38,450	*අ.* අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයයන් 06 ක් සමත් වී තිබීම. (මින් විෂයයන් පහ(05)ක් එකවර සමත් විය යුතු ය) *වෘත්තීය සුදුසුකම් :* අදාළ තනතුරට නියමිත පරිදි තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබා ඇති පරිදි ජාතික වෘත්තීය කුසලතාවන්හි (N. V. Q.) අවම වශයෙන් 2 වන මට්ටමේ නිපුණතාවයක් ලබා ගෙන තිබීම හෝ අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ මාස 06කට නොඅඩු පළපුරුද්දක් ලබා තිබීම. (සහතික මගින් සනාථ කළ යුතු ය) *පළපුරුද්ද :* (විවෘත අයදුම්කරුවන් සඳහා අදාළ නොවේ) අදාළ පළාත් පාලන ආයතනයක ප්‍රාථමික ශ්‍රේණියේ තනතුරක සේවය ස්ථිර කර ඇති සේවා කාලය වසර 05 සපුරා ඇති හා අදාළ කාර්යක්ෂමතා කඩඉම සමත් වසර 05ක සතුටුදායක සේවා කාලයක් සපුරා ඇති සේවකයෙකු විය යුතු ය.

අනු. අංකය	*තනතුරු නාමය*	*තනතුරු පුරප්පාඩු සංඛ්‍යාව*	*වැටුප් ක්‍රමය*	*අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්*
3	වැඩ/ක්ෂේත්‍ර කම්කරු	04	PL1-2016 (රා.ප.ව. 3/2016 අනුව) රු. 24,250 - 10x250 - 10x270 - 10x300 - 12x330 - රු. 36,410	*අධ්‍යාපන සුදුසුකම් :* 8 වන ශ්‍රේණිය (9 වසර) සමත් වී තිබිය යුතු ය.
4	සෞඛ්‍ය කම්කරු	01	PL1-2016 (රා.ප.ව. 3/2016 අනුව) රු. 24,250 - 10x250 - 10x270 - 10x300 - 12x330 - රු. 36,410	*අධ්‍යාපන සුදුසුකම් :* 8 වන ශ්‍රේණිය (9 වසර) සමත් වී තිබිය යුතු ය.
5	රියැදුරු III	06	PL3-2016 (රා.ප.ව. 3/2016 අනුව) රු. 25,790 - 10x270 - 10x300 - 10x330 - 12x350 - රු. 38,990	*අධ්‍යාපන සුදුසුකම් :* අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා.පෙළ) විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් සිංහල/දෙමළ භාෂාව ඇතුළුව සම්මාන සාමාර්ථ දෙකක් (02ක්) සහිතව විෂයයන් හයක් (06ක්) සමත් වී තිබීම. (එක් වරකදී විෂයයන් පහක් (05ක්) අවම වශයෙන් සමත්ව තිබිය යුතු ය.) *වෘත්තීය සුදුසුකම් :* පුද්ගලික/කුලී රථ සහ තාර බර හොන්ඩර 24ට අඩු ස්ටේෂන් වැගන් රථ පැදවීම පිළිබඳව මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කළ මෝටර් රථ පැදවීමේ බලපත්‍රයක් ලබා තිබීම. (බඳවා ගන්නා දිනට වසර තුනකට (03කට) පෙර අවම වශයෙන් "ඒ" සහ "සී1" වාහන පන්තියේ බලපත්‍රයක් හෝ නව රියැදුරු බලපත්‍රය අනුව "බී" පන්තියේ බලපත්‍රයක් ලබා තිබිය යුතු ය.) සහ මහා මාර්ග නීති සංග්‍රහය පිළිබඳව මනා දැනුමක් තිබිය යුතු අතර අවම උස අඩි 5ක් විය යුතු ය. *පළපුරුද්ද :* බලපත්‍ර ලැබීමෙන් පසු රියැදුරෙකු ලෙස අවම වශයෙන් වසර 03ක පළපුරුද්දක් ලබා තිබීම (විධිමත් සහතිකයක් මගින් සනාථ කළ යුතු ය.)
6	ආයුර්වේද ඖෂධ සංයෝජක	01	PL2-2016 (රා.ප.ව. 3/2016 අනුව) රු. 25,250 - 10x270 - 10x300 - 10x330 - 12x350 - රු. 38,450	*අධ්‍යාපන සුදුසුකම් :* අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් (02ක්) සහිතව විෂයයන් හයක් (06ක්) සමත් වී තිබීම. (මින් විෂයයන් 05ක් එකවර සමත්වී තිබිය යුතු ය.) *පළපුරුද්ද :* රජයේ ආයුර්වේද බෙහෙත් ශාලාවක හෝ රජය පිළිගත් ලියාපදිංචි ආයුර්වේද බෙහෙත් ශාලාවක වසරකට නොඅඩු කාලයක ක්ෂේත්‍රයට අදාළ සේවා පළපුරුද්ද ලබා තිබීම. (සහතික මගින් සනාථ කළ යුතු ය.)

අනු. අංකය	*තනතුරු නාමය*	*තනතුරු පුරප්පාඩු සංඛ්‍යාව*	*වැටුප් ක්‍රමය*	*අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්*
7	පෙර පාසැල් ගුරු/පෙර පාසැල් පාලිකා	01	MN1-2016 (රා.ප.ච. 3/2016 අනුව) රු. 27,140-10x300 - 11x350 - 10x495 - 10x660 - රු. 45,540	*අධ්‍යාපන සුදුසුකම් :* සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව ගණිතය සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථ සහිතව එකවර විෂයයන් 06කින් අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම. සහ අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී අවම වශයෙන් එකක්වත් (01) (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත් ව තිබීම. *වෘත්තීය සුදුසුකම් :* පෙර පාසැල් ගුරුවරුන් පුහුණු කිරීමේ රජයේ ආයතනයක් මගින් හෝ රජය පිළිගත් (ලියාපදිංචි කරන ලද) පෙර පාසැල් ගුරු පුහුණු ආයතනයක් මගින් ළදරු අධ්‍යාපන හා ළමා සංවර්ධනය පිළිබඳ මාස 06කට නොඅඩු කාලයක් පාඨමාලාවක් හදාරා සහතිකයක් ලබා තිබීම.

බඳවා ගැනීමේ ක්‍රමය :

- ඉහත අංක 01-02-03-04-06-07 තනතුරු සඳහා මූලික අධ්‍යාපන සුදුසුකම්වලට අමතරව ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් පැවැත්වෙන අතර එම තනතුරු වලට අදාළ ප්‍රායෝගික දැනුම පළපුරුද්ද කාලීන සිදුවී පිළිබඳ අවබෝධය හා පෞරුෂය පිළිබඳ සලකා බලනු ලබන අතර එහි දී වැඩිම ලකුණු ලබාගත් අනුපිළිවෙලට අනුව බඳවා ගැනීම සිදු කරනු ලැබේ.

- ඉහත අංක 05 දරන තනතුර සඳහා මූලික අධ්‍යාපන සුදුසුකම් පරීක්ෂාවෙන් පසුව වාචික හා ප්‍රායෝගික වෘත්තිය පරීක්ෂණයක් පැවැත්වෙන අතර එහිදී රිය පැදවීමේ නිපුණතාවය මාර්ග නීති පිළිබඳ ප්‍රායෝගික දැණුම හා මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ මූලික දැනුම පිළිබඳ පරීක්ෂාවක් සිදු කරනු ලැබේ.

බඳවා ගැනීම සඳහා වෙනත් සුදුසුකම් :

- ❖ අයදුම්කරුවන් පරම්පරාවෙන් හෝ ලියාපදිංචියෙන් ශ්‍රී ලාංකික පුරවැසියන් විය යුතු ය.
- ❖ විශිෂ්ට චරිතයකින් හා මනා සෞඛ්‍යයකින් යුක්ත විය යුතුය.
- ❖ අයදුම්පත් භාරගන්නා අවසන් දිනට පූර්වාසන්නයේ අවම වශයෙන් වසර 03ක් අඛණ්ඩව බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචියක් ඇති අයෙකු විය යුතු ය.
- ❖ අයදුම්පත් භාරගන්නා අවසන් දිනට (2019.01.31 දිනට) වයස අවු. 18ට නොඅඩු 45ට නොවැඩි විය යුතු ය. (රාජ්‍ය සේවයේ හෝ යම් පළාත් රාජ්‍ය සේවයක දැනටමත් සේවයේ නියුතු ස්ථිර සේවකයින් සඳහා මෙම උපරිම වයස් සීමාව බලපානු නොලැබේ.)
- ❖ දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවෙකු නොකරනු ලැබූ හෝ රාජ්‍ය හෝ පළාත් පාලන සේවයෙන් පහ කරනු නොලැබුවෙකු හෝ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 44/90 යටතේ විශ්‍රාම නොලැබූ අයෙකු විය යුතුය.
- ❖ අවශ්‍ය වුවහොත් සභාව විසින් නියම කරනු ලබන ඇපයක් මුදලින් හෝ රක්ෂණ සහතිකයක් මගින් ඇප තැබීමට සුදුනම් විය යුතුය.

සේවයේ නියුක්ත කරවීමේ පොදු කොන්දේසි :

- ❖ මෙම තනතුර ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය.
  තෝරා ගනු ලබන්නන් අවුරුදු 03ක පරිවාස කාලයකට යටත් වේ.
- ❖ වැන්දඹු හා වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතුය.
- ❖ පරිවාස කාලය තුළදී පැමිණීම. වැඩ, හැසිරීම, සතුටුදායක වන්නේනම් පරිවාස කාලය අවසානයේ සේවයේ ස්ථිර කිරීම පිළිබඳව සලකා බලනු ලැබේ.
- ❖ මෙම බඳවා ගැනීමේ කොන්දේසි හා රෙගුලාසිවලට අනුකූලව ශ්‍රී ලංකා ජනරජයේ නියෝගවලටද බස්නාහිර පළාත් සභාව හෝ බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් වරින්වර නිකුත් කරනු ලබන රෙගුලාසි හා නියෝගවලට ද වත්තල ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන උපදෙස් පරිදි කටයුතු කිරීමට ද බැඳී සිටිය යුතු ය.
- ❖ දිවා හා රාත්‍රී කාලයේ සේවයේ යෙදවීම සඳහා ශාරීරික වශයෙන් සුදුසු තත්වයක සිටිය යුතු අතර මනා ඇස් පෙනීමක් සහිත විය යුතුය. (රජයේ වෛද්‍ය නිලධරයෙකු විසින් නිකුත් කරන ලද වෛද්‍ය සහතිකයකින් ඒ බව සනාථ කළ යුතුය.)

අයදුම්පත් සමග පහත සඳහන් සහතිකවල පිටපත් ඉදිරිපත් කළ යුතු ය.

- ❖ උප්පැන්න සහතිකය;
- ❖ අධ්‍යාපන සහතිකය;
- ❖ ජාතික හැඳුනුම්පත;
- ❖ ප්‍රාදේශීය ලේකම්ගේ අනු අත්සන සහිත ග්‍රාම නිලධාරි විසින් නිකුත් කළ පදිංචිය සනාථ කිරීමේ සහතිකය;
- ❖ මෑතක දී ලබාගත් චරිත සහතික 02ක්; (එක් සහතිකයක් ප්‍රදේශයේ ග්‍රාම නිලධාරීගෙන් ලබාගත් එකක් විය යුතුය.)
- ❖ වෙනත් සුදුසුකම් හා වෘත්තීය පළපුරුද්ද පිළිබඳ සහතික.

අයදුම්පත් එවිය යුතු ආකාරය :

- ❖ මෙම නිවේදනයේ දක්වෙන ආදර්ශ අයදුම්පත්‍රය අනුව අඟල් 12X8 ප්‍රමාණයේ තමා විසින් පිළියෙල කරගත් අයදුම්පත් 2019.01.31 දිනයට හෝ ඊට පෙර"ලේකම්, වත්තල ප්‍රාදේශීය සභාව, වෙළඳ සංකීර්ණය, කෙරවලපිටිය, හැඳල, වත්තල" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.
- ❖ අයදුම්පත බහාලන කවරයේ වම් පස ඉහළ කෙළවරේ අදාළ තනතුර සඳහන් කළ යුතුය.
- ❖ දැනටමත් රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් අයදුම්පත් තම ආයතන ප්‍රධානියාගේ නිර්දේශයෙන් එවිය යුතුය.
- ❖ අතින් ගෙනවිත් දෙන අයදුම්පත් භාර ගනු නොලබන අතර, ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

සැලකිය යුතුයි.-

මෙම අයදුම්පත් කැඳවීමෙන් පසුව හෝ කැඳවන අතරතුර කාලසීමාවේ මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම, වෙනස් කිරීම, මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීම වත්තල ප්‍රාදේශීය සභාවේ ලේකම් සතුය. එමෙන්ම ඉහත සඳහන් සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

කේ. එච්. එස්. අයිරාංගනී,
ලේකම්,
වත්තල ප්‍රාදේශීය සභාව.

2018 ක්වූ ඔක්තෝබර් මස 02 වැනි දින,
වත්තල ප්‍රාදේශීය සභාවේ දී ය.

ආදර්ශ අයදුම්පත

වත්තල ප්‍රාදේශීය සභාව

..... තනතුර සඳහා වූ අයදුම්පත්‍රය

1. *(අ)* මුලකුරු සමග නම :——————————————————.
   (ආ) මුලකුරුවලින් හැඳින්වෙන නම :——————————————————
2. පෞද්ගලික ලිපිනය :——————————————————
3. ජාතික හැඳුනුම්පත් අංකය :——————————————————
4. දුරකථන අංකය :——————————————————
5. උපන් දිනය (උප්පැන්න සහතිකය ඇමිණිය යුතුය) :——————————————————
6. අයදුම්පත් භාරගන්නා අවසන් දිනට 2019.01.31 දිනට වයස :
7. ස්ථිර පදිංචි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :——————————————————.
8. ස්ථිර පදිංචිය දරන පළාත් පාලන ආයතන බල ප්‍රදේශය :—————————————————— .
9. *(අ)* ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙක් ද?:—————————————————— .
   (ආ) එසේ නම් පරම්පරාවෙන් ද? ලියාපදිංචියෙන් ද? :—————————————————— .
10. ස්ත්‍රී/පුරුෂ භාවය :—————————————————— .
11. විවාහක/ අවිවාහක බව :_____ .
12. අධ්‍යාපන සුදුසුකම්/සමත් වී ඇති ඉහළම විභාගය :—————————— (ඡායා පිටපත් ඇමිණිය යුතුය.)
13. *(අ)* පළපුරුද්ද සහ වෘත්තිය සුදුසුකම්:——————————
    (ආ) වෙනත් සුදුසුකම්:—————————————————— .
14. *(අ)* ඔබට කුමන හෝ වරදකට අධිකරණයකින් දඬුවම් පනවා තිබේ ද? :——————
    (ආ) එසේ නම් දඬුමේ ස්වභාවය :—————————————————— .
15. ඔබ දැනට මෙම සභාවේ සේවය කරන්නේ නම් සේවා කාලය සේවා විස්තරය හා තනතුරේ ස්වභාවය :—————————————————— .

    (අනියම්, ස්ථිර නොවන ආදේශක, ගිවිසුම් පදනම් මත, ව්‍යාපෘති පදනම)

මෙම ඉල්ලුම් පත්‍රයේ මා විසින් සපයන ලද තොරතුරු සත්‍ය වූත් නිවැරදි වූත් ඒවා බව සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරු අසත්‍ය හෝ වැරදි බව අනාවරණය වුවහොත් මෙම තනතුරට මා තෝරා ගැනීමට නුසුදුස්සෙකු බවට පත්වන බවත්, තෝරා ගැනීමෙන් පසු දැනගතහොත් වන්දියක් නොගෙවා සේවයෙන් පහ කිරීමට යටත් වන බවත්, මම දනිමි.

——————————— .

අයදුම්කරුගේ අත්සන.

දිනය :——————.

දැනට රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය

මෙම ඉල්ලුම්කරු වන ..... මහතා/මහත්මිය දැනට මෙම දෙපාර්තමේන්තුවේ/ ආයතනයේ ..... දින සිට ..... දින දක්වා ..... වශයෙන් සේවය කරයි. ඔහු/ඇය සේවයෙන් මුදාහල හැක/ නොහැක. ඔහු/ඇය මොනයම් ආකාරයේ හෝ විනයානුකූල දඬුවමකට (අවවාද කිරීමක් හැර) භාජනය වී නොමැති බව මෙයින් සහතික කරන අතර, අයදුම්පත නිර්දේශ කර/ නොකර ඉදිරිපත් කරමි.

———————————.

ආයතනයේ ප්‍රධානියාගේ අත්සන.
(නිල මුද්‍රාව තබන්න)

දිනය :——————.

තංගල්ල ප්‍රාදේශීය සභාව

දකුණු පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩු පිරවීම

තංගල්ල ප්‍රාදේශීය සභාවේ දැනට පුරප්පාඩු වී ඇති පහත උපලේඛනයේ සඳහන් තනතුරුවලට බඳවා ගැනීම සඳහා නියමිත සුදුසුකම් සපුරා ඇති දකුණු පළාත තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් පමණක් අයදුම්පත් කඳවනු ලැබේ. (තංගල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචිකරුවන්ට සහ තංගල්ල ප්‍රාදේශීය සභාවේ දැනටමත් තාවකාලික, අනියම්, ආදේශක, කොන්ත්‍රාත් පදනම මත සේවයේ නියුක්ත වූ අය කෙරෙහි විශේෂ සැළකිල්ලක් දක්වනු ලැබේ.)

අනු. අංකය	*තනතුරු නාමය*	*තනතුරු සංඛ්‍යාව*	*වැටුප් කේතය/ වැටුප් ක්‍රමය*	*අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්*
01.	රියදුරු	02	PL3-03/2016	1. දෙවරකට නොවැඩි වාර ගණනකදී අධ්‍යාපන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයෙන් සිංහල/දෙමළ භාෂාව ඇතුළුව සම්මාන දෙකක් සහිතව විෂයයන් 06ක් සමත් විය යුතු ය. 2. මගී ආසන 26ට වැඩි බස් රථ පැදවීම සඳහා මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් විසින් නිකුත් කරන ලද බලපත්‍රයක් ලබා තිබිය යුතු ය. ('ඒ' පන්තියේ බලපත්‍රයක්) අවම වශයෙන් වාහන රියදුරෙකු ලෙස වසර 03ක පළපුරුද්දක් ලබා තිබිය යුතු ය.
02.	සෞඛ්‍ය කම්කරු	02	PL1-03/2016	අටවන ශ්‍රේණිය (නවවන වසර) සමත් විය යුතු ය.
03.	වැඩ/ක්ෂේත්‍ර කම්කරු	02	PL1-03/2016	අටවන ශ්‍රේණිය (නවවන වසර) සමත් විය යුතු ය.
04.	පුස්තකාල සහායක	01	PL1-03/2016	දෙවරකට නොවැඩි වාර ගණනකදී අධ්‍යාපන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයෙන් සම්මාන දෙකක් සහිතව විෂයයන් 06ක් සමත් විය යුතු ය.

03. *බඳවා ගැනීමේ පොදු කොන්දේසි :*

1. අයදුම්කරු ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතු ය.
2. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර 5කට වැඩි කාලයක් අයදුම්කරු දකුණු පළාත තුළ පදිංචිකරුවෙකු විය යුතු ය.
3. අයදුම්කරු මනා සෞඛ්‍ය තත්ත්වයෙන් සිටිය යුතු ය.
4. දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියක වරදකරුවකු කරනු ලැබූවකු හෝ රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයෙන් පහ කරනු ලැබූවෙකු නොවිය යුතු ය.
5. සේවා අවශ්‍යතාවය අනුව විධිමත් සම්මුඛ පරීක්ෂණයකින් බඳවා ගැනීම් සිදු කරනු ලැබේ.

04. *වයස් සීමාව* -

ඉල්ලුම්පත්‍ර භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ අවුරුදු 45ට නොවැඩි විය යුතු ය. දැනටමත් රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත අයදුම්කරුවන්ට වයස් සීමාව බල නොපැවැත් වේ.

05. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි* -

01. තනතුරු ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතයි. තනතුරට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට යටත් විය යුතු ය.

02. පත් වීම අවුරුදු 03ක පරිවාස කාලයකට යටත් වේ.

03. වාර්ෂික වැටුප් පරිමාණය :

රියදුරු : රු. 25,790 - 10x270 - 10x300 - 10x330 - 12x350 - රු. 38,990
සෞඛ්‍ය කම්කරු වැඩ/ක්ෂේත්‍ර කම්කරු පුස්තකාල සහායක රු. 24,250 - 10x250 - 10x270 - 10x300 - 12x330 - රු. 36,410.00

04. පළමු කාර්යක්ෂමතා කඩඉම, බඳවාගනු ලැබීමෙන් පසුව එළඹෙන පළමු වසර තුන ඉක්මවා යාමට පෙර සමත් විය යුතු ය.

- රියදුරු - මහා මාර්ග නීති සංග්‍රහය පිළිබඳ දැනුම මැනීම පරීක්ෂණයකින් සහ මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳව පවත්වනු ලබන පරීක්ෂණයකින් සමත් විය යුතු ය.
- සෞඛ්‍ය කම්කරු, වැඩ/ක්ෂේත්‍ර කම්කරු, පුස්තකාල සහායක - සාමාන්‍ය කාර්යාල ක්‍රම හා ආයතනික පරිපාලන ක්‍රමවේදයන් පිළිබඳව තම රාජකාරිවලට අදාළ දැනුම හා තනතුරට පැවරෙන කාර්යයන් පිළිබඳව දැනුම හා අත්පත් කර ගත යුතු ප්‍රවීණතාවයන් පිළිබඳ පරීක්ෂණයකින් සමත් විය යුතු ය.

05. එම තනතුරු සඳහා බඳවා ගැනීමේ පටිපාටිවල නියෝගවලට අමතරව, ආයතන සංග්‍රහයේ රෙගුලාසිවලට ද දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගවලට සහ දෙපාර්තමේන්තු නියෝගවලට අනුකූලව සේවය කිරීමට බැඳී සිටිය යුතු ය.

06. *අයදුම්කළ යුතු පිළිවෙල:*

1. මෙම නිවේදනයේ සඳහන් ආදර්ශ ආකෘති ප්‍රකාරව A4 ප්‍රමාණයේ කඩදාසිවල දෙපැත්තම ප්‍රයෝජනයට ගෙන පිළියෙල කරන ලද අයදුම්පත් සම්පූර්ණ කර "සභාපති, තංගල්ල ප්‍රාදේශීය සභාව, නෙටොල්පිටිය" යන ලිපිනයට 2018.12.28 දිනට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.
2. අයදුම්පත්‍ර බහා එවන කවරයේ වම් පස උඩ කෙළවරේ "..... තනතුර සඳහා අයදුම්පත" යනුවෙන් සඳහන් කර තිබිය යුතු ය.
3. දැනටමත් රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත් ආයතන ප්‍රධානියා මගින් එවිය යුතු යි.
4. නියමිත දිනට පසුව ලැබෙන ඉල්ලුම්පත් පිළිබඳව සළකා බලනු නොලැබේ.
5. අයදුම්පත් සමග පහත සඳහන් සහතිකවල සහතික කළ පිටපත් එවිය යුතු යි. සහතිකවල මුල් පිටපත් පරීක්ෂණ අවස්ථාවේ දී ඉදිරිපත් කළ යුතු ය.

(i) උප්පැන්න සහතිකය;
(ii) අධ්‍යාපන සහතිකය;
(iii) පදිංචිය සනාථ කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම් සහතික කරන ලද ග්‍රාම නිලධාරි සහතිකය;
(iv) මෑතකදී ලබා ගත් චරිත සහතික 02 ක්;
(v) වෘත්තීය සුදුසුකම් සහතිකය;
(vi) සේවා පළපුරුද්ද පිළිබඳ සහතිකය.

ලාලිත ආර්. වනිගසේකර,
සභාපති,
තංගල්ල ප්‍රාදේශීය සභාව.

2018 නොවැම්බර් මස 26 වැනි දින,
නෙටොල්පිටිය,
තංගල්ල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

ආදර්ශ අයදුම්පත්‍රය

නංගල්ල ප්‍රාදේශීය සභාව

..... *නතනුර සඳහා අයදුම්පත්‍රය*

01. අයදුම්කරුගේ සම්පූර්ණ නම :————————————————

02. මුලකුරු සමග නම :————————————————.

03. ස්ථිර ලිපිනය :————————————————.

04. උපන් දිනය : අවුරුද්ද:————————, මාසය :————————, දිනය:————————,

05. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස : අවුරුදු :————————, මාස :————————, දින:————————,

06. ස්ත්‍රී/පුරුෂ භාවය:———————————————— .

07. විවාහක/අවිවාහක බව :————————————————.

08. ජාතිය/ආගම :———————————————— .

09. ඔබ ශ්‍රී ලාංකික පුරවැසියෙක් ද? එසේ නම් පරම්පරාවෙන් ද? ලියාපදිංචි වීමෙන් ද යන වග : _____ .

10. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචි කාලය :———————————————— .

11. අධ්‍යාපන සුදුසුකම් (සහතික පිටපත් අමුණා එවන්න) :———————————————— .

12. වෙනත් සුදුසුකම් :———————————————— .

13. සේවා පළපුරුද්ද හා වෘත්තීය සුදුසුකම් :———————————————— .

14. ඔබ දැනටමත් මෙම ප්‍රාදේශීය සභාවේ සේවය කරන්නේ නම්, එම සේවා කාලය සහ විස්තර, එම පත්වීමේ ස්වභාවය (තාවකාලික/අනියම්/ආදේශක/කොන්ත්‍රාත්) :———————————————— .

15. ඔබ කවරදාක හෝ චෝදනාවක් ලබා උසාවියකින් වරදකරු වී තිබේද ? :———————————————— .

අනාවරණය වුවහොත්, නුසුදුස්සෙකු බවට පත්වන බවත්, පත්වීම ලැබීමෙන් පසු එවැනි කරුණක් ඔප්පු වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහකරනු ලැබීමට යටත්වන බවත් දන්වමි.

————————————;
අයදුම්කරුගේ අත්සන

දිනය :———————— .

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය
(දැනට සේවයේ නියුක්ත වූවන්ට පමණි)

අයදුම්කරු ඉහතින් දක්වා ඇති තොරතුරු නිවැරදි බවත්, තෝරාගනු ලැබුවහොත් සේවයෙන් මුදා හැරීමට එකඟ වන බවත්, ... වශයෙන් සේවය කරන බවත් සහතික කරමි.

දිනය:———————— . ————————————— ;
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.

පළාත් පාලන නිවේදන

පාතදුම්බර ප්‍රාදේශීය සභාව

මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත
(272 වැනි අධිකාරය)

මෙහි පහත සඳහන් අය විසින් උපලේඛනයේ සඳහන් කර ඇති ස්ථානයේ 2019 වර්ෂයට ගෝ ඝාතකාගාරයක් හා එළු ඝාතකාගාරයක් පවත්වාගෙන යාම සඳහා බලපත්‍ර ඉල්ලමින් අයදුම්පත්‍ර මා වෙත ඉදිරිපත් කර ඇති බවත් එම බලපත්‍ර නිකුත් කිරීම පිළිබඳව පාතදුම්බර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පදිංචි හෝ ජීවත්වන අයෙක් හෝ අයවළුන් විරුද්ධ වන්නේ නම් ඔහු හෝ ඇය එසේ විරුද්ධ වන්නේ කුමන හේතූන් පදනම් කරගෙන ද යන්න පිළිබඳව විස්තර ලිඛිතව පිටපත් දෙකකින් යුක්තව මෙම දැන්වීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* (ආ) කොටසේ පළ වූ දා සිට දින 14ක් ඇතුළත මා වෙත දන්වා එවිය යුතු බව, මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳව ආඥාපනතේ 272 වැනි අධිකාරය 7 (2) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

ටී. එම්. ඒ. කේ. බණ්ඩාර,
සභාපති,
පාතදුම්බර ප්‍රාදේශීය සභාව.

2018 නොවැම්බර් මස 26 වැනි දින,
පාතදුම්බර ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

උපලේඛනය

ඉල්ලුම්කරුගේ නම	*ස්වභාවය*	*ගෝ ඝාතකාගාරය හා එළු ඝාතකාගාරය පවත්වාගෙන යන ස්ථානය*
1. අයි. එම්. යෙහිසාන් මයා අංක 6/15, නුවර පාර, මඩවල කඩවීදිය.	ගෝ ඝාතකාගාරය	11/6, නුවර පාර, මඩවල.
2. අයි. එම්. යෙහිසාන් මයා අංක 6/15, නුවර පාර, මඩවල කඩවීදිය.	එළු ඝාතකාගාරය	15/6, නුවර පාර, මඩවල.

12-390/1

පාතදුම්බර ප්‍රාදේශීය සභාව

2019 වර්ෂය සඳහා ගවමස්, එළුමස් වෙළෙඳසැල් පවත්වාගෙන යාම
වෙනුවෙන් බලපත්‍ර නිකුත් කිරීම

මෙහි පහත උපලේඛනයේ සඳහන් අය විසින් ඒ ඒ ස්ථානයන්හි ගවමස්, එළුමස් වෙළෙඳාම් කරගෙන යාම සඳහා බලපත්‍ර ලබාගැනීමට ඉදිරිපත්ව සිටින බව සෞඛ්‍යාතක ආඥාපනතේ 272 වැනි අධිකාරය 7(2) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

මෙම බලපත්‍ර නිකුත් කිරීම පිළිබඳව පාතදුම්බර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පදිංචි යම් අයෙකු විරුද්ධ නම් ඔහු හෝ ඇය විරුද්ධ වන්නේ කුමක් නිසා ද යන වග සඳහන් ලියවිල්ලක් පිටපත් දෙකකින් යුක්තව මෙම දැන්වීම *ගැසට් පත්‍රයේ* පළවූ දින සිට දින 14ක් (දාහතරක්) ඇතුළත මා වෙත ඉදිරිපත් කළ යුතු බව මෙයින් දන්වමි.

මෙම කාලසීමාව තුළ මෙම නිවේදනය පිළිබඳ යම් විරුද්ධත්වයක් ඉදිරිපත් නොවුවහොත් මෙහි උපලේඛනයේ සඳහන් ඉල්ලුම්කරුවන් වෙත අදාළ ව්‍යාපාර ස්ථානවල වෙළෙඳාම කරගෙන යාම සඳහා 2019.01.01 සිට 2019.12.31 වැනි දින දක්වා බලපත්‍ර ලබාදීම කරන බව පොදු මහජනතාවගේ දැන ගැනීම සඳහා මෙයින් ප්‍රකාශයට පත්කරමි.

ටී. එම්. ඒ. කේ. බණ්ඩාර,
සභාපති,
පාතදුම්බර ප්‍රාදේශීය සභාව.

2018 නොවැම්බර් මස 26 වැනි දින,
පාතදුම්බර ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

උපලේඛනය

ඉල්ලුම්කරුගේ නම	*වෙළෙඳාම් කරන ස්ථානය*	*වෙළඳාමේ ස්වභාවය*
1. කේ. එම්. තයියුබ් මයා	40/ඒ, උෑරාදෙණිය, ගුන්නෑපාන	ගවමස්
2. එස්. එම්. රාසික් මයා	342, දොරගමුව පාර, උඩතලවින්න	ගවමස්
3. එස්. එම්. ඉල්ලියාස් මයා	357, දොරගමුව පාර, උඩතලවින්න	ගවමස්
4. ඒ. ඒ. එම්. මසාහිම් මයා	7/බී/1, පොල්ගොල්ල	ගවමස්
5. එම්. එම්. රිෆාන් මයා	437, දොරගමුව පාර, ගලදෙනිය හන්දිය	ගවමස්
6. අයි. එම්. යෙහිසාන් මයා	13/සී, කටුගස්තොට පාර, මඩවල	එළුමස්

12-390/2

මොරටුව මහා නගර සභාව

2019 වර්ෂයට අදාළව වරිපනම් බදු පැනවීම

(252 අධිකාරය) මහා නගර සභා අඥාපනතේ 238(1) වැනි වගන්තිය යටතේ මොරටුව මහා නගර සභා බල ප්‍රදේශය ඇතුළත පිහිටියා වූ නිවාසවල, ගොඩනැගිලිවල, ඉඩම්වල, ගෙපත්වල වාර්ෂික වටිනාකම සඳහා 2018 වර්ෂය සඳහා වූ තක්සේරුව, 2019 වර්ෂය සඳහා තක්සේරුව ලෙස සම්මත කළ යුතු බවටත් එකී තක්සේරුව මත මහා නගර සභා අඥාපනතේ 230 (1) වගන්තියෙහි ඇති විධිවිධාන ප්‍රකාරව එකී දේපළ මත ඉහත කී තක්සේරුව සඳහා වාර්ෂික වටිනාකමින් පහත දැක්වෙන පරිදි වරිපනම් බද්දක් නියම විය යුතු බවටත්,

1. නේවාසික ස්ථාන සඳහා එම දේපළවල වාර්ෂික වටිනාකමෙන් - 7%
2. රාජ්‍ය දේපළ හා වෙළඳ, කර්මාන්ත හෝ වාණිජ කාර්යය සඳහා භාවිතා කරනු ලබන ස්ථාන මත එම දේපළවල වාර්ෂික වටිනාකමෙන් - 16%
3. හිස් ඉඩම් සහ තනාගෙන යන ගොඩනැගිලි සඳහා වරිපනම් බදු වශයෙන් කාර්තුවකට රු. 50.00 බැගින් වන මුදලක් අය කිරීමටත්

තවද, 2019 වර්ෂයෙහි පහත උපලේඛනයෙහි සඳහන් එක් එක් කාර්තුව වෙනුවෙන් ඉදිරියෙන් නිරූපිත දිනයට පෙර එසේ නියම කරන ලද වාර්ෂික වරිපනම් බද්ද මොරටුව මහා නගර සභා අරමුදලට ගෙවිය යුතු බවටත්, එලෙස වාර්ෂික වරිපනම් බද්ද 2019 වර්ෂයෙහි ජනවාරි මස 31 වැනි දිනට හෝ ඊට ප්‍රථම ගෙවන්නේ නම් වාර්ෂික වරිපනම් බද්දේ ප්‍රමාණයෙන් සියයට දහය (10%)ක වට්ටමක් ද, එකී උපලේඛනයෙහි එක් එක් කාර්තුව ඉදිරියේ තුන්වන තීරුවේ නිරූපිත දිනයට පෙර අදාළ වරිපනම් බදු මුදල මොරටුව මහා නගර සභා අරමුදලට ගෙවනු ලබන්නේ නම් එක කාර්තුවක අදාළ මුදලින් 5%ක වට්ටමක් ද මොරටුව මහා නගර සභාව ලබා දිය යුතු බවත්, එකී බදු මුදල් ගෙවීම පැහැර හැරීම මත වරෙන්තුවක් නිකුත් කරනු ලැබිය හැකි අතර එසේ නිකුත් කරනු ලබන වරෙන්තුව මත නේවාසික ස්ථානයන් සම්බන්ධයෙන් වූ විට 15%ක් හා රජයේ දේපළ හා වාණිජ ස්ථාන සම්බන්ධයෙන් 20%ක වරෙන්තු ගාස්තුවක් මොරටුව මහා නගර සභාවට ගෙවිය යුතු බවත්, 2018.09.14 දිනැති මුදල් කටයුතු පිළිබඳ ස්ථාවර කාරක සභාවේ අංක 12 නිර්දේශය පරිදි 2018.10.04 දිනැති මාසික මහා සභාවේ අංක 6(9) 12 යටතේ අනුමත කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඩබ්. සමන්ලාල් ප්‍රනාන්දු,
නගරාධිපති.

2018 නොවැම්බර් මස 14 වැනි දින,
මොරටුව මහා නගර සභා කාර්යාලයේ දී ය.

උපලේඛනය

කාර්තුව	*ගෙවිය යුතු දිනය*	*5% වට්ටම් සඳහා හිමිකම් ලබන අවසාන දිනය*
පළමුවන කාර්තුව	2019 ජනවාරි 01 සිට 31 දක්වා	2019 ජනවාරි 31
දෙවන කාර්තුව	2019 අප්‍රේල් 01 සිට 30 දක්වා	2019 අප්‍රේල් 30
තුන්වන කාර්තුව	2019 ජූලි 01 සිට 31 දක්වා	2019 ජූලි 31
හතරවන කාර්තුව	2019 ඔක්තෝබර් 01 සිට 31 දක්වා	2019 ඔක්තෝබර් 31

12-358

ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභාව

2018 අංක 01 දරන පරිපුරක අයවැය ලේඛණය

මහ නගර සභා ආඥාපනතේ
(252 වැනි අධිකාරය)
214 (2) (ආ) ඡේදය යටතේ කෙරෙන දැන්වීමයි.

ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභාවේ 2018 වර්ෂයේ අංක. 01 දරන පරිපුරක අයවැය ලේඛණය මහජන ප්‍රදර්ශනය සඳහා කාර්යාල වේලාවන් තුල 2018 දෙසැම්බර් මස 14 දින සිට මහ නගර සභා කාර්යාලයේ තබා ඇති බව මෙයින් දැනුම් දෙමි.

නීතිඥ ඕ.වී. මධුර විතානගේ,
නගරාධිපති.
ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ
මහ නගර සභාව.

2018 දෙසැම්බර් මස 14 වැනි දින
ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ
මහ නගර සභාව
රාජගිරිය.

12-520

පදවිය ප්‍රාදේශීය සභාව

උතුරු මැද පළාත - අනුරාධපුර

සම්මත අතුරු ව්‍යවස්ථා පිළිගැනීමේ යෝජනාව

1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ දෙවන වගන්තියේ (1) වන වගන්තියේ (අ) ඡේදය සමග කියවිය යුතු, 261 වන අධිකාරය වූ 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ දෙවන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ පැවරී ඇති බලතල ප්‍රකාර උතුරු මැද පළාතේ, පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2016 මාර්තු මස 30 වැනි දිනැති අංක 1960/35 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ iv (ආ) වන කොටසේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* නිවේදනයෙන් ප්‍රකාශයට පත්කරන ලද්දා වූ අංක 1 සිට 10 දක්වා වන පහත උපලේඛනයේ සඳහන් උතුරුමැද පළාතේ ප්‍රාදේශීය සභා සම්මත අතුරු ව්‍යවස්ථා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත් වූ දින සිට පිළිගෙන ක්‍රියාත්මක කිරීමටත්, ඒ දිනය වන විටත් ක්‍රියාත්මකව පැවති 1988 අගෝස්තු මස 23 වැනි දිනැති අංක 520/7 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* iv (ආ) වන කොටස මගින් ප්‍රකාශයට පත් කරන ලද ප්‍රාදේශීය සභා සම්මත අතුරු ව්‍යවස්ථාවල ඉහත කී උතුරුමැද පළාතේ ප්‍රාදේශීය සභා සම්මත අතුරු ව්‍යවස්ථාවලට සමාන සම්මත අතුරු ව්‍යවස්ථා මෙදින දක්වා කරන ලද කාර්යයන්ට බලපෑමක් නොවන සේ මෙදින සිට ක්‍රියාත්මක වීම නතර විය යුතු බවත්, ඉහත කී පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ සහ 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 හා 126 වන වගන්තිවලින් පදවිය ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල ප්‍රකාරව මෙයින් නිවේදනය කරමි.

බී. බී. එම්. මහින්ද නිශ්ශංක,
සභාපති,
ප්‍රාදේශීය සභාව, පදවිය.

2018 ක් වූ නොවැම්බර් මස 13 වැනි දින,
පදවිය ප්‍රාදේශීය සභාව.

උපලේඛනය

1. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ බත් කඩ, ආපන ශාලා, තේ හෝ කෝපි කඩ පවත්වාගෙන යාම විධිමත් කිරීම, අධික්ෂණය කිරීම හා පාලනය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව.
2. ප්‍රාදේශීය සභාබල ප්‍රදේශය තුළ හෝටල් පවත්වාගෙන යාම විධිමත් කිරීම, අධික්ෂණය කිරීම හා පාලනය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව.
3. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පොදු ක්‍රීඩා භූමි විධිමත් කිරීම, අධික්ෂන කිරීම හා පාලනය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා.

4. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ නවාතැන් පොළවල් පවත්වාගෙන යාම විධිමත් කිරීම, අධීක්ෂණය කිරීම හා පාලනය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා.
5. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ බේකරි පිළිබඳ අතුරු ව්‍යවස්ථා.
6. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ප්‍රචාරක දැන්වීම් පිළිබඳ අතුරු ව්‍යවස්ථා.
7. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ වාහන නතර කිරීම හා වාහන හැසිරවීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා.
8. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ මාළු විකිණීම විධිමත් කිරීම, අධීක්ෂණය කිරීම හා පාලනය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා.
9. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ මස් විකිණීම විධිමත් කිරීම, අධීක්ෂණය කිරීම හා පාලනය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා.
10. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ සංචාරක වෙළෙඳුන් විසින් ආහාර පාන ද්‍රව්‍ය වෙළෙඳාම් කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා.

12-326

නගර සභා සණ අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ අතුරු ව්‍යවස්ථාව වැළඳගැනීම

1989 අංක 12 දරන පළාත් සභා (අනුශාංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදය සමග කියවිය යුතු 261 වන අධිකාරය වන 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ (2) වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ වයඹ පළාතේ, පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, වයඹ පළාතේ පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා විසින් සම්පාදනය කරනු ලැබූ 2015.09.25 වැනි දින අංක 1933/40 දරන ශ්‍රී ලංකා ප්‍රාජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ (අති විශේෂ) *ගැසට් පත්‍රයේ* iv (අ) වැනි කොටසේ පළකරනු ලැබූවා වූ නගර සභා සණ අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ අතුරු ව්‍යවස්ථාව, 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන අතුරු ව්‍යවස්ථා පනතේ 3 වැනි වගන්තියෙහි සඳහන් විධිවිධාන අනුව හලාවත නගර සභා බල ප්‍රදේශය සඳහා ක්‍රියාත්මක විය යුතු බවට 255 වන අධිකාරය වන නගර සභා ආඥාපනතේ 153 හා 157 වගන්ති තුළින් ලැබී ඇති බලතල ප්‍රකාරව පහත සම්මත අතුරු ව්‍යවස්ථාව වැළඳගෙන ක්‍රියාත්මක කිරීම සුදුසු බවට 2018 වර්ෂයේ ඔක්තෝබර් මස 11 වැනි දින පවත්වන ලද හලාවත නගර සභාවේ මහා සභා රැස්වීමේදී තීරණ අංක 5/I/1 යටතේ සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

ඩබ්. එම්. ඒ. තුෂාන් චතුරංග,
සභාපති,
හලාවත නගර සභාව,
හලාවත.

2018 ඔක්තෝබර් මස 11 වැනි දින,
හලාවත නගර සභාවේ දී ය.

12-230/8

කුරුණෑගල ප්‍රාදේශීය සභාව

ගෝඝාතක බලපත්‍ර ලබාදීම සම්බන්ධ විරෝධතා කැඳවීම
ගෝඝාතක ආඥා පනත (272 වැනි අධිකාරිය)

කුරුණෑගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පවත්වාගෙන යනු ලබන මෙහි පහත උපලේඛනයේ සඳහන් ගෝඝාතකාගාරය පවත්වාගෙන යාමට සහ අනෙකුත් ස්ථානයන්හි මස් විකිණීම සඳහා 2019 වර්ෂයට බලපත්‍ර ඉල්ලුම්කර තිබෙන බැවින් ගෝඝාතක ආඥාපනතේ 7(2) වැනි උපවගන්තිය ප්‍රකාරව විරෝධතා කැඳවීමට 2018 වර්ෂයෙහි නොවැම්බර් මස 15 වැනි දින පවත්වන ලද කුරුණෑගල ප්‍රාදේශීය සභා මහා සභා රැස්වීමේ දී තීරණ අංක 07 යටතේ පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

මෙම ස්ථාන සඳහා බලපත්‍රයක් නිකුත් කිරීම පිළිබඳ කුරුණෑගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පදිංචි යම් අයෙක් විරුද්ධ වන්නේ නම් එකී විරුද්ධ වීමට හේතු සඳහන් කර ලිඛිතව පිටපත් දෙකකින් යුක්තව මෙම නිවේදනය ගැසට් පත්‍රයේ පළ වූ දින සිට දින 14ක් ඇතුළත ඒ බව ලේඛනගත තැපෑලෙන් මා වෙත එවන මෙන් දන්වා සිටිනු ලැබේ.

ආර්. පී. අචල නිමන්ත වික්‍රමතිලක,
සභාපති,
කුරුණෑගල ප්‍රාදේශීය සභාව.

2018 නොවැම්බර් මස 15 වැනි දින,
කුරුණෑගල ප්‍රාදේශීය සභාවේ දී ය.

තීරණය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය සමග කියවිය යුතු ගෝඝාතක ආඥා පනතේ (272) අධිකාරියේ 7 වැනි වගන්තියේ (2) වැනි උප වගන්තිය ප්‍රකාරව ගෝඝාතක බලපත්‍රයක් අයදුම්කර ඇති පහත උපලේඛනයේ සඳහන් ස්ථාන සඳහා එකී බලපත්‍රය නිකුත් කිරීම සම්බන්ධයෙන් බල ප්‍රදේශය තුළ පදිංචිකරුවන්ගෙන් අයෙක් විරුද්ධ වන්නේ නම් ඒ සඳහා දින 14ක කාලයක් තුළ විරෝධතා ඉදිරිපත් කිරීමට අවස්ථාව සලසා දීමට මා විසින් තීරණය කරමි.

උපලේඛනය

01. මල්ලවපිටිය දළුපොතයාය ගෝඝාතකාගාරය
02. මල්ලවපිටිය එළ හරක් මස් කඩය අංක 01
03. මල්ලවපිටිය එළ හරක් මස් කඩය අංක 04
04. මල්ලවපිටිය එළ හරක් මස් කඩය අංක 05
05. වැල්ලව සතිපොල අසල එළ හරක් මස් කඩය
06. වැල්ලව සතිපොළ උෟරු මස් කඩය
07. මාස්පොත සතිපොල උෟරු මස් කඩය (අංක 01)
08. මාස්පොත සතිපොල උෟරු මස් කඩය (අංක 02)
09. මල්කඩුවාව එළ හරක් මස් කඩය
10. මල්පිටිය එළ හරක් මස් කඩය
11. හදිරවලාන එළ හරක් මස් කඩය
12. යන්තම්පලාව එළ හරක් මස් කඩය
13. යන්තම්පලාව එළු/කුකුළු මස් කඩය
14. අළකොලදෙණිය එළ හරක් මස් කඩය
15. කුදුම්බුව උෟරු මස් කඩය
16. මල්පිටිය උෟරු මස් කඩය
17. මහගම උෟරු මස් කඩය
18. තිත්තවැල්ල උෟරු මස් කඩය
19. තෙලියාගොන්න එළ හරක් මස් කඩය - 01
20. තෙලියාගොන්න එළ හරක් මස් කඩය - 02

12-152

ඇලහැර ප්‍රාදේශීය සභාව

1952 අංක 06 දරන පළාත් පාලන ආයතන සම්මත අතුරු ව්‍යවස්ථා පනත

		රු. ශත	*රු. ශත*	*රු. ශත*
01.	ඇඳුම්, මදුරුදැල්, බෑග්, පාපිසි හෝ තිර රෙදි මැසීම	500 0	750 0	1,000 0
02.	ධීවර ආම්පන්න නිෂ්පාදනය	500 0	750 0	1,000 0
03.	පානීය ජල බෝතල් නිෂ්පාදනය	500 0	750 0	1,000 0
04.	මැටි බඳුන් නිපදවීම	500 0	750 0	1,000 0
05.	නිවාස වයරින් කිරීම හා ජලනල සවිකිරීම	500 0	750 0	1,000 0
06.	කජු සැකසීම	500 0	750 0	1,000 0
07.	පොල් පරාල පැලීම	500 0	750 0	1,000 0
08.	කොප්පරා නිෂ්පාදනය	500 0	750 0	1,000 0
09.	වීදුරු කැපීම	500 0	750 0	1,000 0
10.	ඔරලෝසු අළුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
11.	දුරකථන අළුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
12.	විදුලි උපකරණ අළුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
13.	ආමේචර් එතීම	500 0	750 0	1,000 0
14.	අත්කම් භාණ්ඩ නිපදවීම	500 0	750 0	1,000 0
15.	බිම්මල් නිෂ්පදනය	500 0	750 0	1,000 0

ආරච්චිකට්ටුව ප්‍රාදේශීය සභාව

2019 වර්ෂය සඳහා ව්‍යාපාර බද්ද පැනවීම

ආරච්චිකට්ටුව ප්‍රාදේශීය සභාව විසින් 2018 ඔක්තෝබර් මස 09 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ දී තීරණ අංක 05:01 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2019 වර්ෂය සඳහා පනවන ලද ව්‍යාපාර බද්ද, එම වර්ෂයේ මාර්තු 31 දිනට පෙර ආරච්චිකට්ටුව ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවත් වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

කේ. තෙච්චනාමූර්ති,
සභාපති,
ආරච්චිකට්ටුව ප්‍රාදේශීය සභාව.

2018 නොවැම්බර් මස 29 වැනි දින,
ආරච්චිකට්ටුව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වන වගන්තියේ (1) වන උපවගන්තියෙන් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර, එකී පනතේ හෝ ඒ යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබා ගැනීම හෝ එම පනතේ 150 වන වගන්තිය යටතේ යම් බද්දක් ගෙවීම අවශ්‍ය නොවන්නාවූ යම් ව්‍යාපාරයක් ආරච්චිකට්ටුව ප්‍රාදේශීය සභා ප්‍රදේශය ඇතුළත 2019 වර්ෂයේ දී පවත්වාගෙන යන සෑම තැනැත්තෙක්ගෙන්ම එම ව්‍යාපාරයේ 2018 වර්ෂයේ ආදායම මෙහි පහත උපලේඛනයෙහි I වැනි තීරුවේ නිරූපිත යම් විෂයාංක සීමාවන් ඇතුළත පවතින අවස්ථාවක එකී II වැනි තීරුවේ අනුරූප සටහනේ නිරූපිත අනුප්‍රමාණයක ව්‍යාපාර බද්දක් 2019 වර්ෂය සඳහා පනවා අයකළ යුතු බවටත්, එකී ව්‍යාපාර බද්දට යටත් තැනැත්තෙකු 2019 වර්ෂයේ මාර්තු 31 දිනට පෙර එම බද්ද ආරච්චිකට්ටුව ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවටත් ආරච්චිකට්ටුව ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

උපලේඛනය

I තීරුව	*II* තීරුව
2018 වර්ෂයේදී ව්‍යාපාරයේ ආදායම	රු. ශත
රු. 6,000 නොඉක්මවන අවස්ථාවක	කිසිවක් නොමැත
රු. 6,000 ඉක්මවන එහෙත් රු. 12,000 නොඉක්මවන අවස්ථාවක	90.00
රු. 12,000 ඉක්මවන නමුත් රු. 18,750 නොඉක්මවන විට	180.00
රු. 18,750 ඉක්මවන නමුත් රු. 75,000 නොඉක්මවන විට	360.00
රු. 75,000 ඉක්මවන නමුත් රු. 1,50,000 නොඉක්මවන විට	1,200.00
රු. 1,50,000 ඉක්මවන විට	3,000.00

12 - 342/5

ආරච්චිකට්ටුව ප්‍රාදේශීය සභාව

2019 වර්ෂය සඳහා වාහන හා සතුන් පිළිබඳව බදු පැනවීම

ආරච්චිකට්ටුව ප්‍රාදේශීය සභාව විසින් 2018 ඔක්තෝබර් මස 09 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේදී තීරණ අංක 05:01 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඒ අනුව ආරච්චිකට්ටුව ප්‍රාදේශීය සභා ප්‍රදේශය තුළ මෙම බද්දට යටත් වන කිසියම් වාහනයක් හෝ සතෙකු තමා සන්තකයේ තබා ගන්නා සෑම තැනැත්තෙකුම විසින් එකී වාහනය හෝ සතා තමන් භාරයේ තබා ගන්නා දින ගණන දින තිහක් (30) සම්පූර්ණ වූ වහාම 2019 වර්ෂ සඳහා වන මෙම බද්ද ආරච්චිකට්ටුව ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවත්' වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ

කේ. තෙච්චනාමූර්ති,
සභාපති,
ආරච්චිකට්ටුව ප්‍රාදේශීය සභාව.

2018 නොවැම්බර් මස 29 වැනි දින,
ආරච්චිකට්ටුව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වන වගන්තිය සමඟ කියවිය යුතු එම පනතේ 148 වන වගන්තියේ (4) වන උපවගන්තියෙන් ප්‍රාදේශීය සභා වලට ලැබී ඇති බලතල ප්‍රකාර, ආරච්චිකට්ටුව ප්‍රාදේශීය සභා ප්‍රදේශය තුළ 2019 වර්ෂයේ දී පහත උපලේඛනයෙහි I වැනි තීරුවේ සඳහන් කිසියම් වාහනයක් හෝ සතෙකු තමා සන්තකයේ තබාගන්නා සෑම තැනැත්තෙකු මතම II වැනි තීරුවේ අනුරූප සටහනේ නිරූපිත ප්‍රමාණයක බද්දක් 2019 වර්ෂය සඳහා පනවා අය කිරීමට ආරච්චිකට්ටුව ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

උපලේඛනය I

	I වැනි තීරුව	*II වැනි තීරුව* *රු. ශත*
01.	(i) මෝටර් රථයක්, මෝටර් ට්‍රයිකාරයක්, මෝටර් ලොරියක්, මෝටර් බයිසිකලයක් කරත්තයක්, ජින් රික්ෂෝවක්, බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් නොවන සෑම වාහනයක් සඳහාම	25 0
	(ii) සෑම බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් හෝ බයිසිකල් කාරයක් හෝ බයිසිකල් කරත්තයක් සඳහා :	
	(අ) වෙළෙඳ කාර්යයන් සඳහා යොදවන්නේ නම්	18 0
	(ආ) වෙළෙඳ නොවන කාර්යයන් සඳහා යොදවන්නේ නම්	4 0
	(iii) සෑම කරත්තයක් සඳහා	20 0
	(iv) සෑම අත් කරත්තයක් සඳහා	10 0
	(v) සෑම රික්ෂෝවක් සඳහා	7 50
	(vi) සෑම අශ්වයෙකු, පෝනියෙකු හෝ කොටළුවෙකු සඳහා	15 0
	(vii) සෑම අලියෙකු සඳහා	50 0

02. විෂ්කම්භය අඟල් 26 නොඉක්මවන රෝද සහිත ළමා වාහන, වීල්බැරෝ, හුදෙක් පෞද්ගලික ස්ථානවල පමණක් වෙළෙඳ කාර්ය සඳහා යොදවන අත්කරත්ත සහ වෙළෙඳ කාර්ය සඳහා නොයොදවන අත්කරත්ත ඉහත ගෙවීමෙන් නිදහස් කෙරේ.

12 - 342/6

ආරච්චිකට්ටුව ප්‍රාදේශීය සභාව

2019 වර්ෂය සඳහා ප්‍රචාරක දැන්වීම් පුවරු සඳහා ගාස්තු අයකිරීම

ආරච්චිකට්ටුව ප්‍රාදේශීය සභාව විසින් 2018 ඔක්තෝබර් මස 09 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේදී තීරණ අංක 05:01 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

කේ. තෙච්චනාමූර්ති,
සභාපති,
ආරච්චිකට්ටුව ප්‍රාදේශීය සභාව.

2018 නොවැම්බර් මස 29 වැනි දින,
ආරච්චිකට්ටුව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122(1) වන වගන්තිය අනුව පැවරී ඇති බලතල ප්‍රකාරව 1988.08.23 වැනි දින අංක 520/7 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළාත් පාලන, නිවාස හා ඉදිකිරීම් කටයුතු ගරු අමාත්‍යතුමා විසින් අනුමත කර ප්‍රකාශයට පත්කර ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවේ 39 වැනි කොටසේ ප්‍රචාරක දැන්වීම්/දෘශ්‍ය පරිසරය පිළිබඳ අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාර ආරච්චිකට්ටුව ප්‍රාදේශීය සභා සීමාව තුළ යම් වීදියකට, පාරකට, ඇලකට, මාවතකට හෝ අහසට පෙනෙන පරිදි දැන්වීම් ප්‍රදර්ශනය කිරීමට සැලැස්වීම වෙනුවෙන් පහත උපලේඛනයේ සඳහන් බලපත්‍ර ගාස්තු 2019 වර්ෂය සඳහා පනවා අය කිරීමට ආරච්චිකට්ටුව ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

උපලේඛනය

විස්තරය	*වර්ග අඩියකට අයකරනු ලබන බලපත්‍ර ගාස්තුව රු. ශත*
01. බිත්තියක හෝ පුවරුවක ප්‍රදර්ශනය කරනු ලබන දැන්වීමකට ලිත් වර්ෂයකට	50 0
02. බිත්තියක හෝ පුවරුවක හෝ ලෑල්ලක ආධාරකයක් මගින් ප්‍රදර්ශනය කරන ප්‍රතිදීප්ත ප්‍රචාරක දැන්වීම් සඳහා ලිත් වර්ෂයකට	75 0
03. මාස 03 කට වැඩි කාලයක් හා වර්ෂයකට අඩු කාලයක් තුළ ප්‍රදර්ශනය කරනු ලබන තාවකාලික බැනර් සඳහා	15 0
04. මාස 06 කට වැඩි කාලයක් ප්‍රදර්ශනය කරනු ලබන තාවකාලික බැනර් සඳහා	25 0

12 - 342/7

ආරච්චිකට්ටුව ප්‍රාදේශීය සභාව

2019 වර්ෂය සඳහා සේවා ගාස්තු අයකිරීම

ආරච්චිකට්ටුව ප්‍රාදේශීය සභාව විසින් 2018 ඔක්තෝබර් මස 09 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ දී තීරණ අංක 05:01 යටතේ පහත දක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

කේ. තෙච්චනාමූර්ති,
සභාපති,
ආරච්චිකට්ටුව ප්‍රාදේශීය සභාව.

2018 නොවැම්බර් මස 29 වැනි දින,
ආරච්චිකට්ටුව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

2019 වර්ෂය සඳහා සේවා ගාස්තු නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බව ආරච්චිකට්ටුව ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

		රු. ශත
01.	වීථි රේඛා හා නොපවරා ගැනීමේ සහතික නිකුත් කිරීම	600 0
	තැන්පත් මුදල	100 0
02.	ගොඩනැගිලි අයදුම්පත්	100 0
03.	ඉඩම් පිඹුරුපත අනුමත කිරීම	1,000 0
04.	වරිපනම් ලේඛනයේ නම වෙනස් කිරීම	50 0

					රු. ශත
05.	අනුකූලතා සහතික නිකුත් කිරීම				1,000 0
06.	ගොඩනැගිලි ඉදි කිරීම සඳහා පෙරසැරි ගාස්තු				
	නේවාසික (වර්ග අඩියකට)				1 0
	ව්‍යාපාරික (වර්ග අඩියකට)				2 0
07.	මෝටර් ග්‍රේඩරය කුලියට දීම (මීටර් පැය 01ට)				3,700 0
08.	ජල බවුසරය සඳහා				1,000 0
	ප්‍රවාහන ගාස්තුව (කි. මී. 01 ට)				50 0
09.	ගලි බවුසරය සඳහා				
		ගෘහස්ථ	ව්‍යාපාරික	ආගමික	
	බල ප්‍රදේශය තුල	2,500 0	4,000 0	1,000 0	
	බල ප්‍රදේශයෙන් පිට	6,000 0	6,000 0	1,000 0	
	ප්‍රවාහන ගාස්තුව (කි. මී. 01 ට)				100 0
10.	සුසාන භූමි වෙන්කර ගැනීම				900 0
11.	ත්‍රීරෝද රථ සඳහා				
	ලියාපදිංචි ගාස්තුව				500 0
	වාර්ෂික බලපත්‍ර ගාස්තුව				500 0
12.	ක්‍රීඩා පිට්ටනි කුලියට දීම (දිනකට)				1,000 0
13.	පුස්තකාල සඳහා -				
	සාමාජික ගාස්තුව				60 0
	සාමාජිකත්වය අලුත් කිරීමේ ගාස්තුව				40 0
	පොත් නැවත භාරදීමේ ප්‍රමාද ගාස්තු (දිනකට)				1 0
14.	සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමේ ගාස්තුව				1,000 0
15.	කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීමේ ගාස්තු				
	රු. 100,000 ට අඩු කර්මාන්ත සඳහා				1,000 0
	රු. 100,000 සිට රු. 250,000 දක්වා				2,000 0
	රු. 250,000 සිට රු. 500,000 දක්වා				2,500 0
	රු. 500,000 සිට රු. 10,00,000 දක්වා				3,000 0
	රු. 10,00,000 ට වැඩි				3,500 0

ගලෙන්බිඳුණුවැව ප්‍රාදේශීය සභාව

2019 වර්ෂය සඳහා ව්‍යාපාර බදු පැනවීම

ගලෙන්බිඳුණුවැව ප්‍රාදේශීය සභාව විසින් 2018.10.23 වැනි දින පවත්වනු ලැබූ මහසභා රැස්වීමේ තීරණ අංක 1 යටතේ පහත දැක්වෙන යෝජනාව සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2019 වර්ෂය සඳහා නියම කරන ලද එම ව්‍යාපාර බද්ද, එම් වර්ෂයේ අප්‍රේල් මස 30 වැනි දිනට පෙර ගලෙන්බිඳුණුවැව ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බව වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

ජේ. එම්. රත්නායක,
සභාපති,
ගලෙන්බිඳුණුවැව ප්‍රාදේශීය සභාව,
ගලෙන්බිඳුණුවැව.

2018 ඔක්තෝබර් මස 26 වැනි දින,
ගලෙන්බිඳුණුවැව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වැනි උපවගන්තියේ (i) වැනි උපවගන්තිය යටතේ ගලෙන්බිඳුණුවැව ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල යටතේ ගලෙන්බිඳුණුවැව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත කරගෙන යනු ලබන, ඉහත කී පනතේ 150 වැනි වගන්තිය යටතේ යම් බද්දක් ගෙවීමට යටත් වන යම් කර්මාන්තයක් (වෙළෙඳාමක්) නොවන්නා වූ සහ යම් අතුරු ව්‍යවස්ථාවක් යටතේ බලපත්‍රයක් ලබා ගැනීම අවශ්‍ය නොවන්නා වූ, යම් ව්‍යාපාරයක් කරගෙන යනු ලබන අවස්ථාවක, ඒ ව්‍යාපාරයෙන් පෙර වර්ෂයේ ලැබූ ආදායම, පහත උපලේඛනයේ I වන තීරුවේ සඳහන් යම් විෂයාංකයක සීමාවන් ඇතුළත පවතින අවස්ථාවක, ඒ උපලේඛනයේ II වන තීරුවේ සඳහන් ප්‍රමාණයට සමාන මුදලක් බද්දක් ලෙස 2019 වර්ෂය සඳහා නියම කර අයකර ගත යුතු බව සහ ඒ ව්‍යාපාර බද්ද ඒ වර්ෂයේ අප්‍රේල් මස 30 වැනි දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවත්, ගලෙන්බිඳුණුවැව ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

උපලේඛනය

I වැනි තීරය *2018 වර්ෂයේ දී ආදායම*	*II වැනි තීරය* *රු. ශත*
රු. 6,000 නොඉක්මවන අවස්ථාවක	කිසිවක් නැත
රු. 6000 ඉක්මවන නමුත් රු. 12,000 නොඉක්මවන අවස්ථාවක	90 0
රු. 12,000 ඉක්මවන නමුත් රු. 18,750 නොඉක්මවන අවස්ථාවක	180 0
රු. 18,750 ඉක්මවන නමුත් රු. 75,000 නොඉක්මවන අවස්ථාවක	300 0
රු. 75,000 ඉක්මවන නමුත් රු. 1,50,000 නොඉක්මවන අවස්ථාවක	1,200 0
රු. 1,50,000 ඉක්මවන අවස්ථාවක	3,000 0

මෙම ව්‍යාපාර බදු අදාළ වන ව්‍යාපාර :

01. කොමිස් ඒජන්තවරු
02. වෙන්දේසිකරුවන්
03. බ්‍රෝකර්වරු
04. මුදල් ආයෝජකයන්
05. දේශීය හා විදේශීය බැංකු ආයතන
06. වාහන සේවා ආයතන
07. රක්ෂණ සමාගම්
08. උකස් බඩු ගන්නා ආයතන
09. පෞද්ගලික තැපැල් කාර්යාල
10. ඉන්ධන පිරවුම්හල්
11. දුරකථන පහසුකම් සේවා ස්ථාන

12. රට බීම හල්
13. උත්සව භාණ්ඩ කුළියට දීම
14. අවමංගල සේවා කටයුතු ආයතන
15. විදේශ රැකියා ආයතන
16. සතුන් වෙළෙඳාම් කරන්නන්
17. සැපයුම්කරුවන්
18. රියැදුරු පුහුණු ආයතන
19. පින්තාරුකරුවන්
20. රේස් ඔට්ටු දැමීමේ ව්‍යාපාර
21. රථවාහන කුළියට දීමේ ආයතන
22. ඡායාරූප ශාලා
23. මුද්‍රණාලයක් පවත්වාගෙන යාම
24. යතුරුපැදි හා කෘෂිවාහන අලෙවි කිරීම
25. ලොතරැයි නියෝජිත ආයතනයක්
26. පරිගනක පුහුණු මධ්‍යස්ථාන
27. සූර්ය ශක්තිය භාවිතයෙන් විදුලිය නිපදවන උපකරණ විකිණීම
28. ගෘහ භාණ්ඩ අලෙවිසැලක්
29. මැටි භාණ්ඩ වෙළෙඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
30. පොත් සාප්පුවක් පවත්වාගෙන යාම
31. සමාජ ශාලාවක්
32. පරිගනක හා උපාංග විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
33. ස්වර්ණාභරණ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
34. ඇස් කණ්නාඩි විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
35. නිමි ඇඳුම් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
36. පෞද්ගලික උපකාරක පන්ති පවත්වාගෙන යාම
37. උපදේශන සේවා ලබා දීමේ ආයතනයක් පවත්වාගෙන යාම.

12 - 186/1

ගලෙන්බිඳුණුවැව ප්‍රාදේශීය සභාව

2019 වර්ෂය සඳහා කර්මාන්ත බදු පැනවීම

ගලෙන්බිඳුණුවැව ප්‍රාදේශීය සභාව විසින් 2018.10.23 වැනි දින පවත්වනු ලැබූ මහසභා රැස්වීමේ තීරණ අංක 1(I) යටතේ පහත දැක්වෙන යෝජනාව සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2019 වර්ෂය සඳහා නියම කරන ලද එම කර්මාන්ත (වෙළෙඳ) බද්ද, එම වර්ෂයේ අප්‍රේල් මස 30 වැනි දිනට පෙර ගලෙන්බිඳුණුවැව ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බව වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

ජේ. එම්. රත්නායක,
සභාපති,
ගලෙන්බිඳුණුවැව ප්‍රාදේශීය සභාව,
ගලෙන්බිඳුණුවැව.

2018 ඔක්තෝබර් මස 26 වැනි දින,
ගලෙන්බිඳුණුවැව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 වැනි උපවගන්තියේ (I) වැනි උපවගන්තියෙන් ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල යටතේ ගලෙන්බිඳුණුවැව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත කරගෙන යනු ලබන, ඉහත කී පනතේ 152 වැනි වගන්තිය

යටතේ යම් ව්‍යාපාර බද්දක් ගෙවීමට යටත්වන යම් ව්‍යාපාරයක් නොවන්නා වූ සහ කිසියම් අතුරු ව්‍යවස්ථාවක් යටතේ බලපත්‍රයක් ලබා ගැනීමට අවශ්‍ය නොවන්නා වූ, යම් කර්මාන්තයක් (වෙළෙඳාමක්) කරගෙන යනු ලබන අවස්ථාවක, ඒ එක් එක් කර්මාන්තය (වෙළෙඳාම) පවත්වාගෙන යනු ලබන ස්ථානයේ වාර්ෂික වටිනාකම, පහත උපලේඛනයේ I වැනි තීරුවේ සඳහන් යම් විෂයාංකයක සීමාවන් ඇතුළත පවතින අවස්ථාවක, ඒ උපලේඛනයේ II වැනි තීරුවේ සඳහන් ප්‍රමාණයට සමාන මුදලක් කර්මාන්ත (වෙළෙඳ) බද්දක් 2019 වර්ෂය සඳහා නියම කර අයකර ගත යුතු බව සහ ඒ කර්මාන්ත (වෙළෙඳාම්) බද්ද ඒ වර්ෂයේ අප්‍රේල් මස 30 වැනි දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවත්, ගලෙන්බිඳුණුවැව ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

උපලේඛනය

අනු. අංකය	*i වැනි තීරුව* *කර්මාන්තය*	*ii වැනි තීරුව* *පරිශ්‍රයෙහි වාර්ෂික ආදායම*		
		රු. 750 නොඉක්මවන අවස්ථාවක	*රු. 750 ඉක්මවන නමුත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක*	*රු.1,500 ඉක්මවන අවස්ථාවක*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
01.	වීමෝල	500 0	750 0	1,000 0
02.	ගඩොල් කපන ස්ථානයක්	500 0	750 0	1,000 0
03.	පෑස්සුම් වැඩපලක්	500 0	750 0	1,000 0
04.	යාන්ත්‍රික වඩු මඩුවක්	500 0	750 0	1,000 0
05.	කළුගල් කඩන ස්ථානයක්	500 0	750 0	1,000 0
06.	ඇඹරුම්හලක්	500 0	750 0	1,000 0
07.	වාහන අළුත්වැඩියාව	500 0	750 0	1,000 0
08.	රන්, රිදී, පිත්තල භාණ්ඩ නිෂ්පාදනය	500 0	750 0	1,000 0
09.	ලී මෝලක්	500 0	750 0	1,000 0
10.	යකඩ කම්හලක්	500 0	750 0	1,000 0
11.	කොහු නිෂ්පාදන	500 0	750 0	1,000 0
12.	සිමෙන්ති භාණ්ඩ නිෂ්පාදන	500 0	750 0	1,000 0

12 - 186/2

ගලෙන්බිඳුණුවැව ප්‍රාදේශීය සභාව

අතුරු ව්‍යවස්ථා යටතේ 2019 වර්ෂය සඳහා ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරනු ලබන බලපත්‍ර මත ගාස්තු නියම කිරීම

ගලෙන්බිඳුණුවැව ප්‍රාදේශීය සභාව විසින් 2018.10.23 වැනි දින පවත්වනු ලැබූ මහසභා රැස්වීමේ තීරණ අංක 1(II) යටතේ පහත දැක්වෙන යෝජනාව සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

යම් අතුරු ව්‍යවස්ථාවක නියමය යටතේ බලපත්‍ර ලබාගත යුතු යම් කර්මාන්තයක් හෝ වෙළෙඳාමක් පවත්වාගෙන යනු ලබන ස්ථානය වෙනුවෙන් 2019 වර්ෂය සඳහා ගලෙන්බිඳුණුවැව ප්‍රාදේශීය සභාවෙන් නිකුත් කරනු ලබන සෑම බලපත්‍රයක්ම වෙනුවෙන් ඒ යෝජනාවේ සඳහන් ආකාරයේ බලපත්‍ර ගාස්තුවක් අයකරනු ලබන බව වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

ජේ. එම්. රත්නායක,
සභාපති,
ගලෙන්බිඳුණුවැව ප්‍රාදේශීය සභාව,
ගලෙන්බිඳුණුවැව.

2018 ඔක්තෝබර් මස 26 වැනි දින,
ගලෙන්බිඳුණුවැව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

ප්‍රාදේශීය සභාව විසින් සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක් යටතේ හෝ ගලෙන්බිඳුණුවැව ප්‍රාදේශීය සභාව විසින් පිළිගෙන ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවක් යටතේ බලපත්‍ර ලබාගත යුතු යම් කර්මාන්තයක් හෝ ව්‍යාපාරයක් පවත්වාගෙන යනු ලබන ස්ථානයක් සඳහා ගලෙන්බිඳුණුවැව ප්‍රාදේශීය සභාව විසින් 2019 වර්ෂය සඳහා නිකුත් කරනු ලබන සෑම බලපත්‍රයක් සම්බන්ධයෙන් ම, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වැනි වගන්තිය සමග කියවිය යුතු 149 වැනි වගන්තියෙන් ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර පහත උපලේඛනයේ I වැනි තීරුවේ සඳහන් එක් එක් කර්මාන්තය හෝ ව්‍යාපාරය වෙනුවෙන් එම උපලේඛනයේ II වැනි තීරුවේ අනුරූපී සටහනෙහි නිරූපිත බලපත්‍ර ගාස්තුවක් නියමකර අයකර ගැනීමටත්,

එකී උපලේඛනයේ සඳහන් කර්මාන්ත හෝ ව්‍යාපාර අතරින් ලංකා සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි කර ඇති හෝ එය විසින් අනුමත කර ඇති හෝ පිළිගෙන ඇති හෝටලයක්, ආපන ශාලාවක්, නවාතැන් පලක් වන විට, එකී හෝටලයෙන්, ආපන ශාලාවෙන්, නවාතැන් පළෙන් පසුගිය වර්ෂයේ ලත් ලැබීම්වලින් සියයට එකකට (1%) සමාන මුදල් ප්‍රමාණයක් හෝ ඉහත කී උපලේඛනයේ II වැනි තීරුවේ නිරූපිත ප්‍රමාණය යන මුදල් ප්‍රමාණ දෙකෙන් වැඩි මුදලට සමාන ප්‍රමාණයක බලපත්‍ර ගාස්තුවක් නියමකර අය කිරීමටත් ගලෙන්බිඳුණුවැව ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

උපලේඛනය

අනු. අංකය	*I වැනි තීරුව* *බලය ලබාදෙන කාර්යය*	*II වැනි තීරුව* *පරිශ්‍රයෙහි වාර්ෂික ආදායම*		
		රු. 750 නොඉක්මවන අවස්ථාවක	*රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක*	*රු.1,500 ඉක්මවන අවස්ථාවක*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
01	ලැගුම් නිවාසයක්	500 0	750 0	1,000 0
02	හෝටලයක්	500 0	750 0	1,000 0
03	ආපන ශාලාවක්	500 0	750 0	1,000 0
04	බත් කඩයක්	500 0	750 0	1,000 0
05	තේ කඩයක්	500 0	750 0	1,000 0
06	කෝපි කඩයක්	500 0	750 0	1,000 0
07	බේකරියක්	500 0	750 0	1,000 0
08	කිරි පට්ටියක්	500 0	750 0	1,000 0
09	කිරි විකිණීම	500 0	750 0	1,000 0
10	මාළු විකිණීම	500 0	750 0	1,000 0
11	සිසිල් බීම කර්මාන්ත ශාලාවක්	500 0	750 0	1,000 0
12	ලොන්ඩරියක්	500 0	750 0	1,000 0
13	ගව ගාලක්	500 0	750 0	1,000 0
14	කොණ්ඩා කැපීමේ සැලුන් හලක්	500 0	750 0	1,000 0
15	බාබර් සාප්පුවක්	500 0	750 0	1,000 0
16	මස් විකිණීම	500 0	750 0	1,000 0
17	ගෝ ඝාතක ස්ථානයක්	500 0	750 0	1,000 0
18	අයිස් කර්මාන්ත ශාලාවක්	500 0	750 0	1,000 0

ගලෙන්බිඳුණුවැව ප්‍රාදේශීය සභාව

2019 වර්ෂය සඳහා සේවා ගාස්තු නියම කිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතෙන් ගලෙන්බිඳුණුවැව ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල, කාර්යය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේදී ඉටු කරනු ලබන පොදු උපයෝගී සේවා, සුභසාධන සේවා සහ වෙනත් බලතල ක්‍රියාවට නැංවීමේ දී අවශ්‍ය කරන සේවා සැපයීම වෙනුවෙන් 2019 වර්ෂය තුළ දී අයකරනු ලබන ගාස්තු නියම කිරීම පිළිබඳ පහත සඳහන් යෝජනා සම්මත 2018.10.23 වැනි දින තීරණ අංක 1(IV) යටතේ සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ජේ. එම්. රත්නායක,
සභාපති,
ගලෙන්බිඳුණුවැව ප්‍රාදේශීය සභාව,
ගලෙන්බිඳුණුවැව.

2018 ඔක්තෝබර් මස 26 වැනි දින,
ගලෙන්බිඳුණුවැව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතෙන් ගලෙන්බිඳුණුවැව ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී ඉටු කරනු ලබන පහත සඳහන් පොදු උපයෝගී සේවා, සුභසාධන සේවා සහ වෙනත් බලතල ක්‍රියාවට නැංවීමේ දී අවශ්‍ය කරන සේවා සැපයීමේදී 2019 වර්ෂය ඇතුළත ප්‍රාදේශීය සභා අරමුදලට අයකර ගත යුතු ගාස්තු මෙහි උපලේඛනයේ සඳහන් ආකාරයට විය යුතු යැයි ගලෙන්බිඳුණුවැව ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

අනු අංකය	*ගාස්තු වර්ගය*		*මුදල රු. ශත*
1	වීථි රේඛා සහතික නිකුත් කිරීමේ ගාස්තු		800 0
2	වීථි රේඛා පරීක්ෂණ ගාස්තු		500 0
3	ගොඩනැගිලි ඉල්ලුම්පත් ගාස්තු		300 0
4	ගොඩනැගිලි ඉල්ලුම්පත් අනුමත කිරීම (වර්ග අඩියකට)	නේවාසික	2 50
5		වානිජ	5 0
6	ගොඩනැගිලි ඉල්ලුම්පත් පරීක්ෂණ ගාස්තු		1,000 0
7	අනුකූලතා සහතික අනුමත කිරීමේ ගාස්තු		1,000 0
8	අනුකූලතා සහතික පරීක්ෂණ කිරීමේ ගාස්තු		500 0
9	මිනින්දෝරු සැලැස්ම අයදුම්පත් ගාස්තු		150 0
10	මිනින්දෝරු සැලැස්ම පරීක්ෂණ ගාස්තු		500 0
11	මිනින්දෝරු සැලැස්ම සහතික කිරීමේ ගාස්තු		1,000 0
12	පුස්තකාල සාමාජික ඉල්ලුම්පත් ගාස්තු		10 0
13	පුස්තකාල සාමාජික තැන්පත් මුදල් - වැඩිහිටි		150 0
14	පුස්තකාල සාමාජික තැන්පත් මුදල් - ළමා		100 0
15	පරිසර බලපත්‍ර ඉල්ලුම්පත් ගාස්තු		250 0
16	පරිසර බලපත්‍ර අලුත් කිරීමේ ඉල්ලුම්පත් ගාස්තු		100 0
17	පොදු ප්‍රදර්ශන බලපත්‍ර ගාස්තු (දිනකට)		500 0
18	වැලි කැණීම/බොරළු කැණීම, පරීක්ෂණ ගාස්තු		3,000 0
		නිර්දේශ ලබා දීමේ ගාස්තු	2,000 0
19	බර යන්ත්‍ර කුලියට දීම (ඉන්ධන සහිතව)		
	(ඉන්ධන මිල ඉහල යාම මත ගාස්තු වෙනස්විය හැක.)		
	ට්‍රැක්ටරය බවුසරය සමග (දිනකට)		6,500 0
	ට්‍රැක්ටරය ට්‍රේලරය සමග (දිනකට)		5,000 0
	කැපුම්තලය අඩි 10, අශ්ව බල 120, මෝටර් ග්‍රේඩරය (පැයකට) යන එන ගමන්වාර කාලය ද සමග		4,000 0
	ලෝඩර් බැකෝ යන්ත්‍රය (පැයකට) යනඑන කාලයද සමග		3,000 0
	ටොන් 08 මාර්ග තලය යන්ත්‍රය (පැය 06)		15,000 0
	කම්පැක්ටරය දිනකට ඉන්ධන රහිතව, ක්‍රියාකරු සහිතව		3,500 0

අනු. අංකය	ගාස්තු වර්ගය	මුදල රු. ශත
20.	ගල් රෝල ප්‍රවාහනය	
	(i) දුර කි.මී. 10 ට අඩුනම් ආරම්භක ගාස්තු	2,400 0
	යාමට හා ඒමට 01 කි.මී.ට ගාස්තුව	200 0
	(ii) දුර කි.මී. 11 සිට කි.මී. 20 දක්වා ආරම්භක ගාස්තු	2,000 0
	යාමට හා ඒමට කි.මී. 1කට ගාස්තුව	200 0
	(iii) දුර කි.මී. 21 වැඩි නම් ආරම්භක ගාස්තුව	1,600 0
	යාමට හා ඒමට කි.මී. 1කට ගාස්තුව	200
21	තාප්පයක් සඳහා (දිග මීටරයකට)	50 0
22	වරිපනම් අයිතිය තහවුරු කිරීමේ ඉල්ලුම්පත් ගාස්තු	100 0
23	වරිපනම් ලේඛනයේ නම වෙනස් කිරීමේ ගාස්තුව	3,000 0
24	බැරල් 02 (ටොන් 02) කම්පක මාර්ග තලනය (ක්‍රියාකරු ඉන්ධන සහිතව දිනකට)	5,000 0
25	දම්වැල් කියත පැය 03කට (ක්‍රියාකරු සහිතව, ඉන්ධන රහිතව)	3,000 0
26	දම්වැල් කියත දිනකට (පැය 06)	6,000 0
27	GI බට එකක් සඳහා එක් දිනකට	20 0
28	ප්‍රවාහන ගාස්තු (වැලි, බොරළු, ගල්) කියුබ් එකකට	100 0
29	බහුකාර්යය ගොඩනැගිල්ල සඳහා	
	ශාලාව පමණක් (දිනකට)	6,000 0
	ශාලාව ශබ්ද විකාශන යන්ත්‍ර සමග (දිනකට)	8,000 0
	ශාලාව බහු මාධ්‍ය උපකරණ සමග (දිනකට)	9,000 0
	ශාලාව බහු මාධ්‍ය උපකරණ, ශබ්ද විකාශන යන්ත්‍ර සමග (දිනකට)	11,000 0
	ශාලාව විදුලි ආලෝකකරණ උපකරණ, ශබ්ද විකාශන යන්ත්‍ර සමග (දිනකට)	12,000 0
	ශාලාව විදුලි අලෝකකරණ උපකරණ, බහු මාධ්‍ය උපකරණ, ශබ්ද විකාශන යන්ත්‍ර සමග (දිනකට)	15,000 0

12 - 186/4

ගලෙන්බිඳුණුවැව ප්‍රාදේශීය සභාව

2019 වර්ෂය සඳහා වරිපනම් පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වන වගන්තියේ (i) වන උපවගන්තියෙන් ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර, ගලෙන්බිඳුණුවැව ප්‍රාදේශීය සභාව විසින් 2018.10.23 වැනි දින සභා තීරණ අංක 1 (V) යටතේ වරිපනම් කාර්යය සම්බන්ධයෙන් මෙහි පහත සඳහන් යෝජනාව සම්මත කර බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ. මේ වරිපනම් නියම කිරීමේ කාර්යය සඳහා ඉහත කී ප්‍රාදේශීය සභා පනතේ 134 වැනි වගන්තියේ නියමයන් සම්පූර්ණ කර ඇති බව වැඩිදුරටත් දන්වමි.

ඉහත කී වර්ෂයට අදාළ සම්පූර්ණ වරිපනම් මුදල 2019 ජනවාරි මස 31 වැනි දින හෝ එදිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවනු ලැබුවහොත් ඒ මුදලෙන් සියයට දහයක (10%) වට්ටමක් ද, කිසියම් කාර්තුවකට අදාළ වරිපනම් මුදල, ඒ කාර්තුවේ පළමුවන මාසය අවසන් වීමට පෙර ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබුවහොත් ඒ කාර්තුවේ මුදලෙන් සියයට පහක (05%) වට්ටමක් ද, ගෙවනු ලැබේ.

ඒ ආකාරයෙන් යම් වට්ටමක් ලබා ගැනීමට හැකි වන්නේ අදාළ කාලයට පෙර පැවති හිඟ වරිපනම් වේ නම්, ඒ හිඟය ද ගෙවා අවසන් කළහොත් පමණක් බවත් වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

ජේ. එම්. රත්නායක,
සභාපති,
ගලෙන්බිඳුණුවැව ප්‍රාදේශීය සභාව,
ගලෙන්බිඳුණුවැව.

2018 ඔක්තෝබර් මස 26 වැනි දින,
ගලෙන්බිඳුණුවැව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වැනි වගන්තියේ (i) වැනි උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර, අනුරාධපුර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය පළාත් පාලන සහකාර කොමසාරිස්වරයාගේ අනුමැතිය ඇතිව, ගලෙන්බිඳුණුවැව ප්‍රාදේශීය සභාව විසින් දියුණු කළ ප්‍රදේශයක්/ප්‍රදේශ බවට ප්‍රකාශයට පත්කර ඇති ප්‍රදේශයේ/ප්‍රදේශවල පිහිටා ඇති නිශ්චල දේපළවල සහ ඒ ඒ පන්තියට හෝ වර්ගයාට අයත් නිශ්චල දේපළවල 2014 වර්ෂය තුළ බල පැවැත්වූ වාර්ෂික වටිනාකම්, 2019 වර්ෂය සඳහා එකී පනතේ 146 වැනි වගන්තියේ නියමය පරිදි, සම්මත කිරීමටත්,

ඉහත කී 134 වැනි වගන්තියේ (1) වන උපවගන්තියෙන් ලැබී ඇති බලතල යටතේ එකී නිශ්චල දේපළ අතරින් කුඹුරු ඉඩම් හැර සෙසු සියලුම නිවාසවල, ගොඩනැගිලිවල, ඉඩම්වල, ගෙපත්වල වාර්ෂික වටිනාකමෙන් සියයට දහයක් (10%)ක වරිපනමක් 2019 වර්ෂය සඳහා නියම කිරීමටත්, සහ

එකී වරිපනම්, එකී වර්ෂයේ මාර්තු මස 31, ජූනි මස 30, සැප්තැම්බර් මස 30 සහ දෙසැම්බර් මස 31 යන දිනවලින් අවසන් වන කාර්තු හතර තුළදී සාමාන්‍ය වාරික හතරකින් ගෙවන ලෙසටත්, එකී වාර්ෂික වරිපනම් බද්ද 2019 වර්ෂයේ ජනවාරි මස 31 වැනි දිනට හෝ ඊට ප්‍රථම ගෙවන්නේ නම් වාර්ෂික වරිපනම් බද්දේ ප්‍රමාණයෙන් 10%ක වට්ටමක් ද, එකී උපලේඛනයෙහි එක් එක් කාර්තුව ඉදිරියේ තුන්වන තීරුවේ නිරූපිත දිනයට පෙර අදාළ වරිපනම් බදු මුදල ප්‍රාදේශීය සභා අරමුදලට ගෙවනු ලබන්නේ නම් එක් කාර්තුවට අදාළ මුදලින් 05%ක වට්ටමක් ද, ප්‍රාදේශීය සභාව විසින් දීමට ගලෙන්බිඳුණුවැව ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

උපලේඛනය

කාර්තුව	*ගෙවිය යුතු දිනය*	*වට්ටම සඳහා හිමිකම් ලබන අවසාන දිනය*
පළමු කාර්තුව	2019.03.31	2019.01.31
දෙවන කාර්තුව	2019.06.30	2019.04.30
තෙවන කාර්තුව	2019.09.30	2019.07.31
සිව්වන කාර්තුව	2019.12.31	2019.10.31

12 - 186/5

ගලෙන්බිඳුණුවැව ප්‍රාදේශීය සභාව

2019 වර්ෂය සඳහා අප්‍රසන්න හා අන්තරාදායක වෙළෙඳාම වෙනුවෙන් අතුරු ව්‍යවස්ථාව යටතේ බලපත්‍ර ගාස්තු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වැනි වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 147 වැනි වගන්තිය යටතේ ගලෙන්බිඳුණුවැව ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරවත් 122 වගන්තියේ (I) වැනි උපවගන්තිය සාදන ලද අතුරු ව්‍යවස්ථාවට අනුව ගලෙන්බිඳුණුවැව ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරවත් ගලෙන්බිඳුණුවැව ප්‍රාදේශීය සභාව විසින් 2018.10.23 වැනි දින සභා තීරණ අංක 1 (III)

යටතේ අප්‍රසන්න හා අන්තරාදායක අතුරු ව්‍යවස්ථා යටතේ බලපත්‍ර ගාස්තු පැනවීම සම්බන්ධයෙන් මෙහි පහත සඳහන් යෝජනාව සම්මත කර බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ජේ. එම්. රත්නායක,
සභාපති,
ගලෙන්බිඳුණුවැව ප්‍රාදේශීය සභාව,
ගලෙන්බිඳුණුවැව.

2018 ඔක්තෝබර් මස 26 වැනි දින,
ගලෙන්බිඳුණුවැව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වැනි වගන්තිය සමග කියවිය යුතු 147 වැනි වගන්තිය යටතේ ගලෙන්බිඳුණුවැව ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර එකී පනතේ හෝ එකී පනත යටතේ 122 වන වගන්තියේ (i) වැනි උපවගන්තිය යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවක විස්තර කර ඇති මෙහි පහත උපලේඛනයෙහි I වන තීරුවේ නිරූපිත යම් කාර්යයක් සඳහා ගලෙන්බිඳුණුවැව ප්‍රාදේශීය සභා ප්‍රදේශය ඇතුළත අප්‍රසන්න හා අන්තරාදායකව යම් පරිශ්‍රයක් පාවිච්චි කිරීමට බලය දෙමින් 2019 වර්ෂයේ නිකුත් කරන යම් බලපත්‍රයක් සම්බන්ධයෙන් එම උපලේඛනයේ II වැනි තීරුවේ අනුරූප සටහනේ නිරූපිත බලපත්‍ර ගාස්තුවක් පනවා 2019 වර්ෂයට අයකළ යුතු යැයි මම යෝජනා කරමි.

උපලේඛනය

I වැනි තීරුව		*II වැනි තීරුව*		
අනු. අංකය	*බලය ලබාදෙන කාර්යය*	*පරිශ්‍රයෙහි වාර්ෂික ආදායම*		
		රු. 750 නොඉක්මවන අවස්ථාවක	*රු. 750 ඉක්මවන නමුත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක*	*රු.1,500 ඉක්මවන අවස්ථාවක*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
01.	සිල්ලර වෙළඳාම් කිරීමේ වෙළෙඳසැලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
02.	තොග වශයෙන් භාණ්ඩ ගබඩා කර විකිණීම	500 0	750 0	1,000 0
03.	ලී වෙළෙඳසැලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
04.	පළතුරු වෙළෙඳසැලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
05.	සංචාරකව වෙළෙඳාම් කිරීම	500 0	750 0	1,000 0
06.	කළුගල් ඇඹරවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
07.	බැටරි නැවත ආරෝපණය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
08.	එළවලු වෙළෙඳසැලක් පවත්වාගෙන යාම	350 0	550 0	750 0
09.	පා පැදි අළුත්වැඩියාව	350 0	600 0	1,000 0
10.	ගැලුම් 50ට වඩා ඉන්ධන ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
11.	කෘත්‍රිම පොහොර ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
12.	කාර් ෂීට් කුෂන් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
13.	යකඩ බඩු කඩයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
14.	ට්‍රේලර් සාප්පුවක් පවත්වාගෙන යාම (මැෂින් 3)	500 0	750 0	1,000 0
15.	ට්‍රේලර් සාප්පුවක් පවත්වාගෙන යාම (මැෂින් 5)	500 0	750 0	1,000 0
16.	කුළු බඩු පමණක් පැකට් කර විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

	I වැනි තීරුව	*II වැනි තීරුව*		
අනු. අංකය	*බලය ලබාදෙන කාර්යය*	*පරිශ්‍රයෙහි වාර්ෂික ආදායම*		
		රු. 750 නොඉක්මවන අවස්ථාවක	*රු. 750 ඉක්මවන නමුත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක*	*රු.1,500 ඉක්මවන අවස්ථාවක*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
17.	පෞද්ගලික ආරෝග්‍ය ශාලාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
18.	පටිගත කිරීමේ හා වීඩියෝ කිරීමේ ආයතනයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
19.	අළුත් හෝ පාවිච්චි කරන ලද ටයර් ගබඩා කිරීම හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
20.	තීන්ත හෝ සායම් වර්ග විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
21.	පින්තූර රාමු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
22.	පා පැදි හා රථ වාහන අමතර කොටස් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
23.	පෙට්‍රල්, ඩීසල්, වෙනත් ඛනිජ තෙල් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
24.	හතු වගා කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
25.	මනාලියන් හැඩ ගැන්වීම හෝ කොණ්ඩා මෝස්තර දැමීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
26.	බුලත්, පුවක් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
27.	සාප්පු බඩු ඇතුලු සුඛෝපභෝගී විදුලි භාණ්ඩ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
28.	වීඩියෝ පට අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
29.	ඇළුමිනියම් හා ප්ලාස්ටික් භාණ්ඩ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
30.	කෘෂි රසායන ද්‍රව්‍ය විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
31.	ධාන්‍ය වර්ග ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
32.	ඉංග්‍රීසි හා සිංහල බෙහෙත් වර්ග විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
33.	වැලි ගොඩදැමීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
34.	සිමෙන්ති හා අළු හුණු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
35.	උළු ගබඩා කර විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
36.	රූපවාහිනී ඇන්ටනා නිපදවීමේ හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
37.	ගෑස් වෙළෙඳාම	500 0	750 0	1,000 0
38.	රන්, රිදී, පිත්තල භාණ්ඩ ඔප දැමීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
39.	නූඩ්ල්ස්, පපඩම් නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
40.	රෙදි මුද්‍රණය හා සායම් දැමීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
41.	යෝගට් හා අනෙකුත් ශීතකළ ආහාර නිපදවීම	500 0	750 0	1,000 0
42.	රස කැවිලි නිපදවා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
43.	විදුලි උපකරණ අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
44.	ජංගම හා ස්ථාවර දුරකථන අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
45.	කෑලි රෙදි විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
46.	හඳුන්කුරු නිෂ්පාදන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
47.	ස්වභාවික අමුද්‍රව්‍ය යොදා භාණ්ඩ නිෂ්පාදනය (කොසු, ඉදල්, බුරුසු, පාපිසි)	500 0	750 0	1,000 0

ගලෙන්බිඳුණුවැව ප්‍රාදේශීය සභාව

2019 වර්ෂය සඳහා ප්‍රචාරක දැන්වීම් - දෘෂ්‍ය පරිසරය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වැනි වගන්තියේ (i) වැනි උපවගන්තියෙන් ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර, ගලෙන්බිඳුණුවැව ප්‍රාදේශීය සභාව විසින් 2018.10.23 වැනි දින සභා තීරණ අංක 1(VI) යටතේ ප්‍රචාරක දැන්වීම්, දෘශ්‍ය පරිසරය කාර්යය සම්බන්ධයෙන් මෙහි පහත සඳහන් යෝජනාව සම්මත කර බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ජේ. එම්. රත්නායක,
සභාපති,
ගලෙන්බිඳුණුවැව ප්‍රාදේශීය සභාව,
ගලෙන්බිඳුණුවැව.

2018 ඔක්තෝබර් මස 26 වැනි දින,
ගලෙන්බිඳුණුවැව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 (i) වන වගන්තියෙන් පැවරී ඇති බලතල අනුව, 1988.08.23 වැනි දින අංක 520/7 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ IV(ආ) කොටසේ පළාත් පාලන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකර ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවේ 39 වැනි කොටසේ ප්‍රචාරක/දෘෂ්‍ය පරිසර විධිවිධාන ප්‍රකාර ගලෙන්බිඳුණුවැව ප්‍රාදේශීය සභා සීමාව තුළ යම් ක්‍රමයකට පාරකට, ඇලකට, වැවකට හෝ අහසට පෙනෙන පරිදි දැන්වීමක් ප්‍රදර්ශනය කිරීමට සැලැස්වීම වෙනුවෙන් පහත උපලේඛනයේ සඳහන් බලපත්‍ර ගාස්තුවක් 2019 වර්ෂයට අය කළ යුතු යැයි මම තීරණය කරමි.

උපලේඛනය

	රු. ශත
01. විදුලි බුබුළු, වෙනත් විද්‍යුත් උපකරණ යෙදූ දැන්වීම් පුවරුවක් වෙනුවෙන්	1,000 0
02. ස්ථිර දැන්වීම් පුවරුවක් වෙනුවෙන්	1,000 0
03. ඉඩම් වෙන්දේසි කිරීම සම්බන්ධ දැන්වීම් පුවරුවක් වෙනුවෙන්	1,000 0
04. වෙනත් සාමාන්‍ය දැන්වීම් පුවරුවක් වෙනුවෙන් (වර්ග අඩියකට)	50 0
05. කිසියම් බැම්මක, බිත්තියක දැන්වීම් පුවරුවක් වෙනුවෙන්	1,000 0

12 - 186/7

ගලෙන්බිඳුණුවැව ප්‍රාදේශීය සභාව

2019 වර්ෂය සඳහා වාහන හා සත්ව බද්ද පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 148 වැනි වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 147 වැනි වගන්තියේ (i) වන උපවගන්තියෙන් ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර. ගලෙන්බිඳුණුවැව ප්‍රාදේශීය සභාව විසින් 2018.10.23 වැනි දින සභා තීරණ අංක 1(VII) යටතේ වාහන හා සත්ව බද්ද සම්බන්ධයෙන් මෙහි පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ජේ. එම්. රත්නායක,
සභාපති,
ගලෙන්බිඳුණුවැව ප්‍රාදේශීය සභාව,
ගලෙන්බිඳුණුවැව.

2018 ඔක්තෝබර් මස 26 වැනි දින,
ගලෙන්බිඳුණුවැව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 148 වැනි වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 147 වැනි වගන්තියේ (i) වැනි උපවගන්තිය යටතේ ගලෙන්බිඳුණුවැව ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර සාමාන්‍යයෙන් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ඇති හෝ පාවිච්චි කරනු ලබන්නා වූ සෑම වාහනයක් සහ සතෙක් වෙනුවෙන්ම මෙහි උපලේඛනයේ සඳහන් අනුප්‍රමාණ අනුව වූ වාර්ෂික බද්දක් 2019 වර්ෂයේ දී පනවා අයකළ යුතු යැයි මම තීරණය කරමි.

උපලේඛනය

	බද්ද *රු. ශත*
1. මෝටර් රථයක්, මෝටර් ට්‍රයිසිකලයක්, මෝටර් ලොරියක්, ජීන් රික්ෂෝවක්, කරත්තයක්, මෝටර් බයිසිකලයක් හෝ බයිසිකලයක් නොවන සෑම වාහනයක් සඳහාම	25 0
2. සෑම බයිසිකලයක් හෝ කරත්තයක් සඳහා	
(අ) වෙළඳ කාර්යයන් සඳහා යොදවන්නේ නම්	18 0
(ආ) වෙළඳ කාර්යයන් සඳහා නොවන කාර්යයන් සඳහා යොදවන්නේ නම්	4 0
3. සෑම කරත්තයක් සඳහාම	20 0
4. සෑම අත් කරත්තයක් සඳහාම	10 0
5. සෑම රික්ෂෝවක් සඳහාම	7 50
6. සෑම අශ්වයෙකු, පෝනියෙකු හෝ කොටළුවෙකු සඳහාම	20 0
7. සෑම ඇතෙකු හෝ අලියෙකු සඳහාම	50 0

විශ්කම්භය 26" නොඉක්මවන රෝද ඇති ළමා වාහන, වීල් බැරෝ, හුදෙක් පෞද්ගලික ස්ථානවල පමණක් වෙළෙඳ කාර්ය සඳහා යොදවන අත් කරත්ත සහ වෙළෙඳ කාර්යය සඳහා නොයොදවන අත් කරත්ත මෙකී වගකීමෙන් නිදහස් කෙරේ.

මේ උපලේඛනයේ වෙළෙඳ කාර්යය යන්නට විකිණීම සඳහා හෝ අන්‍යාකාරයකින් හෝ යම් වෙළෙඳ ව්‍යාපාරයක් නැතහොත් කර්මාන්තයක් සඳහා වූ යම් ද්‍රව්‍ය හෝ බඩු යම් ලිඛිත නැතහොත් මුද්‍රිත ද්‍රව්‍ය ගෙන යාම හෝ ප්‍රවාහනය කිරීම ඇතුළත් වේ.

12 - 186/8

කුරුණෑගල ප්‍රාදේශීය සභාව

2019 වර්ෂය සඳහා වරිපනම් බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වැනි වගන්තියෙන් කුරුණෑගල ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව කුරුණෑගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයෙහි 2019 වර්ෂය සඳහා වරිපනම් බදු නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට 2018 වර්ෂයෙහි සැප්තැම්බර් මස 20 වැනි දින පවත්වන ලද කුරුණෑගල ප්‍රාදේශීය සභා රැස්වීමේදී තීරණ අංක 03 යටතේ පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

ආර්. පී. අචල නිමන්ත වික්‍රමතිලක,
සභාපති,
කුරුණෑගල ප්‍රාදේශීය සභාව.

2018 සැප්තැම්බර් මස 20 වැනි දින,
කුරුණෑගල ප්‍රාදේශීය සභාවේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 146 වන වගන්තියේ (1) වන උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව කුරුණෑගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ දියුණු ගම් ප්‍රදේශය ලෙස ප්‍රකාශයට පත්කළ ප්‍රදේශ ඇතුළත පිහිටියා වූ නිවාසවල, ගොඩනැගිලිවල, ඉඩම්වල, ගෙපත්වල වාර්ෂික වටිනාකම සඳහා 2011 වර්ෂය සඳහා වූ තක්සේරුව 2019 වර්ෂය සඳහා තක්සේරුව ලෙස පිළිගත යුතු බවටත්,

එකී පනතේ 134 වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ එකී දේපළ මත ඉහත කී තක්සේරුව සඳහා වාර්ෂික වටිනාකමින් සියයට පහක (5%) වාර්ෂික වරිපනම් බද්දක් නියම විය යුතු බවටත්,

තව ද, එකී පනතේ 134 වන වගන්තියේ (6) සහ (7) යන උපවගන්තීන් යටතේ 2019 වර්ෂයෙහි පහත උපලේඛනයෙහි සඳහන් එක් එක් කාර්තුව වෙනුවෙන් ඉදිරියෙන් නිරූපිත දිනයට පෙර එසේ නියම කරන ලද වාර්ෂික වරිපනම් බද්ද කුරුණෑගල ප්‍රාදේශීය සභා අරමුදලට ගෙවිය යුතු බවටත්, එලෙස වාර්ෂික වරිපනම් බද්ද, එම වර්ෂයෙහි ජනවාරි මස 31 වන දින හෝ ඊට ප්‍රථම ගෙවන්නේ නම් වාර්ෂික වරිපනම් බද්දේ ප්‍රමාණයෙන් සියයට දහයක (10%) වට්ටමක් ද, එකී උපලේඛනයෙහි එක් එක් කාර්තුව ඉදිරියෙන් තුන්වන තීරුවේ නිරූපිත දිනයට පෙර අදාළ වරිපනම් බදු මුදල කුරුණෑගල ප්‍රාදේශීය සභා අරමුදලට ගෙවනු ලබන්නේ නම් එම කාර්තුවට අදාළ මුදලින් 5% ක වට්ටමක් ද ලබා දිය යුතු බවටත් කුරුණෑගල ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

උපලේඛනය

කාර්තුව	*ගෙවිය යුතු දිනය*	*5% වට්ටම සඳහා හිමිකම් ලබන අවසාන දිනය*
පළමු වන කාර්තුව	2019.03.31	2019.01.31
දෙවන කාර්තුව	2019.06.30	2019.04.30
තුන් වන කාර්තුව	2019.09.30	2019.07.31
හතරවන කාර්තුව	2019.12.31	2019.10.31

12 - 153/1

කුරුණෑගල ප්‍රාදේශීය සභාව

2019 වර්ෂය සඳහා අක්කර බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තියෙන් කුරුණෑගල ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව කුරුණෑගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයෙහි 2019 වර්ෂය සඳහා අක්කර බදු නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට 2018 වර්ෂයෙහි සැප්තැම්බර් මස 20 වැනි දින පවත්වන ලද කුරුණෑගල ප්‍රාදේශීය සභා රැස්වීමේදී තීරණ අංක 04 යටතේ පහත සඳහන් යොජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

ආර්. පී. අචල නිමන්ත වික්‍රමතිලක,
සභාපති,
කුරුණෑගල ප්‍රාදේශීය සභාව.

2018 සැප්තැම්බර් මස 20 වැනි දින,
කුරුණෑගල ප්‍රාදේශීය සභාවේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ, 146 වන වගන්තියේ (1) වන උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව කුරුණෑගල ප්‍රාදේශීය සභා ප්‍රදේශය ඇතුළත 2018 වර්ෂය සඳහා බලාත්මක කරන ලද සත්‍යක්ෂණය කිරීම 2019 වර්ෂය සඳහා සත්‍යක්ෂණය කිරීම ලෙස පිළිගත යුතු බවටත්,

එකී සත්‍යාක්ෂණය කිරීම මත 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වගන්තියේ (3) වන උපවගන්තිය ප්‍රකාරව කුරුණෑගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටියා වූ ද, ඉහත කී පනතේ 135 වන වගන්තියෙන් අක්කර බද්දෙන් නිදහස් කර නොමැත්තා වූ ද, ස්ථිර හෝ නීතිපතා ගොවිතැනක් යටතේ වූ-

(අ) හෙක්ටයාර් පහක් හෝ ඊට වැඩි වූ සෑම ඉඩමක් වෙනුවෙන් ම එකී ඉඩමේ සෑම හෙක්ටයාරක්ම මත 2019 වර්ෂය සඳහා රුපියල් දහය බැගින් වන වාර්ෂික අක්කර බද්දක් පනවා අය කිරීමටත්,

(ආ) ඉහත කී පනතේ 134 වන වගන්තියේ (3) වන උපවගන්තියේ අතුරු විධානය යටතේ පළාත් පාලන විෂය භාර ගරු අමාත්‍යතුමා විසින් කුරුණෑගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය විශේෂ ප්‍රදේශයක් වශයෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 1989.03.10 දිනැති ගැසට් පත්‍රයෙන් ප්‍රකාශයට පත් කර ඇති හෙයින්, හෙක්ටයාර් එකකට වැඩි එහෙත්, හෙක්ටයාර පහකට අඩු සෑම ඉඩමක් මත 2019 වර්ෂය සඳහා රුපියල් පනහ බැගින් වන වාර්ෂික අක්කර බද්දක් පනවා අය කිරීමට සහ,

(ඇ) එකී අක්කර බද්ද 134 වැනි වගන්තියේ (6) වන උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් 30, හා ඔක්තෝබර් 31 යන දිනවලට පෙර සමාන වාරික හතරකින් ගෙවිය යුතු බවට ද,

තව ද, 134 වැනි වගන්තියේ (7) වැනි උපවගන්තියෙහි විධිවිධානවලට අනුකූලව 2019 වර්ෂයෙහි පහත උපලේඛනයෙහි සඳහන් එක් එක් කාර්තුව වෙනුවෙන් ඉදිරියෙන් නිරූපිත දිනයට පෙර එසේ නියම කරන ලද වාර්ෂික අක්කර බද්ද කුරුණෑගල ප්‍රාදේශීය සභා අරමුදලට ගෙවිය යුතු බවටත්, එලෙස වාර්ෂික අක්කර බද්ද එම වර්ෂයෙහි ජනවාරි මස 31 වන දින හෝ ඊට ප්‍රථම ගෙවන්නේ නම් වාර්ෂික අක්කර බද්දේ ප්‍රමාණයෙන් සියයට දහයක (10%) ක වට්ටමක් ද, එකී උපලේඛනයෙහි එක් එක් කාර්තුව ඉදිරියේ තුන්වන තීරුවේ නිරූපිත දිනයට පෙර අදාළ අක්කර බදු මුදල ප්‍රාදේශීය සභා අරමුදලට ගෙවනු ලබන්නේ නම් එකී කාර්තුවට අදාළ මුදලින් 5%ක වට්ටමක් ද කුරුණෑගල සභාව ලබා දිය යුතු බවටත් කුරුණෑගල ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

උපලේඛනය

කාර්තුව	*ගෙවිය යුතු දිනය*	*5% වට්ටම සඳහා හිමිකම් ලබන අවසාන දිනය*
පළමු වන කාර්තුව	2019.03.31	2019.01.31
දෙවන කාර්තුව	2019.06.30	2019.04.30
තුන්වන කාර්තුව	2019.09.30	2019.07.31
හතරවන කාර්තුව	2019.12.31	2019.10.31

12 - 153/2

කුරුණෑගල ප්‍රාදේශීය සභාව

2019 වර්ෂය සඳහා බලපත්‍ර ගාස්තු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වන වගන්තිය හා 149 වන වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව, කුරුණෑගල ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව කුරුණෑගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයෙහි 2019 වර්ෂය සඳහා බලපත්‍ර ගාස්තු නියම කිරීම සඳහා 2018 වර්ෂයෙහි සැප්තැම්බර් මස 20 වැනි දින පවත්වන ලද කුරුණෑගල ප්‍රාදේශීය සභා මහා සභා රැස්වීමේදී තීරණ අංක 05 යටතේ පහත සඳහන් යොජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

ආර්. පී. අචල නිමන්ත වික්‍රමතිලක,
සභාපති,
කුරුණෑගල ප්‍රාදේශීය සභාව.

2018 සැප්තැම්බර් මස 20 වැනි දින,
කුරුණෑගල ප්‍රාදේශීය සභාවේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වන වගන්තිය හා 149 වැනි වගන්තිය යටතේ කුරුණෑගල ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර එකී පනතේ හෝ එකී පනත යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවක හෝ කුරුණෑගල ප්‍රාදේශීය සභාව විසින් පිළිගෙන ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවක් යටතේ මෙහි පහත උපලේඛනයෙහි I වන තීරුවේ නිරූපිත යම් කාර්යයක් සඳහා කුරුණෑගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත යම් ස්ථානයක් හෝ පරිශ්‍රයක් පාවිච්චි කිරීමට බලය දෙමින් 2019 වර්ෂයේ නිකුත් කරනු ලබන යම් බලපත්‍රයක් සම්බන්ධයෙන් එම උපලේඛනයෙහි II තීරුවේ අනුරූප සටහනේ නිරූපිත බලපත්‍ර ගාස්තුවක් 2019 වර්ෂය සඳහා නියම විය යුතු බවට ද,

තව ද, එකී ස්ථානය හෝ පරිශ්‍රය 1968 අංක 14 දරන සංචාරක මණ්ඩල පනතේ කාර්යය සඳහා සංචාරක මණ්ඩලයේ අනුමත කර ඇති, පිළිගෙන ඇති හෝටලයක්, ආපන ශාලාවක්, නවාතැන්පළක් වන විටදී. ඊට අදාළ බලපත්‍ර ලබාදීමේ දී එම ස්ථානයේ හෝ පරිශ්‍රයේ 2018 වර්ෂයේ ලැබීම්වලින් 1%ක් බලපත්‍ර ගාස්තුව ලෙස 2019 වර්ෂය සඳහා නියම විය යුතු බවටත් කුරුණෑගල ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

උපලේඛනය අංක 01

අප්‍රසන්න ව්‍යාපාර :

අනු. අංක	*I වන තීරය* *බලය දෙනු ලබන කාර්යය*	*II වන තීරය* *පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකම*		
		රු. 750 නොඉක්මවන අවස්ථාවක	*රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1,500 ඉක්මවන අවස්ථාවක*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
1.	මිනිරන් ශුද්ධ කිරීම හෝ ගබඩා කිරීම	500 0	750 0	1,000 0
2.	පොහොර හෝ රසායනික පොහොර නිපදවීම හෝ විකිණීම	500 0	750 0	1,000 0
3.	සම් පදම් කිරීම	500 0	750 0	1,000 0
4.	සම් විකිණීමට තබා ගැනීම	500 0	750 0	1,000 0
5.	සත්ත්ව පාලනය (මස්, බිත්තර, හෝ කිරි සඳහා)	500 0	750 0	1,000 0
6.	උම්බලකඩ නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
7.	රබර් නිෂ්පාදනය කිරීම හෝ රබර් රොටී තබා ගැනීම	500 0	750 0	1,000 0
8.	පශු වෛද්‍ය ගිලන්හලක් පැවැත්වීම	500 0	750 0	1,000 0
9.	තොග වශයෙන් විකිණීම සඳහා නරක්වන සුළු කෑම වර්ග හෝ ආහාර ද්‍රව්‍ය තබා ගැනීම	500 0	750 0	1,000 0
10.	කරවල, ලුණු මාළු හෝ ජාඩි කිලෝග්‍රෑම් 150 කට වැඩි ප්‍රමාණයක් තබා ගැනීම	500 0	750 0	1,000 0
11.	මාළු හෝ මස් ජාඩි දැමීම හෝ වේළීම හෝ අයිස් දැමීම	500 0	750 0	1,000 0
12.	පොල්කටු අඟුරු හෝ දූව අඟුරු නිපදවීම	500 0	750 0	1,000 0
13.	දුම්කොළ වියළීම	500 0	750 0	1,000 0
14.	සත්ත්ව ආහාර නිපදවීම	500 0	750 0	1,000 0
15.	පුන්නක්කු නිපදවීම	500 0	750 0	1,000 0
16.	සත්ත්ව මාංස හෝ ලේ පැසවීම	500 0	750 0	1,000 0
17.	සබන් නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
18.	සත්ත්ව ඇටකටු ඇඹරීම හෝ තබා ගැනීම	500 0	750 0	1,000 0
19.	ට්‍රන්ක් පෙට්ටි සෑදීම	500 0	750 0	1,000 0
20.	අළුත් ලෝහ හෝ පරණ ලෝහ තබා ගැනීම	500 0	750 0	1,000 0
21.	ලෝහ සුන්බුන් තබා ගැනීම	500 0	750 0	1,000 0

අනු. අංක	බලය දෙනු ලබන කාර්යය	*I වන තීරය*	*II වන තීරය* පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකම	
		රු. 750 නොඉක්මවන අවස්ථාවක	රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක	රු. 1,500 ඉක්මවන අවස්ථාවක
		රු. ශත	රු. ශත	රු. ශත
22.	ගෘහ භාණ්ඩ නිපදවීම	500 0	750 0	1,000 0
23.	වේවැල් භාණ්ඩ නිපදවීම	500 0	750 0	1,000 0
24.	වඩු කර්මාන්ත ශාලාවක් පැවැත්වීම	500 0	750 0	1,000 0
25.	සිරප් හෝ පළතුරු බීම නිපදවීම	500 0	750 0	1,000 0
26.	රස කැවිලි නිපදවීම	500 0	750 0	1,000 0
27.	පොල් ලෙලි පෙගවීම (හෝ පල් කිරීම)	500 0	750 0	1,000 0
28.	බුරුසු වර්ග නිපදවීම (දත් බුරුසු හැර)	500 0	750 0	1,000 0
29.	දත් බුරුසු නිපදවීම	500 0	750 0	1,000 0
30.	රා එකතු කිරීම	500 0	750 0	1,000 0
31.	විනාකිරි නිපදවීම	500 0	750 0	1,000 0
32.	දූව ඉරීම	500 0	750 0	1,000 0
33.	පින්තාරු තීන්ත, වාර්නිෂ් හෝ ඩිස්ටෙම්පර් නිපදවීම	500 0	750 0	1,000 0
34.	සෝඩා නිපදවීම	500 0	750 0	1,000 0
35.	කෙඳි සායම් කිරීම	500 0	750 0	1,000 0
36.	සම් භාණ්ඩ නිපදවීම	500 0	750 0	1,000 0
37.	පළතුරු, මාළු හෝ වෙනත් ආහාර වර්ග ටින්වල ඇසිරීම	500 0	750 0	1,000 0
38.	කෝපි, ධාන්‍ය වර්ග ටින්වල ඇසිරීම	500 0	750 0	1,000 0
39.	බේකින් පවුඩර් නිපදවීම	500 0	750 0	1,000 0
40.	ගෑස් මැන්ටල් නිපදවීම	500 0	750 0	1,000 0
41.	පොටි නිපදවීම	500 0	750 0	1,000 0
42.	ඉටිපන්දම් නිපදවීම	500 0	750 0	1,000 0
43.	කපුරු නිපදවීම	500 0	750 0	1,000 0
44.	ලියන තීන්ත, අච්චු තීන්ත, හෝ ස්ටෙන්සිල් තීන්ත නිපදවීම	500 0	750 0	1,000 0
45.	රෙදි සෝදන නිල් නිපදවීම	500 0	750 0	1,000 0
46.	ලාකඩ නිපදවීම	500 0	750 0	1,000 0
47.	සුවඳ විලවුන් නිපදවීම	500 0	750 0	1,000 0
48.	පාසැල් රට හුණු නිපදවීම	500 0	750 0	1,000 0
49.	ටයර් හෝ ටියුබ් නිපදවීම	500 0	750 0	1,000 0
50.	ටයර් නැවත පිරවීම	500 0	750 0	1,000 0
51.	ටයර් ටියුබ් වෝල්කනයිසින් කිරීම	500 0	750 0	1,000 0
52.	සිමෙන්ති නිපදවීම	500 0	750 0	1,000 0
53.	සිමෙන්ති භාණ්ඩ හෝ ඇස්බැස්ටෝස් සිමෙන්ති භාණ්ඩ නිපදවීම	500 0	750 0	1,000 0
54.	වැලි කඩදාසි නිපදවීම	500 0	750 0	1,000 0
55.	ප්ලාස්ටික් භාණ්ඩ නිපදවීම	500 0	750 0	1,000 0
56.	ගඩොල් පිළිස්සීම	500 0	750 0	1,000 0
57.	යන්ත්‍රානුසාරයෙන් රෙදි විවීම	500 0	750 0	1,000 0
58.	අම්ල නිෂ්පාදනය හෝ නැවත ඇතිරීම	500 0	750 0	1,000 0
59.	උළු නිපදවීම	500 0	750 0	1,000 0
60.	පොහොර හුණු පිටි හෝ වෙනත් ද්‍රව්‍යයන් දමා තිබූ ගෝනි පිරිසිදු කොට විකිණීම	500 0	750 0	1,000 0
61.	යන්ත්‍රානුසාරයෙන් සිමෙන්ති බ්ලොක් ගල් නිපදවීම	500 0	750 0	1,000 0

උපලේඛන අංක 02

අන්තරාදායක ව්‍යාපාර :

අනු. අංක	*බලය දෙනු ලබන කාර්යය*	*I වන තීරය*	*II වන තීරය පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකම*	
		රු. 750 වැඩි නොවන විට	*රු. 750ට වැඩි නමුත් රු. 1,500ට වැඩි නොවන විට*	*රු. 1,500ට වැඩි වන විට*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
1.	කළුගල් කැණීම හෝ කැඩීම	500 0	750 0	1,000 0
2.	එළවළු තෙල් නිෂ්පාදනය	500 0	750 0	1,000 0
3.	පොල්තෙල් නිෂ්පාදනය	500 0	750 0	1,000 0
4.	ගිනි පෙට්ටි නිෂ්පාදනය හෝ ගබඩා කිරීම	500 0	750 0	1,000 0
5.	මෙතිලේටඩ් ස්ප්‍රීතු නිෂ්පාදනය	500 0	750 0	1,000 0
6.	තේ පෙට්ටි නිපදවීම	500 0	750 0	1,000 0
7.	කොහු හෝ වෙනත් කෙඳි වර්ග නිපදවීම	500 0	750 0	1,000 0
8.	කොහු හෝ වෙනත් කෙඳි වර්ගවලින් භාණ්ඩ නිපදවීම	500 0	750 0	1,000 0
9.	පිදුරු තබා ගැනීම	500 0	750 0	1,000 0
10.	පාවිච්චි කරන ලද ඇඳුම් ගබඩා කිරීම	500 0	750 0	1,000 0
11.	ස්වර්ණාභරණ නිෂ්පාදනය හෝ අළුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
12.	යන්ත්‍රානුසාරයෙන් ලී ඉරීම	500 0	750 0	1,000 0
13.	හිරිගල් හෝ හුණුගල් කැණීම	500 0	750 0	1,000 0
14.	යන්ත්‍රෝපකරණ පාවිච්චි කරන කම්හලක් පැවැත්වීම	500 0	750 0	1,000 0
15.	හිස් ගෝනි හෝ හිස් බෝතල් තබා ගැනීම	500 0	750 0	1,000 0
16.	පාපැදි හෝ යතුරුපැදි අළුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
17.	පාවිච්චි කරන ලද කඩදාසි හෝ පත්තර තබා ගැනීම	500 0	750 0	1,000 0
18.	විසිතුරු පින්තාරු කිරීම	500 0	750 0	1,000 0
19.	ගිණිකෙළි භාණ්ඩ හෝ රතිඤ්ඤු ගබඩා කිරීම	500 0	750 0	1,000 0
20.	යන්ත්‍රෝපකරණ, ආයුධ, උපකරණ නිපදවීම	500 0	750 0	1,000 0

උපලේඛනය අංක 03

අප්‍රසන්න හා අන්තරාදායක ව්‍යාපාර :

අනු. අංක	*බලය දෙනු ලබන කාර්යය*	*I වන තීරය*	*II වන තීරය පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකම*	
		රු. 750 වැඩි නොවන විට	*රු. 750ට වැඩි නමුත් රු. 1,500ට වැඩි නොවන විට*	*රු. 1,500ට වැඩි වන විට*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
1.	තලාතු මිනිරන් ශුද්ධ කිරීම	500 0	750 0	1,000 0
2.	රසායනික ද්‍රව්‍ය පාවිච්චි කර කුරුඳු, කරදමුංගු, එනසාල් හෝ කෙඳි වර්ග සකස් කිරීම	500 0	600 0	1,000 0
3.	ඩ්‍රයික්ලීන් කිරීම හෝ සායම් දැමීම	500 0	750 0	1,000 0
4.	රෙදි මුද්‍රණය කිරීම හෝ සායම් දැමීම හෝ බතික් කිරීම	500 0	750 0	1,000 0
5.	විද්‍යුත් ලෝහ ආලේපනය කිරීම	500 0	750 0	1,000 0
6.	තෙල් හෝ සත්ත්ව මේද නිපදවීම	500 0	750 0	1,000 0

අනු. අංක	බලය දෙනු ලබන කාර්යය	I වන තීරය	II වන තීරය පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකම	
		රු. 750ට වැඩි නොවන විට	රු. 750ට වැඩි නමුත් රු. 1,500ට වැඩි නොවන විට	රු. 1,500ට වැඩි වන විට
		රු. ශත	රු. ශත	රු. ශත
7.	හුණුගල් හෝ හිරිගල් නිපදවීම	400 0	700 0	1,000 0
8.	ගිණිකෙළි භාණ්ඩ හෝ රතිඤ්ඤ, නිපදවීම	500 0	750 0	1,000 0
9.	මෝරතෙල් සකස් කිරීම	500 0	750 0	1,000 0
10.	බෝට්ටු තැනීම	500 0	750 0	1,000 0
11.	බැටරි විද්‍යුත් ආරෝපණය හෝ අලුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
12.	ලෝහ වර්ග පෑස්සීම	500 0	750 0	1,000 0
13.	මෝටර් වාහන අලුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
14.	මෝටර් වාහන සේවා කිරීම	500 0	750 0	1,000 0
15.	යන්ත්‍රානුසාරයෙන් ලෝහ කුඩු කිරීම	500 0	750 0	1,000 0
16.	වාත්තු මඩුවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
17.	බෙලෙක් වැඩපලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
18.	මෝටර් වාහන බොඩි තැනීම	500 0	750 0	1,000 0
19.	කෘමිනාශක, දිලීර නාශක, පැළෑටි නාශක හෝ පළිබෝධ නාශක නිපදවීම හෝ නැවත පිරවීම	500 0	750 0	1,000 0
20.	විෂබීජ නාශක නිපදවීම	500 0	750 0	1,000 0
21.	මදුරු දඟර නිපදවීම	500 0	750 0	1,000 0

උපලේඛනය අංක 04

අනු. අංක	වෙනත් අතුරු ව්‍යවස්ථා යටතේ වන ව්‍යාපාර	I වන තීරය	II වන තීරය පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකම	
		රු. 750ට වැඩි නොවන විට	රු. 750 ට වැඩි නමුත් රු. 1,500 වැඩි නොවන විට	රු. 1,500ට වැඩි වන විට
1.	ලැගුම්හලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
2.	හෝටලයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
3.	බත් කඩයක්, ආපන ශාලාවක්, තේ, කෝපි කඩයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
4.	බේකරියක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
5.	කිරි පට්ටියක් හෝ කිරි වෙළෙඳාමක් කිරීම	500 0	750 0	1,000 0
6.	මාළු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
7.	මස් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
8.	ලොන්ඩරියක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
9.	අයිස්ක්‍රීම් කර්මාන්තශාලාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
10.	ගෝඝාතකාගාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
11.	කොණ්ඩ සැලුන් හා බාබර් සැලුන් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
12.	සිසිල් බීම කර්මාන්තශාලාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
13.	පෞද්ගලික වෙළෙඳසැලක් හෝ වෙනත් බලයලත් ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
14.	සංචාරක වෙළෙඳාම	500 0	750 0	1,000 0
15.	ග්‍රැමෆෝන් සහ ශබ්ද විකාශන යන්ත්‍ර ක්‍රියාකරවීම	500 0	750 0	1,000 0

කුරුණෑගල ප්‍රාදේශීය සභාව

2019 වර්ෂය සඳහා කර්මාන්ත බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 වන වගන්තියේ (1) වන උපවගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව, කුරුණෑගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2019 වර්ෂයට අදාළව කර්මාන්ත බදු නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට 2018 වර්ෂයෙහි සැප්තැම්බර් මස 20 වැනි දින පවත්වන ලද කුරුණෑගල ප්‍රාදේශීය සභා මහා සභා රැස්වීමේදී තීරණ අංක 06 යටතේ පහත සඳහන් යොජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

ආර්. පී. අචල නිමන්ත වික්‍රමතිලක,
සභාපති,
කුරුණෑගල ප්‍රාදේශීය සභාව.

2018 සැප්තැම්බර් මස 20 වැනි දින,
කුරුණෑගල ප්‍රාදේශීය සභාවේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 වන වගන්තියේ (1) වන උපවගන්තියෙන් කුරුණෑගල ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව කුරුණෑගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත යම් පරිශ්‍රයක පවත්වාගෙන යනු ලබන මෙහි පහත උපලේඛනයෙහි I වන තීරුවේ නිරූපිත සෑම කර්මාන්තයක් සම්බන්ධයෙන් එම පරිශ්‍රයේ 2018 වර්ෂයේ වාර්ෂික වටිනාකම මත පහත උපලේඛනයෙහි II වන තීරුවේ අනුරූප සටහනේ නිරූපිත ප්‍රමාණයක කර්මාන්ත බද්දක් 2019 වර්ෂය සඳහා නියම විය යුතු බවටත්, එකී කර්මාන්ත බද්දට යටත් තැනැත්තකු 2019 වර්ෂයේ අප්‍රේල් මස 30 දිනට පෙර බද්ද කුරුණෑගල ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවටත් කුරුණෑගල ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

උපලේඛනය

I වන තීරුව		*II වන තීරුව* *පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකම*		
	කර්මාන්තය	*රු. 750 නොඉක්මවන අවස්ථාවක*	*රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1,500 ඉක්මවන අවස්ථාවක*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
1.	වී තම්බා කොටන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
2.	පානීය ජලය බෝතල්කර අලෙවි කිරීම	500 0	750 0	1,000 0
3.	යන්ත්‍රානුසාරයෙන් උළු නිෂ්පාදනය	500 0	750 0	1,000 0
4.	ගඩොල් නිෂ්පාදනය කර අලෙවි කිරීමේ කර්මාන්තයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
5.	පොල්තෙල් නිෂ්පාදනය කර අලෙවි කිරීමේ කර්මාන්තයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
6.	සිසිල්බීම නිෂ්පාදනය කර අලෙවි කිරීමේ කර්මාන්තයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
7.	පාවහන් නිෂ්පාදනය කර අලෙවි කිරීමේ කර්මාන්තයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
8.	බුරුසු නිෂ්පාදනය කර අලෙවි කිරීමේ කර්මාන්තයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

	I වන තීරුව	*II වන තීරුව* *පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකම*		
	කර්මාන්තය	*රු. 750 නොඉක්මවන අවස්ථාවක*	*රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1,500 ඉක්මවන අවස්ථාවක*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
9.	දුව පදම් කිරීමේ කර්මාන්තයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
10.	සුදු යකඩ අත් වැටවල් නිෂ්පාදනය කර අලෙවි කිරීමේ කර්මාන්තයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
11.	අත් යන්ත්‍ර රෙදි නිෂ්පාදනය කර අලෙවි කිරීම	500 0	750 0	1,000 0
12.	ප්ලාස්ටික් භාණ්ඩ නිෂ්පාදනය	500 0	750 0	1,000 0
13.	කොහුබත් කැට ආශ්‍රිත නිෂ්පාදන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
14.	පොල් ලෙලි කැබලි (කටර්) සකස් කිරීමේ කර්මාන්තයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
15.	පොල් ලී නිෂ්පාදනය සහ විකිණීමේ කර්මාන්තයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

12 - 153/4

කුරුණෑගල ප්‍රාදේශීය සභාව

2019 වර්ෂය සඳහා ව්‍යාපාර බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වන වගන්තියේ (1) වන උපවගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව, කුරුණෑගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2019 වර්ෂයට අදාළව ව්‍යාපාර බදු නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට 2018 වර්ෂයෙහි සැප්තැම්බර් මස 20 වැනි දින පවත්වන ලද කුරුණෑගල ප්‍රාදේශීය සභා මහා සභා රැස්වීමේදී තීරණ අංක 07 යටතේ පහත සඳහන් යොජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

ආර්. පී. අචල නිමන්ත වික්‍රමතිලක,
සභාපති,
කුරුණෑගල ප්‍රාදේශීය සභාව.

2018 සැප්තැම්බර් මස 20 වැනි දින,
කුරුණෑගල ප්‍රාදේශීය සභාවේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වන වගන්තියේ (1) වන උපවගන්තියෙන් කුරුණෑගල ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව එකී පනතේ හෝ ඒ යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබා ගැනීම හෝ එම පනතේ 150 වන වගන්තිය යටතේ යම් බද්දක් ගෙවීම අවශ්‍ය නොවන්නා වූ යම් ව්‍යාපාරයක් කුරුණෑගල ප්‍රාදේශීය සභා ප්‍රදේශය ඇතුළත 2019 වර්ෂයේ දී පවත්වාගෙන යන සෑම තැනැත්තෙක්ගෙන්ම එම ව්‍යාපාරයේ 2018 වර්ෂයේ ආදායම මෙහි පහත උපලේඛනයෙහි I වන තීරුවේ නිරූපිත යම් විෂයාංක සීමාවන් ඇතුළත පවතින අවස්ථාවක එකී II වන තීරුවේ අනුරූප සටහනේ නිරූපිත අනුප්‍රමාණයක ව්‍යාපාර බද්දක් 2019 වර්ෂය සඳහා නියම විය යුතු බවටත්, එකී ව්‍යාපාර බද්දට යටත් තැනැත්තකු 2019 වර්ෂයේ අප්‍රේල් මස 30 දිනට පෙර බද්ද කුරුණෑගල ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවටත් කුරුණෑගල ප්‍රාදේශීය සභාවට යෝජනා කරන්නීය.

උපලේඛනය

I තීරුව	*II වන තීරුව*
2018 වර්ෂයේ දී ව්‍යාපාරයේ ආදායම	*රු. ශත*
රු. 6,000 නොඉක්මවන අවස්ථාවක	කිසිවක් නොමැත
රු. 6,000 ඉක්මවන එහෙත් රු. 12,000 නොඉක්මවන අවස්ථාවක	90 0
රු. 12,000 ඉක්මවන නමුත් රු. 18,750 නොඉක්මවන විට	180 0
රු. 18,750 ඉක්මවන නමුත් රු. 75,000 නොඉක්මවන විට	360 0
රු.75,000 ඉක්මවන නමුත් රු. 150,000 නොඉක්මවන විට	1,200 0
රු. 150,000 ඉක්මවන විට	3,000 0

12 - 153/5

කුරුණෑගල ප්‍රාදේශීය සභාව

2019 වර්ෂය සඳහා වාහන හා සත්ව බදු

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 හා 148 වගන්තිවල විධිවිධාන ප්‍රකාරව කුරුණෑගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2019 වර්ෂයට අදාළව වාහන හා සත්ව බදු නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට 2018 වර්ෂයෙහි සැප්තැම්බර් මස 20 වැනි දින පවත්වන ලද කුරුණෑගල ප්‍රාදේශීය සභා මහා සභා රැස්වීමේදී තීරණ අංක 08 යටතේ පහත සඳහන් යොජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

ආර්. පී. අචල නිමන්ත වික්‍රමතිලක,
සභාපති,
කුරුණෑගල ප්‍රාදේශීය සභාව.

2018 සැප්තැම්බර් මස 20 වැනි දින,
කුරුණෑගල ප්‍රාදේශීය සභාවේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 හා 148 වන වගන්තිවලින් කුරුණෑගල ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර කුරුණෑගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත 2019 වර්ෂයේදී පහත උපලේඛනයෙහි I වන තීරුවේ සඳහන් කිසියම් වාහනයක් හෝ සතෙකු තමා සන්තකයේ තබා ගන්නා සෑම තැනැත්තකු ම එහි II වන තීරුවේ සඳහන් අනුප්‍රමාණයක වාහන හා සත්ව බද්දක් 2019 වර්ෂය සඳහා නියම විය යුතු බවටත් එකී වාහන හා සත්ව බද්දට යටත් තැනැත්තකුම විසින් එකී වාහනය හෝ සතා තමන් භාරයේ තබා ගන්නා දින ගණන දින තිහක් සම්පූර්ණ වූ වහාම 2019 වර්ෂය සඳහා වන මෙම බද්ද කුරුණෑගල ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවටත් කුරුණෑගල ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

උපලේඛනය

I වන තීරුව			*II වන තීරුව* *රු. ශ.*
(1)	(i)	මෝටර් රථයක්, මෝටර් ට්‍රයිකාරයක්, මෝටර් ලොරියක්, මෝටර් සයිකලයක්, කරත්තයක්, ජීන් රික්ෂෝවක්, බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් නොවන සෑම වාහනයක් සඳහා	25 0

	I වන තීරුව	*II වන තීරුව*
		රු. ශ.
(ii)	සෑම බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් හෝ බයිසිකල් කාරයක් හෝ බයිසිකල් කරත්තයක් සඳහා -	
	(අ) වෙළෙඳ කාර්යයක් සඳහා යොදවන්නේ නම්	18 0
	(ආ) වෙළෙඳ නොවන කාර්යයක් සඳහා යොදවන්නේ නම්	4 0
(iii)	සෑම කරත්තයක් සඳහා	20 0
(iv)	සෑම අත් කරත්තයක් සඳහා	10 0
(v)	සෑම රික්ෂෝවක් සඳහා	7 50
(vi)	සෑම අශ්වයෙකු, පෝනියෙකු හෝ කොටළුවෙකු සඳහා	15 0
(vii)	සෑම ඇතෙකු සඳහා	50 0

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර එකී පනතේ හෝ ඒ යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබා ගැනීම හෝ එම පනතේ 150 වැනි වගන්තිය යටතේ යම් බද්දක් ගෙවීම අවශ්‍ය නොවන්නා වූ යම් ව්‍යාපාරයක් බුත්තල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත 2019 වර්ෂයේ පවත්වාගෙන යනු ලබන සෑම තැනත්තෙකුගෙන් ම එම ව්‍යාපාරයේ 2018 වර්ෂයේ ආදායම මෙහි පහත උපලේඛනයෙහි (I) වැනි තීරුවේ නිරූපිත යම් විෂයාංකයක සීමාවන් ඇතුළත පවතින අවස්ථාවක එකී උපලේඛනයේ දෙවැනි තීරුවේ අනුරූප සටහනේ නිරූපිත අනුප්‍රමාණයක ව්‍යාපාර බද්දක් 2019.01.01 දින සිට පනවා අය කළ යුතු බව 2018.10.18 දින පැවති බුත්තල ප්‍රාදේශීය සභා මාසික රැස්වීමේ දී යෝජනා ස්ථිරත්වයෙන් සභා සම්මත වූ බව මෙයින් නිවේදනය කරමි.

නිකවත්තේ නන්දසිරි,
සභාපති,
බුත්තල ප්‍රාදේශීය සභාව.

2018 දෙසැම්බර් මස 04 වැනි දින,
බුත්තල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

උපලේඛනය I

	I වැනි තීරුව	*II වැනි තීරුව*
	2018 වර්ෂයේ ආදායම	*රු. ශත*
1.	රු. 6,000 නොඉක්මවන අවස්ථාවක	කිසිවක් නැත
2.	රු. 6,001 සිට රු. 12,000 දක්වා	90 0
3.	රු. 12,001 සිට රු. 18,750 නොඉක්මවන විට	180 0
4.	රු. 18,751 සිට රු. 75,000 නොඉක්මවන විට	360 0
5.	රු. 75,001 සිට රු.1,50,000 නොඉක්මවන විට	1,200 0
6.	රු. 1,50,001 සිට ඉහළට	3,000 0

උපලේඛනය II

ව්‍යාපාර බදු

01. කොන්ත්‍රාත්කරුවන්.
02. මුදල් ණයට දෙන්නන් (රජයේ හා පෞද්ගලික).
03. මුදල් ආයෝජකයින් (බැංකු).
04. වෙන්දේසිකරුවන් හා තැරැව්කරුවන්.
05. විදුලි බලයෙන් ක්‍රියා කරන මුද්‍රණාලයක් පවත්වාගෙන යාම
06. ලොතරැයි ටිකට් නියෝජිතවරුන්.
07. පුද්ගලික බස්රථ නියෝජිතවරුන්.
08. කුළී රථ අයිතිකරුවන්.
09. රැකියා ඒජන්තවරුන්.
10. කොමිස් ඒජන්තවරුන්.
11. ප්‍රචාරක නියෝජිතවරුන්.
12. මෝටර් රථ වාහන අලෙවි කරුවන්.
13. මැණික් වෙළෙන්දන්.
14. බැංකු හෝ රක්ෂණ නියෝජිතවරුන්.
15. ඉන්ධන පිරවුම්හල් නියෝජිතවරුන්.
16. සැපයුම්කරුවන් (හුණුගල්, කළු ගල්).
17. උකස් බඩු ගන්නා ස්ථානයක් පවත්වාගෙන යාම.
18. අනෙකුත් ව්‍යාපාරික නියෝජිතවරුන්.
19. ලිහිසි තෙල් නියෝජිතවරුන්.
20. තාවකාලික අලෙවි ප්‍රවර්ධන කටයුතු
21. ක්‍රීඩා සමාජ පවත්වාගෙන යාම.
22. රියැදුරු පුහුණු ආයතනයක් පවත්වාගෙන යාම.
23. පෞද්ගලික බෙහෙත් ශාලාවක් පවත්වාගෙන යාම.
24. පෞද්ගලික තැපැල් හලක් පවත්වාගෙන යාම.
25. මත්පැන් විකුණන ස්ථානයක් පවත්වාගෙන යාම. (අවසර ලත්)
26. පරිගණක පුහුණු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
27. ගිණුම් සේවා සපයන ස්ථානයක් පවත්වාගෙන යාම.
28. සන්නිවේදන සේවා සපයන ආයතනවල නියෝජිතවරුන්.
29. මෙම වගන්තිය යටතේ ව්‍යාපාර බදු ගෙවිය යුතු බවට බුත්තල ප්‍රාදේශීය සභාව විසින් නියම කරනු ලබන ඇතැම් සීමිත සමාගම්.
30. සම්ප්‍රේෂණ කුළුණු.
31. යන්ත්‍රෝපකරණ කුළී පදනම මත ලබාදීම.
32. අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය බෙදහැරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම.

33. යන්ත්‍රානුසාරයෙන් නිෂ්පාදනය කරන හඳුන්කුරු අලෙවි කරන ව්‍යාපාරයක් පවත්වාගෙන යාම.
34. රසායනාගාරයක් පවත්වාගෙන යාම.
35. විශ්‍රාම ශාලා පවත්වාගෙන යාම.
36. කාමර පහසුකම් ලබාදීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම (කාමර 03ක් සඳහා රු. 1,200.00 කාමර 03ට වැඩි රු. 3,000.00)
37. වැලි ගඩොල් ගබඩා කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම.
38. ගෘහ නිර්මාණ හා උද්‍යාන ශිල්පී ආයතනයක් පවත්වාගෙන යාම.
39. පෞද්ගලික අධ්‍යාපන ආයතන පවත්වාගෙන යාමේ ව්‍යාපාරයක්.
40. විදේශ රැකියා නියෝජිත ආයතනයක් පවත්වාගෙන යාම.
41. ලී බඩු වෙළඳසලක් පවත්වාගෙන යාම.
42. ගෘහ භාණ්ඩ විකිණීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම.
43. සාප්පු බඩු වෙළඳසැලක් පවත්වාගෙන යාම.
44. ඡායාරූප ශාලාවක් පවත්වාගෙන යාම.
45. ගොඩනැගිලි ද්‍රව්‍ය (ව.අ. 1000ට අඩු රු. 1200.00 ව.අ. ව.අ. 1000ට වැඩි රු. 3000.00 ව.අ.) විකිණීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම.
46. පිඟන් බඩු විකිණීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම.
47. ධාන්‍ය මිලදී ගැනීම හා විකිණීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම.
48. මහන මැෂින් අමතර කොටස් විකිණීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම.
49. විදුලි උපකරණ විකිණීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම.
50. පරිගණක උපාංග විකිණීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම.
51. වාහන අමතර කොටස් විකිණීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම.
52. යතුරු පැදි හා පාපැදි විකිණීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම.
53. මසා නිමකළ ඇඳුම් විකිණීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම.
54. පත්තර, සඟරා, පාසල් උපකරණ විකිණීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම.
55. බුලත් පුවක් විකිණීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම.
56. සිමෙන්ති ගබඩා කිරීමේ හා විකිණීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම.
57. තැඹිලි හා කුරුම්බා විකිණීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම.
58 ඉංග්‍රීසි බෙහෙත් අලෙවි කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම (ෆාමසි)
59 විසිතුරු මැටි බඳුන් අලෙවි සැලක් පවත්වාගෙන යාම
60 ශබ්ද විකාශන යන්ත්‍ර හා උත්සව භාණ්ඩ කුළියට දීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම
61 දුරකතන ඇමතුම් සේවා සපයන ව්‍යාපාරයක් (කොමියුනිකේෂන්) සඳහා
62 අඟුරු සඳහා දැව පොල් කටු දැමීම හෝ අඟුරු ගබඩා කිරීමේ ව්‍යාපාරයක් සඳහා
63 ටයර් හෝ ටියුබ් වෝල්කනයිස් කරන ව්‍යාපාරයක් සඳහා
64 කොට්ට පුළුන්, කපු පුළුන් විකිණීමේ ව්‍යාපාරයක් සඳහා
65 ශරීර සුවතා ආයතනයක් පවත්වාගෙන යාම
66 බෝල මේස ක්‍රීඩා කරන ව්‍යාපාරයක් පවත්වාගෙන යාම
67 නොතාරිස් කාර්යාලයක් පවත්වාගෙන යාම
68 පොල් ලී අලෙවිකරන ස්ථානයක් පවත්වාගෙන යාම
69 ජෝතිෂ්‍ය කාර්යාලයක් පවත්වාගෙන යාම
70 පාවහන් විකිණීමේ හා ගබඩා කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම
71 ගුවන් විදුලි, රූපවාහිනී යන්ත්‍ර විකිණීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම
72 ගුවන් විදුලි, රූපවාහිනී යන්ත්‍ර අළුත්වැඩියා කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම
73 සිගරැට් තොග වෙළෙඳ ස්ථානයක් පවත්වාගෙන යාම
74 ලොතරැයි ටිකට් පත් විකිණීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම
75 දන්ත චිකිත්සාගාරයක් සඳහා
76 වෙළෙඳ ප්‍රචාරක දැන්වීම් සැපයීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
77 ටයර් ටියුබ් අලෙවි කරන ව්‍යාපාරයක් පවත්වාගෙන යාම
78 දැව විකුණන ව්‍යාපාර ස්ථානයක් පවත්වාගෙන යාම
79 ගීත පටිගත කරන ව්‍යාපාර ස්ථානයක් පවත්වාගෙන යාම
80 මනාලියන් හැඩගැන්වීමේ ව්‍යාපාර ස්ථානයක් පවත්වාගෙන යාම
81 උත්සව ශාලාවක් පවත්වාගෙන යාම

82 පිත්තල භාණ්ඩ විකිණීමේ ව්‍යාපාර ස්ථානයක් පවත්වාගෙන යාම
83 ගෙවතු පිරිසිදු කිරීමේ/අලංකරණය කිරීමේ සේවා සපයන ව්‍යාපාරයක් පවත්වාගෙන යාම
84 කොන්ක්‍රීට් පෙරසැරි භාණ්ඩ අලෙවිය හා නිෂ්පාදනය කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම
85 උත්සව භාණ්ඩ කුළියට ලබා දීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම
86 කොන්ක්‍රීට් මිශ්‍රණ අලෙවි කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම

12 - 525/3

බුත්තල ප්‍රාදේශීය සභාව

ප්‍රචාරක දැන්වීම් දෘශ්‍ය පරිසරය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122(1) වගන්තියෙන් බුත්තල ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල අනුව 1988.08.23 දින අංක 520/7 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළාත් පාලනය භාර ගරු ඇමතිතුමා විසින් අනුමත කොට ප්‍රකාශයට පත්කර ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවේ 39 වැනි ඡේදය යටතේ වූ ප්‍රචාරක දැන්වීම් (බැනර් ආදිය) ඉදිකිරීම් හා ප්‍රදර්ශනය කිරීම වෙනුවෙන් පහත උපලේඛනයේ දක්වෙන ගාස්තු ප්‍රමාණයෙන් 2019.01.01 වැනි දින සිට පනවා අය කළ යුතු බව 2018.10.18 දින පැවති බුත්තල ප්‍රාදේශීය සභා මාසික රැස්වීමේදී යෝජනා ස්ථිරත්වයෙන් සභා සම්මත වූ බව මෙයින් නිවේදනය කරමි.

නිකවත්තේ නන්දසිරි,
සභාපති,
බුත්තල ප්‍රාදේශීය සභාව.

2018 දෙසැම්බර් මස 04 වැනි දින,
බුත්තල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

උපලේඛනය

විස්තරය	*රු. ශත*
01. ස්ථිර ප්‍රචාරක දැන්වීමක් සඳහා බිත්තියක හෝ පුවරුවක ප්‍රදර්ශනය කරනු ලබන විට වර්ග අඩියකට හෝ ඉන් කොටසක් සඳහා	
එක් කාර්තුවක් සඳහා	25 0
වර්ෂයක් සඳහා	100 0
02. තාවකාලික ප්‍රචාරක දැන්වීමක් සඳහා බැනරයක් වශයෙන් ප්‍රදර්ශනය කරනු ලබන විට වර්ග අඩියකට හෝ ඉන් කොටසකට -	
මසකට (වර්ග අඩියකට)	50 0
මාස 03කට (වර්ග අඩියකට)	65 0
මාස 6ට (වර්ග අඩියකට)	75 0
03. චිත්‍රපටි පෙන්වීම සම්බන්ධ එක් ප්‍රචාරක දැන්වීමක් හෝ වෙනත් ප්‍රචාරක බැනරයක් සඳහා වර්ග අඩියකට හෝ ඉන් කොටසකට -	
මසකට (වර්ග අඩියකට)	50 0
මාස 03කට (වර්ග අඩියකට)	65 0
මාස 6 ට වැඩි (වර්ග අඩියකට)	75 0
04. LED නාමපුවරු වර්ග අඩි 1 ක් සඳහා මාස 03 කට	250 0
මාස 06 කට	500 0
වසරකට	700 0

12 - 525/4

බුත්තල ප්‍රාදේශීය සභාව

2019 වර්ෂය සඳහා රථවාහන හා සතුන් පිළිබඳ බද්ද

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 148 වැනි වගන්තිය යටතේ මෙහි පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් අනු ප්‍රමාණයන් අනුව වාහන හා සතුන් පිළිබඳ බද්දක් බුත්තල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ සීමාව තුළ 2019.01.01 දින සිට නියම කර අය කිරීමට තීරණය කළ බව එකී පනතේ 147 වැනි වගන්තිය ප්‍රකාර මෙයින් දැනුම් දෙන අතර, එකී පනතේ 148(3) වැනි වගන්තිය ප්‍රකාර මෙම මුදල 2019 මාර්තු මස 31 වැනි දිනට පෙර ගෙවිය යුතු බවට 2018.10.18 දින පැවති බුත්තල ප්‍රාදේශීය සභා මාසික රැස්වීමේදී යෝජනා ස්ථිරත්වයෙන් සභා සම්මත වූ බව මෙයින් නිවේදනය කරමි.

නිකවත්තේ නන්දසිරි,
සභාපති,
බුත්තල ප්‍රාදේශීය සභාව.

2018 දෙසැම්බර් මස 04 වැනි දින,
බුත්තල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

උපලේඛනය

		රු. ශත
01.	මෝටර් රථයක්, මෝටර් ට්‍රයි කාරයක්, මෝටර් බයිසිකලයක්, කරත්තයක්, මෝටර් ලොරියක්, ජීප් රික්ෂෝවක්, බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් නොවන සෑම වාහනයක් සඳහා	25 0
02.	සෑම බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් හෝ බයිසිකල් කාරයක් හෝ කරත්තයක් සඳහා -	
	(අ) වෙළෙඳ කාර්යයන් සඳහා යොදවන්නේ නම්	18 0
	(ආ) වෙළෙඳ කාර්යයන් නොවන කාර්යයන් සඳහා යොදවන්නේ නම්,	
	නියමිත බලපත්‍ර ගාස්තුව	4 0
	ලිපි ද්‍රව්‍ය ගාස්තු	6 0
03.	සෑම කරත්තයක් සඳහා	10 0
04.	සෑම අත්කරත්තයක් සඳහා	20 0
05.	සෑම රික්ෂෝවක් සඳහා	10 0
06.	සෑම අශ්වයකු, පෝනියකු, කොටළුවකු සඳහා	7 50
07.	සෑම අලියෙකු සහ ඇතකු සඳහා	50 0

බුත්තල ප්‍රාදේශීය සභාව

ඉඩම් විකිණීම මත බදු අය කිරීම - 2019

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 154(1) වගන්තිය ප්‍රකාරව, බුත්තල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ යම් ඉඩමක් වෙන්දේසි කරුවෙකු හෝ ඔහුගේ සේවකයා හෝ අනු නියෝජිතයා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ හෝ අන්‍යාකාරයෙන් විකුණනු ලබන අවස්ථාවක ඒ ඉඩම් විකිණීමෙන් ලත් මුදලින් සියයට එකක (1%) සමාන බද්දක් විකුණුම්කරු හෝ වෙන්දේසිකරු හෝ තැරැව්කරු හෝ ඔහුගේ සේවකයන් හෝ අනුගාමිකයන් විසින් 2019.01.01 දින සිට බුත්තල ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවට 2018.10.18 දින පැවති බුත්තල ප්‍රාදේශීය සභා මාසික රැස්වීමේදී යෝජනා ස්ථිරත්වයෙන් සභා සම්මත වූ බව මෙයින් නිවේදනය කරමි.

නිකවත්තේ නන්දසිරි,
සභාපති,
බුත්තල ප්‍රාදේශීය සභාව.

2018 දෙසැම්බර් මස 04 වැනි දින,
බුත්තල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

12 - 525/6

බුත්තල ප්‍රාදේශීය සභාව

ප්‍රසිද්ධ රඟ දැක්වීමේ ආඥාපනත යටතේ බලපත්‍ර ගාස්තු පැනවීම

ප්‍රසිද්ධ රඟ දැක්වීමේ ආඥාපනත යටතේ (176 වැනි අධිකාරය) 3 වැනි වගන්තිය ප්‍රකාරව බුත්තල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පවත්වනු ලබන සියළුම වේදිකා නාට්‍ය. චිත්‍රපට දර්ශන, සංගීත සංදර්ශන, සර්කස් සංදර්ශන හා වෙනත් සංදර්ශන සඳහා මෙහි පහත උපලේඛනයේ දැක්වෙන බලපත්‍ර ගාස්තු 2019.01.01 දින සිට පනවා අයකිරීමට 2018.10.18 දින පැවති බුත්තල ප්‍රාදේශීය සභා මාසික රැස්වීමේදී යෝජනා ස්ථිරත්වයෙන් සභා සම්මත වූ බව මෙයින් නිවේදනය කරමි.

නිකවත්තේ නන්දසිරි,
සභාපති,
බුත්තල ප්‍රාදේශීය සභාව.

2018 දෙසැම්බර් මස 04 වැනි දින,
බුත්තල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

උපලේඛනය

01. එක් දිනකට හෝ දින තුන නොඉක්මවන විට	රු. 500 0
02. දින තුන ඉක්මවන සෑම දිනයකටම හෝ ඉන් කොටසකට	රු. 100 0

12 - 525/7

බුත්තල ප්‍රාදේශීය සභාව

වරිපනම් බද්ද - 2019

බුත්තල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ දියුණු ගම් ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත්කර ඇති කොටසේ පිහිටියා වූ ද, වැල්ලවාය පාර, මොනරාගල පාර, කතරගම පාර, බඩල්කුඹුර පාර (පස්සර පාර) යන ප්‍රධාන මාර්ග දෙපස පිහිටියා වූ නිශ්චල දේපළ වාර්ෂික වටිනාකමින් 12%ක් ද, අනෙකුත් අතුරු මාර්ගවලින් 10%ක් ද, බැගින් වූ වරිපනම් බද්දක් 2019 වර්ෂය සඳහා, 2019 මාර්තු මස 31, ජූනි මස 30, සැප්තැම්බර් මස 30, දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වන අයුරින් කාර්තු 4 කින් ගෙවා අවසන් කළ යුතු පරිදි පනවා අයකිරීමටත්, මෙයට පෙර අයකළ තක්සේරුව පිළිගන්නා බවත්, 2019 වර්ෂය සඳහා වන සම්පූර්ණ වරිපනම් බදු 2019 වර්ෂයේ ජනවාරි මස 31 වැනි දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලය වෙත ගෙවනු ලැබුවහොත් එම සම්පූර්ණ වරිපනම් ප්‍රමාණයෙන් සියයට දහයක (10%) වට්ටමක් ලබා දීම සහ ඔබ කාර්තු වශයෙන් වරිපනම් ගාස්තු එම කාර්තුවේ මුල් මාසය ඇතුළත ගෙවීම් කරන්නේ නම් 5%ක වට්ටමක් ගෙවීම සුදුසු බවටත් 2018.10.18 දින පැවති බුත්තල ප්‍රාදේශීය සභා මාසික රැස්වීමේදී යෝජනා ස්ථිරත්වයෙන් සභා සම්මත වූ බව මෙයින් නිවේදනය කරමි.

නිකවත්තේ නන්දසිරි,
සභාපති,
බුත්තල ප්‍රාදේශීය සභාව.

2018 දෙසැම්බර් මස 04 වැනි දින,
බුත්තල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

12 - 525/8

බුත්තල ප්‍රාදේශීය සභාව

අක්කර බද්ද - 2019

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134(3) වැනි වගන්තියෙන් සැලසී ඇති විධිවිධාන පරිදි බුත්තල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ වරිපනම් බදු අයනොකරනු ලබන ප්‍රදේශවල පිහිටියා වූ ස්ථීර, නිතිපතා ගොවිතැන් යටතේ වූ ඉඩම්වලින් පහත උපලේඛනයේ සඳහන් ප්‍රමාණයන්ගෙන් යුත් අක්කර බද්දක් 2019.01.01 දින සිට පනවා අය කිරීමට තීරණය කර ඇති බව 2018.10.18 දින පැවති බුත්තල ප්‍රාදේශීය සභා මාසික රැස්වීමේදී යෝජනා ස්ථිරත්වයෙන් සභා සම්මත වූ බව මෙයින් නිවේදනය කරමි.

නිකවත්තේ නන්දසිරි,
සභාපති,
බුත්තල ප්‍රාදේශීය සභාව.

2018 දෙසැම්බර් මස 04 වැනි දින,
බුත්තල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

උපලේඛනය

	ඉඩම් ප්‍රමාණය	*බදු අනු ප්‍රමාණය වර්ෂයකට රු. ශත*
01.	ඉඩමේ ප්‍රමාණය හෙක්ටයාර් 5කට අඩු හෙක්ටයාර් 1ට නොඅඩුවන අවස්ථාවක දී එක් හෙක්ටයාරයකට	50 0
02.	ඉඩමේ ප්‍රමාණය හෙක්ටයාර් 5ක් හෝ ඊට වැඩිවන අවස්ථාවලදී එක් හෙක්ටයාරයකට	10 0

12 - 525/9

බුත්තල ප්‍රාදේශීය සභාව

රථ ගාල් ගාස්තු අය කිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126 ඌ උපවගන්තියට අනුව අතුරු ව්‍යවස්ථාවට අනුකූලව බුත්තල ප්‍රාදේශීය සභාව විසින් ස්ථාපිත කර ඇති බුත්තල, පැල්වත්ත, ඔක්කම්පිටිය නගරවල ඇති ත්‍රීවීල්, ට්‍රැක්ටර් රථ, වෑන් රථ, ලොරි රථ සහ අත්ට්‍රැක්ටර් රථ සඳහා සකස් කර ඇති වාහන ගාල් කිරීම නවතා තැබීම, පාලනය කිරීම සඳහා 2019.01.01 දින සිට පහත උපලේඛනයට අනුව ගාස්තු අය කිරීමට 2018.10.18 දින පැවැති බුත්තල ප්‍රාදේශීය සභා මාසික රැස්වීමේදී යෝජනා ස්ථිරත්වයෙන් සභා සම්මත වූ බව මෙයින් නිවේදනය කරමි.

නිකවත්තේ නන්දසිරි,
සභාපති,
බුත්තල ප්‍රාදේශීය සභාව.

2018 දෙසැම්බර් මස 04 වැනි දින,
බුත්තල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

උපලේඛනය

වාහන වර්ගය	*මසකට අය කරන ගාස්තුව රු. ශත*
ත්‍රීවීල් රථ	100 0
වෑන්රථ	250 0
ලොරි රථ	300 0
ට්‍රැක්ටර් රථ	300 0
අත් ට්‍රැක්ටර් රථ	150 0

දෛනික ජංගම වෙළෙඳාම සඳහා ගාස්තු අය කිරීම :

වෙළෙඳාම	*යතුරු පැදි රු. ශත*	*ත්‍රීවීල් රු. ශත*	*අනෙකුත් වාහන රු. ශත*
ජංගම මාළු වෙළෙඳාම	100 0	150 0	200 0
ජංගම පළතුරු වෙළෙඳාම	100 0	150 0	200 0
ජංගම රස කැවිලි හා බේකරි නිෂ්පාදන	100 0	150 0	200 0
ජංගම එළවළු වෙළෙඳාම හා වෙනත්	100 0	150 0	200 0

12 - 525/10

බුත්තල ප්‍රාදේශීය සභාව

පාරිසරික බලපත්‍ර ගාස්තු පැනවීම - 2019

1988 අංක 56 දරන ජාතික පාරිසරික පනතින් සංශෝධිත, 1980 අංක 47 දරන පාරිසරික පනතේ 26 වැනි වගන්තිය යටතේ ප්‍රාදේශීය සභාවලට පැවරී ඇති බලතල ප්‍රකාරව, බුත්තල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ කරනු ලබන යම් කර්මාන්තයක්, ව්‍යාපාරයක් සඳහා

පරිසර බලපත්‍රයක් ලබාගත යුතු යම් තැනැත්තෙකුගෙන් පහත උපලේඛනයේ සඳහන් පරිදි පරීක්ෂණ ගාස්තුවක් හා බලපත්‍ර ගාස්තුවක් 2019.01.01 දින සිට පනවා අය කළ යුතු බවටත්, එකී ගාස්තුව බලපත්‍රය ලබාගැනීමට පෙර බුත්තල ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවටත් 2018.10.18 දින පැවති බුත්තල ප්‍රාදේශීය සභා මාසික රැස්වීමේදී යෝජනා ස්ථිරත්වයෙන් සභා සම්මත වූ බව මෙයින් නිවේදනය කරමි.

නිකවත්තේ නන්දසිරි,
සභාපති,
බුත්තල ප්‍රාදේශීය සභාව.

2018 දෙසැම්බර් මස 04 වැනි දින,
බුත්තල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

උපලේඛනය

01. පරීක්ෂණ ගාස්තු - රු. 3,000ක අවමයක සිට රු. 10,000ක් දක්වා උපරිමයකට යටත් වේ. (කර්මාන්තයේ වර්ගය හා ප්‍රමාණය අනුව ගාස්තුව වෙනස් විය හැකි ය.)

02. බලපත්‍ර ගාස්තුව රු. 4,000.00කි.

12 - 525/11

බුත්තල ප්‍රාදේශීය සභාව

සහතික පත් හෝ සේවාවක් ලබාදීම සඳහා ගාස්තු අය කිරීම - 2019

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතින් ප්‍රාදේශීය සභාවලට පැවරී ඇති බලතල ප්‍රකාරව බුත්තල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පහත උපලේඛනයේ පළවන (I) වැනි තීරුවේ සඳහන් සහතිකයක් හෝ සේවාවක් ලබාදීම සඳහා එම උපලේඛනයේ (II) වැනි තීරුවේ ඒ ඒ සහතිකය හෝ සේවාව සැපයීම වෙනුවෙන් සඳහන් කර ඇති ගාස්තුව 2019.01.01 දින සිට පනවා අයකළ යුතු බවටත්, එකී සේවාව හෝ සහතිකය ලබා ගන්නා යම් තැනැත්තෙකු විසින් ඒ සේවාව හෝ සහතිකය ලබා ගැනීමට පෙර එම ගාස්තුව බුත්තල ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවට 2018.10.18 දින පැවති බුත්තල ප්‍රාදේශීය සභා මාසික රැස්වීමේදී යෝජනා ස්ථිරත්වයෙන් සභා සම්මත වූ බව මෙයින් නිවේදනය කරමි.

නිකවත්තේ නන්දසිරි,
සභාපති,
බුත්තල ප්‍රාදේශීය සභාව.

2018 දෙසැම්බර් මස 04 වැනි දින,
බුත්තල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

උපලේඛනය

	I වැනි තීරුව	*II වැනි තීරුව* *ගාස්තු ප්‍රමාණය* *රු. ශත*
1.	ඉඩම් සැලසුම් අනුමත කිරීමේ ගාස්තු	1,000 0
2.	අනුකූලතා සහතික නිකුත් කිරීමේ පරීක්ෂණ ගාස්තු	නාගරික සංවර්ධන අධිකාරියේ අංක 1597/8 හා 2009.04.17 දරන *අති විශෙෂ* ගැසට් පත්‍රය ප්‍රකාරව
3.	ගොඩනැගිලි අයදුම්පත්‍ර ගාස්තුව	500 0

I වැනි තීරුව		*II වැනි තීරුව* *ගාස්තු ප්‍රමාණය* *රු. ශත*
4.	ඉඩම් අනු කොටස්වලට බෙදීමේ අයදුම්පත්‍ර ගාස්තුව	300 0
5.	ගොඩනැගිලි අයදුම්පත්වල කාලය දීර්ඝ කිරීම සඳහා ගාස්තුව	500 0
6.	පෙරසැරි ගාස්තු	නාගරික සංවර්ධන අධිකාරියේ අංක 1597/8 හා 2009.04.17 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය ප්‍රකාරව*
7.	ඉඩම් කට්ටි සැලසුම් අනුමත කිරීම (පර්චස් එකක් සඳහා)	රු. 500 හා නාගරික සංවර්ධන අධිකාරියේ අංක 1597/8 හා 2009.04.17 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය ප්‍රකාරව*
8.	අනුමත ගොඩනැගිලි සැලසුම් සහතික කළ පිටපතක් ලබා ගැනීම සඳහා	රු. 1,000 0

12 - 525/12

බුත්තල ප්‍රාදේශීය සභාව

පුස්තකාල හා කියවීම් ශාලා පිළිබඳ අතුරු ව්‍යවස්ථාව යටතේ ගාස්තු අය කිරීම - 2019 වර්ෂය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122/1 වගන්තිය ප්‍රකාරව සකස් කොට අංක 3014 දරන හා 2017.12.15 වැනි දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* IV (ආ) කොටසේ පළකරන ලද පුස්තකාල හා කියවීම් ශාලා පිළිබඳ අතුරු ව්‍යවස්ථාව යටතේ පහත උපලේඛනයේ සඳහන් ප්‍රමාණයන් 2019.01.01 දින සිට පනවා අය කළ යුතු බවට බුත්තල ප්‍රාදේශීය සභාවේ සභාපති වශයෙන් 2018.10.18 දින පැවති බුත්තල ප්‍රාදේශීය සභා මාසික රැස්වීමේදී යෝජනා ස්ථිරත්වයෙන් සභා සම්මත වූ බව මෙයින් නිවේදනය කරමි.

නිකවත්තේ නන්දසිරි,
සභාපති,
බුත්තල ප්‍රාදේශීය සභාව.

2018 දෙසැම්බර් මස 04 වැනි දින,
බුත්තල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

උපලේඛනය

I වැනි තීරුව	*II වැනි තීරුව* *රු. ශත*
දඩ ගාස්තු	5 0
අළුත් කිරීමේ ගාස්තු	50 0
වැඩිහිටි සාමාජික ගාස්තු	150 0
ළමා සාමාජික ගාස්තු	50 0

12 - 525/13

බුත්තල ප්‍රාදේශීය සභාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122/1 වගන්ති ප්‍රකාරව සකස් කොට අංක 3014 දරන හා 2017.12.15 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* IV (ආ) කොටස පළ කරන ලද ජල ගාස්තු පිළිබඳ අතුරු ව්‍යවස්ථාව යටතේ පහත උපලේඛනයේ සඳහන් ප්‍රමාණයන් 2019.01.01 දින සිට පනවා අය කළ යුතු බවට බුත්තල ප්‍රාදේශීය සභාවේ සභාපති වශයෙන් 2018.10.18 දින පැවති බුත්තල ප්‍රාදේශීය සභා මාසික රැස්වීමේදී තීරණය මෙයින් නිවේදනය කරමි.

නිකවත්තේ නන්දසිරි,
සභාපති,
බුත්තල ප්‍රාදේශීය සභාව.

2018 දෙසැම්බර් මස 04 වැනි දින,
බුත්තල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

2019 වර්ෂයට මාළිගාවිල/ජනාවාස 09/11 ජල ව්‍යාපෘති දෙක සඳහා ජල ගාස්තු අය කිරීම

(01) ගෘහස්ථ කාර්යයන් සඳහා ජල ගාස්තු අයකිරීම පහත පරිදි වේ.

ඒකක	*ඒකකයකට අය කිරීම (රු. ශත)*
1 - 10	12.00
11 - 20	15.00
21 - 25	18.00
26 - 30	25.00
30 ට වැඩි සෑම ඒකකයකටම	55.00

* වාණිජ කාර්යයන් සඳහා ඒකකයකට රු. 65.00 බැගින් අය කරනු ලැබේ.
* ගෘහස්ථ හා වාණිජ කාර්යයන් සඳහා ස්ථාවර ගාස්තු වශයෙන් රු. 100.00 ක් අය කරනු ලැබේ.
* ඒකක 20ට වඩා වැඩියෙන් ජලය පාරිභෝජනය කරන්නේ නම්, 10% ක අධි ගාස්තුවක් අය කරනු ලැබේ.

(02) නව ජල සම්බන්ධතා ලබා දීමේ දී ඉල්ලුම්පත්‍ර ගාස්තු සඳහා රු. 50.00 ක් අය කරනු ලැබේ.

(03) මාළිගාවිල ජල ව්‍යාපෘතියෙන් නව ජල සම්බන්ධතාවයක් ලබා ගැනීමේදී රු. 10,000.00 ක මුදලක් ද ජනාවාස 9/11 ජල ව්‍යාපෘතියෙන් නව ජල සම්බන්ධතාවයක් ලබා ගැනීමේ දී රු. 8,000.00 ක මුදලක් ද අය කරනු ලැබේ.

(04)

* මනුවලට අනිසි ලෙස අත ගැසීම මනුවල මුද්‍රා කැඩීම හා අයථා පරිදි ජලය ලබා ගැනීම සඳහා ගෘහ අය කිරීමේ දඩය වශයෙන් රු. 2,000.00 ක් අය කෙරේ.
* මනුවලට අනිසි ලෙස අත ගැසීම, මනුවල මුද්‍රා කැඩීම හා අයථා පරිදි ජලය ලබා ගැනීම සඳහා වෙළෙඳ හා කාර්යාල සඳහා දඩය වශයෙන් රු. 5,000.00 ක් අය කෙරේ.
* බිල්පත් මාසිකව නොගෙවීමේ හේතුවෙන් විසන්ධි කිරීමෙන් අනතුරුව මසක් ඇතුළත ජල සම්බන්ධතාවය ලබා ගන්නේ නම් රු. 800.00 ක් ද මසකට පසු ජලසම්බන්ධතාවය ලබා ගන්නේ නම් රු. 2,500.00 ක්ද, යළි ඇමුණුම් ගාස්තු වශයෙන් අයකරනු ලැබේ.

(05) ජල බවුසර් සේවාව

* හිස් ට්‍රැක්ටර් බවුසරය (ලීටර් 3,000) දිනකට සැපයීම රු. 500.00
* හිස් ලොරි බවුසරය (ලීටර් 6,000) දිනකට රු. 4,000.00
  (යාමට සහ ඒමට කි.මී. 5 ක් ඇතුළත)
* කි.මී. 5 ට වැඩිවන සෑම කි. මීටරයකට ම රු. 100 බැගින්

(06) සභාව සතු යන්ත්‍රෝපකරණ සැපයීම වෙනුවෙන් ගාස්තු අය කිරීම

	රු. ශත
* මෝටර් ග්‍රේඩර් යන්ත්‍ර සැපයීම මීටර් පැය 01 ක් සඳහා ගමන් කාලය ඇතුළුව	4,800.00
* මාර්ග තලන යන්ත්‍රය සැපයීම මීටර් පැයක් සඳහා ගමන් කාලය ඇතුළුව	
ටොන් 8	3,680.00
ටොන් 14	4,680.00
* බැකෝ ලෝඩර් යන්ත්‍රය සැපයීම මීටර් පැය 01 සඳහා ගමන් කාලය ඇතුළුව	2,800.00
* ටිපර් රථ සැපයීම සඳහා ගාස්තු කියුබ් 03 මීටර් පැය 01 ක් සඳහා	1,500.00
* ටිපර් රථ සැපයීම සඳහා ගාස්තු කියුබ් 02 මීටර් පැය 01 ක් සඳහා	1,100.00

12 - 525/14

බුත්තල ප්‍රාදේශීය සභාව

කසල ශෝධනය පිළිබඳ අතුරු ව්‍යවස්ථාව යටතේ ගාස්තු අයකිරීම - 2019 වර්ෂය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122/01 වගන්තිය ප්‍රකාරව සකස් කොට අංක 3014 දරන හා 2017.12.15 වැනි දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ IV (ආ) කොටසේ පළකරන ලද කසල ශෝධනය පිළිබඳ අතුරු ව්‍යවස්ථාව යටතේ ගාස්තු පහත උපලේඛනයේ සඳහන් ප්‍රමාණයන් 2019.01.01 වැනි දින සිට පනවා අය කල යුතු බව බුත්තල ප්‍රාදේශීය සභාවේ සභාපති වශයෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව 2018.10.18 දින මාසික සභා රැස්වීමේදී ගන්නා ලද තීරණය මෙයින් නිවේදනය කරමි.

නිකවත්තේ නන්දසිරි,
සභාපති,
බුත්තල ප්‍රාදේශීය සභාව.

අය කරනු ලබන කසල ගාස්තු ප්‍රමාණය

අනු. අංකය	*ආයතනය මගින් දිනකට පළාත් පාලන ආයතන වෙත ලබා දෙනු ලබන කසල ප්‍රමාණය*	*මසකට අයකරනු ලබන ලබන ගාස්තු ප්‍රමාණය රු. ශත*
1.	කිලෝ 0-5 දක්වා	ගාස්තු අය නොකළ යුතුයි
2.	කිලෝ 5-10 දක්වා	350 0
3.	කිලෝ 10-20 දක්වා	400 0
4.	කිලෝ 20-30 දක්වා	600 0
5.	කිලෝ 30-50 දක්වා	1,000 0
6.	කිලෝ 50-100 දක්වා	2,000 0
7.	කිලෝ 100-150 දක්වා	3,000 0
8.	කිලෝ 150-200 දක්වා	4,000 0
9.	කිලෝ 200-300 දක්වා	6.000 0
10.	කිලෝ 300 ට වැඩි	7,500 0

යම් නිවසක හෝ ආයතනයක අපද්‍රව්‍ය බැහැරලීම සඳහා තක්සේරු ගාස්තු ගෙවා බැහැරවීමට සභාව සතු වාහන යෙදවීම ආදායම් පරීක්ෂකවරුන්ගේ තක්සේරු වාර්තාව අනුව ගාස්තු අයකර සේවා සැපයීම.

12 - 525/15

බුත්තල ප්‍රාදේශීය සභාව

නිශ්චල දේපළ කළමනාකරණය පිළිබඳ වූ සම්මන්ත්‍රණශාලා පිළිබඳ අතුරු ව්‍යවස්ථාව යටතේ ගාස්තු අය කිරීම - 2019 වර්ෂය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122/01 වගන්තිය ප්‍රකාරව සකස් කොට අංක 3014 දරන හා 2017.12.15 වැනි දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* IV (ආ) කොටසේ නිශ්චල දේපළ කළමනාකරණය පිළිබඳ වූ සම්මන්ත්‍රණශාලා පිළිබඳ අතුරු ව්‍යවස්ථාව යටතේ ගාස්තු පහත උපලේඛනයේ සඳහන් ප්‍රමාණයන් 2019.01.01 වැනි දින සිට පනවා අයකල යුතු බව බුත්තල ප්‍රාදේශීය සභාවේ සභාපති වශයෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව 2018.10.18 දින මාසික සභා රැස්වීමේදී ගන්නා ලද තීරණය මෙයින් නිවේදනය කරමි.

නිකවත්තේ නන්දසිරි,
සභාපති,
බුත්තල ප්‍රාදේශීය සභාව.

උපලේඛනය

I වැනි තීරුව	*II වැනි තීරුව* රු. ශත
සභා රැස්වීම් ශාලා වෙන්කිරීම එක් දිනකට	2,500 0
ප්‍රාදේශීය සභා සම්මන්ත්‍රණ ශාලාව රාජ්‍ය ආයතන හා පෙර පාසල් සඳහා දිනකට	3,000 0
මුදල් අයකරන පෞද්ගලික කටයුතු සඳහා දිනකට	7,000 0

I වැනි උපලේඛනය

ප්‍රාදේශීය සභාවේ පිහිටි ..... සම්මන්ත්‍රණ ශාලාව පරිහරණය සඳහා අවසර ලබා ගැනීමේ ඉල්ලුම් පත්‍රය

01. ඉල්ලුම්කරු/ආයතනයේ නම : .....
02. ලිපිනය : .....
03. ජා.හැ.අංකය. : .....
04. රැස්වීම් ශාලාව ඉල්ලුම් කරනු ලබන කාරණය :
05. අවශ්‍ය කරන දිනය හා වේලාව :

දින සිට	දින තෙක්	වේලාව
.....	.....	.....

06. ශාලාව භාවිත කිරීමට පිටතින් රැගෙන එන උපකරණ ලී බඩු හා ශබ්ද වාහිනී උපකරණ විස්තර
.....
.....

ඉහත සඳහන් කර ඇති තොරතුරු සියල්ල සත්‍ය හා නිවැරදි බවට සහතික කරමි. මේ ඉල්ලීම අනුව අදළ රැස්වීම් ශාලාව වෙන් කර දෙනු ලැබුවහොත් එම රැස්වීම් ශාලාවේ ගොඩනැගිලිවලට ඉදිකිරීම් වලට උපකරණවලට හා සවිකිරීම් වලට කිසියම් හානියක් සිදු වුවහොත් එහි අලාභය තැන්පත් මුදලින් ප්‍රාදේශීය සභාව විසින් අයකරන ගැනීමට එකඟ වන අතර එහි තැන්පත් මුදල ඒ අයකිරීම සඳහා ප්‍රමාණවත් නොවන විටක තවදුරටත් අවශ්‍ය වන මුදල් ප්‍රාදේශීය සභාවට ගෙවීමට එකඟ වෙමි. එසේම සම්මන්ත්‍රණ ශාලාව අධීක්ෂණය කිරීම හා පානය කිරීම පිළිබඳව අතුරු ව්‍යවස්ථා විධිවිධාන පිළිපැදීමට එකඟ වෙමි.

අත්සන : .....

දිනය : .....

බුත්තල ප්‍රාදේශීය සභාව

දඩාවතේ යන සතුන් පිළිබඳ අතුරු ව්‍යවස්ථාව යටතේ ගාස්තු අය කිරීම - 2019 වර්ෂය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122/01 වගන්තිය ප්‍රකාරව සකස් කොට අංක 3014 දරන හා 2017.12.15 වැනි දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ IV (ආ) කොටසේ පළකරන ලද දඩාවතේ යන සතුන් පිළිබඳ අතුරු ව්‍යවස්ථාව යටතේ ගාස්තු පහත උපලේඛනයේ සඳහන් ප්‍රමාණයන් 2019.01.01 වැනි දින පනවා අයකල යුතු බව බුත්තල ප්‍රාදේශීය සභාවේ සභාපති වශයෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව 2018.10.18 දින පැවති මාසික සභා රැස්වීමේදී ගන්නා ලද තීරණය මෙයින් නිවේදනය කරමි.

නිකවත්තේ නන්දසිරි,
සභාපති,
බුත්තල ප්‍රාදේශීය සභාව.

උපලේඛනය

I වැනි තීරුව	*II වැනි තීරුව*
	රු. ශත
අයාලේ යන ගවයින් ඇල්ලීම	1,000 0
ගාල් කර රැකබලා ගැනීම එක් දිනකට	500 0 බැගින්
රජයේ ගාස්තුව	2,000 0

12 - 525/17

බුත්තල ප්‍රාදේශීය සභාව

මාර්ගවල ගමන්කරන වාහනවල බර හා වේගය සීමා කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව යටතේ ගාස්තු අයකිරීම 2019 වර්ෂය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122/01 වගන්තිය ප්‍රකාරව සකස් කොට අංක 3014 දරන හා 2017.12.15 වැනි දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ IV (ආ) කොටසේ මාර්ගවල ගමන්කරන වාහනවල බර හා වේගය සීමා කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව යටතේ ගාස්තු පහත උපලේඛනයේ සඳහන් ප්‍රමාණයන් 2019.01.01 දින සිට පනවා අයකල යුතු බව බුත්තල ප්‍රාදේශීය සභාවේ සභාපති වශයෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව 2018.10.18 දින පැවති මාසික සභා රැස්වීමේදී ගන්නා ලද තීරණය මෙයින් නිවේදනය කරමි.

නිකවත්තේ නන්දසිරි,
සභාපති,
බුත්තල ප්‍රාදේශීය සභාව.

උපලේඛනය

ප්‍රාදේශීය සභා මාර්ගවල ගමනා ගමනය සඳහා අයදුම්පත්‍රය

01. ඉල්ලුම්කරුගේ නම : .....
02. ලිපිනය : .....
03. ජා.හැ.අංකය : .....
04. දුරකතන අංකය : .....
05. වාහන අංකය : .....
06. වාහනයේ බර : .....
07. ප්‍රවාහනය කරනු ලබන ද්‍රව්‍ය : .....
08. ද්‍රව්‍ය පැටවූ පසු සම්පූර්ණ බර : .....
09. ගමන් කරන මාර්ගය පිළිබඳ විස්තර : .....

රූප සටහන් මගින්

10. අයදුම්කරන අවසර පත්‍රය වලංගු විය යුතු කාල සීමාව

ආරම්භක දිනය : ..... අවසාන දිනය : .....

11. ප්‍රාදේශීය සභා මාර්ගවල ගමනාගමනය පාලනය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාවල නියමයන් සියල්ලම පිළිපදින බවටත් අවසර පත්‍රය මගින් ලැබී ඇති අවසරය පරිදි ක්‍රියාකරන බවටත් මෙයින් පෙරොන්දු වෙමි.

අයදුම්කරුගේ අත්සන : .....

දිනය : .....

2 වන උපලේඛනය

නියමිත බර සීමාව ඉක්මවා වාහන ධාවනය කිරීමේ අවසර පත්‍රය

01. සභාවේ නම : .....
02. බලපත්‍රධාරියාගේ නම : .....
03. බලපත්‍රධාරියාගේ ලිපිනය : .....
04. වාහනයේ අංකය : .....
05. ප්‍රවාහනය කරනු ලබන ද්‍රව්‍ය : .....
06. උපරිම මුළු බර ප්‍රමාණය : .....
07. අවසර පත්‍ර වලංගු කාල සීමාව : .....

	දිනය	*ආරම්භක වේලාව*	*අවසාන වේලාව*
1.	.....	.....	.....
2.	.....	.....	.....
3.	.....	.....	.....
4.	.....	.....	.....
5.	.....	.....	.....

අවසර පත්‍රයේ වංලගු මාර්ගයන් :

1. .....
2. .....
3. .....
4. .....
5. .....

.....
සභාපති

..... (ප්‍රාදේශීය සභාව)
නිල මුද්‍රාව

දිනය : .....

තුන්වෙනි උපලේඛනය

..... ප්‍රාදේශීය සභාව

	මාර්ගයේ නම	*දුර ප්‍රමාණය*	*උපරිම බර සීමාව*	*උපරිම වේග සීමාව*
1				
2				
3				
4				
5				
6				
7				
8				
9				
10				

උපලේඛනය

I වැනි තීරුව	*II වැනි තීරුව*	*වේග සීමාව*	*බර*
ගංගා වැලි ප්‍රවාහනය කියුබ් 01	රු. 100.00	පැයට කි.මී. 30	ටොන් 5ට අඩු
බොරළු ප්‍රවාහනය කියුබ් 01	රු. 100.00	පැයට කි.මී. 30	ටොන් 7ට අඩු
වෙනත් ඛනිජ සම්පත්	රු. 100.00	පැයට කි.මී. 30	ටොන් 5ට අඩු
දැව ප්‍රවාහනය ලොරි රථයකින්	රු. 500.00	පැයට කි.මී. 30	ටොන් 10ට අඩු
දැව ප්‍රවාහනය ට්‍රැක්ටරයකින්	රු. 250.00	පැයට කි.මී. 25	ටොන් 5ට අඩු

බුත්තල ප්‍රාදේශීය සභාව

මලාප්‍රවාහනය පිළිබඳ අතුරු ව්‍යවස්ථාව යටතේ ගාස්තු අය කිරීම - 2019 වර්ෂය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122/01 වගන්තිය ප්‍රකාරව සකස් කොට අංක 3014 දරන හා 2017.12.15 වැනි දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ IV (ආ) කොටසේ පළකරන ලද මලාප්‍රවාහනය පිළිබඳ අතුරු ව්‍යවස්ථාව යටතේ ගාස්තු පහත උපලේඛනයේ සඳහන් ප්‍රමාණයන් 2019.01.01 වැනි දින සිට පනවා අය කල යුතු බව බුත්තල ප්‍රාදේශීය සභාවේ සභාපති වශයෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව 2018.10.18 වැනි දින මාසික රැස්වීමේදී ගන්නා ලද තීරණය මෙයින් නිවේදනය කරමි.

නිකවත්තේ නන්දසිරි,
සභාපති,
බුත්තල ප්‍රාදේශීය සභාව.

2017 දෙසැම්බර් මස 04 වැනි දින,
බුත්තල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

උපලේඛනය

1 වැනි තීරුව	*2 වැනි තීරුව* *රු. ශත*
ගලි රථ සේවය බල ප්‍රදේශය තුළ සේවා සැපයීම	5,340 0
ගමන් කරන එක් කි.මී. සඳහා යෑම සහ ඒම පිළිබඳව	25 0
බල ප්‍රදේශයෙන් පිටත එක් ගලි රථයක් සඳහා	6,810 0
ගමන් කරන එක් කි.මී. සඳහා යෑම ඒම සහිතව	50 0

12 - 525/19

බුත්තල ප්‍රාදේශීය සභාව

බුත්තල ප්‍රාදේශීය සභා සීමාව තුළ ගොඩනැගිලි ඉදිකිරීම් සඳහා සැලසුම් පරීක්ෂා කිරීම සහ ගාස්තු අය කිරීම් පිළිබඳ අතුරු ව්‍යවස්ථාව යටතේ ගාස්තු අයකිරීම

2019 වර්ෂය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126 වන වගන්තියේ VIII වන උප වගන්තිය යටතේ ලැබී ඇති බලතල අනුව බුත්තල ප්‍රාදේශීය සභා සීමාව තුළ ගොඩනැගිලි ඉදිකිරීම් සඳහා වූ සැලසුම් පරීක්ෂා කිරීම සහ ගාස්තු අයකිරීම් පිළිබඳ වූ අතුරු ව්‍යවස්ථාව 2019 ජනවාරි 01 වැනි දින සිට ක්‍රියාත්මක කොට නාගරික සංවර්ධන අධිකාරිය විසින් ප්‍රකාශයට පත් කරන ලද දියුණු කලා යැයි හඳුනාගෙන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශේෂ* ගැසට් පත්‍ර අංක 442/17 දරන හා 1987.02.27 වැනි දින හා *ගැසට් පත්‍ර* අංක 455/21 දරන හා 1987.05.28 වැනි දින හා *ගැසට් පත්‍ර* වලින් ප්‍රකාශයට පත් කරන ලද බිම් කොටස් හැර ඉතිරි සෑම භූමි ප්‍රමාණයක් සඳහා ම මෙකී අතුරු ව්‍යවස්ථාව ක්‍රියාත්මක කොට ගොඩනැගිලි ඉදිකිරීම සඳහා වූ සැලසුම් පරීක්ෂා කිරීම සඳහා වූ සැලසුම් පරීක්ෂා කිරීම හා ගාස්තු අයකිරීම 2019.01.01 වැනි දින සිට ක්‍රියාත්මක වන බව බුත්තල ප්‍රාදේශීය සභාවේ සභාපති වශයෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව 2018.10.18 දින ගන්නා ලද මාසික සභා රැස්වීමේදී තීරණය මෙයින් නිවේදනය කරමි.

නිකවත්තේ නන්දසිරි,
සභාපති,
බුත්තල ප්‍රාදේශීය සභාව.

බුත්තල ප්‍රාදේශීය සභා සීමාව තුළ ගොඩනැගිලි ඉදිකිරීම් සඳහා වූ සැලසුම් පරීක්ෂා කිරීම සහ ගාස්තු අය කිරීම් පිළිබඳ වූ අතුරු ව්‍යවස්ථාව

01. මෙම අතුරු ව්‍යවස්ථාව සෑදීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126 VIII වගන්තිය යටතේ බලය ලැබී ඇත.

02. මෙම අතුරු ව්‍යවස්ථාව බුත්තල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ නිවාස හා නගර සංවර්ධන ආඥාපනතේ විධිවිධාන අදාළ වන බල ප්‍රදේශයන්හි ගොඩනැගිලි ඉදිකිරීම සඳහා සැලසුම් හා ගොඩනැගිලි ඉදිකිරීමට අදාළ ඉඩම් කොටස් සඳහා වන සැලසුම් පරීක්ෂා කිරීම සහ ඒ සම්බන්ධයෙන් ගාස්තු අයකිරීම සඳහා විධිවිධාන සැලසීම පිණිස පනවනු ලබයි.

03. මෙම අතුරු ව්‍යවස්ථාව බුත්තල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයන්හි ගොඩනැගිලි ඉදිකිරීම සහ ඉඩම් කොටස් සඳහා වූ සැලසුම් පරීක්ෂා කිරීම පිළිබඳ වූ අතුරු ව්‍යවස්ථාවයි.

04. බුත්තල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ යම් ඉඩමක පොළව අභ්‍යන්තරයට හෝ පොළොව මතුපිටට ඉදිකරනු ලබන සෑම ස්ථිර ඉදිකිරීමක් ම හා ඉදිකිරීමකට අදාළවන සෑම ඉඩම් කොටසක් ම නිවාස හා නගර සංවර්ධන ආඥාපනතේ විධිවිධානයන්ට අනුකූලව සභාපති විසින් අනුමත කරන ලද සැලැස්මකට අනුකූලවිය යුතුය.

05. බුත්තල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ යම් ඉඩමක ගොඩනැගිලි ඉදිකිරීම සම්බන්ධයෙන් සැලසුම් හා ඉඩම් කොටසකට හෝ ඉඩම් අනුබෙදුමකට අදාළ සැලැසුමක් අනුමත කරගැනීම සඳහා 1953 අංක 53 දරන සංශෝධිත පනතේ සංශෝධිත නිවාස හා නගර සංවර්ධන ආඥාපනතේ විධිවිධානයන්ට අනුව සකස් කරන ලද අයදුම්පත්‍රයක් යටතේ අයදුම් කල යුතු අතර, බුත්තල ප්‍රාදේශීය සභාව විසින් කලින් කලට සම්මත කරනු ලබන ගාස්තුවක් ගෙවා බුත්තල ප්‍රාදේශීය සභාව වෙතින් අදාළ අයදුම්පත්‍රය ලබාගත යුතුය.

06. 1953 අංක 53 දරන සංශෝධිත පනතින් සංශෝධිත නිවාස හා නගර සංවර්ධන ආඥාපනතට අනුකූලව ගොඩනැගිලි ඉදිකිරීම් සැලැස්මක් සඳහා වූ සෑම අයදුම් පත්‍රයක් ම එම ආඥාපනත යටතේ අනුමත කරන ලද ඉඩම් කොටස් සඳහා ම විය යුතුය.

07. ඉහත 06 වන වගන්තිය අනුව ඉදිරිපත් කරනු ලබන සෑම අයදුම්පත්‍රයකට ම අදාළ වූ සැලසුම් බුත්තල ප්‍රාදේශීය සභාව විසින් තීරණය කරන ලද සංයුතියකින් යුත් කමිටුවක් විසින් පරීක්ෂා කර බැලිය යුතුය.

08. 07 වන වගන්තියෙහි සඳහන් කාර්යයන් සඳහා සභාව විසින් කලින් කලට යෝජනා සම්මුතියන් මගින් තීරණය කරනු ලබන ගාස්තුවක් අය කිරීම නිත්‍යානුකූලව වන්නේය.

09. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ ගොඩනැගිලි ඉදිකිරීම හා ඉඩම් කොටසක් හෝ අනුබෙදුමක් සඳහා වන සැලසුම් පරීක්ෂා කිරීම, අදාළ සැලැස්ම අනුමත කිරීම නිවාස හා නගර සංවර්ධන ආඥාපනත හා ඒ යටතේ සාදන ලද රෙගුලාසිවලට අනුකූලව විය යුතුය.

10. අනුමැතිය සඳහා ඉදිරිපත් කරනු ලබන සෑම සැලැසුම් අයදුම්පත්‍රයක්ම සම්බන්ධයෙන් ම බුත්තල ප්‍රාදේශීය සභාව වෙත ලැබී දින 30 ක් ඇතුළත ඊට අදාළ අනුමැතිය හෝ එය ප්‍රතික්ෂේප කරන්නේ නම් ඊට අදාළ හේතු සහිතව තීරණය අයදුම්කරු වෙත ලිඛිතව දැන්විය යුතුය.

11. ඉහත 07 වන වගන්තියෙහි කමිටුවෙහි කාර්යය සඳහා ඊට අදාළ සංයුතියෙහි සාමාජිකයින් වෙනුවෙන් අතිරේක පරිශ්‍රමිකයක් සභාව විසින් තීරණය කරන ලදුව අදාළ පළාතේ පළාත් පාලන කොමසාරිස්ගේ අනුමැතිය ඇතිව ගෙවීම නිත්‍යානුකූල වන්නේය.

12. මෙම අතුරු ව්‍යවස්ථාවේ 05 වන වගන්තිය යටතේ ඉදිරිපත් වන අයදුම්පත්‍රය, ඉදිකිරීම සඳහා අදාළ ඉඩම් කොටස් අනුමත කර ගැනීම සඳහා වන අයදුම්පත්‍රයක් වන විටදී අනුබෙදුමට අදාළ වන සම්පූර්ණ ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර් 1 ක් හෝ ඊට වඩා වැඩි වන විට දී හා එම ඉඩම්, ඉඩම් කොටස් අටක් (8) හෝ ඊට වඩා වැඩි ප්‍රමාණයකට අනුබෙදුම් වන විට දී, අනුබෙදුමට අදාළ මාර්ග සඳහා වෙන්කර ඇති ප්‍රමාණය හැර ඉතිරි ප්‍රමාණයන් අදාළ ඉඩමේ පොදු පහසුකම් වශයෙන් බුත්තල ප්‍රාදේශීය සභාව වෙත තෑගි කර හිමිකර දිය යුතුය.

13. මෙම අතුරු ව්‍යවස්ථාවේ කවර හෝ විධිවිධානයක් හෝ උල්ලංඝනය කිරීම වරදක් වන අතර, වරද සම්බන්ධයෙන් නිසි බලය ඇති අධිකරණයක් මගින් ඒ වරදට වරදකරු කරනු ලැබූ විට නියම කළ හැකි උපරිම දඩය සහ එම කඩකිරීම හෝ උල්ලංඝනය නොකඩවා තවදුරටත් කරගෙන යන විටක ඒ පිළිබඳව වරදකරු කිරීමෙන් පසුව හෝ එම උල්ලංඝනය ගැන අවධානය යොමු කරමින් සභාපතිවරයා විසින් හෝ බලයලත් වෙනත් නිලධාරියෙකු විසින් ලිඛිත දැන්වීමක් භාර දෙනු ලැබීමෙන් පසුව කඩ කිරීමෙන් හෝ උල්ලංඝනය තවදුරටත් නොකඩවා කරගෙන යන සෑම එක් දිනයක් සඳහා ම නියම කළ හැකි අතිරේක දණ්ඩනයේ උපරිමය පිළිවෙළින් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වැනි වගන්තියෙහි (2) වන උපවගන්තියෙන් නියම කර ඇති උපරිම දඩ මුදල හා අතිරේක දණ්ඩනයේ උපරිම විය යුතු ය.

14. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස ;
සභාව යන්නෙන් බුත්තල ප්‍රාදේශීය සභාව ද,
සභාපති යන්නෙන් බුත්තල ප්‍රාදේශීය සභාවේ සභාපති ද,
තැනැත්තා යන්නෙන් යම් පුද්ගලයකු හේ සංස්ථාගත කරන ලද හෝ නොකරන ලද පුද්ගල මණ්ඩලයක් ද අදහස් වේ.

බුත්තල ප්‍රාදේශීය සභා සීමාව තුළ ගොඩනැගිලි ඉදිකිරීම් සඳහා සැලසුම් පරීක්ෂා කිරීම සහ අය කිරීම් පිළිබඳ අතුරු ව්‍යවස්ථා

V වැනි උපලේඛනය

සංවර්ධන අවසර පත්‍ර ලබා ගැනීම සඳහා පෙරසැරි ගාස්තු, ආවරණ අනුමැතිය දීම සඳහා ගාස්තු සහ සේවා ගාස්තු :

සංවර්ධන කාර්යයේ ස්වභාවය	*භාවිතා කළ යුතු ආකෘති පත්‍රය*	*අයකළ යුතු ගාස්තු*
1. සංවර්ධන අවසර පත්‍ර නිකුත් කිරීම	පෙරසැරි ගාස්තු	
I. ඉඩම් අනු කොටස්වලට බෙදීම "අ"	(i.) බිම් කට්ටි ප්‍රමාණය	එක් බිම් කට්ටියකට අය කළ යුතු මුදල (මාර්ග කාණු හා පොදු බිම් කොටස් හැර)
	* ව.මී 150-300 අතර	රු. 500/-
	* ව.මී 301-600 අතර	රු. 400/-
	* ව.මී 601-900 අතර	රු. 300/-
	* ව.මී 900 ට වැඩි	රු. 200/-

II. ගොඩනැගිලි ඉදිකිරීම/ පවත්නා ගොඩනැගිලිවලට අලුතින් කොටසක් එකතු කිරීම/නැවත ඉදිකිරීම "ආ"	(ii.) *ගෙබිමේ විශාලත්වය* වර්ග මීටරවලින්	*පදිංචිය සඳහා* රු.	*වානිජ හෝ වෙනත් භාවිත* රු.
	45ට අඩු	500/-	1,000/-
	45-90	1,500/-	2,000/-
	91-180	2,500/-	3,000/-
	181-270	3,500/-	4,000/-
	271-450	4,500/-	6,000/-
	451-675	5,500/-	8,000/-
	676-900	6,500/-	10,000/-
	901-1225	7,500/-	12,000/-
	1225 ට වැඩි	7,500/-	12,000/-
	ව.මී 1,226න් පසු සෑම ව.මී. 90 ක් සඳහාම රු. 1,000/- බැගින්		ව.මී. 1,226 ඉක්මවීමෙන් පසු සෑම ව.මී. 90ක් සඳහාම රු. 1,250/- බැගින්

සංවර්ධන කාර්යයේ ස්වභාවය	*භාවිතා කළ යුතු ආකෘති පත්‍රය*	*අයකළ යුතු ගාස්තු*
III. මායිම් තාප්ප/ ආරක්ෂක බැමි ඉදිකිරීම	(iii.) නේවාසික දික් මීටර 1 ක් සඳහා ගාස්තුව :	වාණිජ හා වෙනත් වර්ග දික් මීටර 1 ක් සඳහා :
* ගොඩනැගිලි සීමාවෙන් පිටත		රු. 300/-	රු. 400/-
* ගොඩනැගිලි සීමාව තුළ		රු. 500/-	රු. 600/-
IV. ඉඩම්/කුඹුරු ගොඩකිරීම	(iv.) ව.මී. 150 ට අඩු රු. 1,500 ක් සහ එයට වැඩි සෑම ව.මී. 150කට රු. 1,000 බැගින්	
V. දුරකථන කුළුණු/ඇන්ටෙනා කුළුණු ඉදි කිරීම	(v.) උස මීටර් 5-20 දක්වා රු. 20,000 ක් සහ එයට වැඩිවන සෑම වර්ග මීටර් එකකටම රු. 100 බැගින්	
VI. විශේෂ ව්‍යාපෘති සඳහා සංවර්ධන බලපත්‍ර නිකුත් කිරීම	(vi.) රුපියල් මිලියන 5කට රු. 5,000 සහ වැඩිවන සෑම රුපියල් මිලියන එකකට රු. 100 බැගින්	

2. නේවාසික සඳහා වූ ඒකකයකට භාවිතය වෙනස් කිරීම "ආ"

පෙරසැරි ගාස්තු

1. ගෙබිම් ප්‍රමාණය (වර්ග මීටර)	*රු. ශත*
45ට අඩු	5,00.00
45-90	1,000.00
91-180	1,250.00
181-270	1,500.00
271-450	1,750.00
451-675	2,000.00
676-900	2,250.00
900 ට වැඩි	වර්ග මීටර් 901 ට වැඩිවන එක් එක් වර්ග මීටර් 90 සඳහා රු. 500 බැගින්

3. මූලික සැළසුම් නිරාකරණ අනුමැතිය

I. ඉඩම් අනුබෙදුම් සඳහා "ඇ"	* වර්ග මීටර 1,000ට අඩු ඉඩම් සඳහා	රු. 2,000.00
	* වර්ග මීටර 1,001-5,000 දක්වා	රු. 5,000.00
	* වර්ග මීටර 5,001-10,000 දක්වා	රු.10,000.00
	සෑම වර්ග මීටර් 1,000 කටම රු. 1,000 බගින්	
II. ගොඩනැගිලි ඉදිකිරීම/ අලුතින් එකතු කිරීම/නැවත ඉදි කිරීම "ඇ"	1. *නේවාසික*	*වාණිජ හා වෙනත්*
	රු. 2,000.00	රු. 5,000.00
	රු 1,500.00	රු. 3,000.00
	ව.මී 150ට අඩු ඉඩම් සඳහා	රු. 2,500.00
III. මායිම් තාප්ප/ආරක්ෂක බැමි ඉදිකිරීම "ඇ"	* ව.මී 151 සිට 300 දක්වා	රු. 5,000.00
	* ව.මී 301 ට වැඩි වන සෑම ව.මී 150 කටම	රු. 3,000.00 බැගින්
IV. ඉඩම්/කුඹුරු ගොඩකිරීම සඳහා "ඇ"	1. * උස මීටර් 5-20 දක්වා	රු. 20,000.00

සංවර්ධන කාර්යයේ ස්වභාවය	*භාවිතා කළ යුතු ආකෘති පත්‍රය*	*අයකළ යුතු ගාස්තු*
V. දුරකථන/විදුලි සංදේශ කුළුණු "ඇ"	රු. 1,000 බැගින්	
VI. විශේෂ සංවර්ධන ව්‍යාපෘති "ඇ"	1. * කුඩා පරිමාණ රුපියල් මිලියන 5 ට අඩු වන ව්‍යාපෘති * මධ්‍යම පරිමාණ රුපියල් මිලියන 5-50 අතර ව්‍යාපෘති * මහා පරිමාණ රුපියල් මිලියන 50 ට වැඩි වන ව්‍යාපෘති	රු. 10,000.00 රු. 50,000.00 රු. 1,50,000.00
4. අනුකූලතා සහතික නිකුත් කිරීම (සෑම ඉදිකිරීමක්/සංවර්ධනයක් සඳහාම අනුකූලතා සහතිකය ලබා ගත යුතුය) "ඈ"	අනුකූලතා සහතික ප්‍රදානය කිරීමේ ගාස්තු :	
I. ඉඩම් අනු බෙදුම්	1. පළමු බිම් කොටසකට රු. 1,000/- ක් හා ඊට වැඩිවන සෑම බිම් කට්ටියකටම රු. 500/- බැගින්	
II. * නේවාසික ඉදි කිරීම් * වාණිජ හා වෙනත් ඉදිකිරීම්	ii. *ව.මී. 300 ට අඩු රු. 3,000 සහ ඊට වැඩිවන සෑම ව.මී. 1 කට රු. 10 බැගින් *ව.මී. 100ට අඩු රු. 3,000 සහ ඊට වැඩිවන සෑම ව.මී. 1 කටම රු. 20.00 බැගින්	
III. මායිම්/තාප්ප/ආරක්ෂක බැම් ඉදිකිරීම	iii. පළමු දිග මීටර 100 සඳහා රු. 1,000 ක් සහ ඊට වැඩිවන සෑම ව.මී. 1 කටම රු. 10 බැගින්	
IV. ඉඩම්/කුඹුරු ඉඩම් ගොඩකිරීම	iv. ව.මී. 150ට අඩු රු. 3,000 සහ ඊට වැඩිවන සෑම ව.මී. 1 කටම රු. 20/- බැගින්	
V. දුරකථන/විදුලි සංදේශ කුළුණු	v. උස මීටර 5 සිට 20 දක්වා රු. 20,000 සහ ඊට වැඩිවන සෑම මීටර 1 කට රු. 100/- බැගින්	
VI. විශේෂ ව්‍යාපෘති	vi. * කුඩා පරිමාණ සඳහා * මධ්‍යම පරිමාණ සඳහා * මහා පරිමාණ සඳහා	රු. 5,000.00 රු. 10,000.00 රු. 20,000.00
5. මෝටර් රථ නවතා තැබීමේ ස්ථාන (නා.සං.අධිකාරි නියෝග යටතේ සංවර්ධන ස්ථානය තුළ නියම කර ඇති නමුත් සපයා නැති එක් මෝටර් රථයක් නවතා තබන ස්ථාන සඳහා සේවා ගාස්තු)	සේවා ගාස්තු * සැහැල්ලු වාහන හා කාර් * ලොරි * කන්ටේනර් ඇතුළු විශාල වාහන * සියලුම වාහන සඳහා * සියලු වාහන සඳහා	 රු. 5,00,000.00 රු. 10,00,000.00 රු. 25,000,000.00 රු. 5,00,000.00 රු. 2,50,000.00
i කොළඹ මහ නගර සභාව		
ii වෙනත් මහ නගර සභා		
iii නගර සභා, ප්‍රාදේශීය සභා		

සංවර්ධන කාර්යයේ ස්වභාවය	*භාවිතා කළ යුතු ආකෘති පත්‍රය*	*අයකළ යුතු ගාස්තු*
6. ආවරණ අනුමැතිය ලබා දීම	ආවරණ අනුමැතිය ලබා දීම සඳහා ගාස්තු	
I. නිසි බලපත්‍රයක් නොමැති ඉඩම් අනුබෙදුම් කිරීම	එක් එක් බිම් කොටස් සඳහා රු. 750 ක ගාස්තුවක්	
II. නිසි සංවර්ධන බලපත්‍රයකින්/ තොරව ගොඩනැගිලි ඉදිකිරීම/ කොටස් එකතු කිරීම/නැවත ඉදිකිරීම	*නේවාසික ව.මී. 1 ක් සඳහා ගාස්තු*	*වාණිජ හා වෙනත් ව.මී. 1 ක් සඳහා ගාස්තු*
ඉදිකිරීමේ අදියර		
* අත්තිවාරම් වැඩ පමණක් (කයිරු මට්ටම) සම්පූර්ණකොට ඇති විට	රු. 200	රු. 500
* වහල මට්ටම දක්වා (වහලය රහිතව) ඉදිකොට ඇති විට	රු. 300	රු. 1,000
* වහලය ඇතුළුව ඉදිකොට ඇති විට	රු. 400	රු. 1,500
* සම්පූර්ණයෙන් ඉදිකොට ඇති විට	රු. 500	රු. 2,000
III. මායිම් තාප්ප/ආරක්ෂිත බැම්ම ඉදි කිරීම	රු. 400 සෑම වර්ග මීටර් 150 කට රු 5,000 බැගින් උස සෑම මීටර් 5 කට රු. 10,000 බැගින්	රු. 400
IV. ඉඩම්/කුඹුරු ගොඩ කිරීම සඳහා		
V. දුරකථන/විදුලි සංදේශ කුළුණු සඳහා	සෑම උස මීටර් 5 කට රු. 10,000 බැගින්	
VI. විශේෂ සංවර්ධන ව්‍යාපෘති	සෑම මීටර් මිලියන 5 කටම රු. 10,000 බැගින්	
VII. අනුකූලතා සහතිකය නොමැතිව පදිංචි වීම/භාවිතා කිරීම හෝ ප්‍රයෝජනයට ගැනීම	එක් දිනකට රු. 50 බැගින්	

තවලම ප්‍රාදේශීය සභාව

2019 වර්ෂය සඳහා ව්‍යාපාර බදු පැනවීම

තවලම ප්‍රාදේශීය සභාවේ 2018.09.18 පැවති මාසික මහා සභා රැස්වීමේ දී සභා තීරණ අංක 3,xii,a යටතේ පහත තීරණය සභා සම්මත වූ බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

බන්දුල විජේසේකර,
සභාපති,
තවලම ප්‍රාදේශීය සභාව.

2018 ඔක්තෝබර් මස 05 වැනි දින,
තවලම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

තීරණය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වගන්තියේ -

(අ) 1 වන උපවගන්තියේ පැවරී ඇති බලතල ප්‍රකාරව තවලම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ මෙහි උපලේඛනයේ පළමුවන කොටසේ නිරූපිත යම් ව්‍යාපාරයක් 2019 වර්ෂයේ දී පවත්වාගෙන යනු ලබන සෑම තැනැත්තෙකු මත, එකී ව්‍යාපාරයේ 2018 වර්ෂයේ ආදායම දෙවන කොටසේ (I) වන තීරයේ නිරූපිත යම් සීමාවක් ඇතුළත පවත්නා අවස්ථාවක (II) වන තීරයේ අනුරූප සටහනේ නිරූපිත අනුප්‍රමාණ අනුව වූ බද්දක් පනවා අය කිරීමට ;

සහ

(ආ) (3) වන උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර බද්දට යටත් සෑම තැනැන්තෙකු විසින් යථෝක්ත බද්ද 2019 වර්ෂයේ අප්‍රේල් මස 01 වැනි දිනට ප්‍රථම ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබිය යුතු යැයි නියම කිරීමට තවලම ප්‍රාදේශීය සභාව විසින් තීරණය කරන්නීය.

ඒ අනුව තවලම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ව්‍යාපාර බද්දට යටත් සෑම තැනැත්තෙකුම, එකී ව්‍යාපාර බද්ද 2019 අප්‍රේල් මස 01 වැනි දිනට පෙර තවලම ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බව වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

උපලේඛනය

I වන කොටස :

ව්‍යාපාර

1. සිල්ලර වෙළෙඳ සැලක් පැවැත්වීම
2. රෙදිපිළි හෝ නිමි ඇඳුම් අලෙවිසැලක් පැවැත්වීම
3. සාප්පු බඩු අලෙවිසැලක් පැවැත්වීම
4. පාවහන් අලෙවි සැලක් පැවැත්වීම
5. සන්නිවේදන මධ්‍යස්ථානයක් පැවැත්වීම
6. වර්ණ රසායනාගාරයක් පැවැත්වීම
7. ගොඩනැගිලි ද්‍රව්‍ය විකිණීමේ ව්‍යාපාරයක් පැවැත්වීම
8. තීන්ත, සායම් අලෙවි කිරීමේ ව්‍යාපාරයක් පැවැත්වීම
9. පෞද්ගලික අධ්‍යාපන ආයතනයක් පැවැත්වීම
10. පෙර පාසල් දිවා සුරැකුම් මධ්‍යස්ථානයක් පැවැත්වීම
11. පරිගණක පුහුණු පාඨමාලාවක් පැවැත්වීම

12. පරිගණක මෘදුකාංග සංවර්ධන මධ්‍යස්ථානයක් පැවැත්වීම
13. රියැදුරු පුහුණුව සපයන ආයතනයක් පැවැත්වීම
14. සමුපකාර සමිති, සිල්ලර කඩ (ප්‍රාදේශික) පැවැත්වීම
15. බටහිර වෛද්‍ය මධ්‍යස්ථානයක් පැවැත්වීම
16. ආයුර්වේද වෛද්‍ය මධ්‍යස්ථානයක් පැවැත්වීම
17. මූල්‍ය ආයතනයක් පැවැත්වීම
18. රක්ෂණ සේවා සපයන ස්ථානයක් පැවැත්වීම
19. ලීසිං සේවා සපයන ස්ථානයක් පැවැත්වීම
20. පෞද්ගලික රෝහලක් පැවැත්වීම
21. ස්වර්ණාභරණ විකිණීමේ මධ්‍යස්ථානයක් පැවැත්වීම
22. පරිගණක උපාංග විකිණීමේ ස්ථානයක් පැවැත්වීම
23. ලී බඩු විකිණීමේ ස්ථානයක් පැවැත්වීම
24. ප්‍රචාරක කටයුතු කිරීමේ ආයතනයක් පැවැත්වීම
25. උත්සව භාණ්ඩ කුලියට දීමේ ආයතනයක් පැවැත්වීම
26. ඇස් කණ්නාඩි සාප්පුවක් පැවැත්වීම
27. ලොතරැයි නියෝජිත ආයතනයක් පැවැත්වීම
28. පිඟන් මැටි ආශ්‍රිත නිෂ්පාදන අලෙවි කිරීම
29. රේස් බුකියක් පැවැත්වීම
30. පින්තූර රාමු කිරීම හා වීදුරු කැපීමේ ස්ථානයක් පැවැත්වීම
31. වී මිලදී ගැනීමේ ස්ථානයක් පැවැත්වීම
32. සන්නිවේදන සේවා සැපයීමේ ආයතනයක් පැවැත්වීම
33. ජංගම දුරකථන අලෙවි කිරීමේ ස්ථානයක් පැවැත්වීම
34. රැකියා නියෝජිත ආයතනයක් පැවැත්වීම
35. වීඩියෝ පට, සංයුක්ත තැටි විකිණීම හෝ කුලියට දීමේ ස්ථානයක් පැවැත්වීම
36. ලිපි ද්‍රව්‍ය හෝ පොත් සාප්පුවක් පැවැත්වීම
37. ලී බඩු වෙළෙඳසැලක් පැවැත්වීම
38. පුවත්පත් විකිණීමේ ස්ථානයක් පැවැත්වීම
39. සංගීත භාණ්ඩ හෝ ක්‍රීඩා භාණ්ඩ විකිණීමේ ස්ථානයක් පැවැත්වීම
40. ගබඩාවක් ලෙස කුලියට දෙන ස්ථානයක් පැවැත්වීම
41. විදුලි උපකරණ අලෙවි කිරීමේ ස්ථානයක් පැවැත්වීම
42. තොග වශයෙන් භාණ්ඩ විකිණීමේ ස්ථානයක් පැවැත්වීම
43. සිමෙන්ති විකිණීමේ ස්ථානයක් පැවැත්වීම
44. ප්‍රසිද්ධ සමාගම්වල භාණ්ඩ බෙදා හැරීමේ යෝජිත ආයතනයක් පවත්වාගෙන යාම
45. වාහන අලෙවි කිරීමේ ස්ථානයක් පැවැත්වීම
46. යතුරු පැදි, ත්‍රීරෝද රථ අලෙවි කිරීමේ ස්ථානයක් පැවැත්වීම
47. බුලත්, පුවක් විකිණීමේ ස්ථානයක් පැවැත්වීම
48. සුපිරි වෙළෙඳසැලක් (ෆුඩ්සිටියක්) පවත්වාගෙන යාම
49. සත්ත්ව ආහාර විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
50. දුම්කොළ ආශ්‍රිත නිෂ්පාදන විකිණීමේ නියෝජිත ආයතනයක් පැවැත්වීම
51. භාවිතා කරන ලද වාහන විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
52. භාවිතා කරන ලද මෝටර් සයිකල් විකිණීමේ ස්ථානයක් පැවැත්වීම
53. වෛද්‍යවරුන් හා රෝගීන් මුණගස්වන ආයතනයක් (චැනල් සෙන්ටර්) පවත්වාගෙන යාම
54. විදුලි උපකරණ අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
55. තේ දළු එකතු කිරීමේ ස්ථානයක් පැවැත්වීම
56. වාහන අමතර කොටස් විකිණීමේ ස්ථානයක් පැවැත්වීම
57. බලයලත් අරක්කු හා රට බීම විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
58. බටහිර ඖෂධ විකිණීමේ ස්ථානයක් පැවැත්වීම (ෆාමසි)
59. කුළු බඩු එකතු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම

60. වාහන දුම් පරීක්ෂා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
61. ඉන්ධන පිරවුම් හලක් පවත්වාගෙන යාම
62. ජංගම වෙළෙඳ වාහනයක් හෝ ජංගම වෙළෙඳ සැලක් පවත්වාගෙන යාම
63. තේ කම්හලක් පැවැත්වීම
64. ගෑස් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
65. පරණ ලෝහ එකතු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
66. එළවළු, පලතුරු විකිණීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම
67. තොග වශයෙන් භාණ්ඩ ගබඩා කර විකිණීම (ගල්, වැලි, ගඩොල්, සිමෙන්ති, පොහොර.....)

11 වන කොටස

1 වන තීරය 2018 වර්ෂයේ දී ව්‍යාපාරයේ ආදායම	*11 වන තීරය* රු. ශත
1. රු. 6,000.00 නොඉක්මවූ අවස්ථාවක	කිසිවක් නැත
2. රු. 6,000.00 ඉක්මවන නමුත් රු. 12,000.00 නොඉක්මවන අවස්ථාවක	90 0
3. රු. 12,000.00 ඉක්මවන නමුත් රු. 18,750.00 නොඉක්මවන අවස්ථාවක	180 0
4. රු. 18,750 0.00 ඉක්මවන නමුත් රු. 50,000.00 නොඉක්මවන අවස්ථාවක	360 0
5. රු. 50,000.00 ඉක්මවන නමුත් රු. 75,000.00 නොඉක්මවන අවස්ථාවක	750 0
6. රු. 75,000.00 ඉක්මවන නමුත් රු. 150,000.00 නොඉක්මවන අවස්ථාවක	1,200 0
7. රු. 1,50,000 ඉක්මවන අවස්ථාවක	3,000 0

12-323/1

තවලම ප්‍රාදේශීය සභාව

2019 වර්ෂය සඳහා වෙළෙඳ බලපත්‍ර ගාස්තු පැනවීම

තවලම ප්‍රාදේශීය සභාවේ 2018.09.18 පැවති මාසික මහා සභා රැස්වීමේ දී සභා තීරණ අංක 3,xii,b යටතේ පහත තීරණය සභා සම්මත වූ බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

බන්දුල විජේසේකර,
සභාපති,
තවලම ප්‍රාදේශීය සභාව.

තීරණය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වන වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 147 වන වගන්තියේ (1) උපවගන්තියේ (ආ) ඡේදයෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව, තවලම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ මෙහි උපලේඛනයේ 1 වන තීරයේ නිරූපිත යම් කර්මාන්තයක් 2019 වර්ෂයේ දී කරගෙන යාම සඳහා නිකුත් කරනු ලබන යම් බලපත්‍රයක් මත එම කර්මාන්තය කරගෙන යනු ලබන පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම 11 වන තීරයේ නිරූපිත යම් සීමාවන් ඇතුළත වන අවස්ථාවක අනුරූප සටහනේ සඳහන් අනුප්‍රමාණ අනුව වූ බලපත්‍ර ගාස්තුවක් පනවා අයකළ යුතු යැයි තවලම ප්‍රාදේශීය සභාව විසින් තීරණය කරන්නීය.

ඒ අනුව තවලම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ වෙළෙඳ බලපත්‍ර ලබාගත යුතු ව්‍යාපාර/කර්මාන්ත වසින් 2019 වර්ෂය සඳහා පනවන ලද වෙළෙඳ බලපත්‍ර ගාස්තු 2019 අප්‍රේල් මස 01 වැනි දින හෝ ඊට ප්‍රථම ගෙවා වෙළෙඳ බලපත්‍රය ලබාගන්නා ලෙස වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

උපලේඛනය

	1 වන තීරය	*11 වන තීරය*		
	කර්මාන්තය	*පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම*		
		රු. 750 0 දක්වා	*රු. 750 0 ට වැඩි එහෙත් රු. 1,500 0 ට නොවැඩි*	*රු. 1,500 0 ට වැඩි*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
1.	ලැගුම්හලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
2.	හෝටල්	500 0	750 0	1,000 0
3.	බත් කඩ ආපනශාලා සහ තේ හෝ කෝපි කඩ	500 0	750 0	1,000 0
4.	බේකරි	500 0	750 0	1,000 0
5.	කිරි පට්ටි හා කිරි වෙළෙඳාම	500 0	750 0	1,000 0
6.	මාළු විකිණීම	500 0	750 0	1,000 0
7.	මස් විකිණීම	500 0	750 0	1,000 0
8.	අයිස් කර්මාන්ත ශාලා	500 0	750 0	1,000 0
9.	සිසිල් බීම කර්මාන්තශාලා	500 0	750 0	1,000 0
10.	සංචාරක වෙළෙඳාම	500 0	750 0	1,000 0
11.	ලොන්ඩරි	500 0	750 0	1,000 0
12.	ගවගාල්	500 0	750 0	1,000 0
13.	ඝාතක මඩු	500 0	750 0	1,000 0
14.	කොණ්ඩා සැකසීමේ සැලුන් සහ බාබර් සාප්පු	500 0	750 0	1,000 0
15.	කර්මාන්තශාලා	500 0	750 0	1,000 0
16.	අවමංගල්‍ය සේවා සැපයුම් ස්ථාන	500 0	750 0	1,000 0
17.	ඉදිකිරීම් ද්‍රව්‍ය ආශ්‍රිත කර්මාන්ත ස්ථාන හා ඉදිකිරීම් ද්‍රව්‍ය ගබඩා කිරීම	500 0	750 0	1,000 0

සැ. යු. - සංචාරක මණ්ඩලයේ අනුමත හෝටල් ආපනශාලා සහ ලැගුම්හල් පෙර වර්ෂයේ ලැබීම්වලින් 1% බලපත්‍ර ගාස්තුවක් ගෙවිය යුතු ය.

අප්‍රසන්න

1.	යෝගට් නිෂ්පාදනය	500 0	750 0	1,000 0
2.	කුකුළු ගොවිපළ	500 0	750 0	1,000 0
3.	අයිස්ක්‍රීම් නිෂ්පාදනය	500 0	750 0	1,000 0
4.	රස කැවිලි නිෂ්පාදනය	500 0	750 0	1,000 0
5.	වාහන සර්විස් කිරීම	500 0	750 0	1,000 0
6.	කිරි ආහාර නිෂ්පාදිත ආයතනයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
7.	සත්ත්ව ගොවිපළක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

අන්තරාදායක

1.	කෘෂි රසායන ද්‍රව්‍ය ගබඩා කිරීමේ හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
2.	ඇසිඩ් වර්ග නිෂ්පාදනය හා වෙළෙඳාම	500 0	750 0	1,000 0
3.	ෆයිබර් ග්ලාස් නිපදවීමේ හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

ප්‍රසන්න හා අන්තරාදායක

1.	පොහොර විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
2.	සිප්පි ඇඹරුම්හලක් හා රසායනික ද්‍රව්‍ය නිෂ්පාදන ආයතනයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
3.	බැටරි චාර්ජ් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

තවලම ප්‍රාදේශීය සභාව

2019 වර්ෂය සඳහා කර්මාන්ත බදු පැනවීම

තවලම ප්‍රාදේශීය සභාවේ 2018.09.18 පැවති මාසික මහා සභා රැස්වීමේදී සභා තීරණ අංක 3,xii,c යටතේ පහත තීරණය සභා සම්මත වූ බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

බන්දුල විජේසේකර,
සභාපති,
තවලම ප්‍රාදේශීය සභාව.

2018 ඔක්තෝබර් මස 05 වැනි දින,
තවලම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

තීරණය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 වන වගන්තියේ (1) වන උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව,

(අ) තවලම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ 2019 වර්ෂයේදී පවත්වාගෙන යනු ලබන මෙහි පහත උපලේඛනයේ 1 වන තීරයේ නිරූපිත යම් කර්මාන්තයක් සම්බන්ධයෙන් එම කර්මාන්තය කරගෙන යනු ලබන පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම එම උපලේඛනයේ II වන තීරයේ අනුරූප සටහනේ නිරූපිත අනුප්‍රමාණ අනුව වූ කර්මාන්ත බද්දක් 2019 වර්ෂයේ දී පනවා අය කිරීමට,

(ආ) 2018 වර්ෂයේ දෙසැම්බර් මස 31 වැනි දින පැවති යම් කර්මාන්තයක් සම්බන්ධයෙන් වූ විට යටොක්ත බද්ද 2019 අප්‍රේල් මස පළවන දිනට ප්‍රථම කර්මාන්තය කරගෙන යනු ලබන තැනැත්තා විසින් ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබිය යුතු යැයි විධාන කිරීමට,

(ඇ) 2019 වර්ෂයේ දී ආරම්භ කරනු ලබන යම් කර්මාන්තයක් සම්බන්ධයෙන් වූ විට යටොක්ත බද්ද කර්මාන්තය ආරම්භ කර මාස 03ක් ඇතුළත කර්මාන්තය කරගෙන යනු ලබන තැනැත්තා විසින් ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබිය යුතු යැයි විධාන කිරීමට තවලම ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය.

උපලේඛනය

1 වැනි තීරය	*11 වැනි තීරය*		
කර්මාන්ත	*පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම*		
	රු. 750 දක්වා	*රු. 750 ට වැඩි එහෙත් රු. 1,500 ට නොවැඩි*	*රු. 1,500 ට වැඩි*
	රු. ශත	*රු. ශත*	*රු. ශත*
1. ඇදුම් මැසීම	700 0	750 0	1,000 0
2. සිමෙන්ති ගඩොල්, බීරලු,මල් පෝච්චි කොන්ක්‍රීට් සිලින්ඩර් හෝ සිමෙන්ති ආශ්‍රිත වූ කිසියම් භාණ්ඩ නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
3. ඩිජිටල් තාක්ෂණයෙන් මුද්‍රණාලයක් පවත්වාගෙන යෑම	500 0	750 0	1,000 0
4. කුෂන් වැඩ පලක් පවත්වාගෙන යෑම	500 0	750 0	1,000 0

1 වැනි තීරය	*11 වැනි තීරය*		
කර්මාන්ත	*පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම*		
	රු. 750 දක්වා	*රු. 750 ට වැඩි එහෙත් රු. 1,500 0 ට නොවැඩි*	*රු. 1,500 ට වැඩි*
	රු. ශත	*රු. ශත*	*රු. ශත*
5. බීරළු ලී කැටයම් වැඩපලවල්	500 0	750 0	1,000 0
6. ඉදල්, පාපිසි, කොහු ආශ්‍රිත නිෂ්පාදන	500 0	750 0	1,000 0
7. පොල්තෙල් මෝලක්	500 0	750 0	1,000 0
8. ස්වර්ණාභරණ නිපදවීම	500 0	750 0	1,000 0
9. පාවහන් නිෂ්පාදනය	500 0	750 0	1,000 0
10. ඡායාරූපශාලා	500 0	750 0	1,000 0
11. හුණු හා ගඩොල් පෝරණුවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
12. ඇඹරුම්හලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
13. බලවේග තේ කම්හලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
14. උක්මෝලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
15. කොහු මෝලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
16. තේ කොළ, කුළු බඩු පැකට් කර විකිණීම	500 0	750 0	1,000 0
17. වී මෝල්	500 0	750 0	1,000 0
18. ත්‍රීරෝද රථ අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
19. යන්ත්‍රෝපකරණ අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
20. යතුරු පැදි අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
21. පාපැදි යතුරුපැදි අලුත් වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
22. දේශීය බෙහෙත් වර්ග නිෂ්පාදිත ආයතනයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
23. ලියවන පට්ටලයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
24. මෝටර් රථ යතුරු පැදි අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
25. ටයර්, ටියුබ් යතුරුපැදි අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
26. ඇඟලුම් කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
27. ගල් වලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
28. යන්ත්‍රානුසාරයෙන් කැටගල් සකස් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
29. වෙල්ඩින් වැඩපලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
30. ගෘහ භාණ්ඩ, විසිතුරු භාණ්ඩ ආදී නිෂ්පාදන	500 0	750 0	1,000 0
31. කූඩ, වට්ටි වැනි වේවැල් බට ආශ්‍රිත නිෂ්පාදන	500 0	750 0	1,000 0
32. ඉලෙක්ට්‍රිකල් වැඩපලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
33. කෘෂි ආම්පන්න නිෂ්පාදන ආයතනයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
34. ගරාජ්	500 0	750 0	1,000 0

1 වැනි තීරය	*11 වැනි තීරය*		
කර්මාන්ත	*පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම*		
	රු. 750 දක්වා	*රු. 750 ට වැඩි එහෙත් රු. 1,500 0 ට නොවැඩි*	*රු. 1,500 ට වැඩි*
	රු. ශත	*රු. ශත*	*රු. ශත*
35. ලී මෝල්ක්	500 0	750 0	1,000 0
36. යන්ත්‍රානුසාරයෙන් කළුගල් ඇඹරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
37. වායු සමීකරණ ශීතකරණ අලුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
38. මුද්‍රණාලයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
39. වඩු මඩුක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
40. කම්හලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
41. බෑග් මැසීම	500 0	750 0	1,000 0
42. වීදුරු ආශ්‍රිත නිෂ්පාදන	500 0	750 0	1,000 0

12-323/3

තවලම ප්‍රාදේශීය සභාව

2019 වර්ෂය සඳහා ප්‍රචාරක දැන්වීම් සඳහා ගාස්තු පැනවීම

තවලම ප්‍රාදේශීය සභාවේ 2018.09.18 පැවති මාසික මහා සභා රැස්වීමේදී සභා තීරණ අංක 3,xii,d යටතේ පහත තීරණය සභා සම්මත වූ බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

බන්දුල විජේසේකර,
සභාපති,
තවලම ප්‍රාදේශීය සභාව.

2018 ඔක්තෝබර් මස 05 වැනි දින,
තවලම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

තීරණය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වන වගන්තියෙන් පැවරී ඇති බලතල හා 1988.08.23 වැනි දිනැති අංක 520/7 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ සම්මත අතුරු ව්‍යවස්ථා 39 වැනි කොටසින් ප්‍රචාරක දැන්වීම්/දෘෂ්‍ය පරිසරය පිළිබඳ අතුරු ව්‍යවස්ථාවේ විධිවිධානවලින් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාරව තවලම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල යම් වීදියකට, පාරකට, ඇලකට, වැවකට මුහුදකට හෝ අහසට පෙනෙන පරිදි දැන්වීමක් ප්‍රදර්ශනය කිරීම වෙනුවෙන් පහත උපලේඛනයේ දැක්වෙන පරිදි ගාස්තුවක් පනවා අයකළ යුතු යැයි තවලම ප්‍රාදේශීය සභාව විසින් තීරණය කරන ලදී.

උපලේඛනය

1. තාවකාලික (මසකට අඩු දැන්වීම්/බැනර්) ප්‍රචාරක දැන්වීම් සඳහා	-	වර්ග අඩියට රු. 35.00
2. මසකට වැඩි (ස්ථිර ප්‍රචාරක දැන්වීම්) ප්‍රචාරක දැන්වීම් පුවරු සඳහා	-	වර්ග අඩියට රු. 75.00

12-323/4

තවලම ප්‍රාදේශීය සභාව

2019 වර්ෂය සඳහා වාහන හා සතුන් පිළිබඳ බදු පැනවීම

තවලම ප්‍රාදේශීය සභාවේ 2018.09.18 පැවති මාසික මහා සභා රැස්වීමේදී සභා තීරණ අංක 3,xii,e යටතේ පහත තීරණය සභා සම්මත වූ බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

බන්දුල විජේසේකර,
සභාපති,
තවලම ප්‍රාදේශීය සභාව.

2018 ඔක්තෝබර් මස 05 වැනි දින,
තවලම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

තීරණය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වන වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 148 වන වගන්තිය සහ 4 වන උපලේඛනයේ විධිවිධාන වලින් ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල ප්‍රකාර තවලම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ 2019 වර්ෂයේ දී පහත උපලේඛනයේ I වන තීරයේ සඳහන් කිසියම් වාහනයක් හෝ සතෙකු මත ම, එහි II වන තීරුවේ අනුරූපිත සටහනෙහි නිරූපිත බද්දක් 2019 වර්ෂය සඳහා පනවා අයකිරීමට තවලම ප්‍රාදේශීය සභාව විසින් තීරණය කරන්නීය.

21. විදුලි කර්මාන්ත වැඩපලක් හෝ විදුලි උපකරණ නිපදවන හෝ අළුත්වැඩියා කිරීමේ වැඩපලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
22. කිරි ශීත කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

කටාන ප්‍රාදේශීය සභාව

කර්මාන්ත බදු පැනවීම - 2019 වර්ෂය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 වැනි වගන්තිය යටතේ පැවරී ඇති බලතල ප්‍රකාරව 2018 වර්ෂයේ ඔක්තෝබර් මස 17 වැනි දින පවත්වන ලද කටාන ප්‍රාදේශීය සභාවේ මහ සභා රැස්වීමේ දී පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

එම්. නන්ද විජේරත්න සිල්වා,
සභාපති,
කටාන ප්‍රාදේශීය සභාව.

2018 නොවැම්බර් මස 15 වැනි දින,
කටාන ප්‍රාදේශීය සභාව,
දෙමංහන්දිය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 වැනි වගන්තියේ 150(1) උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර කටාන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත යම් පරිශ්‍රයක පවත්වාගෙන යනු ලබන මෙහි පහත උපලේඛනයේ I වන තීරුවේ නිරූපිත සෑම කර්මාන්තයක් සම්බන්ධයෙන් එම උපලේඛනයේ II වන තීරුවේ අනුරූප සටහනේ නිරූපිත ප්‍රමාණයක බද්දක් 2019 වර්ෂය සඳහා පනවා අයකළ යුතු යයි ද 2019 මාර්තු 31 දින හෝ එදිනට පෙර අදළ බදු මුදල අදළ තැනැත්තන් විසින් ගෙවිය යුතු යයි ද යෝජනා කරමි.

උපලේඛනය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150(1) වැනි වගන්තිය යටතේ පැනවිය යුතු බද්ද

අංකය	*I වැනි තීරුව*	*II වැනි තීරුව*		
	බලය දෙනු ලබන කාර්යය/ ව්‍යාපාරයෙහි ස්වභාවය	*පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකම*		
		වාර්ෂික වටිනාකම රු. 750 ට නොවැඩි	*වාර්ෂික වටිනාකම රු. 750 සිට රු. 1,500 දක්වා*	*වාර්ෂික වටිනාකම රු. 1,500 ට වැඩි*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
01.	වාහන සුවඳ ගැන්වීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
02.	විදුලි උපකරණ විකුණනු ලබන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
03.	පාවහන් විකුණන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
04.	විදුලි උපකරණ කුළියට දීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
05.	ටයර් හෝ ටියුබ් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
06.	ක්ෂණික ඡායාරූප පිටපත් ගැනීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
07.	සිසිල් බීම තොග වශයෙන් විකුණන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
08.	ඔරලෝසු අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
09.	ලොතරැයි විකුණන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
10.	සාප්පු බඩු විකුණන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
11.	රෙදිපිළි විකිණීමේ සාප්පුවක් හෝ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
12.	පින්තූර රාමු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
13.	රබර් සීල් සෑදීමේ හෝ ප්ලාස්ටික් නාම පුවරු සෑදීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
14.	විකිණීම සඳහා මහන මැෂින් හෝ ශීතකරණ ගබඩා කිරීම	500 0	750 0	1,000 0
15.	විකිණීම සඳහා බයිසිකල් හෝ මෝටර් සයිකල් ගබඩා කිරීම	500 0	750 0	1,000 0

අංකය	බලය දෙනු ලබන කාර්යය/ ව්‍යාපාරයෙහි ස්වභාවය	පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකම		
		වාර්ෂික වටිනාකම රු. 750 ට නොවැඩි දක්වා	වාර්ෂික වටිනාකම රු. 750 සිට රු. 1,500	වාර්ෂික වටිනාකම රු. 1,500 ට වැඩි
		රු. ශත	රු. ශත	රු. ශත
16.	රථ වාහන අමතර කොටස් විකිණීම	500 0	750 0	1,000 0
17.	රූපවාහිනී, ශීතකරණ, බයිසිකල්, විදුලි පංකා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
18.	විසිතුරු භාණ්ඩ, අත්කම් භාණ්ඩ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
19.	ග්‍රොසරියක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
20.	වෙළෙඳාම සඳහා පොත්පත් හා ලිපිද්‍රව්‍ය ගබඩාකිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
21.	ඇස් කණ්නාඩි රාමු නිපදවීමේ හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
22.	ටෙලෙක්ස්, දුරකථන සේවාවක් හෝ ඒජන්සි තැපැල් කාර්යාලයක් සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
23.	ඉංග්‍රීසි බෙහෙත් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
24.	මල්පැල විකිණීමේ හෝ මල් තවානක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
25.	වීඩියෝ කැසට්පට කුළියට දීමේ හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
26.	පිඟන් භාණ්ඩ, විදුරු භාණ්ඩ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
27.	ගොඩනැගිලි ද්‍රව්‍ය විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
28.	වැලි ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
29.	මැටි හෝ බොරළු කපන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
30.	ශාරීරික අභ්‍යාස පුහුණු ආයතනයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
31.	බැනර්, බෝඩ් ඇඳීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
32.	ජංගම දුරකථන විකිණීමේ හා අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
33.	පරිගණක අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
34.	කජු පැකට් කර විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
35.	බීඩි නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
36.	කුෂන් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
37.	ස්වර්ණාභරණ ඔප දැමීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
38.	බැකෝ යන්ත්‍ර, ට්‍රැක්ටර්, විදුලි උපකරණ යන්ත්‍ර අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
39.	විදුලි බුබුළු නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
40.	රූපලාවන්‍ය, මනාලියන් හැඩ ගැන්වීම ඇතුළු සාප්පුවක් (බියුටි සෙන්ටර්) පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
41.	දුරකථන පහසුකම් ලබාදීමේ කුටියක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
42.	පෞද්ගලික බෙහෙත් ශාලාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
43.	වාහන දුම් පරීක්ෂා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
44.	සිල්ලර බඩු කඩයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
45.	පොල් ලී පැලීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
46.	සුරතල් මසුන් හා සතුන් ඇති කිරීම හා විකිණීම	500 0	750 0	1,000 0
47.	සංගීත භාණ්ඩ කුලියට දීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
48.	පැණි නිපදවීම හා ගබඩා කිරීම	500 0	750 0	1,000 0
49.	සෙල්ලම් බඩු නිපදවීම හා විකිණීම	500 0	750 0	1,000 0
50.	කපාපු පොල් නිපදවීම	500 0	750 0	1,000 0
51.	බෝට්ටු හා බත්තල් සෑදීමේ ස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
52.	ලිහිසි තෙල් විකිණීමේ ස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
53.	පානීය ජලය බෝතල්ගත කර විකිණීම	500 0	750 0	1,000 0
54.	බිම්මල් නිපදවීමේ ස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
55.	කොප්පරා සකස් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
56.	ලෑලි පදම් කිරීමේ ස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0

අංකය	බලය දෙනු ලබන කාර්යය/ ව්‍යාපාරයෙහි ස්වභාවය	පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකම		
		වාර්ෂික වටිනාකම රු. 750 ට නොවැඩි දක්වා	වාර්ෂික වටිනාකම රු. 750 සිට රු. 1,500	වාර්ෂික වටිනාකම රු. 1,500 ට වැඩි
		රු. ශත	රු. ශත	රු. ශත
57.	බ්‍රේක් ලයිනර්/ක්ලච් ලයිනර් නිපදවීම	500 0	750 0	1,000 0
58.	යාන්ත්‍රික උළු සහ ගඩොල් නිපදවීම	500 0	750 0	1,000 0
59.	ගල් ස්මාරක නිපදවීම	500 0	750 0	1,000 0
60.	වාහන අලංකරණය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
61.	ආරක්ෂිත හිස්වැසුම් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
62.	ගෘහ භාණ්ඩ සහ විදුලි උපකරණ විකුණනු ලබන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
63.	රෙදි කැබලි හා ඒ ආශ්‍රිත නිෂ්පාදන අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
64.	විදුලි උපකරණ අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
65.	උද්‍යාන අලංකරණය සහ ගොඩනැගිලි තීන්ත ආලේප කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
66.	වීදුරු හා පිඟන් භාණ්ඩ අලංකරණය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
67.	ඊයන් බරු නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
68.	පිඟන් ගඩොල් සහ නාන කාමර උපකරණ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

12-162/2

කටාන ප්‍රාදේශීය සභාව

ව්‍යාපාර බදු පැනවීම - 2019 වර්ෂය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වැනි වගන්තිය යටතේ පැවරී ඇති බලතල ප්‍රකාරව 2018 වර්ෂයේ ඔක්තෝබර් මස 17 වැනි දින පවත්වන ලද කටාන ප්‍රාදේශීය සභාවේ මහ සභා රැස්වීමේ දී පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

එම්. නන්ද විජේරත්න සිල්වා,
සභාපති,
කටාන ප්‍රාදේශීය සභාව.

2018 නොවැම්බර් මස 15 වැනි දින,
කටාන ප්‍රාදේශීය සභාව,
දෙමංහන්දිය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ පැවරී ඇති බලතල ප්‍රකාර එකී පනතේ හෝ ඒ යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබා ගැනීම හෝ එම පනතේ 150 වන වගන්තිය යටතේ යම් බද්දක් ගෙවීම අවශ්‍ය නොවන්නා වූ මෙහි පහත අංක 2 උපලේඛනයේ දක්වෙන ව්‍යාපාර හෝ වෙනයම් ව්‍යාපාරයක් කටාන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත 2019 වර්ෂයේ දී පවත්වාගෙන යන සෑම තැනැත්තෙකුගෙන්ම එම ව්‍යාපාරයේ 2018 වර්ෂයේ දී ආදායම මෙහි පහත අංක 1 උපලේඛනයේ 1 වන තීරුවේ නිරූපිත යම් විෂයාංකයක සීමාවන් ඇතුළත පවතින අවස්ථාවක මෙහි 2 වන තීරුවේ අනුරූප සටහනේ නිරූපිත අනුප්‍රමාණ අනුව වූ ව්‍යාපාර බද්දක් 2019 වර්ෂයේ පනවා අය කළ යුතු යයි ද එම බද්ද 2019 මාර්තු 31 දින හෝ එදිනට පෙර අදාළ තැනැත්තන් විසින් කටාන ප්‍රාදේශීය සභාව වෙත ගෙවිය යුතු යයි ද යෝජනා කරමි.

අංක 01 උපලේඛනය

මෙම බද්ද ගෙවිය යුතු වර්ෂයට ඉහතින් වූ වර්ෂයේ ලැබීම්වලට අනුකූලව පහත දැක්වෙන ප්‍රමාණයන් නොඉක්මවන පරිදි වේ :-

පළමු වැනි තීරුව	*දෙවැනි තීරුව*
ව්‍යාපාරයේ වාර්ෂික වටිනාකම	*ගෙවිය යුතු වාර්ෂික වටිනාකම*
	රු. ශ.
01. රු. 6,000 නොඉක්මවන විට	නැත
02. රු. 6,000 ඉක්මවන නමුත් රු. 12,000 නොඉක්මවන විට	90 0
03. රු. 12,000 ඉක්මවන නමුත් රු. 18,750 නොඉක්මවන විට	180 0
04. රු. 18,750 ඉක්මවන නමුත් රු. 75,000 නොඉක්මවන විට	360 0
05. රු. 75,000 ඉක්මවන නමුත් රු. 1,50,000 නොඉක්මවන විට	1,200 0
06. රු. 1,50,000 ඉක්මවන විට	3,000 0

උපලේඛන අංක 02

ඉහත සඳහන් බද්ද අදාළ වන ව්‍යාපාර :

01. කොමිස් ඒජන්තවරුන්ගේ ආයතනයක් පැවැත්වීම.
02. වෙන්දේසිකරුවන්ගේ ආයතනයක් පැවැත්වීම.
03. බ්‍රෝකර්වරුන්ගේ ආයතනයක් පැවැත්වීම.
04. මුදල් ණයට දෙන්නන්ගේ ආයතනයක් පැවැත්වීම.
05. මුදල් ආයෝජකයින්ගේ ආයතනයක් පැවැත්වීම.
06. කොන්ත්‍රාත් සමාගමක්/ආයතනයක් පැවැත්වීම.
07. උකස් බඩු ගන්නන්ගේ ආයතනයක් පැවැත්වීම.
08. ගණන් පරීක්ෂකවරුන්ගේ ආයතනයක් පැවැත්වීම.
09. ගෘහ නිර්මාණ ශිල්පීන්ගේ ආයතනයක් පැවැත්වීම.
10. සැලසුම්කරුවන්ගේ ආයතනයක් පැවැත්වීම.
11. රක්ෂණ නියෝජිතයින්ගේ ආයතනයක් පැවැත්වීම.
12. ප්‍රවාහන නියෝජිතයින්ගේ ආයතනයක් පැවැත්වීම.
13. කුලී කාර් අයිතිකරුවන්ගේ ආයතනයක් පැවැත්වීම.
14. රියැදුරන් පුහුණු කිරීමේ ආයතනයක් පැවැත්වීම.
15. ස්ටීප් ටිකට් නියෝජිතයින්ගේ ආයතනයක් පැවැත්වීම.
16. සංචාරක බස් රථ හෝ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම.
17. ලොරි හිමියන්ගේ ආයතනයක් පැවැත්වීම.
18. පෞද්ගලික ආරෝග්‍ය ශාලාවක් පවත්වාගෙන යාම.
19. දේශීය හෝ විදේශීය බැංකු ආයතනයක් පවත්වාගෙන යාම.
20. දේපළ වෙළෙඳ සමාගමක් පැවැත්වීම.
21. රේස් ඔට්ටු සඳහා ස්ථානයක් පැවැත්වීම.
22. වෛද්‍ය පරීක්ෂණාගාරයක් පැවැත්වීම.
23. ඇඟළුම් කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම.
24. දේශීය ද්‍රව්‍ය අපනයනය කිරීමේ සමාගමක් හෝ ආයතනයක් පවත්වාගෙන යාම.
25. ආනයනය කරන ලද මෝටර් රථ අංගනයක් පවත්වාගෙන යාම.
26. වාහන සඳහා ගෑස් බෙදාහැරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම.
27. දුරකථන සේවා සැපයීම සඳහා සංඥා කුළුණක්/ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම.
28. විදේශ සේවා රැකියා සපයන ඒජන්සියක් පවත්වාගෙන යාම.
29. සමුපකාර රෝහලක් පවත්වාගෙන යාම.
30. සූපශාස්ත්‍ර/ බතික් වැඩ පුහුණු පාසලක් පවත්වාගෙන යාම.
31. පෞද්ගලික දත්ත කාර්මිකයින්ගේ ආයතනයක් පවත්වාගෙන යාම.
32. උපදේශක සේවා ආයතනයක් පවත්වාගෙන යාම.
33. පුද්ගලික සාත්තු නිකේතනයක් පවත්වාගෙන යාම.

34. හෙදි පුහුණු ආයතනයක් පවත්වාගෙන යාම.
35. නිවාඩු/සාද නිකේතනයක් පවත්වාගෙන යාම.
36. පෞද්ගලික අධ්‍යාපන ආයතනයක් පවත්වාගෙන යාම.
37. ආයතන පිරිසිදු කිරීමේ ආයතනයක් පවත්වාගෙන යාම.
38. ගීත පටිගත කරනු ලබන ස්ථානයක් පවත්වාගෙන යාම.
39. රටබීම හෝ මෙරට බීම විකුණන ස්ථානයක් පවත්වාගෙන යාම.
40. විදේශිකයින් සඳහා නවාතැන් පහසුකම් සැලසීමේ ස්ථානයක් පැවැත්වීම. (Homes Stay)

12-162/3

කටාන ප්‍රාදේශීය සභාව

වරිපනම් බදු පැනවීම - 2019 වර්ෂය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වැනි වගන්තිය යටතේ පැවරී ඇති බලතල ප්‍රකාරව 2018 වර්ෂයේ ඔක්තෝබර් මස 17 වැනි දින පවත්වන ලද කටාන ප්‍රාදේශීය සභාවේ මහ සභා රැස්වීමේ දී පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

එම්. නන්ද විජේරත්න සිල්වා,
සභාපති,
කටාන ප්‍රාදේශීය සභාව.

2018 නොවැම්බර් මස 15 වැනි දින,
කටාන ප්‍රාදේශීය සභාව,
දෙමංහන්දිය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 146 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ පැවරී ඇති බලතල ප්‍රකාරව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1297 හා 2003.07.11 දිනැති *ගැසට් පත්‍රය* යටතේ කටාන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය දියුණු කළ ප්‍රදේශ යැයි ප්‍රකාශයට පත්කර ඇත්තාවූ ප්‍රදේශයේ ඇතුළත පිහිටියා වූ නිවාසවල, ගොඩනැගිලිවල, ඉඩම්වල, ගෙපත්වල වාර්ෂික වටිනාකම සඳහා 2018 වර්ෂය සඳහා වූ තක්සේරුව/සත්‍යාක්ෂණය 2019 වර්ෂය සඳහා තක්සේරුව/සත්‍යාක්ෂණය ලෙස තීරණය කළයුතු බවත්,

එකී තක්සේරුව මත 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134(1) උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර එකී දේපළ මත ඉහත කී තක්සේරුව අනුව කටාන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ රද්දෙළුව නිවාස යෝජනා ක්‍රමයෙන් බැහැරව පිහිටි සෑම නිශ්චල දේපළකම වාර්ෂික තක්සේරු වටිනාකමින් 6%ක වාර්ෂික වරිපනම් බද්දක්ද, රද්දෙළුගම නිවාස යෝජනා ක්‍රමය තුළ පිහිටි සෑම නිශ්චල දේපළකම වාර්ෂික තක්සේරු වටිනාකමින් 10%ක වාර්ෂික වරිපනම් බද්දක් ද නියම වියයුතු බවටත්,

තවද, 2019 වර්ෂයේ පහත උපලේඛනයේ සඳහන් එක් එක් කාර්තුව වෙනුවෙන් ඉදිරියෙන් නිරූපිත දිනයට පෙර එසේ නියම කරන ලද වාර්ෂික වරිපනම් බද්ද කටාන ප්‍රාදේශීය සභා අරමුදලට ගෙවිය යුතු බවටත්, එලෙස වාර්ෂික වරිපනම් බද්ද 2019 වර්ෂයේ ජනවාරි 31 වන දින හෝ ඊට ප්‍රථම ගෙවන්නේ නම් වාර්ෂික වරිපනම් බද්දේ ප්‍රමාණයෙන් සියයට දහයක (10%) වට්ටමක්ද එකී උපලේඛනයෙහි එක් එක් කාර්තුව ඉදිරියෙන් තුන්වන තීරුවේ නිරූපිත දිනයට හෝ ඊට පෙර අදළ වරිපනම් බද්ද කටාන ප්‍රාදේශීය සභා අරමුදලට ගෙවනු ලබන්නේ නම් එක කාර්තුවකට අදාළ බදු මුදලින් සියයට පහක (5%) වට්ටමක්ද, කටාන ප්‍රාදේශීය සභාව දිය යුතු බවටත් යෝජනා කරමි.

උපලේඛනය

කාර්තුව	*ගෙවිය යුතු දිනය*	*5% වට්ටම සඳහා හිමිකම ලබන අවසාන දිනය*
පළමු කාර්තුව	2019.03.31	2019.01.31
දෙවන කාර්තුව	2019.06.30	2019.04.30
තෙවන කාර්තුව	2019.09.30	2019.07.31
සිව් වන කාර්තුව	2019.12.31	2019.10.31

12-162/4

කටාන ප්‍රාදේශීය සභාව

ඉඩම් විකිණීම මත අයකරනු ලබන බද්ද පැනවීම - 2019 වර්ෂය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 154(1) වගන්තිය යටතේ පැවරී ඇති බලතල ප්‍රකාරව 2018 වර්ෂයේ ඔක්තෝබර් මස 17 වැනි දින පවත්වන ලද කටාන ප්‍රාදේශීය සභාවේ මහ සභා රැස්වීමේ දී පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

එම්. නන්ද විජේරත්න සිල්වා,
සභාපති,
කටාන ප්‍රාදේශීය සභාව.

2018 නොවැම්බර් මස 15 වැනි දින,
කටාන ප්‍රාදේශීය සභාව,
දෙමංහන්දිය.

යෝජනාව

කටාන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත පිහිටියා වූ, යම් ඉඩමක් වෙන්දේසිකරුවෙකු හෝ තැරැව්කරුවෙක් හෝ ඔහුගේ සේවකයා හෝ අනු නියෝජිතයා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ හෝ අන්‍යාකාරයකින් විකුණනු ලබන අවස්ථාවක, ඒ ඉඩම විකිණීමෙන් ලත් මුදලින් සියයට එකකට (01%) සමාන බද්දක් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 154(1) වගන්තිය ප්‍රකාරව විකුණුම්කරු හෝ තැරැව්කරු හෝ ඔහුගේ සේවකයා හෝ අනු නියෝජිතයා විසින් 2019 වර්ෂයේ දී ද 1% බද්ද අදාළ ඉඩම විකුණූ වහාම මෙම සභාව වෙත ගෙවිය යුතු බවට යෝජනා කරමි.

12-162/5

කටාන ප්‍රාදේශීය සභාව

වාහන හා සතුන් පිළිබඳ බද්ද පැනවීම - 2019 වර්ෂය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වැනි වගන්තිය කියවිය යුතු එකී පනතේ 148 වැනි වගන්තිය යටතේ පැවරී ඇති බලතල ප්‍රකාරව 2018 වර්ෂයේ ඔක්තෝබර් මස 17 වැනි දින පවත්වන ලද කටාන ප්‍රාදේශීය සභාවේ මහ සභා රැස්වීමේ දී පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

එම්. නන්ද විජේරත්න සිල්වා,
සභාපති,
කටාන ප්‍රාදේශීය සභාව.

2018 නොවැම්බර් මස 15 වැනි දින,
කටාන ප්‍රාදේශීය සභාව,
දෙමංහන්දිය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 148 වන වගන්තිය යටතේ පැවරී ඇති බලතල ප්‍රකාර කටාන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ 2019 වර්ෂයේ දී පහත උපලේඛනයේ 01 වැනි තීරුවේ නිරූපිත කිසියම් වාහනයක් හෝ සතෙකු තමා සන්තකයෙහි තබා ගන්නා සෑම තැනැත්තෙකුගෙන්ම එකී උපලේඛනයේ 02 වන තීරුවේ නිරූපිත බද්දක් 2019 වර්ෂය සඳහා ගෙවිය යුතු වන අතර, 148(3) වැනි වගන්තියට අනුව මෙම බදු මුදල ගෙවිය යුතු බවට යෝජනා කරමි.

උපලේඛනය

1 වැනි තීරුව	*2 වැනි තීරුව* *රු. ශ.*
මෝටර් රථයක්, මෝටර් ට්‍රයිකාරයක්, මෝටර් ලොරියක්, මෝටර් බයිසිකලයක්, කරත්තයක්, ජීන් රික්ෂෝවක්, බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් නොවන සෑම වාහනයක් සඳහා	25 0
සෑම බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් හෝ බයිසිකල් කාරයක් හෝ කරත්තයක් සඳහා -	
(අ) වෙළෙඳ කාර්යයක් සඳහා යොදවන්නේ නම්	18 0
(ආ) වෙළෙඳ කාර්යයක් සඳහා නොවන කාර්යයක් සඳහා යොදවන්නේ නම්	4 0
සෑම කරත්තයක් සඳහා	20 0
සෑම අත් කරත්තයක් සඳහා	10 0
සෑම රික්ෂෝවක් සඳහා	7 50
සෑම අශ්වයෙකු, පෝනියකු හෝ කොටළුවෙකු සඳහා	15 0
සෑම ඇතෙකු සඳහා	50 0

12-162/6

කටාන ප්‍රාදේශීය සභාව

ප්‍රචාරක දැන්වීම් සඳහා ගාස්තු පැනවීම - 2019 වර්ෂය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122(1) වැනි වගන්තිය යටතේ පැවරී ඇති බලතල ප්‍රකාරව 2018 වර්ෂයේ ඔක්තෝබර් මස 17 වැනි දින පවත්වන ලද කටාන ප්‍රාදේශීය සභාවේ මහ සභා රැස්වීමේ දී පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

එම්. නන්ද විජේරත්න සිල්වා,
සභාපති,
කටාන ප්‍රාදේශීය සභාව.

2018 නොවැම්බර් මස 15 වැනි දින,
කටාන ප්‍රාදේශීය සභාව,
දෙමංහන්දිය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122(1) වැනි වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව, බස්නාහිර පළාතේ පළාත් සභාව විසින් අනුමත කර, බස්නාහිර පළාතේ ගරු ප්‍රධාන අමාත්‍ය හා මුදල් හා ක්‍රම සම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික සංවර්ධන, විදුලිබල හා බල ශක්ති, පරිසර කටයුතු, ජල සම්පාදන හා ජලාපවාහන සහ සංචාරක කටයුතු පිළිබඳ ගරු අමාත්‍යතුමා විසින් අංක 1947/6 හා 2015.12.28 දිනැති IV (ඇ) වැනි කොටස - පළාත් සභා *අති විශෙෂ*

ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත් කර ඇති ප්‍රචාරක දැන්වීම් පිළිබඳ අතුරු ව්‍යවස්ථා මාලාවේ විධිවිධාන ප්‍රකාර කටාන ප්‍රාදේශීය සභා සීමාව තුළ දැන්වීම් ප්‍රදර්ශනය කිරීමට සැලැස්වීම වෙනුවෙන් පහත සඳහන් උපලේඛනයේ දැක්වෙන පරිදි ප්‍රදර්ශන ගාස්තුවක් 2019 වර්ෂය සඳහාද ගෙවිය යුතු බවට යෝජනා කරමි.

උපලේඛනය

අනු. අංකය	*පුවරුවේ ස්වභාවය*	*වර්ග මීටර් ප්‍රමාණය*	*ගාස්තුව රුපියල්*		
			මාස 03කට අඩු	*මාස 03 හෝ 06 අතර*	*වසරක්*
			රු.	*රු.*	*රු.*
01.	කිසියම් බිත්තියක් හෝ තාප්පයක ප්‍රචාරය කරනු ලබන ප්‍රචාරක දැන්වීම්	01ට අඩු	250	350	500
		01ට වැඩි	01ට වැඩි වන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු. 200 බැගින්		
02.	රෙදි, ඩිජිටල් බැනර් ප්‍රදර්ශනය සඳහා	01ට අඩු	250	350	500
		01ට වැඩි	01 ට වැඩි වන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු. 200 බැගින්		
03.	තහඩු හෝ දැව මගින් ප්‍රදර්ශනය කරනු ලබන ප්‍රචාරක දැන්වීම් සඳහා	01ට අඩු	500	750	1,000
		01ට වැඩි	01 ට වැඩි වන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු. 300 බැගින්		
04.	විදුලිය යොදා ක්‍රියාත්මක කරනු ලබන ප්‍රචාරක දැන්වීම් සඳහා	01ට අඩු	500	750	1,000
		01ට වැඩි	01 ට වැඩි වන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු. 300 බැගින්		
05.	ඉටි රෙදි හෝ කාඩ් බෝඩ් මගින් කරනු ලබන ප්‍රචාරක දැන්වීම්	01ට අඩු	250	350	500
		01ට වැඩි	01 ට වැඩි වන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු. 200 බැගින්		
06.	ප්ලාස්ටික් පුවරු හෝ ෆයිබර් පුවරු මගින් කරනු ලබන ප්‍රචාරක දැන්වීම්	01ට අඩු	250	350	500
		01ට වැඩි	01 ට වැඩි වන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු. 200 බැගින්		
07.	විද්‍යුත් උපකරණ යොදා කරනු ලබන ප්‍රචාරක දැන්වීම්	01ට අඩු	750	850	1,000
		01ට වැඩි	01 ට වැඩි වන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු. 500 බැගින්		

කටාන ප්‍රාදේශීය සභාව

සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි හෝටලයකින්, ආපනශාලාවකින් හෝ නවාතැන් පොළවල් සඳහා ගාස්තු පැනවීම - 2019 වර්ෂය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වැනි වගන්තිය සමග කියවිය යුතු 147 වගන්තිය යටතේ පැවරී ඇති බලතල ප්‍රකාරව 2018 වර්ෂයේ ඔක්තෝබර් මස 17 වැනි දින පවත්වන ලද කටාන ප්‍රාදේශීය සභාවේ මහ සභා රැස්වීමේ දී පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

එම්. නන්ද විජේරත්න සිල්වා,
සභාපති,
කටාන ප්‍රාදේශීය සභාව.

2018 නොවැම්බර් මස 15 වැනි දින,
කටාන ප්‍රාදේශීය සභාව,
දෙමංහන්දිය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වගන්තිය සමග කියවිය යුතු 147 වගන්තිය යටතේ පැවරී ඇති බලතල ප්‍රකාර 1968 අංක 14 දරන සංචාරක සංවර්ධන පනතේ කාර්යය සඳහා යම් හෝටලයක්, ආපන ශාලාවක් හෝ නවැතැන් පොළක් ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි කරනු ලැබ ඇත්තා වූ ද, අනුමත කර හෝ පිළිගත්තා වූ ද අවස්ථාවක එම හෝටලයේ, ආපන ශාලාවේ හෝ නවාතැන් පොලේ පෙර වර්ෂයේ වාර්ෂික ආදායමින් 1% නොඉක්මවන ගාස්තුවක් මෙම සභාව වෙත 2019 වර්ෂය සඳහා ද ගෙවිය යුතු බවට යෝජනා කරමි.

12-162/8

කටාන ප්‍රාදේශීය සභාව

සේවා ගාස්තු, ආකෘති පත්‍ර ගාස්තු සහ අයදුම්පත්‍ර ගාස්තු පැනවීම - 2019 වර්ෂය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ සහ එම පනත මගින් සැලසී ඇති බලතල ප්‍රකාරව සකස් කරන ලද අතුරු ව්‍යවස්ථාවලට අනුව 2018 වර්ෂයේ ඔක්තෝබර් මස 17 වැනි දින පවත්වන ලද කටාන ප්‍රාදේශීය සභාවේ මහ සභා රැස්වීමේ දී පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

එම්. නන්ද විජේරත්න සිල්වා,
සභාපති,
කටාන ප්‍රාදේශීය සභාව.

2018 නොවැම්බර් මස 15 වැනි දින,
කටාන ප්‍රාදේශීය සභාව,
දෙමංහන්දිය.

යෝජනාව

මෙම සභාව මගින් ලබා දෙනු ලබන පහත සඳහන් සේවා සහ අයදුම් පත්‍ර සඳහා පහත සඳහන් පරිදි ගාස්තු පනවා 2019 වර්ෂයේ දී අය කිරීම සුදුසු බවට යෝජනා කරමි.

උපලේඛනය

අනු. අංකය	*සේවාව*	*2019 වර්ෂය සඳහා යෝජිත ගාස්තුව රු. ශත*
01	ගොඩනැගිලි සැලසුම් අනුමත කිරීමේ අයදුම් පත්‍රය	250.00
02	පිඹුරු පත් අනුමත කිරීමේ අයදුම් පත්‍රය	150.00
03	වීථි රේඛා/නොපවරවා ගැනීමේ සහතික නිකුත් කිරීම	500.00
04	වරිපනම් ලේඛන උධෘත සනාථ කරන සහතික (එක් වර්ෂයක කාලයක් සඳහා)	50.00
05	වරිපනම් ලේඛන සංශෝධිත අයදුම් පත්‍රය (A.T.T.)	100.00
06	වරිපනම් ලේඛන සංශෝධන අයදුම් පත්‍රය (A.T.T.) පරීක්ෂණ ගාස්තු	250.00
07	වරිපනම් වාර්තා නිකුත් කිරීම	100.00
08	සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමේ ගාස්තු	2,000.00
09	කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීමේ ගාස්තු	5,000.00
10	*ප්‍රජාශාලා වෙන්කිරීම :* පැය 01ක් සඳහා දින 01ක් සඳහා (ආරක්ෂක ඇප තැන්පත්)	 250.00 2,500.00 1,000.00
11	රද්දොළුව නිවාස යෝජනා ක්‍රමයේ ක්‍රීඩා පිටිය - දින 01ක් සඳහා (ආරක්ෂක ඇප තැන්පත්)	3,000.00 2,000.00
12	*වලිසිංහ හරිස්චන්ද්‍ර ක්‍රීඩා පිටියේ ක්‍රිකට් ක්‍රීඩා පිටිය :* සැහැල්ලු පන්දු තරග සඳහා දිනකට (ආරක්ෂක ඇප තැන්පත්) ලෙදර් පන්දු තරග සඳහා දිනකට (ආරක්ෂක ඇප තැන්පත්) පුහුණු තරග සඳහා දිනකට පුහුණු තරග සඳහා පැය 01කට	 15,000.00 5,000.00 25,000.00 10,000.00 10,000.00 1,500.00
13	අනෙකුත් ක්‍රීඩා පිටි සඳහා දිනකට	500.00
14	*ගලි බවුසරය ලබා දීම :* ප්‍රාදේශීය සභා සීමාව තුළ : නේවාසික ව්‍යාපාරික කර්මාන්ත ආගමික ස්ථාන (පන්සල්/පල්ලි/කෝවිල්) රාජ්‍ය ආයතන/රජයේ පාසැල් බල සීමාවෙන් පිටත : නේවාසික ව්‍යාපාරික කර්මාන්ත ආගමික ස්ථාන (පන්සල්/පල්ලි/කෝවිල්) රාජ්‍ය ආයතන/රජයේ පාසැල් බලසීමාවෙන් පිටත අයකරනු ලබන ස්ථාවර ගාස්තුවලට අමතරව ගමන් කරනු ලබන කිලෝමීටර් 01ක් හෝ ඉන් කොටසක් සඳහා	 3,000.00 4,000.00 6,000.00 1,000.00 2,000.00 4,000.00 5,000.00 7,000.00 1,000.00 2,000.00 50.00

අනු. අංකය	*සේවාව*	*2019 වර්ෂය සඳහා යෝජිත ගාස්තුව රු. ශත*
15	*ආදාහනාගාරය වෙන් කිරීම :*	
	බල ප්‍රදේශය තුළ	5,000.00
	බල ප්‍රදේශයෙන් පිටත	6,000.00

12-162/9

මාලිම්බඩ ප්‍රාදේශීය සභාව

2019 වර්ෂය සඳහා බලපත්‍ර ගාස්තු

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වැනි වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 147 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියේ (ආ) ඡේදයේ පැවරී ඇති බලතල ප්‍රකාර ප්‍රාදේශීය සභා පනතේ හෝ ඒ යටතේ සාදන ලද 1988.08.23 දින 520/7 *අති විශෙෂ ගැසට් පත්‍රය* මගින් ප්‍රකාශිත සම්මත අතුරු ව්‍යවස්ථාව 2008 දෙසැම්බර් මස 23 වැනි දින මාලිම්බඩ ප්‍රාදේශීය සභාව විසින් පිළිගෙන ඇති අතර, ඒ අනුව බලපත්‍රයක් ලබාගත යුතු පහත 1 තීරයේ පළවන පරිශ්‍රයක් ස්ථානයක් සම්බන්ධයෙන් ii වන තීරයේ සඳහන් අනු ප්‍රමාණයෙන් යුත් බලපත්‍ර ගාස්තුවක් 2019 වර්ෂයට අයකිරීමටත් 1968 අංක 14 දරන සංචාරක සංවර්ධන පනත අනුව සංචාරක මණ්ඩලයේ අනුමත හෝටලයක්, ආපන ශාලාවක්, නවාතැන් පොළක් සඳහා බලපත්‍ර ලබා දීමේ දී අදාළ වර්ෂයට පෙර වර්ෂයේ ලැබීම්වලින් 1%ක බලපත්‍ර ගාස්තුවක් 2019 වර්ෂයට පනවා අය කිරීමටත් ඉහත සඳහන් සියලුම බලපත්‍ර 2019.03.31 වැනි දිනට පෙර අදාළ ස්ථානයන් විසින් ලබා ගත යුතු බවට මාලිම්බඩ ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

එකී බලපත්‍ර ගාස්තුව 2019.03.31 වැනි දින හෝ ඊට පෙර ගෙවිය යුතුය.

මෙයට අමතරව රජය විසින් පනවා ඇති මුද්දර ගාස්තු වශයෙන් 10%ක මුදලක් ද බලපත්‍ර ගාස්තුවට අතිරේකව ගෙවිය යුතු ය.

සෝමසිරි වීරමන්,
සභාපති,
මාලිම්බඩ ප්‍රාදේශීය සභාව.

2018 සැප්තැම්බර් මස 18 වැනි දින,
මාලිම්බඩ ප්‍රාදේශීය සභාව,
මාලිම්බඩ.

උපලේඛනය - අංක 01

ප්‍රාදේශීය සභා පනතේ 149 වැනි වගන්තිය යටතේ බලපත්‍ර ගාස්තු

I වැනි තීරය		*II වැනි තීරය*		
වෙළෙඳාමේ හෝ ව්‍යාපාරයේ විස්තරය		*වාර්ෂික වටිනාකම රු. 750 දක්වා*	*වාර්ෂික වටිනාකම රු. 750ට වැඩි එහෙත් රු. 1,500 ට නොවැඩි*	*වාර්ෂික වටිනාකම රු. 1,500 ට වැඩි*
		රු. ශ.	*රු. ශ.*	*රු. ශ.*
01	බේකරියක් පැවැත්වීම	500 0	750 0	1,000 0
02	බත් කඩයක් හෝ භෝජනාගාරයක් පැවැත්වීම	500 0	750 0	1,000 0

		I වැනි තීරය	*II වැනි තීරය*	
	වෙළෙඳාමේ හෝ ව්‍යාපාරයේ විස්තරය	*වාර්ෂික වටිනාකම රු. 750 දක්වා*	*වාර්ෂික වටිනාකම රු. 750ට වැඩි එහෙත් රු. 1,500ට නොවැඩි*	*වාර්ෂික වටිනාකම රු. 1,500 ට වැඩි*
		රු. ශ.	*රු. ශ.*	*රු. ශ.*
03	තේ, කෝපි කඩයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
04	ලැගුම්හලක් පවත්වාගෙන යම	500 0	750 0	1,000 0
05	පළතුරු/එළවළු කඩයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
06	මස් වෙළෙඳසැලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
07	මාළු වෙළෙඳසැලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
08	ලොන්ඩ්‍රියක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
09	සංචාරක වෙළෙඳාම (පොල් හා පළතුරු) පැවැත්වීම	500 0	750 0	1,000 0
10	මී කිරි මුදවා අලෙවි කිරීමේ මධ්‍යස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
11	රස කැවිලි නිෂ්පාදනය කර අලෙවි කිරීම	500 0	700 0	1,000 0
12	කෙටි කෑම නිෂ්පාදනය හා විකිණීම (රෝල්ස්, ඉඳිආප්ප, හැලප)	500 0	750 0	1,000 0
13	සංචාරක මණ්ඩලයේ අනුමත හෝටල්, ආපනශාලා ලැගුම්හල් රෙස්ටුරන්ට්	පෙර වර්ෂයේ ආදායමෙන් 01% බලපත්‍ර ගාස්තු ලෙස ගෙවිය යුතු ය.		
14	විජලනය කරන ලද ආහාර නිෂ්පාදනය	500 0	750 0	1,000 0
15	අයිස් කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
16	බාබර් සාප්පුවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
17	*අප්‍රසන්න හා අන්තරාදායක ව්‍යාපාර :*			
01	යෝගට් නිෂ්පාදනය	500 0	750 0	1,000 0
02	අයිස්ක්‍රීම් නිෂ්පාදනය	500 0	750 0	1,000 0
03	කුකුළු ගොවිපල	500 0	750 0	1,000 0
04	ශීතකළ මාළු වෙළෙඳාම	500 0	750 0	1,000 0
05	හුණු පිළිස්සීම හෝ ගබඩා කිරීම	500 0	750 0	1,000 0
06	කොප්පරා නිෂ්පාදනය	500 0	750 0	1,000 0
07	වාහන සර්විස් කිරීම	500 0	750 0	1,000 0
18	*අන්තරාදායක හා අප්‍රසන්න කර්මාන්ත :*			
01	මෝටර් රථ අළුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
02	එම - (විසිරි පින්තාරු සහිත)	500 0	750 0	1,000 0
03	රන්, රිදී ලෝහ ආලේපනය කිරීම	500 0	750 0	1,000 0
04	බැටරි චාර්ජ් කිරීම	500 0	750 0	1,000 0
05	වායු සමීකරණ, ශීතකරණ අළුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
06	ෆයිබර් ග්ලාස් නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
07	ගඩොල් පෝරණුවක් පැවැත්වීම	500 0	750 0	1,000 0
08	රබර් රෝලක් සහිත දුම් ගෙයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
09	පොල් තෙල් මෝලක්	500 0	750 0	1,000 0
10	කුරුඳු බොයිලේරුවක්	500 0	750 0	1,000 0
11	කම්මලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
12	හඳුන්කුරු නිෂ්පාදනය	500 0	750 0	1,000 0
13	අවමංගල සේවා සපයන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
14	ගෝ ඝාතකාගාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

මාලිම්බඩ ප්‍රාදේශීය සභාව

2019 වර්ෂය සඳහා කර්මාන්ත බදු

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 වැනි වගන්තියේ (1) වන උපවගන්තියෙන් ප්‍රාදේශීය සභාවලට පැවරී ඇති බලතල ප්‍රකාර-

(අ) මාලිම්බඩ ප්‍රාදේශීය සභා බලප්‍රදේශය තුළ 2019 වර්ෂයේ දී කරගෙන යනු ලබන මෙහි පහත සඳහන් උපලේඛනයේ I වැනි තීරයේ දක්වා ඇති යම් කර්මාන්තයක් සම්බන්ධයෙන් එම කර්මාන්තය කරගෙන යනු ලබන පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම අනුව එම උපලේඛනයේ II වැනි තීරයේ අනුරූප සටහනේ නිරූපිත අනුප්‍රමාණ අනුව වූ කර්මාන්ත බද්දක් 2019 වර්ෂය සඳහා පනවා අය කිරීමටත්,

(ආ) 2018 වර්ෂයේ දෙසැම්බර් මස 31 වැනි දින පැවැති යම් කර්මාන්තයක් සම්බන්ධයෙන් වූ විට යටොක්ත බද්ද 2019 අප්‍රේල් 30 වැනි දිනට ප්‍රථම කර්මාන්තය කරගෙන යනු ලබන තැනැත්තා විසින් ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබිය යුතු යැයි විධානය කරමි.

සෝමසිරි වීරමන්,
සභාපති,
මාලිම්බඩ ප්‍රාදේශීය සභාව.

2018 සැප්තැම්බර් මස 18 වැනි දින,
මාලිම්බඩ ප්‍රාදේශීය සභාව,
මාලිම්බඩ.

උපලේඛනය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 වැනි වගන්තිය යටතේ කර්මාන්ත බදු

	I වැනි තීරය	*II වැනි තීරය*		
අනු. අංකය	*වෙළෙඳාමේ හෝ ව්‍යාපාරයේ ස්වභාවය*	*වාර්ෂික වටිනාකම රු. 750 දක්වා*	*වාර්ෂික වටිනාකම රු. 750ට වැඩි එහෙත් රු. 1,500ට නොවැඩි*	*වාර්ෂික වටිනාකම රු. 1,500ට වැඩි*
		රු. ශ.	*රු. ශ.*	*රු. ශ.*
01	ඇඳුම් මැසීම	600 0	1,000 0	3,000 0
02	බීම පැකට් නිෂ්පාදනය කර අලෙවි කිරීම	600 0	1,000 0	3,000 0
03	තුනපහ වර්ග/කජු/ඇට වර්ග/තේ කුඩු/බයිට්/සිංහල බෙහෙත් බඩු/ බෙහෙත් තෙල් ඇතුළු බඩු වර්ග පැකට් කිරීම සහ සංචාරක සාප්පු බඩු වෙළෙඳාම	600 0	1,000 0	3,000 0
04	පා පැදි අළුත්වැඩියා කිරීම	600 0	1,000 0	3,000 0
05	වී මෝල්	600 0	1,000 0	3,000 0
06	යතුරු පැදි/ත්‍රීවීල් අළුත්වැඩියා කිරීම	600 0	1,000 0	3,000 0
07	සිමෙන්ති ගඩොල් නිෂ්පාදනය	600 0	1,000 0	3,000 0
08	ටයර්/ට්‍යුබ් වොල්කනයිස් කිරීම	600 0	1,000 0	3,000 0
09	විද්‍යුත් උපකරණ අළුත්වැඩියා කිරීම	600 0	1,000 0	3,000 0
10	ලියවන පට්ටලයක් පවත්වාගෙන යාම	600 0	1,000 0	3,000 0
11	යාන්ත්‍රික වඩු මඩුවක් පවත්වාගෙන යාම	600 0	1,000 0	3,000 0
12	කුෂන් වැඩපලක් පවත්වාගෙන යාම	600 0	1,000 0	3,000 0
13	ඔරලෝසු අළුත්වැඩියා කිරීම	600 0	1,000 0	3,000 0
14	බීරළු ලී කැටයම් වැඩපලක් පවත්වාගෙන යාම	600 0	1,000 0	3,000 0
15	ලණු/පැදුරු/පාපිසි/ඉදල්/කොසු නිපදවීම සහ විකිණීම	600 0	1,000 0	3,000 0

		I වැනි තීරය	*II වැනි තීරය*	
අනු. අංකය	*වෙළෙඳාමේ හෝ ව්‍යාපාරයේ ස්වභාවය*	*වාර්ෂික වටිනාකම රු. 750 දක්වා*	*වාර්ෂික වටිනාකම රු. 750ට වැඩි එහෙත් රු. 1,500ට නොවැඩි*	*වාර්ෂික වටිනාකම රු. 1,500ට වැඩි*
		රු. ශ.	*රු. ශ.*	*රු. ශ.*
16	ඇඹරුම්හලක් පවත්වාගෙන යාම	600 0	1,000 0	3,000 0
17	බිම් මල් නිෂ්පාදනය කිරීමේ, විකිණීමේ ව්‍යාපාරයක්	600 0	1,000 0	3,000 0
18	පාවහන් නිපදවීමේ හා විකිණීමේ ව්‍යාපාරය	600 0	1,000 0	3,000 0
19	විසිතුරු මල් වෙළෙඳාම	600 0	1,000 0	3,000 0
20	ගල් වලක් පවත්වාගෙන යාම	600 0	1,000 0	3,000 0
21	මුද්‍රණාලය	600 0	1,000 0	3,000 0

12-179/2

මාලිම්බඩ ප්‍රාදේශීය සභාව

2019 වර්ෂය සඳහා ව්‍යාපාර බදු

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල අනුව එකී පනතේ හෝ ඒ යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබා ගැනීම හෝ එකී පනතේ 150 වැනි වගන්තිය යටතේ යම් කර්මාන්ත බද්දක් ගෙවීමට අවශ්‍ය නොවන්නා වූ හා වෘත්තියක් නොවන්නා වූ පහත 1 වන උපලේඛනයේ සඳහන් යම් ව්‍යාපාරයක් මාලිම්බඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ 2019 වර්ෂයේ කරගෙන යනු ලබන සෑම තැනැත්තකුගේම එකී ව්‍යාපාරයේ ඊට පෙර වර්ෂයේ ලැබීම් මෙහි පහත 2 වන උපලේඛනයේ i වන තීරුවේ නිරූපිත යම් විෂයාංගයක සීමාවන් ඇතුළත පවත්නා අවස්ථාවක එහි ii වන තීරුවේ නිරූපිත අනුප්‍රමාණය අනුව වූ ව්‍යාපාර බද්දක් 2019 වර්ෂයේ අප්‍රේල් මස 30 දිනට පෙර ගෙවිය යුතු බවට මාලිම්බඩ ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

සෝමසිරි වීරමන්,
සභාපති,
මාලිම්බඩ ප්‍රාදේශීය සභාව.

2018 සැප්තැම්බර් මස 18 වැනි දින,
මාලිම්බඩ ප්‍රාදේශීය සභාව,
මාලිම්බඩ.

උපලේඛනය 01

1. තේ කම්හලක් පැවැත්වීම.
2. රබර් කම්හලක් පැවැත්වීම.
3. පෞද්ගලික පොළක් පැවැත්වීම.
4. රෙදිපිළි බතික් කිරීමේ ස්ථානයක් පැවැත්වීම.
5. තොග ගබඩාවක් පැවැත්වීම.
6. ඉංග්‍රීසි බෙහෙත් වෙළෙඳාම් කරන ස්ථානයක් පැවැත්වීම.
7. උත්සව භාණ්ඩ බදු දීමේ ස්ථානයක් පැවැත්වීම.
8. ගොඩනැගිලි ද්‍රව්‍ය විකිණීමේ ස්ථානයක් පැවැත්වීම.
9. තේ දළු එකතු කිරීමේ මධ්‍යස්ථානයක් පැවැත්වීම.
10. ලොතරැයි අලෙවි කුටියක් පවත්වාගෙන යාම.
11. ඡායා පිටපත්/ෆැක්ස්/ටෙලෙක්ස් යන්ත්‍ර භාවිතා කරන ස්ථානයක් පැවැත්වීම.
12. ස්වර්ණාභරණ විකිණීමේ ස්ථානයක් පැවැත්වීම.

13. දැව ගබඩාවක්/දැව ඉරුම්හලක් පවත්වාගෙන යාම.
14. ලී වෙළෙඳ සැලක් පවත්වාගෙන යාම.
15. වාහන සේවා සපයන ස්ථානයක් පවාත්වාගෙන යාම.
16. සිල්ලර කඩයක් පවත්වාගෙන යාම (කුඩා/මධ්‍යම/තොග).
17. ගෘහ භාණ්ඩ නිපදවීමේ, විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
18. යකඩ බඩු (හාඩ්වෙයාර්) විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
19. වාහන අමතර කොටස් අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
20. දේශීය ඖෂධ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
21. පින්තූර රාමු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
22. ඡායා පිටපත් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
23. මෙට්ට නිෂ්පාදනය කර විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
24. ශබ්ද විකාශන යන්ත්‍ර බදුදීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
25. සිංහල බෙහෙත් ශාලාවක් පැවැත්වීම
26. ඉංග්‍රීසි බෙහෙත් ශාලාවක් පැවැත්වීම
27. රෙදිපිළි වෙළෙඳසැලක් පැවැත්වීම.
28. සාප්පු බඩු වෙළෙඳසැලක් පැවැත්වීම.
29. සිසිල් බීම බෙදා හැරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
30. ඇස් කන්නාඩි නිෂ්පාදනය කර විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
31. පාවහන් අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
32. නිමි ඇඳුම් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
33. පොල් ලී සකස් කර විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
34. දුරකතන සේවා සපයන සමාගම් පවත්වාගෙන යාම.
35. යතුරු පැදි/ත්‍රී රෝද අමතර කොටස් අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
36. ප්‍රචාරක කටයුතු කිරීමේ ආයතනයක් පවත්වාගෙන යාම.
37. සාප්පු බඩු සහ සිල්ලර වෙළෙඳසැලක් පැවැත්වීම.
38. ඡායාරූප ශාලාවක් පවත්වාගෙන යම.
39. පොත් සාප්පුවක් පවත්වාගෙන යාම.
40. රබර්/කුරුඳු/අනෙකුත් දේශීය ද්‍රව්‍ය මිලට ගන්නා ස්ථානයක් පවත්වාගෙන යාම.
41. පාවහන් විකිණීමේ/නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
42. වෛද්‍ය රසායනාගාරයක් පවත්වාගෙන යාම.
43. විශේෂඥ වෛද්‍ය සේවා සැපයෙන ආයතනයක් පවත්වාගෙන යාම
44. දුරකතන කුටියක් පවත්වාගෙන යාම.
45. විදුලි උපකරණ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
46. වළං විකිණීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම.
47. වර්ණ රසායනාගාරයක් පවත්වාගෙන යාම.
48. ධීවර උපකරණ නිෂ්පාදනය කර විකිණීමේ ස්ථානයක්
49. ප්‍රචාරක දැන්වීම් ඇඳීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
50. සුරතල් මසුන් අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
51. විසිතුරු භාණ්ඩ නිපදවා අලෙවි කිරීමේ ස්ථානයක්.
52. පැල තවානක් පවත්වාගෙන යාම.
53. ඡායා පිටපත් මැෂින් අමතර කොටස් අලෙවි කිරීමේ ව්‍යාපාරයක්.
54. උත්සව අවස්ථා වීඩියෝගත කිරීමේ සහ වීඩියෝපට සංරක්ෂණය කිරීමේ ව්‍යාපාරයක්.
55. ගීත/වීඩියෝපට පටිගත කිරීම, අලෙවි කිරීම හෝ බදු දීම.
56. ගල්, වැලි, ගඩොල් අලෙවි කිරීමේ ව්‍යාපාරයක්
57. පානීය වතුර බෝතල් කිරීමේ ව්‍යාපාරයක්.
58. වාහන මිලදී ගැනීමේ හා විකිණීමේ ව්‍යාපාරයක්.
59. මනාලියන් හැඩගැන්වීම (රූපලාවන්‍ය) ස්ථානයක් පවත්වාගෙන යාම.
60. ලිහිසි තෙල්, කෘෂි රසායන ද්‍රව්‍ය, මෝටර් රථ අමතර කොටස් අලෙවි කිරීමේ ව්‍යාපාරයක්.
61. මැටි ගඩොල්, සිමෙන්ති ගඩොල්, වැලි ඇතුළු ගොඩනැගිලි ද්‍රව්‍ය අලෙවි කිරීම.
62. ප්‍රවාහන සේවයක් පවත්වාගෙන යාම.
63. දුරකථන භුවමාරු ස්ථානයක් පවත්වාගෙන යාම.
64. දර මිලට ගෙන විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
65. ගොඩනැගිලි/නිවාස සැලසුම් ඇඳීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම.
66. රූපවාහිනී/ගුවන් විදුලි/පුවත්පත්/දැන්වීමේ ප්‍රචාරක ස්ථානයක් පවත්වාගෙන යාම.

67. අභ්‍යාස පොත් බෙදා හැරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
68. ඇළුමිනියම් ෂෝරූම්, ෂෝකේස් නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
69. පුවත්පත් වෙළෙඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
70. උපස්ථායක හා මංගල යෝජනා සේවා ස්ථානයක් පවත්වාගෙන යාම.
71. සිමෙන්ති භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
72. පාපිසි හා මදුරු දැල් මැසීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
73. පාසල් උපකරණ, සාප්පු බඩු හා විදුලි උපකරණ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
74. දුරකතන හුවමාරු මධ්‍යස්ථානයක් හා ග්‍රොසරියක් පවත්වාගෙන යාම.
75. ක්‍රීඩා භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
76. පොහොර වෙළෙඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
77. කෘෂි රසායන ද්‍රව්‍ය වෙළෙඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
78. ගෑස් ගබඩාකර විකිණීම ස්ථානයක් පවත්වාගෙන යාම.
79. අන්තර්ජාල සේවා සැපයීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
80. ජංගම දුරකතන අළුත්වැඩියා කිරීමේ හා දුරකතන පහසුකම් ලබාදීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
81. පරිගණක සේවා සැපයීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම.
82. ඡායාරූප ශාලාවක් සහ සන්නිවේදන පහසුකම් ලබාදීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
83. කාඩ්බඩු සහ රෙදිපිළි බෙදාහැරීම.
84. පූජා භාණ්ඩ අලෙවි කිරීම.
85. විද්‍යුත් පරිපථ නිෂ්පාදනය.
86. මහන මැෂින් අළුත්වැඩියා කිරීම.
87. උකස් බඩු ගන්නා ආයතනයක් පවත්වාගෙන යාම.
88. කොන්ත්‍රාත්කරුවන්.
89. සැපයුම්කරුවන්.
90. රියැදුරු පුහුණු සපයන ආයතනයක් පවත්වාගෙන යාම.
91. රක්ෂණ සේවා සපයන ආයතනයක් පවත්වාගෙන යාම.
92. ලීසින් සේවා සපයන ආයතනයක් පවත්වාගෙන යාම.
93. වාහන අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
94. යතුරු පැදි/ත්‍රීවීල් අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
95. මැණික් වෙළෙඳ ව්‍යාපාරික ආයතනයක් පවත්වාගෙන යාම.
96. පෞද්ගලික අධ්‍යාපන ආයතනයක් පවත්වාගෙන යාම.
97. ගෘහනිර්මාණ හෝ වාස්තු විද්‍යා සේවා සපයන ආයතනයක් පවත්වාගෙන යාම.
98. රැකියා නියෝජිත ආයතනයක් පවත්වාගෙන යාම.
99. ජෝතිෂ්‍ය සේවා සපයන ආයතනයක් පවත්වාගෙන යාම.
100. පෞද්ගලික රෝහලක් හෝ සාත්තු නිවාසයක් පවත්වාගෙන යාම.
101. මිනින්දෝරු සේවා සපයන ආයතනයක් පවත්වාගෙන යාම.
102. නීතිඥ සහ නොතාරිස් සේවා සපයන ආයතනයක් පවත්වාගෙන යාම.
103. ඇඟළුම් කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම.
104. සැර බීම සැල් පවත්වාගෙන යාම.
105. පෙර පාසල්/දිවා සුරැකුම් මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම.
106. සත්ත්ව සායනයක් පවත්වාගෙන යාම.
107. සුපිරි වෙළෙඳ සලක් (ෆුඩ් සිටි) පවත්වාගෙන යාම.
108. කුළු බඩු, හාල්, සීනි, කිරි පිටි සිල්ලරට විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
109. පරණ ලෝහ ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
110. ප්‍රසිද්ධ සමාගම්වල භාණ්ඩ ප්‍රදර්ශනය කිරීමේ හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
111. ප්‍රසිද්ධ සමාගම්වල භාණ්ඩ බෙදාහැරීමේ නියෝජිත ආයතනයක් පවත්වාගෙන යාම.
112. සාප්පු බඩු සහ සිල්ලර වෙළෙඳ සැලක් පැවැත්වීම.
113. රබර්/කුරුඳු මිල දී ගැනීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම.
114. සංචාරක වෙළෙඳාම/(ඉදි ආප්ප/පළතුරු/මාළු).
115. මාළු වෙළෙඳාම් කිරීමේ ස්ථානය.
116. වානේ භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ ව්‍යාපාරය.
117. බීම අලෙවිය (කුල් ස්පොට්).
118. කරවල වෙළෙඳාම.
119. පාසල් බෑග් මැසීමේ ව්‍යාපාරය.
120. උත්සව අවස්ථාවල සංගීතය සැපයීමේ ව්‍යාපාරය (DJ).

121. පොත්පත්/සඟරා/ළමා පුවත්පත් ප්‍රකාශනය හා බෙදාහැරීම.
122. සංචාරක වෙළෙඳුම (කිතුල්, පැණි, හකුරු, පිටි)
123. රෙදි මුද්‍රණය කිරීමේ ව්‍යාපාරය
124. පහන්තිර නිෂ්පාදනය හා අලෙවිය
125. බුලත්විට විකිණීම
126. සුදු යකඩ නිෂ්පාදන අලෙවිය
127. ලියවන පට්ටලයක් පවත්වාගෙන යාම
128. භාණ්ඩ ගෙන්වා බෙදා හැරීම
129. භාණ්ඩ අලෙවි නියෝජිත ආයතන (බිස්කට්)
130. අත්මේස් හා ගොඩනැගිලි ද්‍රව්‍ය ගෙන්වා බෙදාහැරීම
131. ජංගම වෙළඳාමක් පවත්වාගෙන යාම
132. මූල්‍ය ආයතනයක් හෝ බැංකුවක් පවත්වාගෙන යාම :
- 1988 අංක 30 දරන පනත යටතේ බැංකු සේවාවක් පවත්වාගෙන යාම
- 1942 අංක 13 දරන උකස් ගන්නන් පිළිබඳ ආඥාපනත යටතේ උකස් ගැනීම
- 2006 අංක 56 දරන මූල්‍ය කල්බදු පනත යටතේ කල්බදු ව්‍යාපාරයක් පවත්වාගෙන යාම
- 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනත යටතේ මුදල් ව්‍යාපාරයක් පවත්වාගෙන යාම
- විද්‍යුත් මුදල් ගනුදෙනු පවත්වාගෙන යාම (ටෙලර් මැෂින්)
133. පේස්ට්‍රි සහ ග්‍රොසරි ද්‍රව්‍ය අලෙවි කිරීම
134. කෙටි කෑම නිෂ්පාදනය හා විකිණීම (රෝල්ස්, ඉඳිආප්ප, හැලප)
135. පේස්ට්‍රි නිෂ්පාදනය හා විකිණීම
136. විදුලි උපකරණ ආනයනය කිරීම
137. ඇලුමිනියම් වැඩපලක් පවත්වාගෙන යාම
138. සබන් අලෙවිය
139. පොල්ලෙලි කැපීමේ ව්‍යාපාරය
140. පූජා භාණ්ඩ විකිණීම
141. දේශීය ද්‍රව්‍ය මිලට ගැනීම
142. ඇළුමිනියම් ප්ලාස්ටික් භාණ්ඩ අලෙවිය
143. ඡායාරූප ශාලාවක් පවත්වාගෙන යාම
144. පොත් සාප්පුවක් පවත්වාගෙන යාම
145. පාවහන් අලුත්වැඩියා කිරීමේ විකිණීමේ ව්‍යාපාරයක්
146. දුම්කොල පැකට් කිරීමේ ව්‍යාපාරයක්
147. තේ - සිල්ලර බඩු අලෙවි කිරීමේ ව්‍යාපාරය
148. අත්මේස් හාඩ්වෙයාර් උපකරණ ගෙන්වා බෙදා හැරීම
149. උත්සව අවස්ථාවල කෑම බීම පිළියෙල කිරීමේ ව්‍යාපාරයක් (කේටරින් සර්විස්) පවත්වාගෙන යාම

මෙම එක් එක් ව්‍යාපාරය වෙනුවෙන් වාර්ෂිකව රු. 3,000 බැගින් අය කළ යුතු ය.

ඉහත සඳහන් ව්‍යාපාර කරගෙන යනු ලබන සෑම තැනැත්තකුගෙන්ම මෙම බද්ද ගෙවිය යුතු වර්ෂයට ඉහතින් වූ වර්ෂයේ ව්‍යාපාර ලැබීම්වලට අනුකූලව පහත සඳහන් ප්‍රමාණයන් අනුව බද්දක් අයකරනු ලැබේ.

2 වන උපලේඛනය

I වැනි තීරුව *ව්‍යාපාරයේ ආදායම*	*II වැනි තීරුව* *ගෙවිය යුතු බද්ද* *රු. ශත*
1. රු. 6,001 සිට රු. 12,000 දක්වා	90 0
2. රු. 12,001 සිට රු. 18,750 දක්වා	180 0
3. රු. 18,751 සිට රු. 75,000 දක්වා	360 0
4. රු.75,001 සිට රු. 1,00,000 දක්වා	600 0
5. රු. 1,00,001 සිට රු. 1,25,000 දක්වා	1,000 0
6. රු. 1,50,001 සිට රු. 2,00,000 දක්වා	2,000 0
7. රු 2,50,000ට වැඩි	3,000 0

මාලිම්බඩ ප්‍රාදේශීය සභාව

2019 වර්ෂය සඳහා වරිපනම් බදු අය කිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ,

(අ) 134 වගන්තියේ (01) වන උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර, මාලිම්බඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ දියුණු කළ ප්‍රදේශයක්/ප්‍රදේශ වශයෙන් ප්‍රකාශයට පත් කරනු ලැබ ඇති ප්‍රදේශයේ/ප්‍රදේශ ඇතුළත පිහිටියා වූ සියලු නිෂ්චල දේපළවල 2010 වර්ෂයේ තක්සේරු දෙපාර්තමේන්තුව විසින් තක්සේරු කරන ලද නව තක්සේරු වටිනාකමින් 2019 වර්ෂයට 6% බැගින් දේපළ බද්දක් පනවා අය කිරීමටත් ;

(ආ) 134 වන වගන්තියේ 6 වන උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර, යථෝක්ත වාර්ෂික වරිපනම් බදු පිළිවෙලින් 2019 මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් 30 හා දෙසැම්බර් 31 යන දිනවලින් අවසන් වන කාර්තු 04 තුළ දී සමාන වාරික 4 කින් ප්‍රාදේශීය සභාවට ගෙවීමටත්,

(ඇ) යථෝක්ත වරිපනම් බද්ද 2019 ජනවාරි මස 31 වැනි දින හෝ ඊට පෙර සම්පූර්ණයෙන් ම ගෙවන්නේ නම් 10% ක වට්ටමක් සහ වාර්ෂික වරිපනම් බද්ද එක් එක් කාර්තුවේ පළමු මාසයේ ගෙවන්නේ නම් 5% ක වට්ටමක් ලබා දීමටත්, මාලිම්බඩ ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

සෝමසිරි වීරමන්,
සභාපති,
මාලිම්බඩ ප්‍රාදේශීය සභාව.

2018 සැප්තැම්බර් මස 18 වැනි දින,
මාලිම්බඩ ප්‍රාදේශීය සභාව,
මාලිම්බඩ.

12-179/4

මාලිම්බඩ ප්‍රාදේශීය සභාව

2019 වර්ෂය සඳහා අක්කර බදු

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ,

(අ) 134 වැනි වගන්තියේ (3) වන උපවගන්තියේ පැවරී ඇති බලතල ප්‍රකාර, මාලිම්බඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශවල පිහිටියා වූ වගා කළ ඉඩම්වලින් හෙක්ටයාර් 01 කට නොඅඩු වන අවස්ථාවක රු. 50.00 බැගින් අක්කර බද්දක් හා ඊට වැඩි වන සෑම හෙක්ටයාරයකටම රු. 10.00 බැගින් අක්කර බද්දක් පනවා අය කිරීමටත්,

(ආ) 134 වගන්තියේ (6) වන උපවගන්තිය ප්‍රකාරව, යථෝක්ත බද්ද 2019 මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් මස 30 හා දෙසැම්බර් මස 31 වැනිදායින් අවසන් වන අයුරු කාර්තු 04 තුළ දී සමාන වාරික 04කින් සහ,

(ඇ) යථෝක්ත අක්කර බද්ද 2019 ජනවාරි මස 31 වැනි දින හෝ ඊට පෙර සම්පූර්ණයෙන් ම ගෙවන්නේ නම් 10% ක වට්ටමක් සහ වාර්ෂික අක්කර බද්ද එක් එක් කාර්තුවේ පළමු මාසයේ ගෙවන්නේ නම් 5% ක වට්ටමක් ලබා දීමටත්, මාලිම්බඩ ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

සෝමසිරි වීරමන්,
සභාපති,
මාලිම්බඩ ප්‍රාදේශීය සභාව.

2018 සැප්තැම්බර් මස 18 වැනි දින,
මාලිම්බඩ ප්‍රාදේශීය සභාව,
මාලිම්බඩ.

12-179/5

මාලිම්බඩ ප්‍රාදේශීය සභාව

2019 වර්ෂය සඳහා විනෝද බද්ද

විනෝද බදු ආඥාපනතේ 2 වැනි වගන්තියේ 1 වැනි උපවගන්තිය යටතේ සෑම චිත්‍රපටි දර්ශනයක් මැජික් දර්ශනයක්, සර්කස් දර්ශනයක්, හා සෑම සංගීත සංදර්ශනයක් සඳහාම මුද්‍රණය කරන ලද ප්‍රවේශ පත්‍රවල වටිනාකමින් 10% ක විනෝද බද්දක් අයකළ යුතු බවට, මාලිම්බඩ ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

ප්‍රසිද්ධ රඟදැක්වීමේ ආඥාපනත

(176) වැනි අධිකාරය ප්‍රසිද්ධ රඟ දැක්වීමේ ආඥාපනතේ 3 වැනි වගන්තිය ප්‍රකාරව, මාලිම්බඩ ප්‍රාදේශීය සභාව විසින් පනවන ලද පහත සඳහන් බලපත්‍ර ගාස්තුවක් 2019 වර්ෂයට ගෙවිය යුතු බවට, මාලිම්බඩ ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

දින 01කට	රුපියල් 100 0
වැඩිවන සෑම දිනකටම	රුපියල් 25 0
ලිත් මාස 01 කාලයක් සඳහා	රුපියල් 1,000 0

සෝමසිරි වීරමන්,
සභාපති,
මාලිම්බඩ ප්‍රාදේශීය සභාව.

2018 සැප්තැම්බර් මස 18 වැනි දින,
මාලිම්බඩ ප්‍රාදේශීය සභාව,
මාලිම්බඩ.

12-179/6

මාලිම්බඩ ප්‍රාදේශීය සභාව

ඉඩම් විකිණීම මත බදු අය කිරීම - 2019

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 154(1) වැනි වගන්තිය යටතේ මාලිම්බඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ යම් ඉඩමක් වෙන්දේසිකරුවකු හෝ තැරැව්කරුවකු හෝ ඔහුගේ සේවකයා හෝ අනුයෝජිතයා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ හෝ අන්‍යාකාරයකින් විකුණනු ලබන අවස්ථාවක, ඒ ඉඩමේ විකිණීමෙන් ලත් මුදලින් 1%කට සමාන බද්දක් විකුණුම්කරු හෝ වෙන්දේසිකරු හෝ තැරැව්කරු හෝ ඔහුගේ සේවකයා හෝ අනුයෝජිතයා විසින් එම ඉඩම් විකිණීමෙන් ලත් මුදලින් මාලිම්බඩ ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවට මාලිම්බඩ ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

සෝමසිරි වීරමන්,
සභාපති,
මාලිම්බඩ ප්‍රාදේශීය සභාව.

2018 සැප්තැම්බර් මස 18 වැනි දින,
මාලිම්බඩ ප්‍රාදේශීය සභාව,
මාලිම්බඩ.

12-179/7

මාලිම්බඩ ප්‍රාදේශීය සභාව

2019 වර්ෂයට සංවර්ධනය නොකළ ඉඩම් මත බදු පැනවීම

මාලිම්බඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත පිහිටියා වූ සහ කිසිදු ගොඩනැගිල්ලක් ඉදිකර නොමැති හෝ විධිමත් හෝ නිත්‍ය ලෙස වගා කිරීමට යටත් කර නොමැත්තා වූ කිසියම් ඉඩමක් සංවර්ධනය නොකළ ඉඩමක් වශයෙන් තීරණය කිරීමටත්,

එවැනි සෑම ඉඩමකම අයිතිකරුගෙන් ඒ ඉඩමේ ප්‍රාග්ධන බිම් අගයෙන් සියයට එකක (1%) සංවර්ධනය නොකළ ඉඩම් මත බද්දක් අයකර ගත යුතු බවට, මාලිම්බඩ ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

සෝමසිරි වීරමන්,
සභාපති,
මාලිම්බඩ ප්‍රාදේශීය සභාව.

මාලිම්බඩ ප්‍රාදේශීය සභාව,
මාලිම්බඩ.

12-179/8

මාලිම්බඩ ප්‍රාදේශීය සභාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත

ප්‍රචාරක දැන්වීම - දෘශ්‍ය පරිසරය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 221(අ) හා 122 - 126 වැනි වගන්තිවලින් පැවරී ඇති බලතල අනුව 1988.08.23 වැනි දින අංක 520/7 දරන පළාත් පාලන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* iv(අ) කොටසේ ගරු අමාත්‍යතුමා විසින් ප්‍රකාශයට පත්කරන ලදුව 2008.12.23 වැනි දින අංක 1586 දරන *ගැසට් පත්‍රයේ* නිවේදනයක් විසින් මාලිම්බඩ ප්‍රාදේශීය සභාව විසින් පිළිගෙන ඇති අතර අතුරු ව්‍යවස්ථාවල 39 වැනි ඡේදය යටතේ මාලිම්බඩ ප්‍රාදේශීය සභා සීමාව තුළ ප්‍රචාරක දැන්වීම් දෘශ්‍ය (බැනර් ඇතුළුව) ඉදිකිරීම හා ප්‍රදර්ශනය කිරීම වෙනුවෙන් පහත උපලේඛනයේ දැක්වෙන ගාස්තු 2019.01.01 වැනි දින සිට නැවත සංශෝධනය කරන තුරු පනවා අයකළ යුතු බවට මාලිම්බඩ ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

සෝමසිරි වීරමන්,
සභාපති,
මාලිම්බඩ ප්‍රාදේශීය සභාව.

මාලිම්බඩ ප්‍රාදේශීය සභාව,
මාලිම්බඩ.

උපලේඛනය

ප්‍රචාරක දැන්වීම් විස්තරය :

01. පෞද්ගලික පරිශ්‍රයේ ඉදි කරනු ලබන හෝ ප්‍රදර්ශනය කරන දැන්වීම් පුවරු සඳහා වර්ෂයකට (වර්ග අඩි 1 මිල රු. 75) බැනර්/කටවුට් සඳහා (ව. අ. 1 ක මිල රු. 50)

02. මහා මාර්ගයට පෙනෙන පරිදි අවකාශිත ඉඩකඩ භාවිතා කරමින් මහා මාර්ගයට යාබද ඉදි කරනු ලබන හෝ ප්‍රදර්ශනය කරනු ලබන පුවරු සඳහා වර්ෂයකට (වර්ග අඩි 1 මිල රු. 50) බැනර්/කටවුට් සඳහා (ව. අ. 1 ක මිල රු. 30)

03. පළාත් පාලන ආයතන පරිශ්‍රයන් ප්‍රයෝජනයට ගනිමින් ඉදි කරනු ලබන හෝ ප්‍රදර්ශනය කරනු ලබන පුවරු සඳහා වර්ෂයකට (වර්ග අඩි 1 මිල රු. 100) බැනර්/කටවුට් සඳහා (ව. අ. 1 ක මිල රු. 50)

04. පළාත් පාලන ආයතන විසින් ඉදි කරන ලද විශාල දැන්වීම් පුවරු භාවිතා කරමින් ප්‍රදර්ශනය කරනු ලබන පුවරු සඳහා වර්ෂයකට (වර්ග අඩි 1 මිල රු. 150), බැනර්/කටවුට් සඳහා (ව. අ. 1 ක මිල.රු. 75)

12-179/9

මාලිම්බඩ ප්‍රාදේශීය සභාව

සම්මත අතුරු ව්‍යවස්ථා

1989 අංක 12 දරන පළාත් සභා (අනුශාංගික විධිවිධාන පනතේ 2 වැනි වගන්තියේ (i) වැනි උපවගන්තියේ (අ) ඡේදය සමග කියවිය යුතු 261 වැනි අධිකාරය වන 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වැනි වගන්තියේ (i) වැනි උපවගන්තිය යටතේ පැවරී ඇති බලතල ප්‍රකාර, දකුණු පළාතේ පළාත් සභාවේ පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2013.05.17 වැනි දින අංක 11811 දරන *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* පළ කරන ලද්දා වූ ද සම්මත අතුරු ව්‍යවස්ථාවල,

අතුරු ව්‍යවස්ථා අංකය	*අතුරු ව්‍යවස්ථාවේ නම*
i	සියලු සම්මත අතුරු ව්‍යවස්ථාවලට අදාළ අර්ථ නිරූපනය පිළිබඳ අතුරු ව්‍යවස්ථා
ii	සියලු සම්මත අතුරු ව්‍යවස්ථාවලට පොදු විධිවිධාන පිළිබඳ අතුරු ව්‍යවස්ථා
iii	කිසියම් අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන හෝ නියමයන් උල්ලංඝනය කිරීම සම්බන්ධ දඬුවම් පිළිබඳ අතුරු ව්‍යවස්ථා
x	පිහිනුම් තටාක
xi	අයිස් කර්මාන්තශාලා
xvi	කර්මාන්තශාලා
xvii	අවමංගල්‍ය සේවා සැපයුම්
xix	පදික මාරු ස්ථාන
xx	ඉදි කිරීම් ද්‍රව්‍ය ආශ්‍රිත කර්මාන්ත ස්ථාන හා ඉදි කිරීම් ද්‍රව්‍ය ගබඩා ස්ථාන විධිමත් කිරීම හා අධීක්ෂණය
xxii	මාර්ගවලට අලාභහානි කිරීම සහ මාර්ගවල ගමනාගමනයට බාධා කිරීම වැළැක්වීම
xxiii	ආදාහනාගාර විධිමත් කිරීම/පාලනය කිරීම/ගාස්තු අය කිරීම
xxiv	පොදු වෙළෙඳපොළ පවත්වාගෙන යාම
xxvi	ප්‍රජා ශාලා
xxix	වාර වාර්තා සහ තොරතුරු ඉදිරිපත් කිරීම

පිළිබඳ යෝජනාව මාලිම්බඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ *ගැසට් පත්‍රයේ* පළවන දින සිට පනවා ක්‍රියාත්මක කිරීමට මාලිම්බඩ ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

සෝමසිරි වීරමන්,
සභාපති,
මාලිම්බඩ ප්‍රාදේශීය සභාව.

2018 සැප්තැම්බර් මස 18 වැනි දින,
මාලිම්බඩ ප්‍රාදේශීය සභාව,
මාලිම්බඩ.

12-179/10

මාලිම්බඩ ප්‍රාදේශීය සභාව

2019 වර්ෂය සඳහා වෙනත් ගාස්තු

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ විධිවිධානවලට යටත්ව මාලිම්බඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ 2019 වර්ෂය සඳහා පහත උපලේඛනයේ දැක්වෙන වෙනත් ගාස්තු ප්‍රමාණයන් අය කළ යුතු බවට මාලිම්බඩ ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය.

සෝමසිරි වීරමන්,
සභාපති,
මාලිම්බඩ ප්‍රාදේශීය සභාව.

2018 සැප්තැම්බර් මස 18 වැනි දින,
මාලිම්බඩ ප්‍රාදේශීය සභාව,
මාලිම්බඩ.

උපලේඛනය

		රු. ශත
01.	ඒටී පෝරම ගාස්තු	300 0
02.	ගොඩනැගිලි අයදුම්පත් ගාස්තු	750 0
03.	අනතුරුදායක ගස් කැපීමේ ගාස්තු - කොස්, තේක්ක, මහෝගනී, පොල් යනාදී	
	දෑව වටිනාකමක් ඇති ගස් සඳහා	500 0
	වෙනත් ගසක් සඳහා (වැඩිවන ගසකට 100.00 බැගින්)	200 0
04.	වීථිරේඛා හා නොපවරා ගැනීමේ අයදුම්පත් ගාස්තු	350 0
05.	ඉඩම් අනුබෙදුමක් සඳහා බලපත්‍රයක් ලබා ගැනීමේ අයදුම්පත්‍ර ගාස්තු	300 0
06.	ගොඩනැගිලි අයදුම්පතක් කාලය දීර්ඝ කිරීම සඳහා - එක් වර්ෂයකට	200 0
07.	නාගරික සංවර්ධන බල ප්‍රදේශයට අයත් නොවන ගොඩනැගිලි සඳහා අනුකූලතා සහතික අයදුම්පත්‍ර ගාස්තු :	
	නාගරික සංවර්ධන බල ප්‍රදේශයට අයත් වන	3,000 0
	නාගරික සංවර්ධන බල ප්‍රදේශයට අයත් නොවන	1,000 0
08.	ගොඩනැගිලි අයදුම්පත්‍ර පරීක්ෂණ ගාස්තු : (නාගරික බල ප්‍රදේශයට අයත් නොවන)	
	වර්ග අඩි 500ට අඩු	100 0
	වර්ග අඩි 501 සිට 1,000 දක්වා	500 0
	වර්ග අඩි 1,001 සිට 1,500 දක්වා	1,000 0
	වර්ග අඩි 1,501 සිට 2,000 දක්වා	1,500 0
	2,000ට වැඩි සෑම වර්ග අඩි 100 කට හෝ ඉන් කොටසකට	100 0
09.	බිම් කට්ටි අනුමත කිරීමේ ගාස්තු (නාගරික බල ප්‍රදේශයට අයත් නොවන)	
	පර්. 06 - 20 දක්වා	250 0
	පර්. 21 - 40 දක්වා	350 0
	පර්. 41 - 60 දක්වා	600 0
	පර්. 61 - 120 දක්වා	1,000 0
	පර්. 121 - 160 දක්වා	2,000 0
	161 ට වැඩි වන සෑම පර්. 01ක් ඉන් කොටසකට	100 0 බැගින්
10.	විදුලිය ලබා ගැනීමේ සහතික නිකුත් කිරීමේ ගාස්තු	200 0
11.	ජල නළ එලීම සඳහා සහතික නිකුත් කිරීමේ ගාස්තු	250 0
	ආරක්ෂිත ඇප තැන්පතු	2,500 0
12.	පරිසර බලපත්‍ර අලුත් කිරීමේ අයදුම්පතක් සඳහා මුද්දර ගාස්තු 10% ඇතුළත්ව	4,000 0
13.	පරිසර බලපත්‍ර පරීක්ෂණ ගාස්තුව	3,000 0
14.	පරිසර බලපත්‍ර අලුත් කිරීමේ අයදුම්පතක් සඳහා	50 0
15.	පරිසර බලපත්‍ර අලුතින් අයදුම් කිරීමේ පෝරම ගාස්තු	100 0
16.	පුස්තකාල සාමාජිකත්වය ලබා ගැනීමේ ඇප තැන්පතුව :	
	පාසල් ළමුන් සඳහා	100 0
	වැඩිහිටි සාමාජිකත්වය සඳහා	150 0
17.	පුස්තකාල අයදුම්පත් ගාස්තු	10 0
	සාමාජිකත්වය අලුත් කිරීම වර්ෂ 05කට වරක් ගාස්තුව	100 0

		රු. ශත
18.	ජල බවුසරය ලබාදීම (දිනකට)	3,500 0
	වැඩි වන දිනක් සඳහා	500 0
	බල ප්‍රදේශයෙන් පිටත	
	කි.මී් 1 - කි.මී. 5 දක්වා	400 0
	කි.මී. 5 - කි.මී. 10 දක්වා	600 0
	ඊට වැඩිවන සෑම කි.මී. 1ක් සඳහා	50 0
19.	වරිපනම් සහතික ගාස්තු	200 0
20.	ව්‍යාපාර හා වෙනත් සහතික ගාස්තු	200 0
21.	පාපැදි නිකුත් කිරීමේ පෝරම ගාස්තු	16 0
22.	ට්‍රැක්ටරය කුළියට දීමේ ගාස්තු (දිනකට)	4,500 0
23.	ලොකු ගල් රෝල කුළියට දීම (පැය 08කට)	8,000 0
	වැඩිවන පැයකට	810 0 බැගින්
24.	ලොකු ගෑස් ලිප බදු දීම (දිනකට)	500 0
25.	කි. ග්‍රෑම් 50ක බත් උයන පියන සහිත සාස්පාන බදු දීම (දිනකට)	350 0
26.	ලොකු තාච්චි 01 බදු දීම (දිනකට)	250 0
27.	ඇළුමිනියම් වතුර උණු කරන ලොකු කේතලය බදු දීම (දිනකට)	100 0
28.	පස් කපන යන්ත්‍රය පැයකට	2,100 0
29.	ටිපර් රථය දිනකට (පැය 08)	12,000 0
30.	පොදු වෙළෙඳපොළවල් බදු දීම - වාණිජ නොවන (දිනකට)	1,000 0
	- වාණිජ	3,000 0
31.	සමර් හට් එකක් බදු දීම සඳහා (දිනකට)	1,000 0
	ටකරන් මඩුව කුළියට දීම	
	10 x 20 මඩුව සඳහා - දිනකට	700 0
	I. දින දෙකක් සඳහා	1,000 0
	10 x 40 මඩුව සඳහා - දිනකට	1,050 0
	II. දින දෙකක් සඳහා	1,500 0
32.	ජංගම වෙළෙඳාම හා ජංගම ප්‍රචාරණ කටයුතු සඳහා ගාස්තු :	
	සැහැල්ලු වාහන හා වෙනත්	500 0
	බර වාහන	1,000 0
33.	ශ්‍රවනාගාරය ලබා දීම	*රැස්වීම් සඳහා රු. ශත*
34.	රාජ්‍ය ආයතන - දින 01 (පැය 08)	3,000 0
	පෞද්ගලික - දින 01 (පැය 08)	5,000 0
	ආරක්ෂිත ඇප තැන්පතුව (පෞද්ගලික අංශයට පමණි)	2,000 0
35.	ජලනල එලීම සඳහා මාර්ග පළුදු කිරීම දික් මීටරයකට :	
	බොරළු මාර්ගය හරහා පළුදු කිරීම	520 0
	බොරළු මාර්ගය ඉවුර පළුදු කිරීම	246 0
	මාර්ග දිගේ ඉවුර පළුදු කිරීම	164 0
	කොන්ක්‍රීට් හා තාර පාර හරහා පළුදු කිරීමට ගාස්තු	520 0
	ඒ සඳහා තැන්පතු	2,500 0
36.	ජල ටැංකිය	500 0
37.	ජල මෝටරය	3,000 0

මාලිම්බඩ ප්‍රාදේශීය සභාව

කසල ගාස්තුව- 2019 වර්ෂය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වැනි වගන්තිය සහ 126 (ix) ආ වගන්තිය ප්‍රකාරව ලැබී ඇති බලතල මත මාලිම්බඩ ප්‍රාදේශීය සභාව විසින් 2008 දෙසැම්බර් මස 23 වැනි දින සම්මත කරගත් පොදු අතුරු ව්‍යවස්ථාව අනුව කසල ශෝධන සේවාව සලසනු ලබන දැහැමි මාවත, මැජෙස්ටික් කෝට් ගම්මානය, මාළිගාතැන්න ගම්මානයේ ආරම්භක කොටස්, අලස්වත්ත ගම්මානය, කොලේජ්වීව් ගම්මානය, මැදගොඩ ඇතුළු කසල එකතු කිරීමේ විශේෂ ව්‍යාපෘතියට ඇතුළත්වීමට කැමති ප්‍රදේශ හා මාර්ගවල පදිංචිකරුවන්ගෙන් පහත උපලේඛනයේ සඳහන් ගාස්තු පනවා අයකළ යුතු බවට මාලිම්බඩ ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

සෝමසිරි වීරමන්,
සභාපති,
මාලිම්බඩ ප්‍රාදේශීය සභාව.

2018 සැප්තැම්බර් මස 18 වැනි දින,
මාලිම්බඩ ප්‍රාදේශීය සභාව,
මාලිම්බඩ.

උපලේඛනය

1. වරිපනම් අය නොකරන වර්ගීකරණය කර දෙනු ලබන කසළ සඳහා නිවසකින් මසකට රු. 75 (වාර්ෂිකව රු. 600)
2. වර්ගීකරණය නොකරන ලද කසළ සඳහා නිවසකින් මාසිකව රු. 300 (වාර්ෂිකව රු. 3,000)
3. වෙන් කරන ලද කසළ සඳහා ව්‍යාපාරික ස්ථානයකින් මසකට රු. 100 (වාර්ෂිකව රු. 1,000)
4. වෙන් නොකරන ලද කසළ සඳහා ව්‍යාපාරික ස්ථානයකින් මාසිකව රු. 400 (වාර්ෂිකව රු. 4,000)
5. වෙන් කරන ලද කසළ සඳහා මධ්‍ය පරිමාණ කර්මාන්තයකින් මසකට රු. 250 (වාර්ෂිකව රු. 2,500)
6. වෙන් නොකරන ලද කසළ සඳහා මධ්‍ය පරිමාණ කර්මාන්තයකින් මසකට රු. 700 (වාර්ෂිකව රු. 7,000)
7. මහා පරිමාණ කර්මාන්ත ශාලාවකින් වෙන් කරන ලද කසල සඳහා මාසිකව රු. 2,000 (වාර්ෂිකව රු. 20,000)
8. වෙන් නොකරන ලද කසල සඳහා මහා පරිමාණ කර්මාන්ත ශාලාවකින් මසකට රු. 6,500 (වාර්ෂිකව රු. 65,000)

12-179/12

අරණායක ප්‍රාදේශීය සභාව

2019 වර්ෂය සඳහා වරිපනම් බදු පැනවීම

අරණායක ප්‍රාදේශීය සභාව විසින් 2018 වර්ෂයේ සැප්තැම්බර් මස 18 වැනි දින පවත්වන ලද අරණායක ප්‍රාදේශීය සභා රැස්වීමේ දී තීරණ අංක 14 යටතේ පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මහජනයා වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2019 වර්ෂය සඳහා පනවන ලද ඒ වරිපනම් බද්ද මාර්තු මස 31, ජූනි 30, සැප්තැම්බර් මස 30 හා දෙසැම්බර් 31 යන දිනවලින් අවසන් වන සෑම කාර්තුවක් තුළ දී සමාන වාරික හතරකින් ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවත් මෙයින් වැඩි දුරටත් නිවේදනය කරනු ලැබේ.

2019 වර්ෂය සඳහා වන සම්පූර්ණ වරිපනම් 2019 වර්ෂයේ ජනවාරි මස 31 වැනි දින හෝ එදිනට පෙර අරණායක ප්‍රාදේශීය සභා කාර්යාලය වෙත ගෙවනු ලැබුවහොත් එම සම්පූර්ණ වරිපනම් ප්‍රමාණයෙන් 10%ක (සියයට දහයක) වට්ටමක් ද, එක් එක් කාර්තුවට අදාළ වරිපනම් ඒ එක් එක් කාර්තුවේ ප්‍රථම මාසයේ අවසන් දින හෝ එදිනට මත්තෙන් අරණායක ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබුව හොත් ඒ එක් එක් කාර්තුවේ වරිපනම් ප්‍රමාණයෙන් 5% (සියයට පහක) වට්ටමක් ද ගෙවනු ලැබේ.

කේ. ඒ. නිහාල් සෙනෙවිරත්න,
සභාපති,
අරණායක ප්‍රාදේශීය සභාව.

2018 නොවැම්බර් මස 23 වැනි දින,
අරණායක ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 146 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව අරණායක ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ දියුණු කළ ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත් කරන ලද ප්‍රදේශ ඇතුලත පිහිටියා වූ සියලුම නිවාසවල, ගොඩනැගිලිවල, ඉඩම්වල හා කවර වූ ගෙපත්වල වාර්ෂික තක්සේරු වටිනාකම වශයෙන් අරණායක ප්‍රාදේශීය සභාව විසින් 2018 වර්ෂය සඳහා පිළිගෙන තිබූ වාර්ෂික තක්සේරු වටිනාකම සහ ඇතැම් දේපල සම්බන්ධයෙන් තක්සේරු දෙපාර්තමේන්තුව විසින් සංශෝධනය කරනු ලැබූ අරණායක ප්‍රාදේශීය සභාව විසින් පිළිගෙන ඇති එම සංශෝධන අනුව වාර්ෂික වටිනාකම ද 2019 වර්ෂය සඳහා පිළිගැනීමටත්,

එකී ප්‍රාදේශීය සභා පනතේ 134 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් ලැබී ඇති බලතල ප්‍රකාරව ඉහත කී වාර්ෂික තක්සේරු වටිනාකමින්,

01. අරණායක, දිප්පිටිය, ගැවිලිපිටිය යන කොට්ඨාසවල නිශ්චල දේපළ මත 10% ක වරිපනමක් ද,

02. උස්සාපිටිය, අලුපොත, විල්පල, දෙබත්ගම, මාවතගොඩ, උග්ගොඩ, හොරේවල යන ප්‍රදේශවල පිහිටි සෑම නිශ්චල දේපළක් මතම 5% (සියයට පහක) වරිපනමක් ද,

2019 වර්ෂය සඳහා පනවා අය කිරීමටත් සහ එකී වරිපනම්, එකී ප්‍රාදේශීය සභා පනතේ 134 වැනි වගන්තියේ (6) වැනි උපවගන්තියේ විධිවිධාන යටතේ 2019 වර්ෂයේ මාර්තු 31, ජූනි 30, සැප්තැම්බර් 30 හා දෙසැම්බර් 31 දින වලදී අවසන් වන එක් එක් කාර්තුවල අවසන් වීමට පෙර සමාන වාරික හතරකින් අරණායක ප්‍රාදේශීය සභාවට ගෙවීමට විධාන කිරීමටත්,

තව ද, 2019 වර්ෂයෙහි පහත උපලේඛනයේ සඳහන් එක් එක් කාර්තුව වෙනුවෙන් ඉදිරියෙන් නිරූපිත දිනයට පෙර එසේ නියම කරන ලද වාර්ෂික වරිපනම් බද්ද 2019 වර්ෂයෙහි ජනවාරි මස 31 වැනි දින හෝ ඊට ප්‍රථම ගෙවන්නේ නම් වාර්ෂික වරිපනම් බද්දේ ප්‍රමාණයෙන් 10% ක (සියයට දහයක්) වට්ටමක් ද, එකී උපලේඛනයෙහි එක් එක් කාර්තුව ඉදිරියේ තුන්වන තීරුවේ නිරූපිත දිනයට පෙර අදාල වරිපනම් බදු මුදල ප්‍රාදේශීය සභා අරමුදලට ගෙවනු ලබන්නේ නම් එක් කාර්තුවකට අදාළ මුදලින් 5% ක වට්ටමක් ද අරණායක ප්‍රාදේශීය සභාව ලබා දිය යුතු බවටත් අරණායක ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

උපලේඛනය

කාර්තුව	*ගෙවිය යුතු දිනය*	*5% වට්ටම සඳහා හිමිකම් ලබන අවසාන දිනය*
පළමු කාර්තුව	2019.03.31	2019.01.31
දෙවන කාර්තුව	2019.06.30	2019.04.30
තුන්වන කාර්තුව	2019.09.30	2019.07.31
හතරවන කාර්තුව	2019.12.31	2019.10.31

12-187/1

අරණායක ප්‍රාදේශීය සභාව

2019 වර්ෂය සඳහා අක්කර බදු පැනවීම

අරණායක ප්‍රාදේශීය සභාව විසින් 2018 වර්ෂයේ සැප්තැම්බර් මස 18 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ දී තීරණ අංක 15 යටතේ පහත සඳහන් යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2019 වර්ෂය සඳහා පනවන ලද ඒ අක්කර බද්ද මාර්තු මස 31, ජූනි 30, සැප්තැම්බර් මස 30 හා දෙසැම්බර් 31 යන දිනවලින් අවසන් වන සෑම කාර්තුවක් තුළ දී සමාන වාරික හතරකින් ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවත් මෙයින් වැඩි දුරටත් නිවේදනය කරනු ලැබේ.

2019 වර්ෂය සඳහා සම්පූර්ණ අක්කර බද්ද 2019 වර්ෂයේ ජනවාරි මස 31 වැනි දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලය වෙත ගෙවනු ලැබුවහොත් එම සම්පූර්ණ අක්කර බදු ප්‍රමාණයෙන් සියයට දහයක (10%) ක වට්ටමක් ද එක් එක් කාර්තුවට අදාළ අක්කර බද්ද ඒ එක් එක් කාර්තුවේ ප්‍රථම මාසයේ අවසන් දිනයට මත්තෙන් ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබුවහොත් සියයට පහක (5%) ක වට්ටමක් ද ගෙවනු ලැබේ.

කේ. ඒ. නිහාල් සෙනෙවිරත්න,
සභාපති,
අරණායක ප්‍රාදේශීය සභාව.

2018 නොවැම්බර් මස 23 වැනි දින,
අරණායක ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 146 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය ප්‍රකාර අරණායක ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල අනුව 2018 වර්ෂයේ සත්‍යාක්ෂණයම 2019 වර්ෂය සඳහා පිළිගැනීමටත්,

එකී පනතේ 134 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තියෙන් ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව අරණායක ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටියා වූ ඉහත කී පනතේ 135 වැනි වගන්තියේ නියමය යටතේ අක්කර බද්දෙන් නිදහස් කර නොමැත්තා වූ ද, ස්ථිර හෝ නිතිපතා වගා යටතේ වූ,

(අ) ඉහත කී පනතේ 134 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තියේ අතුරු විධාන යටතේ පළාත් පාලන විෂයභාර අමාත්‍යතුමා විසින් අරණායක ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය විශේෂ ප්‍රදේශයක් වශයෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ IV (ආ) වැනි කොටස 1989.03.10 දිනැති *ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත් කර ඇති හෙක්ටයාර් එකකට වැඩි එහෙත් හෙක්ටයාර් පහකට අඩු සෑම ඉඩමක් මතම 2019 වර්ෂය සඳහා රු. 50.00 (පනහක්) බැගින් වන වාර්ෂික අක්කර බද්දක් පනවා අයකිරීමටත්,

(ආ) හෙක්ටයාර් 05ක් හෝ ඊට වැඩි වූ සෑම ඉඩමක් වෙනුවෙන්ම එකී ඉඩමේ සෑම හෙක්ටයාරයක් මතම 2019 වර්ෂය සඳහා රු. 10 බැගින් වන වාර්ෂික අක්කර බද්දක් පනවා අයකිරීමටත්, සහ

(ඇ) ප්‍රාදේශීය සභා පනතේ 134 වැනි වගන්තියේ (6) වැනි උපවගන්තියේ විධි විධාන යටතේ එකී වර්ෂයේ මාර්තු 31, ජූනි 30, සැප්තැම්බර් 30 හා දෙසැම්බර් 31 යන දිනවලට පෙර සමාන වාරික හතරකින් අරණායක ප්‍රාදේශීය සභාවට ගෙවීමටත්,

(ඉ) තව ද, 2019 වර්ෂයෙහි පහත උපලේඛනයෙහි සඳහන් එක් එක් කාර්තුව වෙනුවෙන් ඉදිරියෙන් නිරූපිත දිනයට පෙර එසේ නියම කරන ලද වාර්ෂික අක්කර බද්ද අරණායක ප්‍රාදේශීය සභා අරමුදලට ගෙවිය යුතු බවටත්, එසේ වාර්ෂික අක්කර බදු 2019 වර්ෂයෙහි ජනවාරි මස 31 වැනි දින හෝ ඊට ප්‍රථම ගෙවන්නේ නම් වාර්ෂික අක්කර බද්දේ ප්‍රමාණයෙන් සියයට දහයක (10%) වට්ටමක් ද, එකී උපලේඛනයෙහි එක් එක් කාර්තුව ඉදිරියේ තුන්වන තීරුවේ නිරූපිත දිනයට පෙර අදාල අක්කර බදු මුදල අරණායක ප්‍රාදේශීය සභා අරමුදලට ගෙවනු ලබන්නේ නම් එක කාර්තුවකට මුදලින් 5% ක වට්ටමක් ද අරණායක ප්‍රාදේශීය සභාව ලබා දිය යුතු බවටත්, අරණායක ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය.

උපලේඛනය

කාර්තුව		*ගෙවිය යුතු දිනය*	*5% වට්ටම සඳහා හිමිකම් ලබන අවසාන දිනය*
පළමු කාර්තුව	-	2019.03.31	2019.01.31
දෙවන කාර්තුව	-	2019.06.30	2019.04.30

තුන්වන කාර්තුව	-	2019.09.30	2019.07.31
හතරවන කාර්තුව	-	2019.12.31	2019.10.31

12-187/2

අරණායක ප්‍රාදේශීය සභාව

2019 වර්ෂය සඳහා කර්මාන්ත බදු පැනවීම

අරණායක ප්‍රාදේශීය සභාව විසින් 2018 වර්ෂයේ සැප්තැම්බර් මස 18 වැනි දින පවත්වන ලද අරණායක ප්‍රාදේශීය සභා රැස්වීමේ දී සභා තීරණ අංක 16 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2019 වර්ෂය සඳහා පනවන ලද ඒ කර්මාන්ත බද්ද ඒ වර්ෂයේ (2019) මාර්තු මස 31 වැනි දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවත් වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

කේ. ඒ. නිහාල් සෙනෙවිරත්න,
සභාපති,
අරණායක ප්‍රාදේශීය සභාව.

2018 නොවැම්බර් මස 23 වැනි දින,
අරණායක ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර අරණායක ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත කරගෙන යනු ලබන පහත උපලේඛනයේ I වන තීරුවේ සඳහන් එක් එක් කර්මාන්තය වෙනුවෙන්, එම උපලේඛනයේ II වන තීරුවේ ඒ එක් එක් කර්මාන්තය පවත්වාගෙන යනු ලබන ස්ථානයේ වාර්ෂික වටිනාකම අනුරූප තීරුවේ නිරූපිත ප්‍රමාණයක කර්මාන්ත බද්දක් 2019 වර්ෂය සඳහා පනවා අයකල යුතු බවත්, එකී කර්මාන්ත බද්දට යටත් තැනැත්තෙකු 2019 වර්ෂයේ මාර්තු මස 31 වැනි දිනට පෙර අරණායක ප්‍රාදේශීය සභාවට එකී බද්ද ගෙවිය යුතු බවට විධාන කිරීමට අරණායක ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය.

උපලේඛනය

	I තීරුව	*II තීරුව*		
		පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකම		
	කර්මාන්තය	*රු. 750 නොඉක්මවන අවස්ථාවක*	*රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1,500 ඉක්මවන අවස්ථාවක*
		රු. ශ.	*රු. ශ.*	*රු. ශ.*
1.	සිමෙන්ති ගල් හෝ භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
2.	හඳුන්කුරු නිෂ්පාදනය කිරීමේ කර්මාන්තයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
3.	සබන් නිෂ්පාදනය කිරීමේ කර්මාන්තයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
4.	ඉටිපන්දම් නිෂ්පාදනය කිරීමේ කර්මාන්තයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
5.	ගඩොල් හෝ බ්ලොක් ගල් සිමෙන්ති ගල් නිෂ්පාදනය කිරීමේ කර්මාන්තයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

	I තීරුව	*II තීරුව* *පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකම*		
	කර්මාන්තය	*රු. 750 නොඉක්මවන අවස්ථාවක*	*රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1,500 ඉක්මවන අවස්ථාවක*
		රු. ශ.	*රු. ශ.*	*රු. ශ.*
6.	මුද්‍රණාලයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
7.	ඇඳුම් මැසීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
8.	හස්ත කර්මාන්ත වැඩපලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
9.	පොල්තෙල් නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
10.	කුෂන් වැඩපලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
11.	බිම්මල් නිෂ්පාදනය කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
12.	පින්තූර රාමු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
13.	ඡායාරූප ගන්නා ස්ථානයක් (ස්ටුඩියෝ) පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
14.	තේ කුඩු නිෂ්පාදනය කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
15.	විදුලි උපකරණ අළුත්වැඩියා කිරීමේ හෝ නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
16.	පොල් තෙල් සිඳින ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
17.	වී අඹරා සහල් සකස් කිරීම	500 0	750 0	1,000 0
18.	විසිතුරු හෝ වෙනත් වර්ගයේ පැල තවානක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

12-187/3

අරණායක ප්‍රාදේශීය සභාව

2019 වර්ෂය සඳහා බලපත්‍ර ගාස්තු පැනවීම

අරණායක ප්‍රාදේශීය සභාව විසින් 2018 වර්ෂයේ සැප්තැම්බර් මස 18 වැනි දින පවත්වන ලද අරණායක ප්‍රාදේශීය සභා රැස්වීමේ දී තීරණ අංක 17 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඒ අනුව කිසියම් අතුරු ව්‍යවස්ථාවක් යටතේ අරණායක ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ කිසියම් කර්මාන්තයක් පවත්වාගෙන යාම සඳහා 2019 වර්ෂයේ දී අරණායක ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරනු ලබන සෑම බලපත්‍රයක් ම මත ගාස්තුවක් අයකරනු ලබන බව වැඩි දුරටත් නිවේදනය කරනු ලැබේ.

කේ. ඒ. නිහාල් සෙනෙවිරත්න,
සභාපති,
අරණායක ප්‍රාදේශීය සභාව.

2018 නොවැම්බර් මස 23 වැනි දින,
අරණායක ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

ප්‍රාදේශීය සභාව විසින් සාදන ලද අතුරු ව්‍යවස්ථාවක් යටතේ හෝ අරණායක ප්‍රාදේශීය සභාව විසින් පිළිගෙන ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවක් යටතේ අරණායක ප්‍රාදේශීය සභාව විසින් 2019 වර්ෂය තුළ දී නිකුත් කරනු ලබන බලපත්‍ර සම්බන්ධයෙන් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වැනි වගන්තිය සමග කියවිය යුතු 149 වැනි වගන්තියෙන් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති

බලතල ප්‍රකාර පහත උපලේඛනයේ I වන තීරුවේ සඳහන් එක් එක් කර්මාන්තය වෙනුවෙන් එම උපලේඛනයේ II වන තීරුවේ අනුරූප සටහනෙහි නිරූපිත ප්‍රමාණයක බලපත්‍ර ගාස්තුවක් පනවා අය කිරීමටත්,

එකී උපලේඛනයේ සඳහන් කර්මාන්ත 1968 අංක 14 දරන සංචාරක සංවර්ධන පනතේ කාර්ය සඳහා ලංකා සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි කර ඇති හෝ එය විසින් අනුමත කර ඇති හෝ පළිගෙන ඇති හෝටලයක් හෝ ආපනශාලාවක් හෝ නවාතැන්පලක් වන විට, ඉහතින් කුමක් සටහන්ව තිබුණත් එකී හෝටලයෙන් හෝ ආපනශාලාවෙන් හෝ නවාතැන්පලෙන් පසුගිය වර්ෂයේ (2018) වර්ෂයේ ලත් ලැබීම් වලින් 01%ක (සියයට එකක) ප්‍රමාණයක බලපත්‍ර ගාස්තුවක් පනවා අය කිරීමට අරණායක ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය.

උපලේඛනය

I තීරුව		*II තීරුව* *පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකම*		
	බලය දෙනු ලබන කාර්යය	*රු. 750 නොඉක්මවන අවස්ථාවක*	*රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1,500 ඉක්මවන අවස්ථාවක*
		රු. ශ.	*රු. ශ.*	*රු. ශ.*
1.	බේකරියක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
2.	තේ කඩයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
3.	දිවා ආහාර සමඟ හෝටලයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
4.	භෝජනාගාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
5.	ලැගුම් හලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
6.	බාබර් සැප්පුවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
7.	සකස් කරන ලද, පැකට් කරන ලද ශීත කළ කුකුල් මස්, මාළු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
8.	යන්ත්‍රානුසාරයෙන් හෝ අත්බෝර යොදා කළුගල් කැඩීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
9.	සිසිල් බීම නිෂ්පාදනය කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
10.	බේකරි නිෂ්පාදන අලෙවි කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
11.	ජංගම මාළු වෙළඳාම, පාපැදියෙන්, ලොරි රථයෙන්, මෝටර් සයිකලයෙන්, ත්‍රිරෝද රථයෙන්	500 0	750 0	1,000 0
12.	යාන්ත්‍රික දැව ඉරුම් හලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
13.	ලොන්ඩරියක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
14.	වැන්ඩින් වැඩපලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
15.	රූපලාවන්‍ය කටයුතු කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
16.	යාන්ත්‍රික වඩුමඩුවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
17.	විසිරි පින්තාරු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
18.	කෘෂි රසායන ද්‍රව්‍ය රසායනික පොහොර අලෙවි කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
19.	කුකුළු ගොවිපලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
20.	යන්ත්‍රානුසාරයෙන් කළුගල් ඇඹිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
21.	ටයර් හා ටියුබ් වොල්කනයිස් කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
22.	මල් ශාලාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
23.	මෝටර් වාහන සේවා කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
24.	ලියවන පට්ටලයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
25.	ගෑස් අලෙවි කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
26.	රසායනාගාර සේවාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

	I තීරුව	*II තීරුව* *පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකම*		
	බලය දෙනු ලබන කාර්යය	*රු. 750 නොඉක්මවන අවස්ථාවක*	*රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1,500 ඉක්මවන අවස්ථාවක*
		රු. ශ.	*රු. ශ.*	*රු. ශ.*
27.	සත්ව ආහාර ගබඩාකර අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
28.	රතිඤ්ඤු, ඇතුළු ගිණිකෙළි ගබඩාකර අලෙවි කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
29.	රස කැවිලි නිෂ්පාදනය හා අලෙවි කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
30.	දේශීය ආහාර අලෙවි කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

12-187/4

අරණායක ප්‍රාදේශීය සභාව

2019 වර්ෂය සඳහා ව්‍යාපාර බදු පැනවීම

අරණායක ප්‍රාදේශීය සභාව විසින් 2018 වර්ෂයේ සැප්තැම්බර් මස 18 වැනි දින පවත්වන ලද අරණායක ප්‍රාදේශීය සභා රැස්වීමේ දී තීරණ අංක 18 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2019 වර්ෂය සඳහා පනවන ලද ඒ ව්‍යාපාර බද්ද ඒ වර්ෂයේ මාර්තු මස 31 වැනි දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවත් මෙයින් වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

කේ. ඒ. නිහාල් සෙනෙවිරත්න,
සභාපති,
අරණායක ප්‍රාදේශීය සභාව.

2018 නොවැම්බර් මස 23 වැනි දින,
අරණායක ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වන වගන්තියේ (1) වන උපවගන්තියෙන් ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර එකී පනතේ හෝ ඒ යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබා ගැනීම හෝ එකී පනතේ 150 වැනි වගන්තිය යටතේ යම් කර්මාන්ත බද්දක් ගෙවීම අවශ්‍ය නොවන්නා වූ හා වෘත්තියක් නොවන්නා වූ කිසියම් ව්‍යාපාරයක් අරණායක ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත 2019 වර්ෂයේ දී කරගෙන යනු ලබන සෑම තැනැත්තෙකුගෙන්ම එකී ව්‍යාපාරය ඊට පෙර වර්ෂයේ ලැබීම් මෙහි පහත උපලේඛනයේ i වන තීරුවේ නිරූපිත යම් විෂයාංකයක සීමාවන් ඇතුළත පවත්නා අවස්ථාවක එකී ii වන තීරුවේ අනුරූප සටහනෙහි නිරූපිත අනුප්‍රමාණ අනුව වූ ව්‍යාපාර බද්දක් 2019 වර්ෂය සඳහා පනවා අය කිරීමටත්, බද්දට යටත් යම් තැනැත්තකු එකී ව්‍යාපාර බද්ද 2019 වර්ෂයේ මාර්තු 31 වැනි දිනට පෙර අරණායක ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවටත් විධාන කිරීමට අරණායක ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

උපලේඛනය

I වැනි තීරුව	*II වැනි තීරුව*
බද්ද අදාළ වන වර්ෂයට පෙර වර්ෂයේ ව්‍යාපාරයෙන් ලත් ලැබීම් ප්‍රමාණය	*ගෙවිය යුතු බද්ද රු. ශ.*
01. රු. 6,000 නොඉක්මවන විට	නැත
02. රු. 6,000 ඉක්මවන නමුත් රු. 12,000 නොඉක්මවන විට	90 0
03. රු. 1,200 ඉක්මවන නමුත් රු. 18,750 නොඉක්මවන විට	180 0
04. රු. 18,750 ඉක්මවන නමුත් රු. 75,000 නොඉක්මවන විට	360 0
05. රු. 75,000 ඉක්මවන නමුත් රු. 1,50,000 නොඉක්මවන විට	1,200 0
06. රු. 1,50,000 ඉක්මවන විට	3,000 0

12-187/5

අරණායක ප්‍රාදේශීය සභාව

2019 වර්ෂය සඳහා වාහන හා සතුන් පිළිබඳ බදු පැනවීම

අරණායක ප්‍රාදේශීය සභාව විසින් 2018 වර්ෂයේ සැප්තැම්බර් මස 18 වැනි දින පවත්වන ලද මහා සභා රැස්වීමේ දී තීරණ අංක 19 යටතේ පහත දක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඒ අනුව, අරණායක ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ මේ බද්දට යටත් වන කිසියම් වාහනයක් හෝ සතෙකු තබා ගන්නා සෑම තැනැත්තෙකුම විසින් එකී වාහනය හෝ සතා තමන් භාරයේ තබා ගන්නා දින ගණන දින තිහක් සම්පූර්ණ වූ වහාම 2019 වර්ෂය සඳහා වන මෙම බද්ද අරණායක ප්‍රාදේශීය සභාව වෙත ගෙවිය යුතු බවත් වැඩි දුරටත් නිවේදනය කරනු ලැබේ.

කේ. ඒ. නිහාල් සෙනෙවිරත්න,
සභාපති,
අරණායක ප්‍රාදේශීය සභාව.

2018 නොවැම්බර් මස 23 වැනි දින,
අරණායක ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වන වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 148 වන වගන්තිය සමග හතරවැනි උපලේඛනයේ විධිවිධානවලින් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර අරණායක ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ 2019 වර්ෂයේ දී පහත උපලේඛනයේ i වන තීරුවේ සඳහන් කිසියම් වාහනයක් හෝ සතකු තමා සන්තකයේ තබා ගන්නා සෑම තැනැත්තෙකුමත ම එකී උපලේඛනයේ ii වන තීරුවේ අනුරූප සටහනෙහි නිරූපිත බද්දක් 2019 වර්ෂය සඳහා පනවා අය කිරීමට අරණායක ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය.

උපලේඛනය

I වන තීරුව	*II වන තීරුව*
	රු. ශ.
(1) i. මෝටර් රථයක්, මෝටර් ට්‍රයිකාරයක්, මෝටර් ලොරියක්, මෝටර් බයිසිකලයක්, කරත්තයක් ජින් රික්ෂෝවක්, බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් නොවන සෑම වාහනයක් සඳහා	25 0

		රු. ශත
ii.	සෑම බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් හෝ බයිසිකල් කාරයක් හෝ බයිසිකල් කරත්තයක් සඳහා-	
	(අ) වෙළෙඳ කාර්යයක් සඳහා යොදවන්නේ නම්	18 0
	(ආ) වෙළෙඳ නොවන කාර්යයක් සඳහා යොදවන්නේ නම්	4 0
iii.	සෑම කරත්තයක් සඳහා	20 0
iv.	සෑම අත් කරත්තයක් සඳහා	10 0
v.	සෑම රික්ෂෝවක් සඳහා	7 50
vi.	සෑම අශ්වයකු, පෝනියෙකු හෝ කොටළුවකු සඳහා	15 0
vii.	සෑම ඇතෙකු සඳහා	50 0

(2) විශ්කම්භය අඟල් 26 නොඉක්මවන රෝද ඇති ළමා වාහන, වීල්බැරෝ, හුදෙක් පෞද්ගලික ස්ථානවල පමණක් වෙළෙඳ කාර්යය සඳහා යොදවන අත්කරත්ත සහ වෙළෙඳ කාර්යය සඳහා නොයොදවන අත්කරත්ත ඉහත ගෙවීමෙන් නිදහස් කෙරේ.

12-187/6

අරණායක ප්‍රාදේශීය සභාව

2019 වර්ෂය සඳහා සංවර්ධනය නොකළ ඉඩම් මත බදු පැනවීම

අරණායක ප්‍රාදේශීය සභාව විසින් 2018 වර්ෂයේ සැප්තැම්බර් මස 18 වැනි දින පවත්වන ලද අරණායක ප්‍රාදේශීය සභා රැස්වීමේ දී තීරණ අංක 20 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2019 වර්ෂය සඳහා පනවන ලද ඒ සංවර්ධනය නොකළ ඉඩම් මත බද්ද 2019 වර්ෂයේ මාර්තු මස 31 වැනි දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බව වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

කේ. ඒ. නිහාල් සෙනෙවිරත්න,
සභාපති,
අරණායක ප්‍රාදේශීය සභාව.

2018 නොවැම්බර් මස 23 වැනි දින,
අරණායක ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 153 (1) වන වගන්තිය ප්‍රකාර, අරණායක ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි කිසියම් ඉඩමක්, ගොඩනැගිලි ඉදිකිරීමට පෙර ස්ථාවර නැතහොත් නිතිපතා ගොවිතැන් කිරීමට සුදුසුවන විටක හෝ යුක්ති සහගත වියදමකින් ඒ ඉඩම යම් කර්මාන්තයක් සඳහා සංවර්ධනය කළ හැකි විටක එවැනි යම් ඉඩමක,

(අ) ගොඩනැගිලි කිසිවක් ඉදිකර නොමැති නම්, හෝ
(ආ) ඒ ඉඩම විධිමත් ලෙස හෝ නිත්‍ය ලෙස වගා කිරීමට යටත්කර නොමැති විටක, හෝ

එකී ඉඩම සංවර්ධනය නොකළ ඉඩමක් වශයෙන් සැලකීමටත් සහ එවැනි සංවර්ධනය නොකළ ඉඩමක් වශයෙන් සැලකෙන ඉඩම් මත 2019 වර්ෂය සඳහා ඒ එක් එක් ඉඩමේ ප්‍රාග්ධන අගයෙන් 1%ක උපරිම වාර්ෂික බද්දක් 2019 වර්ෂයේ මාර්තු මස 31 දිනට පෙර අරණායක ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවට විධාන කිරීමටත් එම බද්දේ කාර්යය සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 153(1)(ආ) යටතේ වන සමානුපාතය වශයෙන් එම ඉඩමේ ගොඩනැගිලිවලින් ආවරණය වූ බිම් ප්‍රමාණය සම්පූර්ණ බිම් ප්‍රමාණය අතර අනුපාතය 1:5 විය යුතු බවටත් අරණායක ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය.

12-187/7

අරණායක ප්‍රාදේශීය සභාව

2019 වර්ෂය සඳහා ප්‍රචාරක දැන්වීම්/දෘෂ්‍ය පරිසරය පිළිබඳ අතුරු ව්‍යවස්ථානුකූල ගාස්තු

අරණායක ප්‍රාදේශීය සභාව විසින් 2018 වර්ෂයේ සැප්තැම්බර් මස 18 වැනි දින පවත්වන ලද මහා සභා රැස්වීමේ දී තීරණ අංක 21 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

කේ. ඒ. නිහාල් සෙනෙවිරත්න,
සභාපති,
අරණායක ප්‍රාදේශීය සභාව.

2018 නොවැම්බර් මස 23 වැනි දින,
අරණායක ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122(1) වැනි වගන්තියෙන් පැවරී ඇති බලතල අනුව 1988.08.23 වැනි දින 570/7 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළාත් පාලන නිවාස හා ඉදිකිරීම් ගරු අමාත්‍යතුමා අනුමත කර ප්‍රකාශයට පත්කර ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවේ 39 වැනි කොටසේ ප්‍රචාරක දැන්වීම් දෘෂ්‍ය පරිසරය පිළිබඳ අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාර අරණායක ප්‍රාදේශීය සභා සීමාව තුළ යම් වීදියක, ඇළකට, දොළකට, වැවකට හෝ අහසට පෙනෙන පරිදි වර්ග අඩියට නොඅඩු දැන්වීමක් හෝ ඉදිකිරීමක් ප්‍රදර්ශනය කිරීමට සැලැස්වීම වෙනුවෙන් පහත උපලේඛනයේ ගාස්තු අය කිරීමට අරණායක ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය.

උපලේඛනය

		එක් වර්ෂයකට හෝ එක් මාසයකට හෝ ඉන් කොටසකට ගාස්තු රු. ශ.
01.	බිත්තියක, පුවරුවක හෝ ලෑල්ලක ආධාරයෙන් ප්‍රදර්ශනය කර ඇති ප්‍රචාරක දැන්වීමක් සඳහා වර්ග අඩියට	50 0
02.	තාවකාලික ප්‍රචාරක දැන්වීමක් සඳහා වර්ග අඩියට (මාස තුනක කාල පරිච්ඡේදයක් සඳහා)	25 0

12-187/8

අරණායක ප්‍රාදේශීය සභාව

(176 වැනි අධිකරණ) ප්‍රසිද්ධ රඟ දැක්වීම් ආඥාපනත යටතේ පනවනු ලබන ගාස්තු - 2019 වර්ෂය

අරණායක ප්‍රාදේශීය සභාව විසින් 2018 වර්ෂයේ සැප්තැම්බර් මස 18 වැනි දින පවත්වන ලද රැස්වීමේ දී තීරණ අංක 22 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2019 වර්ෂයේ පවත්වනු ලබන සංදර්ශන එකී සංදර්ශන පැවැත්වීමට පෙර බලපත්‍ර ගාස්තුව අරණායක ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවත් මහජනතාව වෙත වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

කේ. ඒ. නිහාල් සෙනෙවිරත්න,
සභාපති,
අරණායක ප්‍රාදේශීය සභාව.

2018 නොවැම්බර් මස 23 වැනි දින,
අරණායක ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

(196 වන අධිකාරිය) ප්‍රසිද්ධ රඟ දැක්වීමේ ආඥාපනතේ (31) වැනි වගන්තිය යටතේ ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර අරණායක ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත මුදල් අයකර පෙන්වනු ලබන සංදර්ශන සඳහා පහත උපලේඛනයේ සඳහන් ගාස්තුවක් 2019 වර්ෂයට පනවා අයකළ යුතු බවත්, එකී බලපත්‍ර ගාස්තුව ගෙවිය යුතු බවට විධාන කිරීමට අරණායක ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

උපලේඛනය

		රු. ශ.
1.	මුදල් අයකර පෙන්වනු ලබන සංගීත සංදර්ශනයක් හැර	
(i)	එක් දිනකට	500 0
(ii)	එක් සතියකට	750 0
(iii)	එක් මසකට	1,500 0
2.	මුදල් අයකර පෙන්වනු ලබන සංගීත සංදර්ශනයක් සඳහා	
(i)	එක් දිනකට	1,000 0
(ii)	දින එකකට වඩා වැඩිවන විට අමතර - රු. 250.00 බැගින්.	

12-187/9

අරණායක ප්‍රාදේශීය සභාව

අන්තරාදායක හා අප්‍රසන්න වෙළෙඳාම් ප්‍රකාශයට පත්කිරීම

අරණායක ප්‍රාදේශීය සභාව විසින් 2018 වර්ෂයේ සැප්තැම්බර් මස 18 දින පවත්වන ලද අරණායක ප්‍රාදේශීය සභා රැස්වීමේ දී තීරණ අංක 23 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

1988 අගෝස්තු මස 23 වැනි දින අංක 520/7 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය* මගින් ප්‍රකාශයට පත්කර ඇති පොදු සම්මත අතුරු ව්‍යවස්ථා මාලාවේ 21 වන අතුරු ව්‍යවස්ථාවේ අන්තර්ගත උපලේඛනයට ඇතුළත්විය යුතු අන්තරාදායක අප්‍රසන්න වෙළෙඳාම් පහත උපලේඛනයේ පරිදි වන බව වැඩිදුරටත් මෙයින් නිවේදනය කරමි.

කේ. ඒ. නිහාල් සෙනෙවිරත්න,
සභාපති,
අරණායක ප්‍රාදේශීය සභාව.

2018 නොවැම්බර් මස 23 වැනි දින,
අරණායක ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

අරණායක ප්‍රාදේශීය සභාවේ විශේෂ කොමසාරිස් විසින් 1989.12.01 දිනැති *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* iv (ආ) වැනි කොටසේ ප්‍රකාශයට පත් කිරීම මගින් අරණායක ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ක්‍රියාත්මක කිරීම සඳහා පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථාව) පනතේ (261 වැනි අධිකාරිය) 3 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ තීරණය කර වැළඳගෙන ඇති පළාත් පාලන නිවාස හා ඉදිකිරීම් කටයුතු භාර අමාත්‍යවරයා විසින් සම්පාදනය කරන ලදුව 1988 අගෝස්තු මස 23 වැනි දින අංක 520/7 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද්දා වූ පොදු අතුරු ව්‍යවස්ථාවල i වැනි හා

ii වැනි කොටසේ 1 සිට 42 දක්වා වූ අතුරු ව්‍යවස්ථා අතුරින් 21 වැනි අතුරු ව්‍යවස්ථාවේ අන්තර්ගත උපලේඛනයට අන්තරාදායක හා අප්‍රසන්න වෙළෙඳමට අදළව පහත උපලේඛනය යටතේ ඇතුළත් වන්නා වූ වෙළෙඳාම් අදළ විය යුතු බවට අරණායක ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

උපලේඛනය

අන්තරාදායක හා අප්‍රසන්න වෙළෙඳාම්

1. යන්ත්‍රානුසාරයෙන් හෝ අත්බෝර මගින් කලුගල්වලක් පවත්වාගෙන යාම
2. කෘෂි රසායන ද්‍රව්‍ය, රසායනික පොහොර අලෙවි කරන ස්ථානයක් පවත්වාගෙන යාම
3. කුකුළු ගොවිපලක් පවත්වාගෙන යාම
4. යන්ත්‍රානුසාරයෙන් කළුගල් ඇඹරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
5. සකස් කරන ලද හෝ පැකට් කරන ලද ශීතකළ කුකුළු මස් අලෙවි කරන ස්ථානයක් පවත්වාගෙන යාම
6. ටයර් හා ටියුබ් වොල්කනයිස් කරන ස්ථානයක් පවත්වාගෙන යාම
7. මල් ශාලාවක් පවත්වාගෙන යාම
8. මෝටර් වාහන සේවා කරන ස්ථානයක් පවත්වාගෙන යාම
9. විසිරි පින්තාරු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
10. වෑල්ඩින් වැඩපලක් පවත්වාගෙන යාම
11. යාන්ත්‍රික දැව ඉරුම්හලක් පවත්වාගෙන යාම
12. යාන්ත්‍රික වඩු මඩුවක් පවත්වාගෙන යාම
13. ලියවන පට්ටලයක් පවත්වාගෙන යාම
14. ගෑස් අලෙවි ස්ථානයක් පවත්වාගෙන යාම
15. රසායනාගාර සේවාවක් පවත්වාගෙන යාම
16. සත්ව ආහාර ගබඩාකර අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
17. රතිඤ්ඤ, ඇතුළු ගිණිකෙළි ගබඩාකර අලෙවිකරන ස්ථානයක් පවත්වාගෙන යාම
18. වී අඹරා සහල් සකස් කරන ස්ථානයක් පවත්වාගෙන යාම

12-187/10

අරණායක ප්‍රාදේශීය සභාව

2019 වර්ෂය සඳහා විවිධ ගාස්තු පැනවීම

අරණායක ප්‍රාදේශීය සභාව විසින් 2018 වර්ෂයේ නොවැම්බර් මස 21 වැනි දින පවත්වන ලද මහා සභා රැස්වීමේ දී තීරණ අංක 24 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

කේ. ඒ. නිහාල් සෙනෙවිරත්න,
සභාපති,
අරණායක ප්‍රාදේශීය සභාව.

2018 නොවැම්බර් මස 23 වැනි දින,
අරණායක ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතින් හා වෙනත් අනපනත්වලින් ප්‍රාදේශීය සභාවලට පැවරී ඇති බලතල ප්‍රකාරව අරණායක ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ කාර්ය, කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී සිදුකරනු ලබන මහජන සුබසාධක සේවා හා වෙනත් බලතල ක්‍රියාවට නැංවීමේ දී අවශ්‍ය කරන සේවා සැපයීම සඳහා 2019 වර්ෂය තුළ දී ප්‍රාදේශීය සභා පොදු අරමුදලට අයකර ගත යුතු ගාස්තු පහත උපලේඛනයේ පරිදි විය යුතු බවට විධාන කිරීමට අරණායක ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය.

උපලේඛනය

		රු. ශ.
1.	වීථි රේඛා හා නොපවරා ගැනීමේ සහතිකය	750 0
2.	මිනින්දෝරු සැලැස්ම අනුමත කිරීමේ ගාස්තු	1,000 0
3.	අනුකූලතා සහතික නිකුත් කිරීම	750 0
4.	ගොඩනැගිලි පරීක්ෂණ ගාස්තු :	

	වර්ග අඩි ප්‍රමාණය	*නේවාසික රු. ශත*	*ව්‍යාපාරික රු. ශත*
(i)	වර්ග අඩි 750 ට අඩු	1,000 0	1,500 0
(ii)	වර්ග අඩි 751 සිට 1,500 දක්වා	1,200.0	1,800 0
(iii)	වර්ග අඩි 1,501 සිට 2,500 දක්වා	1,500.0	2,500 0
(iv)	වර්ග අඩි 2,501 ට වැඩි	2,500.0	3,000 0

			රු. ශ.
5.	(i)	ගොඩනැගිලි බලපත්‍රයේ බලපත්‍ර කාලය වසරකින් දීර්ඝ කිරීම	750 0
	(ii)	අමතර වසරකින් දීර්ඝ කිරීමේ ගාස්තු	100 0

6. පරිසර ආරක්ෂණ බලපත්‍ර සඳහා පරීක්ෂණ ගාස්තු :

(i)	රු. 2,50,000.00 හෝ ඊට අඩු	3,000 0
(ii)	රු. 2,50,001.00 සිට 5,00,000.00	3,750 0
(iii)	රු. 5,00,001.00 සිට 10,00,000.00	5,000 0
(iv)	රු. 10,00,001.00 ට වැඩි	10,000.0

7. පරිසර ආරක්ෂණ බලපත්‍ර ගාස්තු :

(i)	බලපත්‍ර ගාස්තුව	4,000 0
(ii)	මුද්දර ගාස්තු	400 0

8. මාර්ග පලුදු කිරීමේ ගාස්තු :

(i)	කොන්ක්‍රීට් පාර/තාර පාර අඩි - 2 1/2 x 2 1/2 වලක් කැඩීම සඳහා	1,200 0
(ii)	කොන්ක්‍රීට් පාර /තාර පාර හරහා කැඩීම වල සමග	3,000 0
(iii)	පස් පාර/බොරළු පාර - අඩි 2 1/2 x 2 1/2 වලක් කැඩීම සඳහා	1,000 0
(iv)	පස් පාර/බොරළු පාර හරහා - කැඩීම වල සමග	1,500 0
(v)	මාර්ගය දිගට (උරහිස) හෑරීම සඳහා මීටරයක් සඳහා	50 0
(vi)	ජල ව්‍යාපෘති ක්‍රියාත්මක කරන අවස්ථාවේ උරහිස කැඩීම සඳහා එම ව්‍යාපෘති වටිනාකමින් 5%ක සුපරීක්ෂණ ගාස්තුවක් අයකෙරේ.	

09. ගලි බවුසරයේ සේවාව ලබා ගැනීම සඳහා :

* **බල ප්‍රදේශය තුළ සේවය සඳහා -**	*රු. ශ.*
(i) මූලික ගාස්තුව - එක් බවුසරයකට	8,000 0
(ii) සේවක කුලිය	2,000 0
(iii) කිලෝමීටර් එකකට ප්‍රවාහන ගාස්තුව	50 0
(iv) ඊට අමතරව වැඩිවන සෑම බවුසරයක් සඳහාම	4,000 0 බැගින්
(v) සේවක කුලිය	1,000 0 බැගින්
* **බල ප්‍රදේශයෙන් පිට සේවය සඳහා -**	
(i) මූලික ගාස්තුව එක් බවුසරයකට	9,000 0
(ii) සේවක කුලිය	2,000 0
(iii) කිලෝමීටර් එකකට ප්‍රවාහන ගාස්තුව	50 0 බැගින්
(iv) ඊට අමතරව වැඩිවන බවුසරයක් සඳහා	4,500 0 බැගින්
(v) සේවක කුලිය	1,000 0 බැගින්

10. ආදාහනාගාර සේවය ලබා ගැනීමේ ගාස්තු :

බල ප්‍රදේශය තුළ :

(i) මෘත දේහ ආදාහන ගාස්තුව	8,000 0

බල ප්‍රදේශයෙන් පිට :

(i) මෘත දේහ ආදාහන ගාස්තුව	9,000 0

11. ජල බවුසරයේ සේවය ලබා ගැනීම :

බල ප්‍රදේශය තුළ :

(i) පිරවූ ජල බවුසරයක් ගෙන ගොස් භාරදීමට	3,000 0
(ii) පිරවූ ජල බවුසරයක් ගෙනගොස් එක් දිනක් තබා ගැනීම සඳහා	3,750 0
(iii) පිරවූ ජල බවුසරයක් එක් දිනකට වඩා තබා ගන්නේ නම් එක් දිනකට අමතර ගාස්තුව (ඉහත ගාස්තුවලට අමතරව)	500 0
(iv) කිලෝ මීටරයක් සඳහා ප්‍රවාහන ගාස්තු	50 0

බල ප්‍රදේශයෙන් පිටත :

(i) පිරවූ ජල බවුසරයක් ගෙන ගොස් භාරදීම සඳහා	4,000 0
(ii) පිරවූ ජල බවුසරයක් ගෙනගොස් එක් දිනක් තබා ගැනීම සඳහා	4,750 0
(iii) පිරවූ ජල බවුසරයක් එක් දිනකට වඩා තබා ගන්නේ නම් එක් දිනකට අමතර ගාස්තුව (ඉහත ගාස්තුවලට අමතරව)	500 0
(iv) කිලෝ මීටරයක් සඳහා ප්‍රවාහන ගාස්තු	50 0

* හදිසි ආපදා අවස්ථාවකදී සහ ආගමික, සංස්කෘතික හා ජාතික වැදගත්කමකින් යුතු උත්සව මෙන්ම රාජ්‍ය උත්සව සඳහා අවශ්‍යතාවය සලකා බලා ජල බවුසර් නොමිලේ ලබාදීමට කටයුතු කෙරේ.

12. ඉදිකර ඇති ගොඩනැගිලිවල සැලසුම් අනුමත කිරීම සඳහා පරීක්ෂණ ගාස්තුවලට අමතර පහත දඩ ගාස්තු අය කෙරේ.

වර්ග අඩි ප්‍රමාණය	*නේවාසික* *රු. ශ.*	*වාණිජ* *රු. ශ.*
වර්ග අඩි 750 ට අඩු	1,500 0	2,000 0
වර්ග අඩි 751 සිට 1,500 දක්වා	1,750 0	2,500 0
වර්ග අඩි 1,501 සිට 2,500 දක්වා	2,000 0	3,000 0
වර්ග අඩි 2,501 ට වැඩි	3,500 0	5,000 0

13. ක්‍රීඩාපිටි කුලියට දීමේ ගාස්තු (සාමාන්‍ය කටයුතු) :

	රු. ශත	
(i) ක්‍රීඩාපිටිය සඳහා ජලය, විදුලිය සමග දිනකට ගාස්තු	1,500 0	
(ii) දින එකක් සඳහා ඇප තැන්පතු ගාස්තුව	1,000 0	
(iii) ඊට වැඩිවන සෑම දිනකටම එක් දිනක් සඳහා ගාස්තුව	1,250 0	බැගින්
(iv) දින එකකට වඩා වැඩිවන විට ඇප තැන්පතු ගාස්තුව	2,500 0	

* *සංදර්ශන, සංගීත සංදර්ශන ආදී කටයුතු සඳහා ක්‍රීඩාපිටිය කුලියට දීමේ ගාස්තු :*

	රු. ශත
(i) දිනකට ගාස්තුව	2,500 0
(ii) දින එක සිට 03 දක්වා ඇප තැන්පත්	5,000 0
(iii) දින තුනකට වැඩිවන විට ඇප තැන්පත් ගාස්තුව	25,000 0

* සංදර්ශන, සංගීත සංදර්ශන ආදී කටයුතු සඳහා විදුලිය අවශ්‍ය වන්නේ නම් දිනකට රුපියල් 1,000 ක ගාස්තුවක් ගෙවිය යුතු ය.

* රාජ්‍ය ආයතන මගින් සිදුකරනු ලබන උත්සව, රාජ්‍ය ක්‍රීඩා උත්සව, නොමිලේ සිදුකරනු ලබන ආගමික උත්සව, රජයේ පාසල් මගින් පවත්වන ක්‍රීඩා උත්සව ගාස්තුවෙන් නිදහස් කර ඇත. එසේ වුව ද ඉහත උත්සව සඳහා ජලය හා විදුලිය අවශ්‍ය වන්නේ නම් දිනකට රුපියල් 250 ක මුදලක් අයකළ යුතු ය.

14. විවිධ අයදුම්පත් ගාස්තු :

	රු. ශත
(i) ගොඩනැගිලි අයදුම්පත් ගාස්තුව	250 0
(ii) හිමිකම් වෙනස් කිරීමේ අයදුම්පත් ගාස්තුව	250 0
(iii) පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබා ගැනීමේ නව කර්මාන්තයන් සඳහා අයදුම්පත් ගාස්තුව	100 0
(iv) පරිසර ආරක්ෂණ බලපත්‍ර අලුත් කිරීමේ අයදුම්පත් ගාස්තුව	50 0
(v) අනතුරුදායක ගස් ඉවත් කිරීමේ අයදුම්පත් ගාස්තු හා ස්ථාන පරීක්ෂණ ගාස්තු :	
(අ) කොස් ගස් සඳහා	750 0
(ආ) අනෙකුත් ගසක් සඳහා	250 0
(vi) මාර්ග ලියාපදිංචි කිරීමේ අයදුම්පත් ගාස්තුව	250 0
(vii) ඉඩම් කට්ටි කිරීමේ අයදුම්පත් ගාස්තුව	1,000 0
(viii) කර්මාන්ත පෝරම ගාස්තුව	500 0
(ix) පුස්තකාල අයදුම්පත් ගාස්තුව	10 0

15. උද්ධෘත ලබා ගැනීමේ ගාස්තු :

(i) වරිපනම් ලේඛනයේ උද්ධෘතයක් ලබා ගැනීම	300 0
(ii) මාර්ග ලියාපදිංචි *ගැසට් පත්‍රයේ* පිටපතක් ලබා ගැනීම	150 0
(iii) මාර්ග ලියාපදිංචි පිඹුරුපතේ පිටපතක් ලබාගැනීම	500 0

	රු. ශත
16. වෙළඳ ප්‍රචාරණ ගාස්තු (වෙළඳ ප්‍රවර්ධන වැඩසටහන් සඳහා) :	
එක් දිනකට	1,000 0
අමතර දිනකට	500 0
17. හට් එකක් කුලියට දීම - දිනකට	400 0
18. ට්‍රැක්ටර් රථ කුලියට දීම - දිනකට රියදුරු සමග	4,500 0
19. සතිපොළ ගාස්තු :	
(i) ස්ථිර කඩ කාමර	300 0
(ii) තාවකාලික කඩ කාමර	150 0
(iii) සුළු පරිමාණ වෙළෙන්දන්	100 0
20. බැකෝ යන්ත්‍රය කුලියට දීම :	
(i) පැය 02ක් හෝ ඊට අඩු කාලයක් සඳහා කුළිය	6,000 0
(ii) ඊට වැඩිවන සෑම අමතර පැයකට කුළිය	2,800 0
(iii) පැය දෙකකට වැඩි එහෙත් පැය 04ක් හෝ ඊට අඩු කාලයක් සඳහා කුළිය	11,250 0
(iv) ඊට වැඩිවන සෑම අමතර පැයකට කුළිය	2,700 0
21. යූටෝන් ගල් රෝල කුලියට සැපයීම :	
(i) පැය 08කට අඩු කාලයක් සඳහා	7,500 0
(ii) ප්‍රවාහන කුලිය කි. මී. 1ක් සඳහා	100 0
22. කියුබ් තුනේ ලොරි රථය :	
1. දිනකට පැය 08ට ඉන්ධන, කුළී, වැටුප් සමග	14,000 0
2. දිනකට පැය 04ට අඩු කාලයක් සඳහා ඉන්ධන, කුලී, වැටුප් සමග	8,000 0
3. ඊට වැඩිවන අමතර පැයක් සඳහා	1,750 0 බැගින්
23. කොඩි කණු කුළියට සැපයීම :	
(i) එක් කොඩි කණුවක් දිනක් සඳහා	10 0
(ii) අමතර දිනකට	05 0 බැගින්
24. පුස්තකාල සාමාජික ගාස්තු	25 0
25. ටෙන්ඩර් පට්ටාටියෙන් තොරව බල ප්‍රදේශයේ සමිති වෙත කොන්ත්‍රාත් ලබා ගැනීම සඳහා ස්වේච්ඡා සමිති ලියාපදිංචි කිරීමේ ගාස්තු (මෙය අවශ්‍යතාවය අනුව සමිති ලියාපදිංචි කරගත හැක.)	1,000 0

* අරණායක ප්‍රාදේශීය සභාව විසින් 2019 වර්ෂය සඳහා බදු හා ගාස්තු පැනවීමේ දී සිංහල, දෙමළ, ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතුය.

12-187/11

දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය සභාව

2019 වර්ෂයට ව්‍යාපාර බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වැනි වගන්තිය (1) වැනි උපවගන්තිය යටතේ දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර එකී පනතේ හෝ ඒ යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබා ගැනීම හෝ එම පනතේ 150 වන වගන්තිය යටතේ යම් කර්මාන්ත බද්දක් ගෙවීම අවශ්‍ය නොවන්නා වූ යම් ව්‍යාපාරයක් දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත 2019 වර්ෂයේ දී පවත්වාගෙන යන සෑම තැනැත්තෙක්ගෙන් ම එම ව්‍යාපාරයේ 2018 වර්ෂයේ ආදායම මෙහි පහත උපලේඛනයේ I වැනි තීරුවේ නිරූපිත සෑම විෂයාංකයක සීමාවන් ඇතුළත පවතින අවස්ථාවක එකී II තීරුවේ අනුරූප සටහනෙහි නිරූපිත අනුප්‍රමාණයක ව්‍යාපාර බද්දක් 2019 වර්ෂය සඳහා පනවා අය කළ යුතු යැයි ද, සහ

(අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර බද්දට යටත්වන තැනැත්තෙකු විසින්ම යථෝක්ත බද්ද 2019.03.31 වැනි දිනට ප්‍රථම දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබිය යුතු යයි ද 2018.08.21 වැනි දින පැවති සභා රැස්වීමේ අංක 17-2 දරන සභා සම්මුතිය යටතේ තීරණය කළ බව මෙයින් නිවේදනය කරමි.

සුදත් දේශප්‍රිය ජාතුංආරච්චි,
සභාපති,
ප්‍රාදේශීය සභාව,
දෙහිඅත්තකණ්ඩිය.

2018 නොවැම්බර් මස 23 වැනි දින,
දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

උපලේඛනය

I වැනි තීරුව	*II වැනි තීරුව*
2018 වර්ෂයේදී ආදායම	*රු. ශත*
රු. 6,000 නොඉක්මවන අවස්ථාවක	කිසිවක් නොමැත
රු. 6,000 ඉක්මවන එහෙත් රු. 12,000 නොඉක්මවන අවස්ථාවක	90.00
රු. 12,000 ඉක්මවන එහෙත් රු. 18,750 නොඉක්මවන අවස්ථාවක	180.00
රු. 18,750 ඉක්මවන එහෙත් රු. 75,000 නොඉක්මවන අවස්ථාවක	300.00
රු. 75,000 ඉක්මවන එහෙත් රු. 1,50,000 නොඉක්මවන අවස්ථාවක	1,200.00
රු. 1,50,000 ඉක්මවන අවස්ථාවක	3,000.00

12-331/1

දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය සභාව

2019 වර්ෂයට අදාළව වරිපනම් පනවා අය කිරීම

(අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 146 වැනි වගන්තියේ (1) වන උපවගන්තියෙන් දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ දියුණුකළ ප්‍රදේශය ඇතුළත පිහිටි සියලුම නිවාසවල, ගොඩනැගිලිවල, ඉඩම්වල, ගෙපත්වල (නිශ්චල දේපළවල) 2018 වර්ෂයේ පිළිගෙන ක්‍රියාත්මක කළ 2011 වර්ෂයේ දී සිදු කරන ලද තක්සේරුව 2019 වර්ෂය සඳහා පිළිගැනීමටත්,

(ආ) එකී තක්සේරුව මත 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වැනි වගන්තියේ (1) වන උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර එකී දේපළ මත ඉහත කී වාර්ෂික වටිනාකමින් සියයට හයක (6%) වරිපනමක් පනවා අයකළ යුතු බවටත්,

(ඇ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 (6) උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව යටෝක්ත වරිපනම 2019 වර්ෂයේ මාර්තු මස 31, ජූනි 30, සැප්තැම්බර් 30, දෙසැම්බර් 31 යන දිනවලින් අවසන් වන කාර්තු හතර තුළ දී සමාන වාරික 04 කින් ප්‍රාදේශීය සභාවට ගෙවන ලෙස ද, බද්දට යටත් වන සෑම පුද්ගලයෙකුටම විධාන කිරීමට 2018.08.21 වැනි දින පැවති සභා රැස්වීමේ අංක 17-2 දරන සභා සම්මුතිය යටතේ තීරණය කළ බව මෙයින් නිවේදනය කරමි.

සුදත් දේශප්‍රිය ජාතුංආරච්චි,
සභාපති,
ප්‍රාදේශීය සභාව,
දෙහිඅත්තකණ්ඩිය.

2018 නොවැම්බර් මස 23 වැනි දින,
දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

12-331/2

දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය සභාව

2019 වර්ෂයට අදාළ වෙළඳ බලපත්‍ර ගාස්තු පනවා අය කිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වැනි වගන්තිය ප්‍රකාර දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව එකී පනතේ හෝ එකී පනත යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවක විස්තර කර ඇති උපලේඛනයෙහි I වන තීරුවේ නිරූපිත යම් කාර්යයක් සඳහා දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත යම් පරිශ්‍රයක් පාවිච්චි කිරීමට බලය දෙමින් 2019 වර්ෂයට නිකුත් කරනු ලබන යම් බලපත්‍රයක් සම්බන්ධයෙන් එම උපලේඛනයෙහි II තීරුවේ අනුරූප සටහනේ නිරූපිත බලපත්‍ර ගාස්තුවක් පනවා අය කිරීමට 2018.08.21 වැනි දින පැවති සභා රැස්වීමේ අංක 17-2 දරන සභා සම්මුතිය යටතේ තීරණය කළ බව මෙයින් නිවේදනය කරමි.

සුදත් දේශප්‍රිය ජාතුංආරච්චි,
සභාපති,
ප්‍රාදේශීය සභාව,
දෙහිඅත්තකණ්ඩිය.

2018 නොවැම්බර් මස 23 වැනි දින,
දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

උපලේඛනය

I වැනි තීරුව	*II වැනි තීරුව*		
	පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකම		
බලය දෙනු ලබන කාර්යය	*රු. 750 නොඉක්මවන අවස්ථාවක*	*රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1,500 ඉක්මවන අවස්ථාවක*
	රු. ශත	*රු. ශත*	*රු. ශත*
බේකරියක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
ලැගුම්හලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
හෝටලයක් හෝ භෝජනාගාරයක්	500 0	750 0	1,000 0

I වැනි තීරුව	*II වැනි තීරුව*		
	පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකම		
බලය දෙනු ලබන කාර්යය	*රු. 750 නොඉක්මවන අවස්ථාවක*	*රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1,500 ඉක්මවන අවස්ථාවක*
	රු. ශත	*රු. ශත*	*රු. ශත*
රෙස්ටුරන්ට්	500 0	750 0	1,000 0
කිරිපට්ටියක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
බාබර් සාප්පුවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
ග්‍රොසරියක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
සිසිල් බීම නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
අයිස් නිපදවීම	500 0	750 0	1,000 0
ගැලුම් 50ට වැඩි පොල්තෙල් ගබඩා	500 0	750 0	1,000 0
ගැලුම් 10ට වැඩි එළවළු තෙල් ගබඩා	500 0	750 0	1,000 0
ග්‍රොස් 10ට වැඩියෙන් ගිනිපෙට්ටි ගබඩා කර තැබීම	500 0	750 0	1,000 0
යන්ත්‍රෝපකරණ සහිත ලී ඉරුම්හලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
අතින් ලී ඉරන ඉරුම්හලක් හෝ මෝලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
වඩුවැඩ කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
ගෘහ භාණ්ඩ නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
ලොන්ඩ්‍රියක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
හුණු මෝලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
කළුගල් කැඩීම හා පිපිරවීම	500 0	750 0	1,000 0
කබොක් හා බොරළු සෑදීම සඳහා	500 0	750 0	1,000 0
මෝටර් රථ අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම ව. අඩි 750ට අඩු	500 0	750 0	1,000 0
මෝටර් රථ අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම ව. අඩි 750ට වැඩි	500 0	750 0	1,000 0
බයිසිකල් අළුත්වැඩියා කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
අම්ලකර වායුව පාවිච්චි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
බැටරි චාජ් කිරීමේ ස්ථානයක්	500 0	750 0	1,000 0
ලියවන පට්ටලයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
වයින් ස්ප්‍රීතු, මෙතිලේටඩ් විකිණීම හෝ ගබඩා කර තැබීම	500 0	750 0	1,000 0
අයිස්ක්‍රීම් හෝ ශීතකළ බීම වර්ග විකිණීමේ මධ්‍යස්ථානයක්	500 0	750 0	1,000 0
අයිස්ක්‍රීම් නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
රසකැවිලි නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
ශීතකරණවල තබා ගෙන කුකුල් මස් විකිණීම	500 0	750 0	1,000 0
කොන්ක්‍රීට් නිෂ්පාදන ස්ථානයක්	500 0	750 0	1,000 0
ගෑස් විකිණීමේ ස්ථානයක්	500 0	750 0	1,000 0
ඇළුමිනියම්, ප්ලාස්ටික් නිෂ්පාදන ස්ථානයක්	500 0	750 0	1,000 0
මෝටර් වාහන සේවා කිරීමේ ස්ථානයක්	500 0	750 0	1,000 0
ඉන්ධන පිරවුම් හලක් සඳහා	500 0	750 0	1,000 0
ගිනිකෙළි ද්‍රව්‍ය හෝ රතිඤ්ඤු අලෙවි කිරීම	500 0	750 0	1,000 0
ලී භාණ්ඩ නිපදවීම හෝ ගබඩා කර තැබීම	500 0	750 0	1,000 0
අළුත් මාළු විකිණීමේ ස්ථානයක්	500 0	750 0	1,000 0
හුණු අලෙවි කිරීමේ ස්ථානයක්	500 0	750 0	1,000 0
කෘෂි රසායන අලෙවි කිරීම	500 0	750 0	1,000 0
සීනි බෝල, ග්ලූකෝස් නිපදවීම	500 0	750 0	1,000 0
ඇසිඩ් වර්ග බෝතල් කිරීම හා බෙදා හැරීම	500 0	750 0	1,000 0

I වැනි තීරුව	*II වැනි තීරුව*		
	පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකම		
බලය දෙනු ලබන කාර්යය	*රු. 750 නොඉක්මවන අවස්ථාවක*	*රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1,500 ඉක්මවන අවස්ථාවක*
	රු. ශත	*රු. ශත*	*රු. ශත*
යාන්ත්‍රික වඩුමඩුවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
රූපලාවන්‍යාගාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
සුපිරි වෙළඳ සැල්	500 0	750 0	1,000 0
සම්බාහන මධ්‍යස්ථානයක්	500 0	750 0	1,000 0

12-331/3

දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය සභාව

2019 වර්ෂයේ කර්මාන්ත බදු පැනවීම

(අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර, දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය සභා ප්‍රදේශය ඇතුළත යම් පරිශ්‍රයක පවත්වාගෙන යනු ලබන මෙහි පහත උපලේඛනයෙහි I වන තීරුවේ නිරූපිත සෑම කර්මාන්තයක් සම්බන්ධයෙන් එම උපලේඛනයෙහි II වැනි තීරුවේ අනුරූප සටහනේ නිරූපිත ප්‍රමාණයක කර්මාන්ත බද්දක් 2019 වර්ෂය සඳහා පනවා අය කළ යුතු යැයි ද,

(ආ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර, බද්දට යටත් වන සෑම තැනැත්තෙකු විසින් යථෝක්ත බද්ද 2019.03.31 වැනි දිනට ප්‍රථම ගෙවිය යුතු යැයි 2018.08.21 වැනි දින පැවති සභා රැස්වීමේ අංක 17-2 දරන සභා සම්මුතිය යටතේ තීරණය කළ බව මෙයින් නිවේදනය කරමි.

සුදත් දේශප්‍රිය ජාතුංආරච්චි,
සභාපති,
ප්‍රාදේශීය සභාව,
දෙහිඅත්තකණ්ඩිය.

2018 නොවැම්බර් මස 23 වැනි දින,
දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

උපලේඛනය

I වැනි තීරුව	*II වැනි තීරුව*		
	පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකම		
කර්මාන්තය	*රු. 750 නොඉක්මවන අවස්ථාවක*	*රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1,500 ඉක්මවන අවස්ථාවක*
	රු. ශත	*රු. ශත*	*රු. ශත*
යන්ත්‍ර මගින් කලුගල් කැඩීම හා විකිණීම	500 0	750 0	1,000 0
කොහු මෙට්ට නිෂ්පාදනය	500 0	750 0	1,000 0

I වැනි තීරුව	*II වැනි තීරුව*		
	පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකම		
කර්මාන්තය	*රු. 750 නොඉක්මවන අවස්ථාවක*	*රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1,500 ඉක්මවන අවස්ථාවක*
	රු. ශත	*රු. ශත*	*රු. ශත*
රබර් මිශ්‍ර කොහු මෙට්ට නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
උළු මෝලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
මිරිස් මෝලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
වී මෝලක් පවත්වාගෙන යාම (කමත් රහිත)	500 0	750 0	1,000 0
වී මෝලක් පවත්වාගෙන යාම (කමත් සහිත)	500 0	750 0	1,000 0
වී මෝලක් පවත්වාගෙන යාම (මධ්‍යම ප්‍රමාණයේ)	500 0	750 0	1,000 0
වී මෝලක් පවත්වාගෙන යාම (කුඩා ප්‍රමාණයේ)	500 0	750 0	1,000 0
යන්ත්‍රානුසාරයෙන් ක්‍රියාකරන කර්මාන්ත ශාලාවක්	500 0	750 0	1,000 0
කොන්ක්‍රීට් නිෂ්පාදන කරන ස්ථානයක්	500 0	750 0	1,000 0
ඇළුමිනියම්, ප්ලාස්ටික් නිෂ්පාදන ස්ථානයක් සඳහා	500 0	750 0	1,000 0
සිසිල් බීම නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
කුඩා ප්‍රමාණයේ ඇළුමිනියම් වැඩපොළක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
මධ්‍යම ප්‍රමාණයේ ඇළුමිනියම් වැඩපොළක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
ලී වලින් භාණ්ඩ නිපදවීම, ගබඩා කිරීම	500 0	750 0	1,000 0
සීනිබෝල, ග්ලූකෝස් ද්‍රව්‍ය නිපදවීම	500 0	750 0	1,000 0

12-331/4

දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය සභාව

2019 වර්ෂයේ රථ වාහන හා සතුන් පිළිබඳ බදු පැනවීම

(අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වැනි වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 148 වැනි වගන්තිය යටතේ දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ 2019 වර්ෂයේ දී පහත උපලේඛනයෙහි I වැනි තීරුවේ නිරූපිත කිසියම් වාහනයක් හෝ සතෙකු තමා සන්තකයෙහි තබා ගන්නා සෑම තැනැත්තෙකුගෙන්ම එහි II වැනි තීරුවේ නිරූපිත බද්දක් 2019 වර්ෂය සඳහා පනවා අය කළ යුතු යැයි ද, සහ

(ආ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 148 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තිය ප්‍රකාරව, බද්දට යටත් සෑම තැනැත්තෙකු විසින් ම යථෝක්ත 2019.03.31 වැනි දිනට ප්‍රථම ගෙවිය යුතු යැයි 2018.08.21 වැනි දින පැවති සභා රැස්වීමේ අංක 17-2 දරන සභා සම්මුතිය යටතේ තීරණය කළ බව මෙයින් නිවේදනය කරමි.

සුදත් දේශප්‍රිය ජාතුංආරච්චි,
සභාපති,
ප්‍රාදේශීය සභාව,
දෙහිඅත්තකණ්ඩිය.

2018 නොවැම්බර් මස 23 වැනි දින,
දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

උපලේඛනය

I වැනි තීරුව	*II වැනි තීරුව* *රු. ශත*
මෝටර් රථයක්, මෝටර් ට්‍රයිකාරයක්, මෝටර් ලොරියක්, මෝටර් බයිසිකලයක්, කරත්තයක්, ජින් රික්ෂෝවක්, බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් නොවන සෑම වාහනයක් සඳහා	25 0
සෑම බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් හෝ බයිසිකල් කාරයක් හෝ කරත්තයක් සඳහා :	
(අ) වෙළෙඳ කාර්යය සඳහා යොදවන්නේ නම්,	18 0
(ආ) වෙළෙඳ කාර්යයක් නොවන කාර්යයක් සඳහා යොදවන්නේ නම්	4 0
සෑම කරත්තයක් සඳහා	20 0
සෑම අත් කරත්තයක් සඳහා	10 0
සෑම රික්ෂෝවක් සඳහා	7 50
සෑම අශ්වයෙකු, පෝනියෙකු හෝ කොටළුවෙකු සඳහා	15 0
සෑම ඇතෙකු සඳහා	50 0

විෂ්කම්භය අඟල් 26 නොඉක්මවන රෝද සහිත ළමා වාහන, වීල්බැරෝ, හුදෙක් පෞද්ගලික ස්ථානවල පමණක් වෙළෙඳ කාර්ය සඳහා යොදවන අත් කරත්ත සහ වෙළෙඳ කාර්යය සඳහා නොයොදවන අත් කරත්ත මෙකී ගෙවීමෙන් නිදහස් කෙරේ.

මේ උපලේඛනයෙහි වෙළෙඳ කාර්යන්ට, විකිණීම සඳහා හෝ අන්‍යාකාරයකින් හෝ යම් වෙළෙඳ ව්‍යාපාරයක් *නැතහොත්* කර්මාන්තයක් සඳහා වූ යම් ද්‍රව්‍ය හෝ බඩු හෝ යම් ලිඛිත *නැතහොත්* මුද්‍රිත ද්‍රව්‍ය ගෙනයාම හෝ ප්‍රවාහනය කිරීම ඇතුළත් වේ.

12-331/5

දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය සභාව

2019 වර්ෂයට සතිපොළ ගාස්තු අයකිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 119 වැනි වගන්තිය ප්‍රකාර බලපත්‍ර අංක 01 උපලේඛනයේ පරිදි දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි සතිපොළෙහි මෙම බදු අය කිරීම ප්‍රාදේශීය සභාවට සෘජුව වෙළෙඳ අයිතිය බදු දීමේ බදුකරු විසින් 2019 වර්ෂය වෙනුවෙන් බදු අය කිරීමට 2018.11.23 වැනි දින පැවැති සභා රැස්වීමේ අංක 12 දරන සභා සම්මුතිය යටතේ තීරණය කළ බව මෙයින් නිවේදනය කරමි.

සුදත් දේශප්‍රිය ජාතුංආරච්චි,
සභාපති,
ප්‍රාදේශීය සභාව,
දෙහිඅත්තකණ්ඩිය.

2018 නොවැම්බර් මස 23 වැනි දින,
දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

උපලේඛනය - 1

දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පිහිටි සතිපොළෙහි වෙළෙඳුන්ගෙන් අය කළ හැකි උපරිම ගාස්තු :

		රු. ශත
01.	විවෘත කඩ (භූමියේ වර්ග අඩි 01කට)	05 0
02.	වෙළෙඳ පා පැදියක් සඳහා	100 0

		රු. ශත
03.	වෙළෙඳ යතුරු පැදියක් සඳහා	250 0
04.	වෙළෙඳ අත් ට්‍රැක්ටරයක් සඳහා	500 0
05.	වෙළෙඳ ලොරියක් සඳහා	750 0
06.	වෙළෙඳ වෑන් රථයක් සඳහා	750 0
07.	මාළු ලෑල්ලක් සඳහා (ලොරි සහ වෑන්)	750 0

12-331/6

දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය සභාව

2019 වර්ෂයට ප්‍රචාරක දැන්වීම් පුවරු ගාස්තු (සම්මත අතුරු ව්‍යවස්ථා අංක 39 කොටස)

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 221(ඇ) හා 122, 126 වැනි වගන්තිවලින් මා වෙත පැවරී ඇති බලතල අනුව 1988.08.23 වැනි දින අංක 520/7 දරන *පළාත් පාලන අති විශෙෂ ගැසට් පත්‍රයේ IV (ඇ) කොටසේ* ගරු ඇමතිතුමා විසින් ප්‍රකාශයට පත් කරන ලදුව දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය සභාවේ අතුරු ව්‍යවස්ථානුකූලව දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය සභා බල සීමාව තුළ යම් වීදියකට, පාරකට, ඇලකට, මුහුදකට හෝ අහසට පෙනෙන ලෙස දැන්වීමක් හෝ දැන්වීම් ඉදිකිරීමක් ප්‍රදර්ශනය කිරීමට සැලැස්වීම වෙනුවෙන් (බැනර් ඇතුළුව) පහත උපලේඛනයේ දැක්වෙන ගාස්තු 2019.01.01 වැනි දින සිට 2019.12.31 වැනි දින දක්වා බදු පනවා අය කිරීමට 2018.08.21 වැනි දින පැවති සභා රැස්වීමේ අංක 17-2 දරන සභා සම්මුතිය යටතේ තීරණය කළ බව මෙයින් නිවේදනය කරමි.

සුදත් දේශප්‍රිය ජාතුංආරච්චි,
සභාපති,
ප්‍රාදේශීය සභාව,
දෙහිඅත්තකණ්ඩිය.

2018 නොවැම්බර් මස 23 වැනි දින,
දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

උපලේඛනය - 1

		වර්ග අඩියකට ගාස්තුව *රු. ශත*
01.	*ආකාස කොඩියක් (බැනරයක්) සතියකට :*	
(I)	මුදල් ඉපැයීමේ කටයුත්තක් නොවන විට	20 0
(II)	මුදල් ඉපැයීමේ කටයුත්තක් විට	50 0
(III)	ඉඩම්/වෙන්දේසි/විකිණීම් වෙනුවෙන් වූ විට (අතිරේක සතියක් සඳහා ඉහත ගාස්තුවලින් 25% කි.)	50 0
02.	*ස්ථාවර දැන්වීම් පුවරු (වර්ෂයකට) :*	
(1)	වර්ග අඩි 30 ක් දක්වා (ව. අ. 01 ක් සඳහා)	40 0
(2)	වර්ග අඩි 31 සිට 40 දක්වා (ව. අ. 01 ක් සඳහා)	60 0
(3)	වර්ග අඩි 40ට වැඩි (ව. අ. 01 ක් සඳහා)	70 0
(4)	බිත්තියේ ඇඳ ඇති (ව. අ. 01 ක් සඳහා)	30 0
(5)	විශේෂිත දැන්වීම් පුවරු ඉහත පරිදි (ව. අ. 40 සිට වැඩි ව. අ. 1 ක් සඳහා)	75 0
03.	ඩිජිටල් දැන්වීම් පුවරු සඳහා දිනකට (මසකට රු. 6,000 උපරිමයකට යටත්ව)	200 0

12-331/7

දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය සභාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත යටතේ 2019 වර්ෂය සඳහා ගොඩනැගිලි ඉදිකිරීම මත ගාස්තු අය කිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත යටතේ අංක 21, 49, 78 වැනි වගන්තිවලින් දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර 1988.08.23 වැනි දින අංක 520/7 දරන පළාත් සභා *අති විශෙෂ ගැසට් පත්‍රයේ* IV (ආ) කොටසේ ගරු ඇමතිතුමා විසින් ප්‍රකාශයට පත් කරන ලදුව (260 වන අධිකාරය වන) නිවාස හා නගර සංවර්ධන ආඥාපනතේ වගන්තිවලින් පැවරී ඇති බලතල ප්‍රකාරව 2019.01.01 වැනි දින සිට 2019.12.31 වැනි දින දක්වා දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය සභා බල සීමාව තුළ ගොඩනැගිලි ඉදි කිරීම සඳහා පහත දැක්වෙන උපලේඛනයේ දැක්වෙන ගාස්තු මෙම සභාවට අය කිරීමට 2018.08.21 වැනි දින පැවති සභා රැස්වීමේ අංක 17-2 දරන සභා සම්මුතිය යටතේ තීරණය කළ බව මෙයින් නිවේදනය කරමි.

සුදත් දේශප්‍රිය ජාතුංආරච්චි,
සභාපති,
ප්‍රාදේශීය සභාව,
දෙහිඅත්තකණ්ඩිය.

2018 නොවැම්බර් මස 23 වැනි දින,
දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

උපලේඛනය - I

ගොඩනැගිලි ඉදිකිරීම

ගෙබිම විශාලත්වය (ව. අඩි)	*පදිංචිය සඳහා* රු. ශත	*වාණිජ හෝ වෙනත් භාවිතය* රු. ශත
750 හෝ ඊට අඩු	500 0	750 0
751 සිට 1,000	750 0	1,000 0
1,001 සිට 1,200	1,000 0	1,250 0
1,201 සිට 1,500	1,250 0	1,750 0
1,501 සිට 2,000	1,500 0	2,250 0
2,001 සිට 2,500	2,000 0	2,750 0
2,501 සිට 3,000	2,500 0	3,500 0
3,001 සිට 3,500	3,000 0	4,250 0
3,501 සිට 4,000	4,000 0	5,000 0
4,001 සිට 5,000	5,000 0	6,500 0
5,001 සිට 6,000	6,000 0	8,000 0
6,001 සිට 8,000	8,000 0	10,000 0
8,001 සිට 10,000	10,000 0	20,000 0
10,000 ට වැඩි සෑම ව.අ. 01 ක් සඳහා	40 0	100 0

12-331/8

දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය සභාව

2019 වර්ෂය සඳහා එක් එක් සේවාවන් මත ගාස්තු අයකිරීම

දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය සභා බල සීමාව තුළ 2019 වර්ෂය සඳහා එක් එක් සේවාවන් මත ගාස්තු අය කිරීම පහත උපලේඛනයේ දැක්වෙන ගාස්තු මෙම සභාවට අය කිරීමට 2018.08.21 වැනි දින පැවැති සභා රැස්වීමේ අංක 17-2 දරන සභා සම්මුතිය යටතේ තීරණය කළ බව මෙයින් නිවේදනය කරමි.

දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය බල ප්‍රදේශය තුළ සිදු කරනු ලබන සේවාවන් වෙනුවෙන් එක් එක් කාර්යයන් සඳහා බදු පනවා ගාස්තු අය කරන බව වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

සුදත් දේශප්‍රිය ජාතුංආරච්චි,
සභාපති,
ප්‍රාදේශීය සභාව,
දෙහිඅත්තකණ්ඩිය.

2018 නොවැම්බර් මස 23 වැනි දින,
දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

උපලේඛනය - 1

		රු. ශත
01.	පුස්තකාල පෝරම ගාස්තු	10 0
02.	සාමාජිකත්වය අළුත් කිරීමේ ගාස්තු	25 0
03.	පාසල් ළමුන්ගේ සාමාජික ගාස්තු	25 0
04.	වැඩිහිටියන්ගේ සාමාජික ගාස්තු	50 0
05.	දඩ - දිනකට එක් පොතකට	5 0
06.	ගොඩනැගිලි ඉල්ලුම්පත් ගාස්තු	400 0
07.	පරිසර ඉල්ලුම්පත්‍ර ගාස්තු	300 0
08.	පරිසර බලපත්‍ර ඉල්ලුම්කිරීමේ ගාස්තු	100 0
09.	දූන්වීම් පුවරු ඉල්ලුම්පත්‍ර ගාස්තු	100 0
10.	පා පැදි බලපත්‍ර සේවා ගාස්තු	26 0
11.	බිම් කුළිය වර්ග අඩි 01ට - බල ප්‍රදේශය තුළ පුද්ගලයන්ට	03.50
12.	බිම් කුළිය වර්ග අඩි 01ට - බල ප්‍රදේශයෙන් පිට පුද්ගලයන්ට	05 0
13.	කොන්ක්‍රීට් මිශ්‍රණ යන්ත්‍රය කුළියට දීම - දිනකට	3,000 0
14.	ගල්රෝල කුළියට දීම (ටොන් 01)	3,500 0
15.	ගල්රෝල කුළියට දීම (ටොන් 03)	7,500 0
16.	ජල බවුසරය පැය 12ක් තබා ගැනීමට	500 0
17.	ජල බවුසරයෙන් ජලය හලාගෙන ඒමට (ප්‍රවාහනය රහිතව)	500 0
18.	බැකෝ ලෝඩරය කුළියට දීම - පැයකට	3,000 0
19.	මෝටර් ග්‍රේඩරය කුළියට දීම - පැයකට	4,000 0
20.	තහඩු ආවරණය අඩි 20 x 20 - දිනකට	2,500 0
21.	අයාලේ යන ගවයින් ඇල්ලීමේ ගාස්තු (ලොකු ගවයෙකුට)	5,000 0
22.	අයාලේ යන ගවයින් ඇල්ලීමේ ගාස්තු (කුඩා ගවයෙකුට)	2,500 0
23.	අයාලේ යන ගවයින් ඇල්ලීමේ කණු ගාස්තු	100 0
24.	ටිපර් රථය කුළියට දීම - පළමු කි. මී. 25 සඳහා (වැඩිවන කි. මී. 1ට රු. 100)	3,000 0
25.	බස් නැවතුම්පල කඩ කාමර කුළී ගාස්තු	200 0
26.	වීථි රේඛා ඉල්ලුම්පත් ගාස්තු	100 0
27.	වීථි රේඛා/නොපවරා ගැනීමේ සහතිකය	1,000 0
28.	ගොඩනැගිලි අනුකූලතා සහතිකය	1,000 0
29.	වරිපනම් බදු නම වෙනස් කිරීමේ අයදුම්පත් ගාස්තු	1,000 0
30.	මළ සිරුරක් ආදාහනය කිරීම සඳහා ගාස්තු - බල ප්‍රදේශය තුළ	10,000 0
31.	මළ සිරුරක් ආදාහනය කිරීම සඳහා ගාස්තු - බල ප්‍රදේශයෙන් පිට	12,000 0
32.	ත්‍රිරෝද රථයක් ලියාපදිංචි කිරීමේ අයදුම්පත් ගාස්තු	100 0
33.	ත්‍රිරෝද රථයක් ලියාපදිංචි කිරීමේ ගාස්තු	500 0
34.	කාබනික පොහොර කිලෝග්‍රෑම් 25 පැකට් එකක් අලෙවි කිරීම	300 0
35.	නාගරික උද්‍යානයට එක් අයෙකුට ඇතුල් වීමේ ගාස්තු	30 0
36.	නාගරික උද්‍යානයේ පිහිණුම් තටාකයට එක් අයෙකුට පැයකට	50 0
37.	නාගරික උද්‍යානයේ පොකුණේ හංස බෝට්ටු පැදීමට එක් අයෙකුට පැයකට	50 0
38.	නාගරික උද්‍යානයේ රථ ගාලට පාපැදියක් ඇතුල් කිරීමේ ගාස්තු	10 0
39.	නාගරික උද්‍යානයේ රථ ගාලට යතුරුපැදියක් ඇතුල් කිරීමේ ගාස්තු	20 0
40.	නාගරික උද්‍යානයේ රථ ගාලට ත්‍රිරෝද රථයක් ඇතුල් කිරීමේ ගාස්තු	30 0
41.	නාගරික උද්‍යානයේ රථ ගාලට අනෙකුත් වාහන ඇතුල් කිරීමේ ගාස්තු	50 0
42.	නාගරික උද්‍යානයේ මංගල දර්ශන ඡායාරූප ගැනීම සඳහා	1,000 0

දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය සභාව

2019 වර්ෂය සඳහා සුනඛ බද්ද, සුනඛයින් ලියාපදිංචි කිරීමේ ආඥාපනත (477 වැනි අධිකාරය)

2019 වර්ෂයේ සුනඛයින් ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ (477 වැනි අධිකාරය) 4 වැනි වගන්තිය ප්‍රකාරව දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය සභා සීමාව තුළ ඇති කරනු ලබන සෑම බල්ලෙක් හා බැල්ලියක් සඳහා රු. 60 බැගින් 2019 වර්ෂය සඳහා ලියාපදිංචි කිරීමේ ගාස්තුවක් පනවා ඇති බවත්, 2019 ජනවාරි මස 01 වැනි දින සිට පනවා අය කිරීමට 2018.08.21 දින පැවැති සභා රැස්වීමේ දී තීරණය කරන ලදී.

සුදත් දේශප්‍රිය ජාතුංආරච්චි,
සභාපති,
ප්‍රාදේශීය සභාව,
දෙහිඅත්තකණ්ඩිය.

2018 නොවැම්බර් මස 23 වැනි දින,
දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

12-331/10

පදවිය ප්‍රාදේශීය සභාව

2019 වර්ෂයට අදළව බලපත්‍ර ගාස්තු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වැනි වගන්තිය සමග කියවිය යුතු 147 වැනි වගන්තිය යටතේ පදවිය ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව 2018 වර්ෂයේ නොවැම්බර් මස 13 වැනි දින පවත්වන ලද පදවිය ප්‍රාදේශීය සභා රැස්වීමේ දී පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

බී. බී. එම්. මහින්ද නිශ්ශංක,
සභාපති,
පදවිය ප්‍රාදේශීය සභාව.

2018 නොවැම්බර් මස 13 වැනි දින,
පදවිය,
පදවිය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වැනි වගන්තිය සමග කියවිය යුතු 147 වන වගන්තිය යටතේ පදවිය ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර එකී පනතේ හෝ එකී පනත යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවක විස්තර කර ඇති මෙහි පහත උපලේඛනයෙහි I වන තීරුවේ නිරූපිත යම් කාර්යක් සඳහා පදවිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත යම් පරිශ්‍රයක් පාවිච්චි කිරීමට බලය දෙමින් 2019 වර්ෂයේ නිකුත් කරනු ලබන යම් බලපත්‍රයක් සම්බන්ධයෙන් එම උපලේඛනයේ II වන තීරුවේ අනුරූප සටහනේ නිරූපිත බලපත්‍ර ගාස්තුවක් පනවා අය කළ යුතු යැයි යෝජනා කරමි.

උපලේඛනය අනුව

1 වන තීරය *11 වන තීරය*

පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකම

අනු. අංකය	*කර්මාන්තය*	*රු. 750.00 නොඉක්මවන අවස්ථාවක*	*රු. 750.00 ඉක්මවන එහෙත් රු. 1,500.00 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1,500.00 ඉක්මවන අවස්ථාවක*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
01	ලැගුම් නිවාසයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
02	හෝටලයක් පවත්වාගෙන යාම	500 0	700 0	1,000 0
03	බත් කඩයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
04	තේ කඩයක් පවත්වාගෙන යාම	300 0	400 0	1,000 0
05	ආපන ශාලාවක් පවත්වාගෙන යාම	500 0	700 0	1,000 0
06	කෝපි කඩයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
07	බේකරියක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
08	කිරි පට්ටියක් පවත්වාගෙන යාම	500 0	700 0	1,000 0
09	මාළු විකිණීම	500 0	750 0	1,000 0
10	මස් විකිණීම	500 0	750 0	1,000 0
11	සිසිල් බීම කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
12	ලොන්ඩරියක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
13	ගව ගාලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
14	බාබර් සාප්පුවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
15	ගෝඝාතක ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
16	කොණ්ඩා සැකසීමේ සැලුන්හලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
17	කිරි විකිණීම	500 0	750 0	1,000 0
18	පෞද්ගලික වෙළෙඳ පොළක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
19	අයිස් කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

එසේ වුව ද යම් පරිශ්‍රයක හෝටලයක, ආපන ශාලාවක හෝ නවාතැන් පලක කාර්යය සඳහා පාවිච්චි කරනු ලබන්නා වූ ද 1968 අංක 14 දරන සංචාරක සංවර්ධන පනතේ කාර්යයන් සඳහා එම හෝටලය, ආපන ශාලාව හෝ නවාතැන්පල ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි කර ඇත්තා වූද අනුමත කර හෝ පිළිගත්තා වූ ද අවස්ථාවක බලපාන ගාස්තු 2018 වර්ෂයේ ඒ හෝටලය, ආපන ශාලාව හෝ නවාතැන්පලෙහි ආදායමින් 1%ක් විය යුතු ය.

12-319/1

පදවිය ප්‍රාදේශීය සභාව

2019 වර්ෂයට අදාලව කර්මාන්ත බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 වැනි වගන්තිය යටතේ පදවිය ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව 2018 වර්ෂයේ නොවැම්බර් මස 13 වැනි දින පවත්වන ලද පදවිය ප්‍රාදේශීය සභා රැස්වීමේ දී පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

බී. බී. එම්. මහින්ද නිශ්ශංක,
සභාපති,
පදවිය ප්‍රාදේශීය සභාව.

2018 නොවැම්බර් මස 13 වැනි දින,
පදවිය,
පදවිය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

13.	රබර් මුද්‍රා/අංක තහඩු හෝ නාම පුවරු නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
14.	සපත්තු අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
15.	පපඩම් නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
16.	බීඩි නිෂ්පාදනය කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
17.	මෝටර් රථ පින්තාරු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
18.	ගමන් මළු/ජර්කින්/වැහි කබා නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
19.	කුළියට ඇඳුම් මැසීමේ ස්ථානයක් (ටේලර් සාප්පුවක්) පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
20.	රබර් මැෂින්/ඩුම් ගෙයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
21.	වීදුරු කැපීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
22.	මැටි භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
23.	ඇඟළුම් ආම්පන්න නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
24.	බැනර් ඇඳීමේ/ස්ටිකර් නිෂ්පාදනය/ස්ක්‍රීන් ප්‍රින්ටින් කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
25.	ලෝහ වර්ග උණු කිරීමේ කර්මාන්තයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
26.	ස්ප්‍රිතු හා තෙල් වර්ග නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
27.	ලියුම් කවර නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

අනු. අංකය	*I වැනි තීරුව* *කර්මාන්තයේ හෝ ව්‍යාපාරයේ ස්වභාවය*	*II වැනි තීරුව* *ස්ථානයේ වාර්ෂික වටිනාකම*		
		රු. 750 නොඉක්මවන අවස්ථාවක	*රු. 750ට වැඩි එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක*	*රු.1,500 ඉක්මවන අවස්ථාවක*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
28.	ටී. වී. ඇන්ටනා විදුලි පරිපත සැදීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
29.	විසිතුරු භාණ්ඩ, සෙල්ලම් බඩු නිෂ්පාදනය කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
30.	පොත්, ලිපි ද්‍රව්‍ය නිෂ්පාදන ආයතයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

12-175/2

හොරණ ප්‍රාදේශීය සභාව

2019 වර්ෂය සඳහා ව්‍යාපාර බද්ද පැනවීම

හොරණ ප්‍රාදේශීය සභාව විසින් 2018 වර්ෂයේ නොවැම්බර් මස 13 වැනි දින පවත්වන ලද මහ සභා රැස්වීමේ දී තීරණ අංක ඉ:01.1.4 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2019 වර්ෂය සඳහා පනවන ලද ඒ ව්‍යාපාර බද්ද, ඒ වර්ෂයේ අප්‍රේල් මස 30 වැනි දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවත් වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

සභාපති,
හොරණ ප්‍රාදේශීය සභාව.

2018 නොවැම්බර් මස 14 වැනි දින,
හොරණ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වන වගන්තියේ (1) වන උපවගන්තියෙන් ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල ප්‍රකාර, එකී පනතේ හෝ හෝ ඒ යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබා ගැනීම හෝ එකී පනතේ 150 වන වගන්තිය යටතේ යම් කර්මාන්ත බද්දක් ගෙවීම අවශ්‍ය නොවන්නා වූ හා වෘත්තියක් නොවන්නා වූ කිසියම් ව්‍යාපාරයක් හොරණ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත 2019 වර්ෂයේ දී කරගෙන යනු ලබන සෑම තැනැත්තෙකුගේ ම, එකී ව්‍යාපාරයේ ඊට පෙර වර්ෂයේ ලැබීම් මෙහි පහත උපලේඛනයේ I වන තීරුවේ නිරූපිත යම් විෂයාංකයක සීමාවන් ඇතුළත පවත්නා අවස්ථාවක එහි II වන තීරුවේ අනුරූප සටහනෙහි නිරූපිත අනුප්‍රමාණය අනුව වූ ව්‍යාපාර බද්දක් 2019 වර්ෂය සඳහා පනවා අය කිරීමටත්, බද්දට යටත් යම් තැනැත්තෙකු එකී ව්‍යාපාර බද්ද 2019 වර්ෂයේ අප්‍රේල් මස 30 වැනි දිනට පෙර හොරණ ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවටත් හොරණ ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය.

උපලේඛනය

I වැනි තීරය	*II වැනි තීරය*
බද්ද අදාළ වන වර්ෂයට පෙර වර්ෂයේ ව්‍යාපාරයෙන් ලත් ලැබීම් ප්‍රමාණය	*ගෙවිය යුතු බද්ද රු. ශත*
1. රු. 6,000 නොඉක්මවන අවස්ථාවක	නැත
2. රු. 6,000 ඉක්මවන නමුත් රු. 12,000 නොඉක්මවන විට	90 0
3. රු. 12,000 ඉක්මවන නමුත් රු. 18,750 නොඉක්මවන විට	180 0
4. රු. 18,750 ඉක්මවන නමුත් රු. 75,000 නොඉක්මවන විට	360 0
5. රු. 75,000 ඉක්මවන නමුත් රු. 1,50,000 නොඉක්මවන විට	1,200 0
6. රු. 1,50,000 ඉක්මවන විට	3,000 0

12-175/3

හොරණ ප්‍රාදේශීය සභාව

2019 වර්ෂය සඳහා වාහන හා සතුන් පිළිබඳ බදු පැනවීම

හොරණ ප්‍රාදේශීය සභාව විසින් 2018 වර්ෂයේ නොවැම්බර් මස 13 වැනි දින පවත්වන ලද මහ සභා රැස්වීමේ දී තීරණ අංක ඉ:01.1 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඒ අනුව හොරණ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ මේ බද්දට යටත් වන කිසියම් වාහනයක් හෝ සතෙකු තබා ගන්නා සෑම තැනැත්තෙකුම විසින්, එකී වාහනය හෝ සතා තමන් භාරයේ තබා ගන්නා දින ගණන දින තිහක් සම්පූර්ණ වූ වහාම 2019 වර්ෂය සඳහා වන මෙම බද්ද හොරණ ප්‍රාදේශීය සභාව වෙත ගෙවිය යුතු බවත් වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

සභාපති,
හොරණ ප්‍රාදේශීය සභාව.

2018 නොවැම්බර් මස 14 වැනි දින,
හොරණ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වන වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 148 වන වගන්තිය සහ හතරවන උපලේඛනයේ විධිවිධානවලින් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර, හොරණ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ 2019 වර්ෂයේ දී පහත උපලේඛනයේ I වන තීරුවේ සඳහන් කිසියම් වාහනයක් හෝ සතෙකු තමා සන්තකයේ තබා ගන්නා සෑම තැනැත්තෙකු මතම, එහි II වන තීරුවේ අනුරූපිත සටහනෙහි නිරූපිත බද්දක් 2019 වර්ෂය සඳහා පනවා අය කිරීමට හොරණ ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය.

උපලේඛනය

I වැනි තීරුව	*II වැනි තීරුව*
	රු. ශත
I. මෝටර් රථයක්, මෝටර් ට්‍රයිකාරයක්, මෝටර් ලොරියක්, මෝටර් බයිසිකලයක්, කරත්තයක්, ජීන් රික්ෂෝවක්, බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් නොවන සෑම වාහනයක් සඳහා	25 0

	I වැනි තීරුව	*II වැනි තීරුව*
		රු. ශත
II.	සෑම බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් හෝ බයිසිකල් කාරයක් හෝ බයිසිකල් කරත්තයක් සඳහා	
	(අ) වෙළෙඳ කාර්යයක්, සඳහා යොදවන්නේ නම්,	18 0
	(ආ) වෙළෙඳ නොවන කාර්යයක් සඳහා යොදවන්නේ නම්	4 0
III.	සෑම කරත්තයක් සඳහා	20 0
IV.	සෑම අත්කරත්තයක් සඳහා	10 0
V.	සෑම රික්ෂෝවක් සඳහා	7 50
VI.	සෑම අශ්වයෙකු, පෝනියෙකු හෝ කොටළුවෙකු සඳහා	15 0
VII.	සෑම ඇතෙකු සඳහා	50 0

02. විෂ්කම්භය අඟල් 26 නොඉක්මවන රෝද සහිත ළමා වාහන වීල්බැරෝ, හුදෙක් පෞද්ගලික ස්ථානවල පමණක් වෙළෙඳ කාර්යය සඳහා යොදවන අත් කරත්ත සහ වෙළෙඳ කාර්යය සඳහා නොයොදවන අත් කරත්ත ඉහත ගෙවීමෙන් නිදහස් කෙරේ.

12-175/4

හොරණ ප්‍රාදේශීය සභාව

2019 වර්ෂය සඳහා සංවර්ධනය නොකළ ඉඩම් මත බදු පැනවීම

හොරණ ප්‍රාදේශීය සභාව විසින් 2018 වර්ෂයේ නොවැම්බර් මස 13 වැනි දින පවත්වන ලද මහ සභා රැස්වීමේ දී තීරණ අංක ඉ:01.1.6 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2019 වර්ෂය සඳහා පනවන ලද ඒ සංවර්ධනය නොකළ ඉඩම් මත බද්ද, ඒ වර්ෂයේ අප්‍රේල් මස 30 වැනි දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යලයට ගෙවිය යුතු බව වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

සභාපති,
හොරණ ප්‍රාදේශීය සභාව.

2018 ක්වූ නොවැම්බර් මස 14 වැනි දින,
හොරණ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 153 වන වගන්තියේ (1) වන උපවගන්තිය අනුව ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර, හොරණ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත පිහිටි ගොඩනැගිලි ඉදි කිරීමට හෝ ස්ථාවර නැතහොත් නිතිපතා ගොවිතැන් කිරීමට සුදුසු යම් ඉඩමක

(අ) ගොඩනැගිලි කිසිවක් ඉදිකර නොමැති නම්; හෝ
(ආ) ඒ ඉඩම විධිමත් ලෙස හෝ නිත්‍ය ලෙස වගා කිරීමට යටත්කර නොමැති විටෙක; හෝ
(ඇ) ඒ ඉඩමේ ඉදිකර ඇති ගොඩනැගිලිවලට ඇත්ත වශයෙන් ම යටවී ඇති බිම් ප්‍රමාණය සහ ඒ ඉඩමේ සම්පූර්ණ බිම් ප්‍රමාණය අතර ඇති අනුපාතය දහයට එක (10:1) ට වඩා අඩු වන්නේ නම්,

එකී ඉඩම, සංවර්ධනය නොකළ ඉඩමක් වශයෙන් සැලකීමට සහ එවැනි සංවර්ධනය නොකළ ඉඩමක් වශයෙන් සැලකෙන ඉඩම් මත 2019 වර්ෂය සඳහා ඒ එක් එක් ඉඩමේ, භූමියේ ප්‍රාග්ධන අගයෙන් සියයට එකක් (1%) වාර්ෂික බද්දක් පැනවීමටත්, එකී සංවර්ධනය නොකළ ඉඩම මත බද්ද 2019 වර්ෂයේ අප්‍රේල් මස 30 වැනි දිනට පෙර හොරණ ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවට විධාන කළ යුතු යයි හොරණ ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය.

12 - 175/5

හොරණ ප්‍රාදේශීය සභාව

2019 වර්ෂය සඳහා වරිපනම් පැනවීම

හොරණ ප්‍රාදේශීය සභාව විසින් 2018 වර්ෂයේ නොවැම්බර් මස 13 වැනි දින පවත්වන ලද මහ සභා රැස්වීමේ දී තීරණ අංක ඉ:01.1.5 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

එකී සභා සම්මතය සඳහා 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදය සමග කියවිය යුතු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වන වගන්තියේ (1) වන උපවගන්තිය ප්‍රකාර බස්නාහිර පළාතේ පළාත් සභාවේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලැබී ඇති බවත් 2019 වර්ෂය සඳහා පනවන ලද ඒ වරිපනම්, මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් 30 හා දෙසැම්බර් 31 යන දිනවලින් අවසන් වන සෑම කාර්තුවක් තුළදී සමාන වාරික හතරකින් ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවත් වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

2019 වර්ෂය සඳහා වන සම්පූර්ණ වරිපනම් 2019 වර්ෂයේ ජනවාරි මස 31 වැනි දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලය වෙත ගෙවනු ලැබුවහොත් එම සම්පූර්ණ වරිපනම් ප්‍රමාණයෙන් සියයට දහය (10%)ක වට්ටමක් ද, එක් එක් කාර්තුවකට අදාළ වරිපනම් ඒ එක් එක් කාර්තුවේ ප්‍රථම මාසයේ අවසන් දිනයට මත්තෙන් ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබුවහොත් සියයට පහ (5%)ක වට්ටමක් ද ගෙවනු ලැබේ.

සභාපති,
හොරණ ප්‍රාදේශීය සභාව.

2018 ක්වූ නොවැම්බර් මස 14 වැනි දින,
හොරණ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වන වගන්තියේ (1) වන උපවගන්තියෙන් ප්‍රාදේශීය සභා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර දියුණු කළ ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත්කිරීමට හොරණ ප්‍රාදේශීය සභාව විසින් ගනු ලැබූ සභා සම්මුතියට කළුතර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය පළාත් පාලන සහකාර කොමසාරිස්වරයාගෙන් ලද අනුමැතිය අනුව සහ එකී පනතේ 146 වන වගන්තියේ (1) වන උපවගන්තියෙන් ප්‍රාදේශීය සභා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර හොරණ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත පිහිටි සියළුම නිවාසවල, ගොඩනැගිලිවල, ඉඩම්වල හා ගෙපත්වල 2018 වර්ෂයේ දී පළාත් පාලන විෂය භාර අමාත්‍යතුමාගේ විධානය මත කරන ලද නව තක්සේරු වාර්ෂික වටිනාකම්, 2019 වර්ෂය සඳහා පිළිගැනීමටත්,

එකී ප්‍රාදේශීය සභා පනතේ 134 වන වගන්තියේ (1) වන උපවගන්තියෙන් ලැබී ඇති බලතල ප්‍රකාර එකී දේපළ මත හොරණ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත පිහිටි සෑම නිශ්චල දේපළකම වාර්ෂික වටිනාකමෙන් සියයට 6%ක වරිපනමක් 2019 වර්ෂය සඳහා පනවා අය කිරීමටත්, සහ ඒ වරිපනම්, එකී ප්‍රාදේශීය සභා පනතේ 134 වන වගන්තියේ (6) වන උපවගන්තියේ විධිවිධාන යටතේ එකී වර්ෂයේ මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් 30 හා දෙසැම්බර් 31 යන දිනවලින් අවසන් වන කාර්තු හතර තුළදී සමාන වාරික හතරකින් ගෙවීමට විධාන කිරීමටත් හොරණ ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය.

උපලේඛනය

කාර්තුව	*ගෙවිය යුතු දිනය*	*5% වට්ටම් සඳහා නිමිකම් ලබන අවසාන දිනය*
පළමුවන කාර්තුව	2019.03.31	2019.01.31
දෙවන කාර්තුව	2019.06.30	2019.04.30
තුන්වන කාර්තුව	2019.09.30	2019.07.31
හතරවන කාර්තුව	2019.12.31	2019.10.31

12-175/6

හොරණ ප්‍රාදේශීය සභාව

2019 වර්ෂයට අදාළ ප්‍රචාරක දැන්වීම් පිළිබඳ ගාස්තු පැනවීම

හොරණ ප්‍රාදේශීය සභාව විසින් 2018 වර්ෂයේ නොවැම්බර් මස 13 වැනි දින පවත්වන ලද මහ සභා රැස්වීමේ දී තීරණ අංක ඉ:01.1.8 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඒ අනුව කිසියම් අතුරු ව්‍යවස්ථාවක් යටතේ හොරණ ප්‍රාදේශීය සභා සීමාව තුළ කිනම් ආකාරයකට හෝ පෙනෙන පරිදි දැන්වීමක් ප්‍රදර්ශනය කිරීමට සැලැස්වීම වෙනුවෙන් 2019 වර්ෂය සඳහා පහත I උපලේඛනයේ සඳහන් පරිදි ගාස්තුවක් අයකරනු ලබන බව වැඩි දුරටත් නිවේදනය කරනු ලැබේ.

සභාපති,
හොරණ ප්‍රාදේශීය සභාව.

2018 ක්වූ නොවැම්බර් මස 14 වැනි දින,
හොරණ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

හොරණ ප්‍රාදේශීය සභාව විසින් පිළිගෙන ඇති, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 (1) වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව එම පනතේ 126 (XXX) වැනි වගන්තිය සමග කියවිය යුතු හා එකී පනත යටතේ බස්නාහිර පළාතේ, පාලත් පාලන විෂය භාර අමාත්‍යවරයා විසින් සාදන ලද 2015 සැප්තැම්බර් මස 22 වැනි දින බස්නාහිර පළාතේ, පාලත් සභාව විසින් අනුමත කරන ලද 2015.12.28 වැනි දින අංක 1947/6 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජන රජයේ *අති විශේෂ ගැසට් පත්‍රයේ* IV අ කොටසේ පළ කරන ලද්දා වූ ප්‍රචාරක දැන්වීම් පිළිබඳ අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව හොරණ ප්‍රාදේශීය සභා සීමාව තුළ කිනම් ආකාරයකට හෝ පෙනෙන පරිදි දැන්වීමක් ප්‍රදර්ශනය කිරීමට සැලැස්වීම වෙනුවෙන් පහත I උපලේඛනයේ සඳහන් පරිදි ගාස්තුවක් 2019 වර්ෂයට පනවා අය කිරීමට හොරණ ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය.

උප ලේඛනය

අනු. අංකය	*පුවරුවේ ස්වභාවය*	*වර්ග මීටර් ප්‍රමාණය*	*ගාස්තුව රුපියල්*		
			මාස 03ට අඩු	*මාස 03 හෝ 6 අතර*	*වසරක්*
01.	කිසියම් බිත්තියක හෝ තාප්පයක ප්‍රචාරය කරනු ලබන ප්‍රචාරක දැන්වීම්	1 ට අඩු	250 0	350 0	500 0
		1 ට වැඩි	1 ට වැඩිවන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු. 200 බැගින්		
02.	රෙදි, ඩිජිටල් බැනර් සඳහා	3 ට අඩු	250 0	350 0	500 0
		3 ට වැඩි	3 ට වැඩිවන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු. 200 බැගින්		
03.	තහඩු හෝ දැව මගින් ප්‍රදර්ශනය කරනු ලබන ප්‍රචාරක දැන්වීම් සඳහා	1 ට අඩු	500 0	750 0	1,000 0
		1 ට වැඩි	1 ට වැඩිවන සෑම මීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු. 300 බැගින්		
04.	විදුලිය යොදා ක්‍රියාත්මක කරනු ලබන ප්‍රචාරක දැන්වීම් සඳහා	1 ට අඩු	500 0	750 0	1,000 0
		1 ට වැඩි	1 ට වැඩිවන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු. 300 බැගින්		

අනු. අංකය	පුවරුවේ ස්වභාවය	වර්ග මීටර් ප්‍රමාණය	ගාස්තුව රුපියල්		
			මාස 03ට අඩු	මාස 03 හෝ 6 අතර	වසරක්
05.	ඉටිරෙදි හෝ කාඩ්බෝඩ් මගින් කරනු ලබන ප්‍රචාරක දැන්වීම්	1 ට අඩු	250 0	350 0	500 0
		1 ට වැඩි	1 ට වැඩිවන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු. 200 බැගින්		
06.	ප්ලාස්ටික් පුවරු හෝ ෆයිබර් පුවරු මගින් කරනු ලබන ප්‍රචාරක දැන්වීම්	1 ට අඩු	250 0	350 0	500 0
		1 ට වැඩි	1 ට වැඩිවන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු. 200 බැගින්		
07.	විද්‍යුත් උපකරණ යොදා කරනු ලබන ප්‍රචාරක දැන්වීම් සඳහා	1 ට අඩු	750 0	850 0	1,000 0
		1 ට වැඩි	1 ට වැඩිවන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු. 500 බැගින්		

12-175/7

හොරණ ප්‍රාදේශීය සභාව

2019 වර්ෂය සඳහා අක්කර බදු පැනවීම

හොරණ ප්‍රාදේශීය සභාව විසින් 2018 වර්ෂයේ නොවැම්බර් මස 13 වැනි දින පවත්වන ලද මහ සභා රැස්වීමේ දී තීරණ අංක ඉ:01.1.7 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2019 වර්ෂය සඳහා පනවන ලද ඒ අක්කර බද්ද, මාර්තු 31, ජූනි 30, සැප්තැම්බර් 30 හා දෙසැම්බර් 31 යන දිනවලින් අවසන් වන සෑම කාර්තුවක් තුළ දී සමාන වාරික හතරකින් ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවත් වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

2019 වර්ෂය සඳහා වන සම්පූර්ණ අක්කර බද්ද 2019 වර්ෂයේ ජනවාරි මස 31 වැනි දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලයය වෙත ගෙවනු ලැබුවහොත් එම සම්පූර්ණ අක්කර බදු ප්‍රමාණයෙන් සියයට දහය (10%)ක වට්ටමක් ද, එක් එක් කාර්තුවකට අදාළ අක්කර බද්ද ඒ එක් එක් කාර්තුවේ ප්‍රථම මාසයේ අවසන් දිනයට මත්තෙන් ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබුවහොත් සියයට පහ (5%ක) වට්ටමක් ද ගෙවනු ලැබේ.

සභාපති,
හොරණ ප්‍රාදේශීය සභාව.

2018 ක්වූ නොවැම්බර් මස 14 වැනි දින,
හොරණ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 146 වන වගන්තියේ (1) වන උපවගන්තියෙන් ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර 2018 වර්ෂයේ දී බලාත්මක කරන ලද සත්‍යාක්ෂණය කිරීම 2019 වර්ෂය සඳහා පිළිගැනීමටත්,

එකී පනතේ 134 වන වගන්තියේ (3) වන උපවගන්තියෙන් ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර හොරණ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටියා වූ ද ඉහත කී පනතේ 135 වන වගන්තියේ නියමය යටතේ අක්කර බද්දෙන් නිදහස් කර නොමැත්තා වූ ද, ස්ථිර නිතිපතා ගොවිතැනක් යටතේ වූ,

(අ) හෙක්ටයාර් පහක් හෝ ඊට වැඩි වූ සෑම ඉඩමක් වෙනුවෙන් ම, එකී ඉඩමේ සෑම හෙක්ටයාරයක් ම මත 2019 වර්ෂය සඳහා රුපියල් දහය (10.00) බැගින් වන වාර්ෂික අක්කර බද්දක් පනවා අය කිරීමටත්,

(ආ) ඉහත කී පනතේ 134 වන වගන්තියේ (3) වන උපවගන්තියේ අතුරු විධානය යටතේ පළාත් පාලන විෂය භාර ගරු අමාත්‍යතුමා විසින් හොරණ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශ විශේෂ ප්‍රදේශයක් වශයෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ IV (ආ) වන කොටසේ 1989 ..... දිනැති ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත්කර ඇති හෙයින්, හෙක්ටයාර් එකකට වැඩි එහෙත් හෙක්ටයාර් පහකට අඩු වූ සෑම ඉඩමක් මත 2019 වර්ෂය සඳහා රුපියල් පනහක් (රු. 50.00) බැගින් වන වාර්ෂික අක්කර බද්දක් පනවා අය කිරීමට, සහ

(ඇ) ප්‍රාදේශීය සභා පනතේ 134 වන වගන්තියේ (6) වන උපවගන්තියේ විධිවිධාන යටතේ එකී වර්ෂයේ මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් 30 හා දෙසැම්බර් 31 යන දිනවලට පෙර සමාන වාරික හතරකින් ගෙවීමට විධාන කළ යුතු යැයි ද හොරණ ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය.

උපලේඛනය

කාර්තුව	*ගෙවිය යුතු අවසාන දිනය*	*වට්ටම් සඳහා හිමිකම් ලබන අවසාන දිනය*
පළමුවන කාර්තුව	2019.03.31	2019.01.31
දෙවන කාර්තුව	2019.06.30	2019.04.30
තුන්වන කාර්තුව	2019.09.30	2019.07.31
හතරවන කාර්තුව	2019.12.31	2019.10.31

12-175/8

හොරණ ප්‍රාදේශීය සභාව

ත්‍රී රෝද රථ නවතා තැබීමේ ස්ථාන සඳහා 2019 වර්ෂය තුළ අවසරපත්‍ර ලබා දීම මත ගාස්තු පැනවීම

හොරණ ප්‍රාදේශීය සභාව විසින් 2018 වර්ෂයේ නොවැම්බර් මස 13 වැනි දින පවත්වන ලද මහ සභා රැස්වීමේ දී තීරණ අංක ඉ:01.1.9 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඒ අනුව කිසියම් අතුරු ව්‍යවස්ථාවක් යටතේ හොරණ ප්‍රාදේශීය සභා සීමාව තුළ මෙහි පහත I උපලේඛනයේ සඳහන් ස්ථානයන්හි කුලීගමන් සඳහා ත්‍රීරෝද රථ නවතා තබන සෑම තැනැත්තෙකු සඳහාම 2019 වර්ෂය සඳහා II උපලේඛනයේ අනුරූපිත සටහනෙහි නිරූපිත ප්‍රමාණයක ගාස්තුවක් අය කරනු ලබන බව වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

සභාපති,
හොරණ ප්‍රාදේශීය සභාව.

2018 ක්වූ නොවැම්බර් මස 14 වැනි දින,
හොරණ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

හොරණ ප්‍රාදේශීය සභාව විසින් පිළිගෙන ඇති 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 (1) වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව එකී පනත යටතේ බස්නාහිර පළාතේ, පලාත් පාලන විෂයභාර අමාත්‍යවරයා විසින් සාදන ලද 2015 සැප්තැම්බර් මස 22 වැනි දින බස්නාහිර පළාතේ, පළාත් සභාව විසින් අනුමත කරන ලද 2015.12.28 වැනි දිනැති අංක 1947/6 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික

සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රයේ IV අ කොටසේ පළ කරන ලද්දා වූ ත්‍රී රෝද රථ නවතා තැබීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාවේ විධි විධාන ප්‍රකාරව හොරණ ප්‍රාදේශීය සභා සීමාව තුළ මෙහි පහත I උපලේඛනයේ සඳහන් ස්ථානයන්හි 6.00 පැය සිට 20.00 පැය දක්වා කුලී ගමන් සඳහා ත්‍රී රෝද රථ නවතා තබන සෑම තැනැත්තෙකු මතම මෙහි II උපලේඛනයේ අනුරූපිත සටහනෙහි නිරූපිත ප්‍රමාණයක ගාස්තුවක් පනවා අයකිරීමට හොරණ ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය.

උපලේඛනය I

	ස්ථානය	*එකවර නවතා තැබිය හැකි ත්‍රී රෝද රථ සංඛ්‍යාව*
01.	කනන්විල - ආදර්ශ හංදිය	4
02.	කුළුපන හංදිය - බටුවිට පාර	4
03.	පොකුණුවිට හංදිය - වැලිකල පාර	7
04.	හේනගම (ජනසෙත හංදිය)	3
05.	පෙරෙංගියාවල හංදිය - උඩුව පාර	5
06.	පුහුවල හංදිය - මිල්ලෑව පාර	5
07.	වගවත්ත ටයර් කම්හල ඉදිරිපිට	3
08.	අරුණගම හංදිය	3
09.	වගවත්ත හංදිය - වගවත්ත පාර	5
10.	මිදෙල්ලමුලහේන - ප්‍රධාන පාර	3
11.	පෝරුවදණ්ඩ හංදිය - හඳපාන්ගොඩ පාර	5
12.	කුඹුක - කුරුඳුඇන්ද පාර හංදිය	3
13.	කුඹුක හංදිය - ගැලනිගම පාර	6
14.	වීදියගොඩ හංදිය - ගෝනපල පාර	6
15.	ඔලබොඩුව හංදිය - තලගල පාර	4
16.	බටුවිට හංදිය - බටුවිට පාර	3
17.	ඔලබොඩුව - වත්තේකඩේ හංදිය	2
18.	තලගල හංදිය - ගෝනවල පාර	6
19.	ගොඩපරගස් හංදිය - පුහුවල පාර	1
20.	මාරගස්හේන හංදිය - ප්‍රධාන පාර	4
21.	තලගල පාසැල අසල	2
22.	ඔලබොඩුව පාසැල අසල	2
23.	තල්ගහවිල සව්ගස් හංදිය පාර	3
24.	කහටපිටිය වස්කඩුව වත්ත පාර	2
25.	ඔලබොඩුව - මහවත්ත හංදිය	2
26.	මහ උඩුව හංදිය - පෙරෙංගියාවල පාර	2
27.	හඳපාන්ගොඩ හංදිය - පෝරුවදණ්ඩ පාර	5
28.	මාපුටුගල හංදිය - ප්‍රධාන පාර	6
29.	ගුරුගොඩ හංදිය - ප්‍රධාන පාර	5
30.	ගෝනපල හංදිය - ප්‍රධාන පාර	3
31.	කෝරලඉම - කොළඹ පාර	5
32.	හොරගස් හංදිය - ප්‍රධාන පාර	3
33.	මිල්ලෑව - ස්ටෝරුකඩේ හංදිය	4
34.	යකහලුව - ප්‍රධාන පාර	2
35.	කොටිගම් ගොඩ පාදුක්ක පාර - සමූපකාර ප්‍රාදේශිකය අසල	2
36.	තලගල ඩික්සන් මයාගේ නිවස අසල	2
37.	ඉංගිරිය - පානදුර පාර කිරිබෝක්කුව අසල	3
38.	ඉංගිරිය බෝ ගස අසල (පානදුර පාර)	4
39.	ඉංගිරිය බෝ ගස අසල (පාදුක්ක පාර)	2
40.	ඉංගිරිය - පාදුක්ක පාර සමුපකාර මංදිරය ඉදිරිපිට	2
41.	ඉංගිරිය - පානදුර පාර ස.තො.ස. ඉදිරිපිට	3
42.	ඉංගිරිය - රත්නපුර පාර ඉන්ධන පිරවුම්හල අසල	2
43.	අරකවිල - සවුගස්හංදිය පාදුක්ක පාර	3
44.	ඉංගිරිය - පාදුක්ක පාර චම්පිකා සිනමාශාලාව අසල	4
45.	ඉංගිරිය - රෝහල අසල දොඹගස්කන්ද පාර	3

	ස්ථානය	*එකවර නවතා තැබිය හැකි ත්‍රී රෝද රථ සංඛ්‍යාව*
46.	නම්බපාන හංදිය - ප්‍රධාන පාර	3
47.	කඹැල්ලගොඩ හංදිය - කඳන්හේන පාර	3
48.	ඉලිඹ හංදිය - තොටුපල පාර	5
49.	බොරළුගොඩ - නිසලගිරි උයන පාර	3
50.	බොරළුගොඩ - කර්මාන්තපුරය අසල	5
51.	බොරළුගොඩ - කැකුලලිය පාර	3
52.	ගනේතැන්න හංදිය	2
53.	කුඹුක පංසල හංදිය - ගැලනිගම පාර	3
54.	කෝරලඉම - තේ වත්ත පාර	3
55.	කෝරලඉම - සිල්ව වැලිවත්ත පාර	3
56.	මොරගහහේන - පොලීසිය පාර	5
57.	මිරිස්වත්ත හංදිය	2
58.	උඩුව - තක්ෂිලා සෙවන	3
59.	කහටපිටිය - නාගස්හංදිය	3
60.	කහටපිටිය - වෙලේකඩේ හංදිය	3
61.	තලගල - මංගලාරාමය පන්සල අසල	3
62.	මොරගහහේන - පාසල ඉදිරිපිට	3
63.	කුඹුක - වලව්ව වත්ත පාර	2
64.	ඔලබොඩුව - ජාතික තරුණ සේවා මාවත	1
65.	ඉංගිරිය - සතිපොළ අසල (මෛත්‍රී මාවත)	6
66.	ඉංගිරිය - අක්කර 20 පාර	3
67.	ඉංගිරිය - පරණ බස්නැවතුම්පල තුළ	5
68.	කොටිගල හංදිය - කුරණ පාර	5
69.	ඉංගිරිය - රයිගම් වත්ත බෝධිය අසල	15
70.	ඉංගිරිය - ප්‍රාදේශීය ලේකම් කාර්යාලය අසල	2
71.	අරකවිල - පොල්ගස් හංදිය පාර	3
72.	අරකවිල - කොස්හේන හංදිය පාර	5
73.	ඉංගිරිය - පානදුර පාර (පොලිසිය අසල)	2
74.	නම්බපාන - වෝටර්ලුවත්ත අතුරු පාර	3
75.	මැද උෆරුගල - අතුරු මාර්ගය	4
76.	පහල උෆරුගල - නයිපෙනය අසල	3
77.	ඉංගිරිය - බණ්ඩාරනායක පාර පිවිසුම අසල	4
78.	ඉංගිරිය - බෝධිනාගල යහලවත්ත පාර	6
79.	ඉංගිරිය - රයිගම් වත්ත පහල ගේට්ටුව අසල	4
80.	මහ ඉංගිරිය - නාච්චිමලය පාර	6
81.	කිරිගල - පාසල අසල	4
82.	ඉංගිරිය - අමගිර මන්සන්දිය පාසැල් මාවත	3
83.	ඉංගිරිය - ඉසුරුපුර පාර	2
84.	පෝරුවදණ්ඩ - බවුන්ඩර පාර හංදිය	2
85.	රත්මලගොඩ - මැද ගේට්ටුව පාර අසල හංදිය	2
86.	කිරිගල - පරණපොළ අසල	2
87.	ඇදුරුගල - ඉන්ධන පිරවුම්හල අසල	2
88.	මොරගහහේන හංදිය	15
89.	මොරගහහේන - බස්නැවතුම්පල හංදිය	3

උපලේඛනය II

2019 වර්ෂය සඳහා එකවර බලපත්‍ර ලබා ගන්නා අවස්ථාවක	*මාස 06ක කාලයක් සඳහා බලපත්‍ර ලබා ගන්නා අවස්ථාවක*
රු. 1,000 0	රු. 600 0

හික්කඩුව නගර සභාව

2019 වර්ෂය සඳහා වූ වරිපනම් බද්ද පැනවීම

255 වන අධිකාරිය නගර සභා ආඥාපනතේ 166 වන වගන්තිය සමග කියවිය යුතු 252 අධිකාරිය වන මහා නගරසභා ආඥා පනතේ 238 වැනි වගන්තියේ (1) උපවගන්තියෙන් නගර සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර හික්කඩුව නගර සභා බල ප්‍රදේශය ඇතුළත සියළුම නිවාසවල, ගොඩනැගිලිවල, ඉඩම්වල හා ගෙපත්වල 2018 වර්ෂයේ වාර්ෂික වටිනාකම 2019 වර්ෂයේ වාර්ෂික වටිනාකම ලෙස පිළිගැනීමටත් එකී නගර සභා අඥා පනතේ 160 වන වගන්තියෙන් ලැබී ඇති බලතල ප්‍රකාර ඉහත කී වාර්ෂික වටිනාකමෙන්,

(අ) නේවාසික ස්ථාන මත සියයට අටක (8%) වරිපනම් බද්දක් ද,
(ආ) වෙළඳ හෝ වාණිජ කාර්යය සඳහා පාවිච්චි කරනු ලබන ස්ථාන මත සියයට දහයක (10%) වරිපනම් බද්දක් ද,

2019 වර්ෂය සඳහා පනවා අය කිරීමටත්, සහ ඒ වරිපනම් බදු එකී නගර සභා ආඥා පනතේ 170 වන වගන්තිය සමග කියවිය යුතු ඉහත කී නගර සභා ආඥා පනතේ 230 වගන්තියේ (2) වන උපවගන්තියේ (ඇ) ඡේදයේ විධිවිධාන යටතේ, එකී වර්ෂයේ මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් 30, දෙසැම්බර් 31 යන දිනවලින් අවසන් වන කාර්තු හතර තුළදී සමාන වාරික හතරකින් ගෙවීමට විධාන කිරීමටත්, තව ද 1979 අංක 42 දර මහ නගර සභා හා නගර සභා (සංශෝධිත) පනතේ 12 වන වගන්තිය ප්‍රකාර ඉහත සඳහන් වාර්ෂික බදු මුදල් සම්පූර්ණයෙන් පහත දැක්වෙන පරිදි ගෙවූ විට එහි දැක්වෙන වට්ටම් මුදල අඩු කිරීමටත්, 2018.09.18 දින පැවති හික්කඩුව නගර සභා රැස්වීමේදී සභා තීරණ අංක (ඒ) 1-11 හි (1) යටතේ සභා සම්මුතියෙන් තීරණය කර ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

(අ) 2019 ජනවාරි 31 වැනි දින හෝ ඊට පෙර මුළු වර්ෂයකට ගෙවිය යුතු වරිපනම් ගාස්තු ගෙවනු ලැබූ විට එම මුදලින් 10% (සියයට දහයක්) වට්ටම් මුදලක් ද,
(ආ) එම මුදල් කොටස් වශයෙන් ගෙවන විට වරිපනම් බදු ගෙවිය යුතු කාර්තුවේ පළමු වන මාස තුළ ගෙවනු ලැබූවහොත් ඒ ගෙවන මුදලින් 5% (සියයට පහක්) ද

ඉහත සඳහන් බදු මුදල් ඒ ඒ කාර්තුවේ අවසාන දිනට හෝ ඊට පෙර ගෙවනු නොලැබුනහොත් හිඟ බදුමුදල් අය කර ගැනීම සඳහා නිකුත් කරනු ලබන වරෙන්තු සම්බන්ධයෙන් පහත සඳහන් වරෙන්තු ගාස්තුවක් ද අයකරනු ලැබේ.

(අ) මුලු ඉඩම් හෝ පදිංචි ස්ථාන වලින් අයකළ යුතු බද්දෙන් 15% ක් (සියයට පහළොවක් ද)
(ආ) මුඩු ඉඩම් හෝ පදිංචි ස්ථාන නොවන දේපළ වලින් (වාණිජ ස්ථානවලින්) අයකළ යුතු බද්දෙන් 20% (සියයට විස්සක්) ද වේ.

විනී කාරියවසම්,
සභාපති,
හික්කඩුව නගර සභාව.

12-320/1

හික්කඩුව නගර සභාව

2019 වර්ෂය සඳහා වූ ඇතැම් ඉඩම් විකිණීම පිළිබඳ බදු පැනවීම

255 වන අධිකාරිය නගර සභා ආඥාපනතේ 165(ඇ) වන වගන්තිය යටතේ හික්කඩුව නගර සභා සීමාව තුළ පිහිටි යම් ඉඩමක් වෙන්දේසිකරුවෙකු හෝ බ්‍රෝකර්වරයෙකු හෝ ඔහුගේ සේවකයෙකු හෝ අනුයෝජිතයෙකු හෝ ප්‍රසිද්ධ වෙන්දේසියේ නැතහොත් වෙනත් යම් ආකාරයකින් විකුණනු ලැබුවහොත් ඒ විකිණීමෙන් ලැබූ මුදලින් සියයට එකක (1%) සමාන වන බද්දක් ඒ විකුණුම්කරු හෝ වෙන්දේසිකරු හෝ බ්‍රෝකර් හෝ ඔහුගේ සේවකයෙකු හෝ අනුයෝජිතයෙකු විසින් එසේ ඒ ඉඩම විකුණනලද මුදලින් හික්කඩුව නගර සභාවට ගෙවිය යුතු බවට 2018.09.18 දින පැවති හික්කඩුව නගර සභා රැස්වීමේදී සභා තීරණ අංක (ඒ) 1-11 හි (2) යටතේ සභා සම්මුතියෙන් තීරණය කර ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

විනී කාරියවසම්,
සභාපති,
හික්කඩුව නගර සභාව.

12-320/2

හික්කඩුව නගර සභාව

2019 වර්ෂයට අදාළව බලපත්‍ර ගාස්තු පැනවීම

255 වන අධිකාරිය නගර සභා පනතේ 162(1) වන වගන්තිය සමග කියවිය යුතු 164 (1) වගන්තියෙන් ලැබී ඇති බලතල ප්‍රකාර එහි ආඥාපනතේ හෝ ඒ යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවට විස්තර කර ඇති පහත උපලේඛනයේ I තීරුවේ සඳහන් බලය දෙනු ලබන කාර්යයන් වෙනුවෙන් එම උපලේඛනයේ II තීරුවේ එක් එක් ව්‍යාපාරය පවත්වාගෙන යනු ලබන ස්ථානයේ වාර්ෂික වටිනාකමට අනුරූපී තීරුවේ නිරූපිත ප්‍රමාණයක බලපත්‍ර ගාස්තුවක් 2019 වර්ෂය සඳහා පනවා අයකළ යුතු බවටත්, එකී බද්දට යටත් තැනැත්තෙකු 2019 වර්ෂයේ මාර්තු මස 31 වැනි දිනට පෙර හික්කඩුව නගර සභාවට ගෙවිය යුතු බවට 2018.09.18 දින පැවති හික්කඩුව නගර සභා රැස්වීමේ දී සභා තීරණ අංක (ඒ) 1-11හි (3) යටතේ සභා සම්මුතියෙන් තීරණය කර ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

විනී කාරියවසම්,
සභාපති,
හික්කඩුව නගර සභාව.

උපලේඛනය

1 වැනි තීරය		*2 වැනි තීරය*		
බලය දෙනු ලබන කාර්යය				
අංකය	*ව්‍යාපෘතියේ නම*	*ස්ථානයේ වාර්ෂික වටිනාකම රු. 1 - රු. 750 ට නොවැඩි*	*ස්ථානයේ වාර්ෂික වටිනාකම රු. 751 - රු.1,500ට නොවැඩි*	*ස්ථානයේ වාර්ෂික වටිනාකම රු. 1,501 ට වැඩි*
		රු.	*රු.*	*රු.*
01	බේකරියක් පවත්වා ගෙනයාම	500	750	1,000
02	භෝජනාගාරයක් (ආපනශාලාවක්) පවත්වා ගෙන යාම	500	750	1,000
03	ලැගුම්හලක් පවත්වා ගෙන යාම	500	750	1,000
04	ගව මස් විකිණීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම	500	750	1,000
05	අවන් හලක් (ඕපන් බාර් එකක් පවත්වා ගෙන යාම)	500	750	1,000
06	අයිස් නිපදවීමේ ස්ථානයක්	500	750	1,000
07	බත් කඩයක් පවත්වාගෙන යාම	400	600	850
08	1968 අංක 14 දරන සංචාරක පනතේ කාර්යයන් සඳහා ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි වී ඇති ආපනශාලාවක් ලැගුම්හලක් හෝ හෝටලයක් සඳහා අයකරනු ලබන බලපත්‍ර ගාස්තුව වන්නේ එකී ගාස්තුව අයකරනු ලබන අවුරුද්දට පෙරාතුව වූ අවුරුද්දේ ආදායමට අනුව එම ආදායමෙහි 1% ක ගාස්තුවකි			
09	සිරප් හෝ පළතුරු බීම වර්ග සාදන ස්ථානයක් පවත්වාගෙන යාම	500	750	1,000
10	යෝගට් හෝ බීම පැකට් වර්ග නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	400	600	850
11	හෝටලයක් පවත්වාගෙන යාම	500	750	1,000
12	මාළු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500	750	1,000
13	බාබර් සාප්පුවක් පවත්වාගෙන යාම	300	450	700
14	ඩ්‍රයික්ලීන් කරන හෝ සායම් දමන ලොන්ඩරියක් පවත්වාගෙන යාම	400	500	750
15	තේ හෝ කෝපි කඩයක් පවත්වාගෙන යාම	350	450	700

1 වැනි තීරය *2 වැනි තීරය*

බලය දෙනු ලබන කාර්යය

අංකය	*ව්‍යාපෘතියේ නම*	*ස්ථානයේ වාර්ෂික වටිනාකම රු. 1 - රු. 750 ට නොවැඩි*	*ස්ථානයේ වාර්ෂික වටිනාකම රු. 751 - රු.1,500ට නොවැඩි*	*ස්ථානයේ වාර්ෂික වටිනාකම රු. 1,501 ට වැඩි*
		රු.	*රු.*	*රු.*
II කොටස අන්තරාදායක ව්‍යාපාර				
16	යන්ත්‍රානුසාරයෙන් කබොක්, බොරළු හෝ කලුගල් කැඩීමේ ස්ථානයක් පවත්වා ගෙනයාම	500	750	1,000
17	ඉන්ධනවලින් ක්‍රියා කරන යන්ත්‍ර පාවිච්චි කරන ලී ඉරුම් මෝලක් හෝ දැව ගබඩාවක් පවත්වා ගෙන යාම	500	750	1,000
18	යන්ත්‍රෝපකරණ පාවිච්චි කරන ලී මෝලක් පවත්වාගෙන යාම	500	750	1,000
19	යන්ත්‍රෝපකරණ පාවිච්චි කරන කම්හලක් (ග්‍රිල් වැඩපළක්) පවත්වාගෙන යාම	500	750	1,000
20	මුද්‍රණාලයක් පවත්වාගෙන යාම	500	750	1,000
21	හුණුගල් කැඩීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500	750	1,000
22	කළුගල් පිපිරවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500	750	1,000
23	අත්යන්ත්‍ර හැර වෙන විදියකින් රෙදි විවීමේ ස්ථානයක් සඳහා	500	750	1,000
24	ගෑස් සිලින්ඩර් ගබඩා කර තැබීමේ හා විකිණීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම	500	750	1,000
25	විදුලිය භාණ්ඩ විකිණීමේ හෝ නිපදවීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම	500	750	1,000
26	යන්ත්‍රානුසාරයෙන් නොවන කබොක්, බොරළු හෝ කළුගල් කැඩීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500	750	1,000
27	විසිරි පින්තාරු කිරීම සඳහා ස්ථානයක් පැවැත්වීම	500	750	1,000
28	අත් යන්ත්‍ර මගින් ක්‍රියාකරන මුද්‍රණාලයක් පවත්වා ගෙන යාම	500	750	1,000
III කොටස අප්‍රසන්න ව්‍යාපාර				
29	තොග වශයෙන් විකිණීම සඳහා නරක් වන සුළු කෑම වර්ග හා ආහාර ද්‍රව්‍ය ගබඩා කර තබා ගන්නා ස්ථානයක් පවත්වාගෙන යාම	500	750	1,000
30	ශීත කළ මස් හෝ මාළු ගබඩාකර තබා ගැනීමේ හෝ විකිණීමේ ස්ථානයක් (ලේබල් කරන ලද)	400	700	900
31	කොප්පරා නිෂ්පාදනය කිරීම හෝ සකස් කිරීම හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	400	550	850
32	කුකුළන් 250 ට අඩු ගාලක් හෝ කොටුවක් පවත්වා ගෙන යෑම	400	550	850
33	මාළු හෝ මස් ජාඩි දැමීම හෝ වේළීම හෝ අයිස් දැමීම සඳහා ස්ථානයක් පවත්වා ගෙන යාම	400	550	850

1 වැනි තීරය		*2 වැනි තීරය*		
	බලය දෙනු ලබන කාර්යය			
අංකය	*ව්‍යාපෘතියේ නම*	*ස්ථානයේ වාර්ෂික වටිනාකම රු. 1 - රු. 750 ට නොවැඩි*	*ස්ථානයේ වාර්ෂික වටිනාකම රු. 751 - රු.1,500ට නොවැඩි*	*ස්ථානයේ වාර්ෂික වටිනාකම රු. 1,501 ට වැඩි*
		රු.	*රු.*	*රු.*
34	රෙදි මුද්‍රණය කරන හෝ සායම් දමන (බතික්) වැඩපළක් පවත්වා ගෙන යාම	500	750	1,000
35	අයිස්ක්‍රීම් නිපදවීමේ හෝ විකිණීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම	400	550	850
36	ස්නැක් බාර් එකක් හෝ කුල්ස්පොට් එකක් පවත්වාගෙන යාම	350	500	800
37	රසකැවිලි නිපදවීම සඳහා ස්ථානයක් පවත්වා ගෙන යාම	350	500	800
38	ඉස්සන්, කකුලුවන් හෝ මාළු විකිණීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම	500	750	1,000
39	ආහාර වර්ග සඳහා ඇනවුම් භාර ගැනීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500	750	1,000
40	කොළ කැඳ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	250	350	600

IV කොටස :

		වර්ග අඩි 100ට අඩු	*වර්ග අඩි 101-400 දක්වා*	*වර්ග අඩි 401 ට වැඩි*
41	පොල්ලෙලි කොරටුවක් පවත්වාගෙන යාම	25	50	150
42	හිරිගල් හෝ හුණුගල් කැඩීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම	500	750	1,000
43	කුකුළන් 250 ට වැඩි කුකුලු කොටුවක් පවත්වා ගෙන යාම	500	750	1,000
44	හුණු පිළිස්සීමේ හෝ ගබඩා කිරීමේ හෝ සකස් කිරීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම	500	750	1,000
45	කෝපි, ධාන්‍ය වර්ග, මාංශ බෝග හෝ පිටි ඇඹරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500	750	1,000
46	යන්ත්‍රානුසාරයෙන් ධාන්‍ය හෝ මාංශ බෝග කෙටීමේ (වී මෝලක්) ස්ථානයක් පවත්වාගෙන යාම	500	750	1,000
47	සිමෙන්ති භාණ්ඩ හෝ ඇස්බැස්ටෝස් සිමෙන්ති භාණ්ඩ (ගඩොල්, ශ්‍රීල් නිපදවීමේ) ස්ථානයක් පවත්වා ගෙන යාම	500	750	1,000
48	මෝටර් වාහන අලුත්වැඩියා කිරීම හෝ මෝටර් වාහන සර්විස් කිරීමේ වැඩපළක් පවත්වාගෙන යාම	500	750	1,000
49	ලියවන පට්ටලයක් භාවිතා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500	750	1,000
50	සම්භාණ්ඩ නිෂ්පාදනය කරන කර්මාන්ත ශාලාවක් ස්ථානයක් පවත්වාගෙන යාම	500	750	1,000

I වැනි තීරය *II වැනි තීරය*

බලය දෙනු ලබන කාර්යය

අංකය	*ව්‍යාපෘතියේ නම*	*ස්ථානයේ වාර්ෂික වටිනාකම රු. 1 - රු. 750 ට නොවැඩි*	*ස්ථානයේ වාර්ෂික වටිනාකම රු. 751 - රු.1,500ට නොවැඩි*	*ස්ථානයේ වාර්ෂික වටිනාකම රු. 1,501 ට වැඩි*
		රු.	*රු.*	*රු.*
51	පෙට්‍රල් ඩීසල් හෝ වෙනත් යම් බණිජ තෙල් වර්ගයක් ගබඩා කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500	750	1,000
52	පෙට්‍රල් නිකුත් කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500	750	1,000
53	කම්හලක් පවත්වා ගෙන යාම	350	500	600
54	කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම	500	750	1,000
55	පොහොර හෝ රසායනික පොහොර නිෂ්පාදනය කිරීම ගබඩාකර තබා ගැනීම හෝ විකිණීම සඳහා ස්ථානයක් පවත්වා ගෙන යාම	500	750	1,000
56	බැටරි චාජ් කිරීම හෝ අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	300	500	750
57	වායු සමනය යන්ත්‍ර, ශීතකරණ හෝ අධිශීතකරණ (ඩීප්ෆ්‍රීසර්) නිපදවීමේ සර්විස් කිරීමේ හෝ අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500	750	1,000
58	ත්‍රී රෝද රථ අලුත්වැඩියා කිරීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම	500	750	1,000
59	ටයර් හෝ ටියුබ් වීල් එලයිමන්ට් ස්ථානයක් පවත්වාගෙන යාම	350	450	800
60	මැතිලේටඩ් ස්ප්‍රිතු හෝ ඇසිට් වර්ග විකිණීමේ ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	300	450	600
61	කොහු හෝ වෙනත් කෙඳි වර්ග නිපදවීමේ හෝ ගබඩා කිරීම (කොහු මෝල්) පවත්වාගෙන යාම	500	750	1,000
62	වෑල්ඩින් වැඩපළක් පවත්වාගෙන යාම	500	750	1,000
63	ෆයිබර් ග්ලාස් වැඩපළක් පවත්වාගෙන යාම	500	750	1,000
64	බෝට්ටු එන්ජින් අලුත්වැඩියා කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500	750	1,000
65	කුරුඳුතෙල් හිදීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500	750	1,000
66	පාත්‍ර සෑදීමේ බෙලෙක් වැඩපලක් පවත්වාගෙන යාම	400	600	800
67	වෛද්‍ය රසායනාගාරයක් පැවැත්වීම	500	750	1,000
68	පොල්තෙල් සිඳීමේ ස්ථානයක් පැවැත්වීම	400	750	850
69	සංචාරකයින් සඳහා බෝට්ටු කුලියට දීමේ ස්ථානයක් පැවැත්වීම	500	750	1,000
70	යතුරුපැදි අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පැවැත්වීම	500	750	1,000
71	යතුරුපැදි සේවා කිරීමේ ස්ථානයක් පැවැත්වීම	500	750	1,000
72	රේඩියේටර් අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පැවැත්වීම	500	750	1,000
73	වාහන දුම් පරීක්ෂා කිරීමේ ස්ථානයක් පැවැත්වීම	500	750	1,000
74	මෘත ශරීර එම්බාම් කිරීම හා බෙහෙත් ගැල්වීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500	750	1,000

	1 වැනි තීරය	*2 වැනි තීරය*		
	බලය දෙනු ලබන කාර්යය			
අංකය	*ව්‍යාපෘතියේ නම*	*ස්ථානයේ වාර්ෂික වටිනාකම රු. 1 - රු. 750 ට නොවැඩි*	*ස්ථානයේ වාර්ෂික වටිනාකම රු. 751 - රු.1,500ට නොවැඩි*	*ස්ථානයේ වාර්ෂික වටිනාකම රු. 1,501 ට වැඩි*
		රු.	*රු.*	*රු.*
75	වැලි වෙළෙඳාම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500	750	1,000
76	අභ්‍යාස පොත් නිෂ්පාදනය	500	750	1,000
77	ෂොපින් බෑග් නිපදවීමේ කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම	500	750	1,000
78	පානීය ජලය බෝතල් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500	750	1,000
79	සංචාරකයින් සඳහා නිවාස කුළියට දීම	500	750	1,000

12-320/3

හික්කඩුව නගර සභාව

2019 වර්ෂය සඳහා කර්මාන්ත බද්ද පැනවීම

255 වන අධිකාරිය නගර සභා ආඥාපනතේ 165 (අ) වන වගන්තියෙන් නගර සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර හික්කඩුව නගර සභා බල ප්‍රදේශය ඇතුළත කරගෙන යනු ලබන පහත උපලේඛනයේ I තීරුවේ සඳහන් එක් එක් කර්මාන්තය වෙනුවෙන් එම උපලේඛනයේ II තීරුවේ ඒ එක් කර්මාන්තය පවත්වාගෙන යනු ලබන ස්ථානයේ වාර්ෂික වටිනාකමට අනුරූපී තීරුවේ නිරූපිත ප්‍රමාණයක කර්මාන්ත බද්දක් 2019 වර්ෂය සඳහා පනවා අයකිරීමටත් බද්දට යටත් සෑම තැනැත්තෙකුම එකී ව්‍යාපාරයේ බද්ද 2019 වර්ෂයේ අප්‍රේල් මස 30 දිනට පෙර හික්කඩුව නගර සභාවට ගෙවිය යුතු බවට 2018.09.18 වැනි දින පැවති හික්කඩුව නගර සභා රැස්වීමේ දී සභා තීරණ අංක (ඒ) I-II හි (5) යටතේ සභා සම්මුතියෙන් තීරණය කර ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

විනී කාරියවසම්,
සභාපති,
හික්කඩුව නගර සභාව.

උපලේඛනය

	1 වැනි තීරය	*2 වැනි තීරය*		
	කර්මාන්තයේ ස්වභාවය			
අංකය	*ව්‍යාපෘතියේ නම*	*ස්ථානයේ වාර්ෂික වටිනාකම රු.1-රු.750ට නොවැඩි*	*ස්ථානයේ වාර්ෂික වටිනාකම රු.751-රු.1500ට නොවැඩි*	*ස්ථානයේ වාර්ෂික වටිනාකම රු.1501-ට වැඩි*
		රු.	*රු.*	*රු.*
	වෙළෙඳාමේ හෝ ව්‍යාපාරයේ ස්වභාවය			
01	කබොක් බොරළු හෝ කලුගල් කැඩීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500	750	1000

	1 වැනි තීරය	*2 වැනි තීරය*		
	කර්මාන්තයේ ස්වභාවය			
අංකය	*ව්‍යාපෘතියේ නම*	*ස්ථානයේ වාර්ෂික වටිනාකම රු.1-රු.750ට නොවැඩි රු.*	*ස්ථානයේ වාර්ෂික වටිනාකම රු.751-රු.1500ට නොවැඩි රු.*	*ස්ථානයේ වාර්ෂික වටිනාකම රු.1501-ට වැඩි රු.*
02	රට බීම විකුණන ස්ථානයක් පවත්වාගෙන යාම	500	750	1000
03	රේස් බයි රේස් ඔට්ටු අල්ලන ස්ථානයක් පවත්වාගෙන යාම	500	750	1000
04	ස්වර්ණාභරණ නිෂ්පාදනය කිරීමේ හෝ අලුත්වැඩියා කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500	750	1000
05	ගෘහ භාණ්ඩ නිපදවීම හෝ ගබඩා කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500	750	1000
06	හුණු පැකට් ගබඩා කර තැබීම හා විකිණීමේ ස්ථානයක් ස්ථානයක් පවත්වාගෙන යාම	500	750	1000
07	පින්තාරු තීන්ත වාර්නිෂ් හෝ ඩිස්ටැම්පර් සායම් හොන්ඩර 05ට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තැබීම හෝ විකුණන ස්ථානයක් පවත්වාගෙන යාම	500	750	1000
08	ජායාරූප ශාලාවක් පවත්වාගෙන යාම	500	750	1000
09	මැණික් ගල් කැපීම ඔප දැමීම හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500	750	1000
10	මිනී පෙට්ටි සාප්පුවක් පවත්වාගෙන යාම	500	750	1000
11	බටහිර බෙහෙත් වර්ග විකිණීමේ හෝ ප්‍රතිකාර කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500	750	1000
12	උත්සව භාණ්ඩ කුළියට දීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500	750	1000
13	පැරණි ගෘහ භාණ්ඩ විකිණීමේ හා ගබඩාකර තැබීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	400	700	950
14	තොග වශයෙන් සිගරට් තබා ගැනීම විකිණීම බෙදා හරින ස්ථානයක් පවත්වාගෙන යාම	500	750	1000
15	මහන මැෂින් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500	750	1000
16	මෝටර් සයිකල් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500	750	1000
17	රථවාහන විකුණන ස්ථානයක් පවත්වාගෙන යාම	500	750	1000
18	පුද්ගලික අධ්‍යාපන ආයතනයක් පවත්වාගෙන යාම (ළදරු පාසලක් නොවන)	500	750	1000
19	මෝටර් වාහන හා බොඩි නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500	750	1000
20	ගොඩනැගිලි ඉදිකිරීමේ ද්‍රව්‍ය නිපදවීම විකිණීම හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500	750	1000
21	සාප්පු බඩු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500	750	1000
22	ලී බඩු වෙළෙඳසැලක් පවත්වාගෙන යාම	500	750	1000
23	ස්වර්ණාභරණ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500	750	1000
24	ලී විකිණීමේ හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500	750	1000
25	දුරකථන අමතර කොටස් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500	750	1000
26	මූදල් අයකරන පෞද්ගලික ළඳරු පාසලක් පවත්වාගෙන යාම	450	600	900
27	අයිස් ගබඩා කිරීමේ හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500	750	10000

	1 වැනි තීරය	*2 වැනි තීරය*		
	කර්මාන්තයේ ස්වභාවය			
අංකය	*ව්‍යාපෘතියේ නම*	*ස්ථානයේ වාර්ෂික වටිනාකම රු.1-රු.750ට නොවැඩි රු.*	*ස්ථානයේ වාර්ෂික වටිනාකම රු.751-රු.1500ට නොවැඩි රු.*	*ස්ථානයේ වාර්ෂික වටිනාකම රු.1501-ට වැඩි රු.*
28	ධාන්‍ය හෝ මාංශ භෝග හොන්ඩර 05ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	300	450	750
29	කුකුළු කෑම ගබඩා කර තැබීම හෝ විකිණීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම	500	750	1000
30	සිල්ලර බඩු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	400	500	800
31	බැටින් සෙන්ටර් එකක් පවත්වාගෙන යාම	450	500	800
32	ග්‍රෝස් එකකට වඩා වැඩි ප්‍රමාණයක සිසිල් බීම බෝතල් ගබඩා කිරීම හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	350	500	750
33	අලුත් හෝ පරණ ටයර්, ටියුබ් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500	750	1000
34	සම්භාණ්ඩ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500	750	1000
35	පශු වෛද්‍ය ගිලන් හලක් පවත්වාගෙන යාම	500	750	1000
36	සත්ත්ව ආහාර ගබඩාවක් පවත්වාගෙන යාම	500	750	1000
37	ලෝහමය සුන්බුන් ගබඩා කර තැබීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500	750	1000
38	මෙරට හෝ රට වේවැල්වලින් භාණ්ඩ සෑදීම හෝ විකිණීම හෝ එයින් කළ භාණ්ඩ ගබඩා කළ ස්ථානයක් පවත්වාගෙන යාම	400	550	850
39	වඩු මඩුවක් පවත්වාගෙන යාම	500	750	1000
40	කොන්ක්‍රීට් හෝ මැටි පයිප්ප ගබඩාකර තබා ගැනීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500	750	1000
41	මෝටර් සයිකල් කුලීයට දීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500	750	1000
42	සෙල්ලම් බඩු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	400	550	850
43	ආයුර්වේද බෙහෙත් වර්ග විකිණීමේ හෝ ප්‍රතිකාර කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	400	550	850
44	මනාලියන් හැඩගැන්වීමේ, කොණ්ඩා මෝස්තර හා උපකරණ කුළියට දීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500	750	1000
45	අභ්‍යාස පොත් නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500	750	1000
46	මෝටර් සයිකල් මෝටර් රථ අමතර කොටස් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500	750	1000
47	පාපැදි අමතර කොටස් විකිණීමේ ස්ථානයක් පවත්වා ගෙනයාම	400	600	900
48	මෙට්ට්‍රස් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500	750	1000
49	විදේශීය චෙක්පත් මාරු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500	750	1000
50	රෙදි විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500	750	1000
51	බතික් රෙදි විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500	750	1000
52	වාත්තු මඩුවක් පවත්වාගෙන යාම	300	450	750
53	වීදුරු භාණ්ඩ නිපදවීමේ හෝ වීදුරු කැඩපතක් සහ වීදුරු තහඩු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500	750	1000
54	ඇලුමීනියම් භාණ්ඩ නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500	750	1000

		1 වැනි තීරය කර්මාන්තයේ ස්වභාවය	2 වැනි තීරය	
අංකය	ව්‍යාපෘතියේ නම	ස්ථානයේ වාර්ෂික වටිනාකම රු.1-රු.750ට නොවැඩි රු.	ස්ථානයේ වාර්ෂික වටිනාකම රු.751-රු.1500ට නොවැඩි රු.	ස්ථානයේ වාර්ෂික වටිනාකම රු.1501-ට වැඩි රු.
55.	විදුලි කර්මාන්ත වැඩපළක් හෝ ගුවන් විදුලි යන්ත්‍ර අලුත්වැඩියා කරන වැඩපළක් හෝ රූපවාහිනි යන්ත්‍ර අලුත්වැඩියා කිරීමේ වැඩපළක් පවත්වාගෙන යාම	500	750	1000
56.	ජායාරූප පිටපත් කිරීමේ හෝ රෝනියෝ කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	350	500	800
57.	ස්වර්ණාභරණ පාට කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500	750	1000
58.	පිඟන් හෝ පිඟන් භාණ්ඩ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500	750	1000
59.	රබර් සීල් කැපීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	300	450	750
60.	සංචාරකයින් සඳහා පොත්පත් කුලියට ලබාදීමේ ආයතනයක් පවත්වාගෙන යාම	500	750	1000
61.	එළවළු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	300	500	700
62.	දර මඩුවක් පවත්වාගෙන යාම	200	350	500
63.	ප්ලාස්ටික් භාණ්ඩ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	400	550	850
64.	ගීත පටිගත කිරීමේ හෝ කැසට් පට විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	450	600	800
65.	පිත්තල භාණ්ඩ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500	750	1000
66.	තොග වශයෙන් දේශීය සිගරට් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500	750	1000
67.	කැටයම් භාණ්ඩ විකිණීමේ හෝ නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500	750	1000
68.	විසිතුරු භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500	750	1000
69.	කුෂන් වැඩපළක් පවත්වාගෙන යාම	500	750	1000
70.	ලිපි ද්‍රව්‍ය, කඩදාසි, පාසල් පොත්, අභ්‍යාස පොත් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	400	600	750
71.	පාපැදි කුළියට දීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	400	500	750
72.	පොල් පරාල විකිණීමේ හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	250	400	700
73.	ලොතරැයි අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම		600	
74.	විකිණීම සඳහා මාළු ඇති කිරීමේ හෝ මාළු ටැංකි විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	400	600	800
75.	ධීවර ආම්පන්න විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	350	450	700
76.	මල් ශාලාවක් පවත්වාගෙන යාම	500	750	1000
77.	බෙහෙත් වැඩ පළක්, නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	400	500	750
78.	ශබ්ද විකාශන යන්ත්‍ර, විදුලි යන්ත්‍ර හා උපකරණ කුළියට දීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500	750	1000
79.	යකඩ තීන්ත වාර්නිෂ් ඩිස්ටැම්පර් හෝ වෙනත් ගොඩනැගිලි ද්‍රව්‍ය ගබඩා කිරීමේ හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500	750	1000
80.	ඇලුමිනියම් බඩු ගබඩා කිරීමේ හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	400	500	750

	1 වැනි තීරය	*2 වැනි තීරය*		
	කර්මාන්තයේ ස්වභාවය			
අංකය	*ව්‍යාපෘතියේ නම*	*ස්ථානයේ වාර්ෂික වටිනාකම රු.1-රු.750ට නොවැඩි රු.*	*ස්ථානයේ වාර්ෂික වටිනාකම රු.751-රු.1500ට නොවැඩි රු.*	*ස්ථානයේ වාර්ෂික වටිනාකම රු.1501-ට වැඩි රු.*
81.	ඔරලෝසු අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	400	500	750
82.	පළතුරු වෙළඳාම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම	300	500	700
83.	ටින්කෑම, කිරිපිටි, බිස්කට්, කේක් ආදී විවිධ වර්ග (ග්‍රොසරියක්) පවත්වාගෙන යාම	500	750	1,000
84.	පත්තර, සඟරා, පාසල් පොත් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	400	600	800
85.	ග්ලාස් බෝට්ටු කුළියට දීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	50	500	500
86.	පළා වර්ග විකිණීම සඳහා	125	200	350
87.	කිමිදුම් උපකරණ හෝ පිහිනුම් උපකරණ හෝ දියමත ලිස්සා යාමේ ලෑලි කුළියට දීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම	500	750	1,000
88.	නිම් ඇඳුම් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	400	600	800
89.	වැලි, ගල්, ගඩොල් ගබඩා කිරීමේ හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500	750	1,000
90.	සහල් ගබඩා කර විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	450	550	750
91.	ටොන් එකට වැඩි සිමෙන්ති ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500	750	1,000
92.	විදුලි බිල්පත් සඳහා මුදල් එකතු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500	750	1,000
93.	දුරකථන බෙදා හැරීම සඳහා (සම්ප්‍රේෂණාගාර) පවත්වාගෙන යාම	500	750	1,000
94.	තේ කොළ හෝ කෝපි කුඩු හෝ මිරිස් කුඩු හෝ තුනපහ පැකට් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	200	300	450
95.	යතුරුලියන යන්ත්‍ර හෝ රෝනියෝ යන්ත්‍ර අලුත්වැඩියා කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500	750	1,000
96.	විකිණීම සඳහා මල් වැවීම පවත්වාගෙන යාම	250	400	600
97.	විදේශීය දුරකථන සේවාවක් පවත්වාගෙන යාම	500	750	1,000
98.	නාම පුවරු ඇඳීමේ ස්ථානයක් හෝ ප්ලාස්ටික් නාම පුවරු සැකසීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම	450	550	750
99.	ඇස් කණ්නාඩි විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500	750	1,000
100.	දත් බඳින ස්ථානයක් හෝ දන්ත වෛද්‍ය ශාලාවක් පවත්වාගෙන යාම	500	750	1,000
101.	පාපැදි අලුත්වැඩියා කරන ස්ථානයක් පවත්වාගෙන යාම	250	350	600
102.	පානීය ජලය බෝතල් ගතකර විකිණීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම	500	750	1,000
103.	පරිගනක ආශ්‍රයෙන් අධ්‍යාපන පන්ති පවත්වාගෙන යාම	500	750	1,000
104.	පරිගනක ආධාරයෙන් මුද්‍රණ කටයුතු කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500	750	1,000
105.	මුදල් අයකරන පෞද්ගලික කාය වර්ධන මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම	500	750	1,000

	1 වැනි තීරය	*2 වැනි තීරය*		
	කර්මාන්තයේ ස්වභාවය			
අංකය	*ව්‍යාපෘතියේ නම*	*ස්ථානයේ වාර්ෂික වටිනාකම රු.1-රු.750ට නොවැඩි රු.*	*ස්ථානයේ වාර්ෂික වටිනාකම රු.751-රු.1500ට නොවැඩි රු.*	*ස්ථානයේ වාර්ෂික වටිනාකම රු.1501-ට වැඩි රු.*
106.	නියෝජිත තැපැල් කාර්යාලයක් පවත්වාගෙන යාම	500	750	1,000
107.	නිවාස සැලසුම් ඇඳීමේ ස්ථානයක් පවත්වාගෙන යාම (මුල් වර්ෂය සඳහා)	500	750	1,000
108.	තොග වශයෙන් බිත්තර විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	300	500	750
109.	උත්සව හෝ මංගල උත්සව සඳහා ශාලාවක් පවත්වාගෙන යාම	500	750	1,000
110.	වීසීඩී, සීඩී, ඩීවීඩී සංයුක්ත තැටි විකිණීමේ හෝ බදු දීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	450	600	800
111.	පරිගනක යන්ත්‍ර අලුත්වැඩියාව සහ විකිණීම	500	750	1,000
112.	ඔප කරන ලද කළු ගල් විකිණීම	500	750	1,000
113.	රියැදුරු පුහුණු පාසලක් පවත්වාගෙන යාම (මුල් වර්ෂය සඳහා)	500	750	1,000
114.	තෑගි භාණ්ඩ විකිණීම	500	750	1,000
115.	අන්තර්ජාල පහසුකම් සැපයීම	500	750	1,000
116.	හිස් බෝතල් හෝ හිස් ගෝනි ගබඩා කරන ස්ථානයක් පවත්වාගෙන යාම	200	300	500
117.	සාමාන්‍ය වෙළඳාම (සුළු සිල්ලර) ස්ථානයක් පවත්වා ගෙන යාම	200	300	500
118.	පින්තූර රාමු කිරීමේ හෝ විකිණීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම	300	400	600
119.	ස්පයිසර් තෙල් වර්ග, පික්වර් පෝස්කාඩ් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	300	400	600
120.	සංචාරක වෙළඳාම පවත්වාගෙන යාම	500	750	1,000
121.	මැටි වලං හෝ මැටි භාණ්ඩ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	250	350	550
122.	බුලත්, පුවක්, කොසු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	150	225	400
123.	ඇඳුම් මැසීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500	750	1,000
124.	රටකජු පැකට් හෝ බයිට් පැකට් හෝ රටකජු විකිණීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම	350	500	800
125.	දුරකථන කුටියක් පවත්වාගෙන යාම	1,000	1,000	1,000
126.	පූජා භාණ්ඩ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500	750	1,000
127.	පාපැදි විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500	750	1,000
128.	ප්‍රවාහන නියෝජිත ආයතනයක් (මුල් වර්ෂය සඳහා) පවත්වාගෙන යාම	500	750	1,000
129.	බිස්කට් වර්ග තොග වශයෙන් ගබඩා කර විකිණීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම	450	650	850
130.	සංගීත භාණ්ඩ හෝ ක්‍රීඩා භාණ්ඩ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	450	650	850
131.	යතුරු පැදි හා පාපැදි ආරක්ෂා කර දීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500	750	1,000
132.	විදුලි භාණ්ඩ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500	750	1,000
133.	බැටරි විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500	750	1,000

1 වැනි තීරය		*2 වැනි තීරය*		
කර්මාන්තයේ ස්වභාවය				
අංකය	*ව්‍යාපෘතියේ නම*	*ස්ථානයේ වාර්ෂික වටිනාකම රු.1-රු.750ට නොවැඩි රු.*	*ස්ථානයේ වාර්ෂික වටිනාකම රු.751-රු.1500ට නොවැඩි රු.*	*ස්ථානයේ වාර්ෂික වටිනාකම රු.1501-ට වැඩි රු.*
134.	බ්‍රේක් ලයිනර් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	300	450	750
135.	කේක් වර්ග තොග වශයෙන් හෝ සිල්ලරට විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500	750	1,000
136.	වැහි පීලි හෝ ජලනල උපාංග විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500	750	1,000
137.	බෙහෙත් නිෂ්පාදන ආයතනයක් පවත්වාගෙන යාම	150	300	500
138.	ශරීරය පින්තාරු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500	750	1,000
139.	වෛද්‍ය රසායනාගාරයක් පැවැත්වීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500	750	1,000
140.	රූපලාවන්‍ය ආලේපන කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	350	650	850
141.	ළඳරු උපකරණ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	350	650	850
142.	ඉස්සන් ඇල්ලීමේ ජා කොටුවක් පවත්වාගෙන යාම	750	750	750
143.	ජංගම දුරකතන අළුත්වැඩියා කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500	750	1,000
144.	ඒජන්සියක් පවත්වාගෙන යාම	500	750	1,000

12-320/4

හික්කඩුව නගර සභාව

2019 වර්ෂයට අදාලව ව්‍යාපාර බද්ද පැනවීම

255 වන අධිකාරිය නගර සභා අඥාපනතේ 165(ආ) වන වගන්තියෙන් නගර සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර එකී ආඥාපනතේ හෝ ඒ යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබා ගැනීම හෝ එහි ආඥාපනතේ 165 (අ) වන වගන්තිය යටතේ යම් කර්මාන්ත බද්දක් ගෙවීම අවශ්‍ය නොවන්නා වූ කිසියම් ව්‍යාපාරයක් හික්කඩුව නගර සභා බල ප්‍රදේශය ඇතුළත 2019 වර්ෂයේ කරගෙන යනු ලබන සෑම තැනැත්තෙකුගෙන්ම එකී ව්‍යාපාරයේ ඊට පෙර වර්ෂයේ ලැබීම් මෙහි පහත උප ලේඛනයේ 01 වන තීරුවේ නිරූපිත යම් විෂයාංක සීමාවන් ඇතුළත පවතින අවස්ථාවක එනම් දෙවන තීරුවේ අනුරූප සටහනේ නිරූපිත ප්‍රමාණයක ව්‍යාපාර බද්දක් 2019 වර්ෂය සඳහා පනවා අයකිරීමට බද්ද යටතේ සෑම තැනැත්තකුම එකී ව්‍යාපාරයේ බද්ද 2019 වර්ෂයේ ජුනි මස 30 වැනි දිනට පෙර හික්කඩුව නගර සභාවට ගෙවිය යුතු බවට 2018.09.18 දින පැවති හික්කඩුව නගර සභා රැස්වීමේදී සභා තීරණ අංක (ඒ) I-II හි (6) යටතේ සභා සම්මුතියෙන් තීරණය කර ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

වීනි කාරියවසම්,
සභාපති,
හික්කඩුව නගර සභාව.

උපලේඛනය

ආරම්භ වර්ෂය හැරෙන්නට ඉහත සඳහන් ව්‍යාපාර කරගෙන යන සෑම තැනැත්තෙකුගේම පෙර වූ වර්ෂයේ දී ඒ ව්‍යාපාරයේ ලැබීම් වලට අදාළව පහත දැක්වෙන පරිදි වාර්ෂික බද්දකි.

I වැනි තීරුව	*II වැනි තීරුව*
ව්‍යාපාරයේ වාර්ෂික ලැබීම්	*ගෙවිය යුතු බද්ද* *රු. ශත*
රු. 1 සිට රු. 6,000 දක්වා	නැත
රු. 6,001 සිට 12,000 දක්වා	90 0
රු. 12,001 සිට 18,750 දක්වා	180 0
රු. 18,751 සිට 75,000 දක්වා	360 0
රු. 75,001 සිට 15,00,000 දක්වා	1,200 0
රු. 15,00,01 සිට ඉහළට	3,000 0

උපලේඛනය

ඇතැම් වෙළෙඳ ව්‍යාපාර සම්බන්ධ බදු - 165 (*ආ*) වගන්තිය

01. වෙන්දේසිකරුවන්
02. බ්‍රෝකර්වරුන්
03. කොමිස් ඒජන්තවරුන්
04. මුදල් ආයෝජකයන්
05. උකස් බඩු ගන්නවුන්
06. කොන්ත්‍රාත්කරුවන්
07. සැපයුම්කරුවන්
08. රියදුරු පුහුණු ආයතන
09. රක්ෂණ නියෝජිතයෝ
10. ගෘහ නිර්මාණ ශිල්පීන්
11. ප්‍රවාහන සේවා අයිතිකරුවෙකු හා ප්‍රවාහන නියෝජිතයෙකු
12. පෞද්ගලික අධ්‍යාපන ආයතනයක් පවත්වන්නෙකු
13. මුදල ණයට දෙන්නෙකු වශයෙන් කටයුතු කිරීම
14. ලොතරැයි ටිකට් ඒජන්තවරයෙකු
15. විදේශ රැකියා ඒජන්සියක් පවත්වන්නෙකු
16. ගණන් පරීක්ෂකවරුන්
17. නීතිඥයින්
18. පෞද්ගලික මිනින්දෝරුවන්
19. වෛද්‍යවරුන් (ආයුර්වේද)
20. වෛද්‍යවරුන් (බටහිර)
21. මෝටර් රථ ත්‍රීරෝද රථ, යතුරුපැදි අලෙවි නියෝජිත ආයතනයක්
22. පෞද්ගලික බස්රථ සමාගම් හිමියන්
23. ඡායාරූප ශිල්පීන්
24. බැංකු, රක්ෂණ සමාගමක්, මුල්‍ය ආයතනයක්
25. රට බීම සාප්පුවක් (මත් පැන්)
26. ජලය බෙදා හැරීමේ මධ්‍යස්ථානයක්
27. විදුලිය බෙදා හැරීමේ මධ්‍යස්ථානයක්
28. දුරකථන සම්ප්‍රේෂණ මධ්‍යස්ථානයක්
29. විදේශීය දුරකථන සේවා මධ්‍යස්ථානයක්
30. පශු වෛද්‍ය ගිලන්හලක්
31. රූපලාවන්‍ය ආයතනයක්
32. විදේශීය මුදල් මාරු කිරීමේ ස්ථානයක්
33. රියදුරු පුහුණු පාසලක් පවත්වාගෙන යාම
34. කල්බදු ආයතන (ලීසින් ආයතන)

35. ස්වයංක්‍රිය ටෙලර් යන්ත්‍ර
36. ඉන්ධන පිරවුම්හලක් පවත්වාගෙන යාම
37. සුපිරි වෙළඳ සැල්
38. පෞද්ගලික රෝහල්
39. මහා පරිමාණ තුරඟ ඔට්ටුපළ
40. උත්සවශාලාවක් පවත්වාගෙන යාම
41. ඇඟළුම් කර්මාන්තශාලා
42. මහා පරිමාණ ලෙස පානීය ජලය බෝතල් කිරීමේ මධ්‍යස්ථාන
43. ප්‍රචාරක ආයතන
44. කුලී පදනම මත යන්ත්‍රෝපකරණ බදුදීම
45. පිරිසිදු කරන්නන් කුළියට දීමේ ආයතන
46. පෞද්ගලික ආරක්ෂක සේවා සැපයීමේ මධ්‍යස්ථාන
47. ස්වර්ණාභරණ අලෙවිසැල්
48. නගර සභාවට අයත් මාර්ගවල දුරකථන කණු සිටුවිමේදී එක් කණුවක් සඳහ රු. 1,000.00ක වාර්ෂික ගාස්තුවක් ගෙවීම

12-320/5

හික්කඩුව නගර සභාව

ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය කිරීමේ ගාස්තු පැනවීම

255 වැනි අධිකාරය වන නගර සභා ආඥාපනතේ 153 වැනි හා 157 වැනි වගන්තිය යටතේ හික්කඩුව නගර සභාව විසින් සම්පාදිතව එම ආඥාපනතේ 154 වැනි වගන්තිය යටතේ ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය කිරීමේ ගාස්තු 2019 ජනවාරි මස පළමු දින සිට පහත සඳහන් ලෙස පනවා අයකිරීම කළ යුතු බවට 2018.09.18 දින පැවති හික්කඩුව නගර සභා රැස්වීමේදී සභා තීරණ අංක (ඒ) I-II හි (8) යටතේ සභා සම්මුතියෙන් තීරණය කර ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

වීනි කාරියවසම්,
සභාපති,
හික්කඩුව නගර සභාව.

1. යම් තැනැත්තෙකු විසින් උසුලාගෙන යනු ලබන හෝ ගමන් කරන වාහනයකට සවි කොට ඇති හෝ මහජනතාවට දැනගැනීමට හැකි වන පරිදි යම් තැනක සවිකර තබන ප්‍රචාරක බැනරයක් සඳහා වර්ග අඩියකට රු. 30 බැගින්,

2. ප්‍රචාරක දැන්වීම් පුවරුවක් ප්‍රදර්ශනය කිරීම සඳහා යම්කිසි ස්ථානයක සවි කිරීමේ දී මාස 06 කට අඩු කාලයකට වර්ග අඩියකට රු. 100 බැගින් සහ මාස 06 සිට එක් වර්ෂයක කාලයකට වර්ග අඩියකට රු. 150 බැගින්,

3. ව්‍යාපාරික ස්ථානයක සවිකර ඇති වෙළඳ දැන්වීම් පුවරුවක් ප්‍රදර්ශනය කිරීම සඳහා මාස 06 කට අඩු කාලයකට වර්ග අඩියකට රු. 75 බැගින් සහ මාස 06 සිට එක් වර්ෂයක කාලයකට වර්ග අඩියකට රු. 100 බැගින්,

4. ගොඩනැගිල්ලක, බිත්තියක හෝ තාප්පයක පින්තාරු තීන්තෙන් ප්‍රචාරක දැන්වීමක් ඇඳ තැබීම සඳහා මාස 06 කට අඩු කාලයකට වර්ග අඩියකට රු. 30 බැගින් සහ මාස 06 සිට එක් වර්ෂයක කාලයකට වර්ග අඩියකට රු. 50 බැගින්,

5. ප්‍රතිදීප්ත දැන්වීම් පුවරු සඳහා වර්ග අඩියකට රු.200 බැගින්.

12 - 320/6

හික්කඩුව නගර සභාව

2019 වර්ෂය සඳහා විනෝද බදු පැනවීම

2019 වර්ෂය සඳහා විනෝද බදු පැනවීම ආඥාපනත යටතේ සෑම චිත්‍රපටි දර්ශනයක්, ආධාරක චිත්‍රපටි දර්ශනයක්, සර්කස් දර්ශනයක් හා සෑම සංදර්ශනයක් සඳහාම නිකුත් කරනු ලබන ඇතුළත්වීමේ ප්‍රවේශ පත්‍රවල වටිනාකමින් 10% ක බද්දක් පනවා අය කළ යුතු බවට 2018.09.18 දින පැවති හික්කඩුව නගර සභා රැස්වීමේදී සභා තීරණ අංක (ඒ) I-II හි (9) යටතේ සභා සම්මුතියෙන් තීරණය කර ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

වීනි කාරියවසම්,
සභාපති,
හික්කඩුව නගර සභාව.

12-320/7

හික්කඩුව නගර සභාව

සුනඛයින් ලියාපදිංචි කිරීමේ ගාස්තු පැනවීම - 2019

